252 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 252 - இல. 6
Volume 252 - No. 6

2017 මැයි 25වන බ්‍රහස්පතින්දා
2017 மே 25, வியாழக்கிழமை
Thursday, 25th May, 2017

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ යළි පදිංචි වූ ජනතාවට ඉඩම් ඔප්පු ලබාදීම

2017 මැයි මස 25වන දින "ලංකාදීප" පුවත් පතේ පළ වූ වාර්තාව :

ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ ප්‍රකාශය

උයිලන්කුලම් 'නිවාස පනහ යෝජනා ක්‍රමය' සඳහා මූලික පහසුකම් :

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

කරඩිප්පුවල් ජනතාවගේ අවශ්‍යතා :

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත :

පළමුවන වර කියවන ලදි.

කල් තැබීමේ යෝජනාව:

උක් වගාව සඳහා විදේශීය සමාගමකට ඉඩම් ලබාදීම

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல்மூல வினா:

திருகோணமலை மாவட்டத்தில் மீள்குடியேறிய மக்களுக்கு காணி உரிமம் வழங்கல்

2017 மே 25 ஆந் திகதிய 'லங்காதீப' அறிக்கை :

காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரின் கூற்று

உயிலங்குளம் "ஐம்பது வீட்டுத் திட்டத்துக்கான" அடிப்படை வசதிகள்:

சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சரினது கூற்று

கரடிப்பூவல் கிராம மக்களின் தேவைகள் :

சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சரினது கூற்று

குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (விசேட ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம் :

முதன்முறை மதிப்பிடப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை :

கரும்புப் பயிர்ச்செய்கைக்காக வெளிநாட்டுக் கம்பனிக்குக் காணிகளை வழங்குதல்

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Provision of Title Deeds to Resettled People in Trincomalee District

"LANKADEEPA" REPORT OF 25TH MAY, 2017:
Statement by Minister of Lands and Parliamentary Reforms

BASIC FACILITIES FOR "FIFTY-HOUSES SCHEME":
Statement by Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs

NEEDS OF KARADIPPOOVAL COMMUNITY:
Statement by Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs

CODE OF CRIMINAL PROCEDURE (SPECIAL PROVISIONS) (AMENDMENT) BILL:
Read the First time

ADJOURNMENT MOTION:
Land Grant to a Foreign Company for Sugarcane Cultivation

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2017 මැයි 25වන බ්‍රහස්පතින්දා
2017 மே 25, வியாழக்கிழமை
Thursday, 25th May, 2017

පූ.භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.

The Parliament met at 10.30 a.m.
MR. DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂය සඳහා අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂය සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු හරින් ප්‍රනාන්දු මහතා - පැමිණ නැත.

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා (ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி - தேசிய ஒருமைப்பாடு மற்றும் நல்லிணக்க இராஜாங்க அமைச்சர்)
(The Hon. A.H.M. Fowzie - State Minister of National Integration and Reconciliation)

Hon. Speaker, I present a petition from Mr. W. Sirisena Perera of No. 347/14, Kotte Road, Nugegoda.

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன் - கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. V.S. Radhakrishnan -State Minister of Education)

Hon. Speaker, I present -

(1) a petition from Mr. M. M. Palitha Dhanapala of Police Station, Dayagama;

(2) a petition from Mr. W. A. S. Wickramsinghe of No. P.26, Police Quarters, Ampara.

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිඹිස්ස, නාගලවැව යන ලිපිනයෙහි පදිංචි කේ.ජී. ගුණපාල මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of City Planning and Water Supply)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සීදුව, නැඟෙනහිර දඹදූරය, අංක 44 දරන ස්ථානයෙහි පදිංචි ඒ.ජී. බර්නාඩ් පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Public Administration and Management)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කන්තලේ, පරාක්‍රම මාවත, පළමුවැනි පටුමග, අංක 15/17බී දරන ස්ථානයේ පදිංචි ඊ.ඒ.බී. ධර්මසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නුගේගොඩ, මිරිහාන, එදිරිසිංහ පාර, පළමුවැනි පටුමග, 50/28 දරන ස්ථානයේ පදිංචි ඩබ්ලිව්.එල්.කේ. නානායක්කාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ලකී ජයවර්ධන මහතා - පැමිණ නැත.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) හුංගම, බටඅත, උළුගෙදර යන ලිපිනයේ පදිංචි එම්.ඒ.කේ. විජේපාල මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මාකොල දකුණ, සාලිය මාවත, 258/2බී දරන ස්ථානයේ පදිංචි ඩබ්ලිව්.රුවන්පතිරණ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොළඹ 05, කැප්පෙටිපොල මාවත, අංක 11 ඒ දරන ස්ථානයේ පදිංචි කේ.එස්.බී. රොහාන් ඩයස් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා - පැමිණ නැත.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Deputy Speaker, I present a petition from Mr. Anthony Devaraj of No. 1867, Poombuhar Street, Palaiyoothu, Trincomalee.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

දේශපාලන පළිගැනීමට ලක්වූ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයන්: සහන
அரசியல் பழிவாங்கலுக்குள்ளான தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபை ஊழியர்கள்: நிவாரணம்
POLITICALLY VICTIMIZED EMPLOYEES OF NATIONAL HOUSING DEVELOPMENT AUTHORITY: RELIEF

902/'16

1. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) දේශපාලන පළිගැනීම්වලට ලක්වූ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයන්ට සහන සැලසීම සඳහා නව රජය යටතේ කමිටුවක් පත්කර හෝ වැඩ පිළිවෙළක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම කමිටුව පත්කර හෝ වැඩ පිළිවෙළ සකස් කර ඇත්තේ කැබිනට් අනුමතියක් යටතේද; එසේ නම්, එම අනුමතිය ලද දිනය කවරේද;

(iii) දේශපාලන පළිගැනීම් සඳහා සහන ලබාදීමට සලකා බලන කාලසීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළිගැනීමට ලක්වූවන්ට සහන ලබාදීම සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩ පිළිවෙළ කවරේද;

(ii) එසේ පළිගැනීමට ලක්වී, සහන ලබා උසස්වීම් ලද පුද්ගලයන්ගේ නම්, පළිගැනීමට ලක්වූ හේතුව සහ ඔවුන්ට ලබා දුන් සහනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන්ට උසස්වීම් සමඟ හිඟ වැටුප් ලබා දෙන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசியல் பழிவாங்கல்களுக்கு ஆளாகியுள்ள தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகார சபையின் ஊழியர்களுக்கு நிவாரணம் வழங்க புதிய அரசாங்கத்தின் கீழ் குழுவொன்று நியமிக்கப்பட்டு அல்லது வேலைத்திட்ட மொன்று தயாரிக்கப்பட்டுள்ளதா;

(ii) ஆமெனில், மேற்படி குழு நியமிக்கப்பட்டு அல்லது வேலைத்திட்டமொன்று தயாரிக்கபட்டு இருப்பது அமைச்சரவையின் அங்கீகாரத்தின் கீழா; ஆமெனில், மேற்படி அங்கீகாரம் பெறப்பட்ட திகதி யாது;

(iii) அரசியல் பழிவாங்கல்களுக்கு நிவாரணம் வழங்குவதற்காக கவனத்திற் கொள்ளப்படும் கால எல்லை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) பழிவாங்கலுக்கு ஆளாகியுள்ளவர்களுக்கு நிவாரணம் வழங்குவதற்காக செயற்படுத்தப் பட்ட வேலைத்திட்டம் யாது;

(ii) அவ்வாறு பழிவாங்கலுக்கு ஆளாகி, நிவாரணங்கள் பெற்று, பதவியுயர்வு பெற்றுள்ளவர்களின் பெயர், பழிவாங்கலுக்கான காரணம் மற்றும் இவர்களுக்கு வழங்கப்பட்டுள்ள நிவாரணம் தனித்தனியாக யாது;

(iii) இவர்களுக்கு பதவியுயர்வோடு நிலுவைச் சம்பளம் வழங்கப்படுகின்றதா;

(iv) ஆமெனில், அது எத்திகதியிலிருந்து;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing and Construction:

(a) Will he inform this House -

(i) whether a committee has been appointed or a programme has been arranged to grant relief to employees of the National Housing Development Authority who were subjected to political victimization;

(ii) if so, whether the appointment of such a committee or the arrangement of such a programme was done under a Cabinet approval, and if so, the date on which approval was received; and

(iii) the time period taken into consideration when granting relief for political victimization;

(b) Will he also inform this House -

(i) the programme implemented to grant relief to those who were subjected to victimization;

(ii) separately the names of the persons who, having been subjected to victimization, received relief and have been given promotions, along with the reason for vengeance and the relief they received;

(iii) whether they will be paid their salary in arrears along with their promotions; and

(iv) if so, of the date from which it will be made effective?

(c) If not, why?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை பிரதி அமைச்சர்)

(The Hon. Indika Bandaranayake - Deputy Minister of Housing and Construction)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ඔව්. අමාත්‍යාංශ මට්ටමින් කමිටුවක් පත් කර ඇත. එම කමිටුව ජාතික නිවාස සංවර්ධන අධිකාරියට විශේෂිත වූ කමිටුවක් නොවන අතර, මෙම අමාත්‍යාංශය යටතේ පවතින සියලු ආයතනවල දේශපාලන පළිගැනීම්වලට ලක්වූ සේවකයන්ට සහන සැලසීමට පත් කරන ලද කමිටුවකි.

(ii) නැත.

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ගේ අංක ADS/PA/152 හා 2015.06.11 දිනැති ලිපිය මඟින් මෙම කමිටුව පත් කිරීම සඳහා එකඟතාව ලැබී ඇති අතර, එම කමිටුව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු බවට උපදෙස් ලැබී නොමැත. කෙසේ වුවද, මෙම කමිටුව විසින් ලබාදී ඇති නිර්දේශ සඳහා 2016.03.02 දිනැති අමප අංක 16/1129/734/002 I දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී ඇත.

(iii) 1994 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා.

(ආ) (i) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද නිර්දේශ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සෘජුවම ක්‍රියාත්මක කිරීමට හැකියාව පවතින නිර්දේශ ක්‍රියාත්මක කෙරේ.

එමෙන්ම අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට අපහසු නිර්දේශ සම්බන්ධයෙන් තවදුරටත් උපදෙස් ලබාගැනීම සඳහා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ මේ සම්බන්ධයෙන් පිහිටුවා ඇති විමර්ශන කමිටුව වෙත අදාළ නිර්දේශ යොමු කර ඇත.

(ii) නිර්දේශ අතුරින් ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ 71ක් හඳුනාගෙන ඇති අතර, ඊට අදාළ තොරතුරු ඇමුණුම මඟින් දක්වා ඇත.

(iii) ඔව්.

හිඟ වැටුප් ලබාදෙන ලෙසට කර ඇති නිර්දේශ සඳහා පමණක් මහා භාණ්ඩාගාරයෙන් මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමෙන් අනතුරුව හිඟ වැටුප් ලබාදීමට කටයුතු කෙරේ.

(iv) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති නිර්දේශයන්හි උසස්වීම්/හිඟ වැටුප් ලබාදිය යුතු කාල සීමාව ඇමුණුමෙහි දක්වා ඇත. ඒ අනුව අදාළ උසස්වීම් හා හිඟ වැටුප් ලබාදීමට කටයුතු කෙරේ.

(ඇ) අදාළ නොවේ.

ඇමුණුම **සභාගත*** කරමි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)

(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන් මා මුලින්ම ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමන්ලා සිරිකොත පක්ෂ මූලස්ථානයට කැඳවා, සිරිකොතේදි interview කරලා තමයි ජාතික නිවාස සංවර්ධන

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

අධිකාරියට අදාළව සහ නිවාස අමාත්‍යාංශයේම දේශපාලන පළිගැනීම්වලට අදාළව සහන ලබා දීමේ කටයුත්ත කෙරෙන්නේ කියා චෝදනාවක් ඉදිරිපත් වෙනවා. එවිට සිදු වන්නේ, වෙනත් දේශපාලන පක්ෂයක, වෙනත් දේශපාලන අදහසක් දරන කෙනෙකුට ඊට අදාළව ඉල්ලුම් කිරීමේ හෝ එම ස්ථානයට යෑමේ හෝ ප්‍රායෝගික ගැටලුවක් මතු වීමයි කියා ඔබතුමාටම තේරෙනවා. කරන interview එකක් අමාත්‍යාංශ මට්ටමින් කර හෝ අදාළ කැඳවීම් කරනවා නම් එය ප්‍රායෝගිකයි. එවැනි කටයුත්තක් සිරිකොත හරහා සිද්ධ වනවාද? සිරිකොතේ අනුමැතිය ලබා ගන්න ඕනෑ කියා අදහසක් ඒ ඉල්ලුම් පත්‍රවලම තිබෙනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක සිරිකොතේ වුණොත් ඔබතුමාටත් ප්‍රශ්නයක් වෙනවා නේ. ඔබතුමාට ඩාර්ලි පාරට යන්න වනවා නේද? එහෙම දෙයක් සිද්ධ වනවාද, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා? පළමුවන අතුරු ප්‍රශ්නය එයයි.

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිරිකොතේ අනුමැතියක් මේකට අවශ්‍ය වන්නේ නැහැ. 1994 ඉඳලා 2014 දක්වා දේශපාලන පළිගැනීම්වලට ලක් වූ, අසාධාරණයට ලක් වූ සියලු දෙනා-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ අය interview කළේ කොහේදිද කියලායි අහන්නේ.

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
අමාත්‍යාංශයේ දි. සියලු වැඩ කටයුතු අමාත්‍යාංශ මට්ටමින් කෙරෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට සහතිකයක්, තහවුරුවක් තිබෙනවාද, දේශපාලන පක්ෂ හැටියට භේදයකින් තොරව සහන ලබා දෙන බවට. මොකද, දේශපාලන පළිගැනීම්වලට ලක් වූවන්ට සහන දෙනවා කියන පදනමට ආවාට පසුව පක්ෂ භේදයකින් තොරව එයට සහන දුන්නොත් තමයි පළිගැනීමට ලක් නොවන්නේ. එහෙම නැත්නම් නැවතත් පළිගැනීමට ලක් වෙනවා. එකී කාලය තුළ දේශපාලන පළිගැනීම්වලට ලක් වූවන්ට දේශපාලන පක්ෂ භේදයකින් තොරව ඔබතුමන්ලා සහන ලබා දීමට කටයුතු කරන බවට සහතිකයක් දෙන්න පුළුවන්ද? එවැනි සහතිකයක් දෙන්න ඔබතුමාට පුළුවන්ද?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
අනිවාර්යයෙන්ම අපි කරනවා. ඔබතුමාටත් එහෙම මොනවා හරි ගැටලුවක් තිබෙනවා නම් අපට ඉදිරිපත් කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
පක්ෂග්‍රාහී නොවනවාද කියලායි අහන්නේ.

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
අපක්ෂපාතීව අපි ඒ වැඩ කටයුතු කරනවා. ඔබතුමා ඒක අපට ඉදිරිපත් කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට යම් කිසි ගැටලුවක් තිබෙනවා නම් සෘජුව ගරු ඇමතිතුමාට කියන්න කියලායි කියන්නේ. තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමාගේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයට අදාළවයි අහන්නේ. 2017 අප්‍රේල් මාසයේ 26වැනිදා අමාත්‍යාංශයේ ලේකම් ඩබ්ලිව්. කේ.කේ. අතුකෝරල මහතා ඔබතුමා යටතේ තිබෙන ආයතන 18කට අදාළව චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා. එහි සඳහන් වෙනවා, " විදේශ රටවල අධ්‍යාපන පුහුණු පාඨමාලා, වැඩමුළු, සම්මන්ත්‍රණ, නිරීක්ෂණ චාරිකා යනාදී වැඩසටහන් සඳහා නිලධාරීන් තෝරා ගැනීම" කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ යටතේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා, "යම් කිසි විදේශ රටක ආරාධනාවක් අනුව හෝ ඔබ ආයතනයේ නිලධාරීන් එවැනි විදේශ චාරිකා සඳහා"-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් ඔය කියවන්නේ එතුමාට ඉදිරිපත් කළ ප්‍රශ්නයට අදාළ එකක් නොවෙයි නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔව්, එතුමා ඒකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරනවා නම් ප්‍රශ්නයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අතුරු ප්‍රශ්න අහන්න ඕනෑ, එතුමා ලබා දුන්න උත්තරයක් මත නේ. ඔබතුමා ඉදිරිපත් කරන්නේ අලුත් කාරණයක් නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, සාමාන්‍යයෙන් ඇමතිවරු උත්තර දෙනවා. මෙතුමා ප්‍රතික්ෂේප කරනවා නම් මම මේක අයින් කර ගන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එම අතුරු ප්‍රශ්නයට පිළිතුරු දෙන්න එතුමා ලැහැස්තියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එහෙම කරන්න බැහැ. එතකොට පැයක් ඇතුළත ප්‍රශ්න 15ක් අහන්න පුළුවන්ද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අද ප්‍රශ්න අහන ගරු මන්ත්‍රීතුමන්ලා ගොඩක් ඇවිල්ලා නැහැ. එදා ගරු කථානායකතුමා ගරු අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමා පිළිතුරු දෙන්න කැමැති නම් ප්‍රශ්නය අහන්න අවස්ථාව ලබා දුන්නා. පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායක්. මේක ඉස්කෝලයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙහි පැහැදිලිව සඳහන් කර තිබෙනවා "එම විදේශ වාරිකා සඳහා සහභාගි වීමට අපේක්ෂිත නිලධාරින්ගේ නාම යෝජනා ගරු අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කර එතුමාගේ උපදෙස් හා එකඟතාව ලබා ගත යුතු බව මෙයින් දන්වා සිටිමි" කියලා. ඉන් පසුව නැවත තිබෙනවා, එවැනි වැඩසටහන් සඳහා ඇමතිතුමාගේ එකඟතාව ලබා ගැනීමෙන් අනතුරුව දිවයිනෙන් බැහැරවීමට යන කොට ඇමතිතුමාගෙන් නැවත අවසරය ගන්න කියලා. මම මේක ඉතාම කෙටියෙන් කියන්නේ.

සාමාන්‍යයෙන් සෑම අමාත්‍යාංශයකම විදේශ පුහුණුවට යෑම සඳහා සුදුසු නිලධාරින් තෝරන්නේ අමාත්‍යාංශ ලේකම්වරයායි. ඒ තෝරන ලද නිලධාරින්ගේ ලැයිස්තුව පසුව වෙනස් කිරීමේ අයිතිය ඇමතිවරයාට තිබෙනවා. නමුත් මේකේ මුල්ම යෝජනාව පවා ගන්න වෙලා තිබෙන්නේ ඇමතිවරයාගෙන්. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එම නිසා පැහැදිලිවම මේක දේශපාලනීකරණයක් වෙනවා. මේකෙන් සාධාරණ නිලධාරින්ට අවස්ථාවක් නැති වෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අදහස දැනගන්න කැමැතියි.

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන දේශපාලනීකරණයක් වෙන්නේ නැහැ. ඔය කියනවා වාගේ ගැටලුවක් අපේ අමාත්‍යාංශයට මේ වන තෙක් පැන නැඟිලා නැහැ. ඔබතුමා අපට මේ සම්බන්ධයෙන් ලිඛිතව ඉදිරිපත් කරන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් 2017 අප්‍රේල් 26වැනි දින චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා. අදට මාසයක් වෙනවා. මේක වුණොත්, අනිවාර්යයෙන්ම නිලධාරින්ට සිද්ධ වෙනවා, -[බාධා කිරීමක්]

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට මේ ගැන ලිඛිතව දෙන්න. මම පෞද්ගලිකව මේ ගැන සොයා බලා ඔබතුමාට දැනුම් දෙන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැනට විනාඩි අටහමාරක් ගත වෙලා තිබෙනවා, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි. මෙහෙම කථා කළොත් ප්‍රශ්න 15ක් පැයකින් අහන්නේ කොහොමද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
උත්තර දෙන්න නේ කාලය ගත්තේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතුමා උත්තරයක් දුන්නා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ප්‍රශ්නයක් අහන කොට කියන්න එපා කාලය නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 2-928/'16-(4), ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය මම හතරවැනි වතාවට අහන්නේ. ඒත් පිළිතුරක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතැන ගැටලුවක් තිබෙනවා, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතැන විතරක් නොවෙයි, මීට කලින් සිදුවීමෙත් ගැටලුවක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ ඔබතුමන්ලා හිතන විධිය නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
විදේශ ඇමතිතුමා දැන් මාරු වෙලා නේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අලුත් විදේශ ඇමතිතුමා අදයි වැඩ බාර ගන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මටයි කථා කරන්න අවස්ථාව ලබා දෙන්න ඕනෑ. මගේ අයිතිවාසිකමයි නැති වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභානායකතුමා ආණ්ඩු පක්ෂයේ -

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට ආසන්නයේ සිටින නිසා මම මෙහෙම කියන දේ ඔබතුමාට ඇසෙනවා. නමුත් මම ඈතින් සිටියා නම් මොකද වෙන්නේ? ඒ නිසා කරුණාකරලා මට "මයික්" එක දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. හතර වෙනි අවස්ථාවටයි මෙම ප්‍රශ්නයට පිළිතුරු දීම ප්‍රතික්ෂේප වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බිමල් රත්නායක මැතිතුමාගේ මයික්‍රෆෝනය දෙන්න. එතුමා කියන්නේ හතර වතාවක් මෙම ප්‍රශ්නය -

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒක කියන්නම්. මම මේ ප්‍රශ්නය හතර වැනි අවස්ථාවටයි, අහන්නේ. මේක අමුතු ප්‍රශ්නයක් නොවෙයි. මේ සියලුම සංඛ්‍යා ලේඛන තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා දේශපාලන පත්වීම් විදේශ සේවයට දීලා, උත්තර දෙන එක මඟින් මඟට ප්‍රතික්ෂේප කරන්නේ ඇයි? මේ තොරතුරු සියල්ල තිබෙනවා, ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි. අනෙක, මේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ 2015.01.08 සිට 2016.08.01 දක්වා වූ තොරතුරුයි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මම හිතන විධියට, විදේශ කටයුතු ඇමතිතුමා වැඩ භාර ගන්නෙත් අද. එතුමා සති දෙකකින් උත්තර දෙයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නමුත් ඔබතුමා දන්නවා, සති දෙක කියන්නේ, සති දෙක නොවෙයි කියා. පාර්ලිමේන්තු -

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
[බාධා කිරීම්] එතුමා පත්වීම භාර ගෙනත් දවස් දෙකයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ගණන් - [බාධා කිරීමක්]

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 4-945/'16 - (4), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2016.08.24 දින අසන ලද ප්‍රශ්නය මම නැවත අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයත් විදේශ කටයුතු ඇමතිතුමාගෙන් අහලා තිබෙන්නේ. විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දී සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ ප්‍රශ්නයත් බිමල් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය වාගේම හතර වැනි වතාවට අහන්නේ. අලුත් විදේශ කටයුතු ඇමතිතුමා අද වැඩ භාර ගන්නවා කියලායි ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියන්නේ. එහෙම නම් ඒකටත් සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟට,තිබෙන්නේ ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාගේ ප්‍රශ්නය. එතුමාට අපි නිරෝගි සුව පතනවා. එතුමා අසනීප තත්ත්වයෙන් පසු වෙනවා කියලා දැනුම් දීලා තිබෙනවා.

කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : රාජ්‍ය ආයතන සතු ඉඩම්

கிரான் பிரதேச செயலாளர் பிரிவு : அரச நிறுவனங்களுக்குரிய காணிகள்

KIRAN DIVISIONAL SECRETARY'S DIVISION: LANDS BELONGING TO STATE INSTITUTIONS

1316/'16

10. ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)

ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තු, දකුණ කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි රාජ්‍ය ආයතන සතු ඉඩම් ප්‍රමාණය කවරේද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචිකරුවන් විසින් රජයේ ඉඩම් ප්‍රදාන/ බලපත්‍ර මත ලබා ගැනීම සඳහා අයදුම් කර තිබේද;

(iii) එසේ නම්, එම ඉල්ලීම් ප්‍රමාණය කොපමණද;

(iv) එම අයදුම්කරුවන්ට මේ දක්වා ප්‍රදාන/බලපත්‍ර මත ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தின், கோரளைப்பற்று தெற்கு கிரான் பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள அரசாங்க நிறுவனங்களுக்குச் சொந்தமான காணிகளின் அளவு யாதென் பதையும்;

(ii) மேற்படி பிரதேச செயலாளர் பிரிவில் வசிப்பவர்கள் அரசாங்க காணிகளை அளிப்புப் பத்திரத்தின்/அனுமதிப்பத்திரத்தின் மூலம் பெற்றுக்கொள்ள விண்ணப்பித்துள்ளார்களா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி கோரிக்கைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி விண்ணப்பதாரர்களுக்கு இற்றைவரை அளிப்புப் பத்திரத்தின்/ அனுமதிப்பத்திரத்தின் மூலம் பெற்றுக் கொடுக்கப்பட்டுள்ள காணி களின் அளவு யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Lands and Parliamentary Reforms:

(a) Will he inform this House -

(i) the extent of land which belongs to the Public Institutions located in Koralaipattu, South Kiran Divisional Secretary's Division in the Batticaloa District;

(ii) whether the occupants in that Divisional Secretary's Division have applied to obtain State lands on grants/permits;

(iii) if so, the number of applications received for it;

(iv) the extent of land provided to the aforesaid applicants on grants/permits by now?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරලේපත්තු දකුණු කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි රාජ්‍ය ආයතන සතු ඉඩම් ප්‍රමාණය අක්කර 228.174 (දෙසිය විසිඅටයි දශම එකයි හතයි හතරකි)

(ii) ඔව්.

(iii) 8,259 (අටදහස් දෙසිය පනස්නවයයි)

(iv) දැනට බලපත්‍ර හෝ දීමනාපත්‍ර මඟින් ලබා දුන් ඉඩම් ප්‍රමාණය අක්කර 21,845 (විසිඑක් දහස් අටසිය හතළිස්පහකි)

(ආ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු එම්.එච්.එම්. සල්මාන් මැතිතුමා. You may raise your first Supplementary Question.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)

ගරු ඇමැතිතුමනි, දැන් ඔබතුමා (අ) (i) ප්‍රශ්නයට පිළිතුරු දීලා කිව්වා රාජ්‍ය ආයතන සතු ඉඩම් ප්‍රමාණය අක්කර 228යි කියලා. ඒ එක්කම ඔබතුමා (අ) (iv) ප්‍රශ්නයට පිළිතුරු දෙමින් කිව්වා මේ දක්වා අක්කර 21,845ක් ප්‍රදානය කර තිබෙනවා කියලා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

(අ) (1) ප්‍රශ්නයට පිළිතුර තමයි අක්කර 228. දැනට බලපත්‍ර, දීමනාපත්‍ර මඟින් ලබා දුන් ඉඩම් ප්‍රමාණය අක්කර 21,845යි.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)

කෝරලේපත්තු දකුණ කිරාන් ප්‍රාදේශීය ලේකම් කෝට්ඨාසය තුළ පිහිටි රාජ්‍ය ආයතන සතු ඉඩම් ප්‍රමාණය අක්කර දෙසිය ගණන නම්, බලපත්‍ර මත හෝ දීමනාපත්‍ර මත අක්කර 21,845ක් දෙන්න හැකියාවක් තිබෙනවාද? එතැන පොඩි පරස්පරතාවක් තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

එතැන අක්කර 228 කියන්නේ රජයේ ඉඩම් නේ. ඒ කියන්නේ රාජ්‍ය ආයතන සතු ඉඩම් ප්‍රමාණය.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි රාජ්‍ය ආයතන සතු ඉඩම් තිබෙන්නේ අක්කර 228යි. බලපත්‍ර හා දීමනාපත්‍ර මඟින් ලබා දීලා තිබෙනවා, අක්කර 21,845ක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 3-931/'16-(4), ගරු චන්දිම ගමගේ මහතා.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු චන්දිම ගමගේ මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

සරණාගත කඳවුරුවල ජීවත්වන දෙමළ ජනතාව සතුව තිබූ රත්‍රන් : විස්තර
அகதி முகாம்களிலுள்ள தமிழ் மக்களுக்குரித்தான தங்கம்: விபரம்
GOLD BELONGING TO TAMIL PEOPLE LIVING IN REFUGEE CAMPS: DETAILS

1004/'16

5. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු වාසුදේව නානායක්කාර මහතා වෙනුවට)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு வாசுதேவ நாணாயக்கார சார்பாக)
(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. Vasudeva Nanayakkara)
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4) :

(අ) (i) යුද්ධයෙන් පසුව සරණාගත කඳවුරුවල ජීවත්වන දෙමළ ජනතාවට අයත් රත්‍රන් විශාල ප්‍රමාණයක් කවුරුන් හෝ භාරයේ තබා තිබේද;

(ii) මෙම රත්‍රන් තැන්පතු ගණනය කර තිබේද;

(iii) එම පුද්ගලයන්ගේ රත්‍රන් මෙතෙක් ඔවුන් වෙත යළි ලබා දී නොමැති බවට පැමිණිලි කර තිබේද;

(iv) ඉහත (i) සම්බන්ධයෙන් පවතින තොරතුරු කවරේද;

(v) එම හිමිකම් පෑම නිරාකරණය කිරීම සඳහා රජය මඟින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்ற மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யுத்தத்தின் பின்னர் அகதி முகாம்களில் தஞ்சம் புகுந்த தமிழ் மக்களுக்குச் சொந்தமான பெருமளவு தங்கம் எங்கேனும் நம்பிக்கைப் பொறுப்பில் வைப்பீடு செய்யப்பட்டதா என்பதையும்;

(ii) இவ்வைப்பீடுகளைக் கணக்கிட முடியுமா என்பதையும்;

(iii) இதுவரையில் அவர்களின் தங்கம் அவர்களுக்கு திருப்பிக் கொடுக்கப்படவில்லையென முறைப்பாடுகள் கிடைக்கப்பெற்றுள்ளனவா என்பதையும்;

(iv) மேற்படி (i) தொடர்பில் கிடைக்கக் கூடியதாகவுள்ள விபரங்கள்;

(v) இக்கோரிக்கைகளைத் தீர்ப்பதற்காக அரசாங்கத்தால் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகளையும் ;

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs:

(a) Will he inform this House -

(i) whether a large quantity of gold belonging to Tamil people who are living in refugee camps after the war, was deposited anywhere in a trust;

(ii) whether these deposits were enumerated;

(iii) whether there are complaints that their gold has not been returned to them so far;

(iv) the available details regarding (i) above; and

(v) the steps taken by the Government to settle these claims?

(b) If not, why?

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා (බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டி. எம். சுவாமிநாதன் - சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர்)
(The Hon. D.M. Swaminathan - Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) යුද්ධයෙන් පසුව අවතැන්වූවන් සඳහා නවාතැන් පහසුකම් වවුනියාව දිස්ත්‍රික්කයේ ලබා දීමට කටයුතු සංවිධානය කරන ලදී. මෙම ජනතාවගේ දේපළ හා ආභරණ

සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් හෝ ඒ පිළිබඳ විස්තරයක් ඔවුන් සතුව නොමැති බව වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පවසා ඇත.

(ii) විස්තර නොමැත.

(iii) විස්තර නොමැත.

(iv) විස්තර නොමැත.

(v) මෙම අමාත්‍යාංශයට අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 6-1051/'16-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

සහල් ආනයනය - 2014 : විස්තර
அரிசி இறக்குமதி - 2014 : விபரம்
IMPORTATION OF RICE - 2014 : DETAILS

1134/'16

7. ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා වෙනුවට)
(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ சார்பாக)
(The Hon. Nihal Galappaththi on behalf of the Hon. (Dr.) Nalinda Jayathissa)
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2014 වසරේ අග භාගයේදී රට තුළ සහල් හිඟයක් ඇති වන බවට ලංකා සතොස වෙත වාර්තාවක් ඉදිරිපත් කර තිබුනේද;

(ii) එසේ නම්, ඒ අනුව ආනයනය කරන ලද සහල් ප්‍රමාණය කොපමණද;

(iii) සහල් ආනයනය කරන ලද කාල වකවානු කවරේද;

(iv) ඒ සඳහා කැබිනට් අනුමතිය ලබා ගෙන තිබේද;

(v) ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කර තිබේද;

(vi) එසේ නම්, මිල ගණන් ඉදිරිපත් කළ සමාගම් කවරේද;

(vii) මෙම සහල් තොගයේ වටිනාකම කොපමණද;

(viii) එම සහල් තොගය ගබඩාකර තබන ලද රජයේ හා පෞද්ගලික අංශයේ ගබඩා කවරේද;

(ix) සහල් ගබඩා කිරීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(x) පෞද්ගලික අංශයේ ගබඩා පහසුකම් ලබාගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2014ஆம் ஆண்டின் இறுதிப் பகுதியில் நாட்டினுள் அரிசி பற்றாக்குறை ஏற்பட்டதாக லங்கா சதொசவிற்கு அறிக்கையொன்று சமர்ப் பிக்கப்பட்டிருந்ததா என்பதையும்;

(ii) ஆமெனில், அதன் பிரகாரம் இறக்குமதி செய்யப்பட்ட அரிசியின் அளவு எவ்வள வென்பதையும்;

(iii) அரிசி இறக்குமதி செய்யப்பட்ட காலகட்டங்கள் யாவையென்பதையும்;

(iv) அதன் பொருட்டு அமைச்சரவையின் அங்கீகாரம் பெறப்பட்டுள்ளதா என்பதையும்;

(v) அதன்பொருட்டு பெறுகைகள் நடைமுறை பின்பற்றப்பட்டுள்ளதா என்பதையும்;

(vi) ஆமெனில், விலைகளைச் சமர்ப்பித்துள்ள கம்பனிகள் யாவையென்பதையும்,

(vii) மேற்படி அரிசித் தொகையின் பெறுமதி யாதென்பதையும்,

(viii) மேற்படி அரிசித் தொகை களஞ்சியப்படுத்தி வைக்கப்பட்ட அரசாங்க மற்றும் தனியார் துறையின் களஞ்சியங்கள் யாவையென் பதையும்;

(ix) அரிசியைக் களஞ்சியப்படுத்துவதற்காகச் செல விடப்பட்டுள்ள பணத்தொகை எவ்வள வென்பதையும்;

(x) தனியார் துறையின் களஞ்சிய வசதிகளை பெற்றுக்கொள்ளும்போது பெறுகைகள் நடைமுறை பின்பற்றப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல் என்?

asked the Minister of Industry and Commerce :

(a) Will he inform this House -

(i) whether a report had been submitted to Lanka Sathosa to the effect that a scarcity of rice would occur in the country during the latter part of the year 2014;

(ii) if so, the quantity of rice imported accordingly; the periods in which rice was imported;

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

(iii) whether Cabinet approval has been obtained for it;

(iv) whether procurement process was followed in this regard;

(v) if so, the names of the companies which submitted bids;

(vi) the value of the aforesaid amount of rice;

(vii) the Government and private warehouses in which the aforesaid stock of rice was stored;

(xi) the amount of money spent for storing rice; and

(x) whether procurement procedure was followed in obtaining warehouse facilities from the private sector?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව හා අනෙකුත් ආයතන විසින් හාල් හිඟතාවක් ඇතිවන බවට වාර්තා කර ඇත.

2014.06.05 දින දිස්ත්‍රික් ලේකම් - කෑගල්ල විසින් සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති ලිපිය. (ඇමුණුම 1)*

2014.06.23 දින ආරක්ෂිත තොගයක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාව දැක්වෙන සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් සතොස සභාපති වෙත යොමු කරන ලද ලිපිය. (ඇමුණුම 2)*

2014.08.11 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දීමේ ලිපිය. (ඇමුණුම 3)*

2014.10.23 දින මුදල් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යවන ලද ලිපිය. (ඇමුණුම 4)*

2014.11.12 දින බංගලාදේශ රජයෙන් සහල් මෙට්‍රික් ටොන් 25,000ක් ගෙන්වීමට අමාත්‍ය මණ්ඩල තීරණය. (ඇමුණුම 5)*

භාණ්ඩාගාරය විසින් ලංකා සතොස වෙත සහල් ආනයනය සඳහා ලංකා බැංකුව සහ මහජන බැංකුව වෙත මූල්‍ය පහසුකම් ලබා දීමේ ලිපි. (ඇමුණුම 6)*

(ii) මෙට්‍රික් ටොන් 257,557

(iii) 2014 අප්‍රේල් සිට 2015 අප්‍රේල් දක්වා

(iv) මෙට්‍රික් ටොන් 75,000ක් ආනයනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. තවත් මෙට්‍රික් ටොන් 152,255ක් මුදල් අමාත්‍යාංශයේ අනුමැතියෙන් ආනයනය කර ඇත. මෙට්‍රික් ටොන් 30,302ක් ලංකා සතොසේ මුදල් මඟින් ආනයනය කර ඇත.

ලංකා සතොස අරමුදල් යටතේ සහල් ආනයනය	-	මෙට්‍රික් ටොන්	30,302
කැබිනට් අනුමැතිය යටතේ සහල් ආනයනය	-	මෙට්‍රික් ටොන්	75,000
මුදල් අමාත්‍යාංශ අනුමැතිය යටතේ සහල් ආනයනය	-	මෙට්‍රික් ටොන්	152,255
		මෙට්‍රික් ටොන්	**257,557**

(v) නැත.

(vi) මුදල් අමාත්‍යාංශය හා සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යාංශයේ අනුදැනුම මත ලංකා සතොස සභාපතිවරයා වෙත ණයවර ලිපි විවෘත කිරීම සඳහා ලබා දෙනු ලැබූ පහත දැක්වෙන පූර්ව ඉන්වොයිස් (Pro forma Invoice) මඟින් ණයවර ලිපි විවෘත කරන ලදී.

- United Foods Limited -India
- Contract sign by Govt. of Sri Lanka and Govt. of Bangladesh
- ACP Industries Limited -India
- Trident Champer Limited - India
- Omvishkar Exports - India

පසුගෙවීම් ක්‍රමය යටතේ (DP Terms) ලංකා සතොස මඟින් පහත සඳහන් සැපයුම්කරුවන්ගෙන් සහල් ආනයනය කර ඇත.

- Omvishkar Exports - India
- Shamali Spice Limited - India
- Mohan Sundaram Exports - India
- Luxmi Exports - India
- Star Export - India
- Rika Group of Company - India
- Uma Exports - India

(vii)

	ප්‍රමාණය (මෙ.ටො.)	වටිනාකම (රු.) (මි.ර.ගැ.)
• පසුගෙවීම් ක්‍රමය යටතේ සෘජුවම විදේශීය වෙළෙඳ පොළෙන් සහල් මිලදී ගැනීම.	29,262	1,851,055,933
• ලංකා සතොස විසින් ණයවර ලිපියක් මඟින් සෘජුවමවිදේශීය වෙළෙඳ පොළෙන් සහල් මිලදී ගැනීම.	1,040	62,634,808
• අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත විදේශීය වෙළෙඳ පොළෙන් සහල් මිලදී ගැනීම.	75,000	4,347,942,373
• මහා භාණ්ඩාගාරයේ එකඟතාව මත විදේශීය වෙළෙඳ පොළෙන් සහල් මිලදී ගැනීම.	152,255	9,734,901,658
	257,557	15,996,534,772

(viii)

රජයේ ගබඩා	පෞද්ගලික ගබඩා
මැකලම් සතොස ගබඩා සංකීර්ණය	ඒකල ගබඩාව
මාලිගාවත්ත සතොස ගබඩා සංකීර්ණය	පෙතියාගොඩ ගබඩාව
වේයන්ගොඩ ගබඩාව	සපුගස්කන්ද ගබඩාව
මීතොටමුල්ල ගබඩාව	පට්ටිවිල ගබඩාව
මරදගහමුල ගබඩාව	බොල්ලෑගල ගබඩාව
බූස්ස ගබඩාව	මාබිම ගබඩාව
කුරුණෑගල ගබඩාව	ACE කන්ටේනර් අංගනය
වැලිසර ගබඩාව	ඒෂියන් කන්ටේනර් අංගනය
රත්මලාන ගබඩාව	

(ix) රු. 223,176,500/-

(x) නැත.

(ආ) අදාළ නොවේ.

මඩකලපුව දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදිකිරීම : වැය කළ මුදල

மட்டக்களப்பு மாவட்ட வீதிகள் நிர்மாணம் : செலவிட்ட பணம்

CONSTRUCTION OF ROADS IN BATTICALOA DISTRICT: MONEY SPENT

1235/'16

8. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට පැවැති මුළු මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායින් තාර දමා තිබූ මාර්ග සංඛ්‍යාව සහ කිලෝ මීටර් ප්‍රමාණය කොපමණද;

(iii) වර්ෂ 1983 සිට යුද්ධය නිම වනතුරු එම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදිකිරීම සඳහා පැවති රජයන් විසින් වියදම් කරන ලද මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්ධය නිම වීමෙන් පසු මෙම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදි කිරීම වෙනුවෙන් එක් එක් වර්ෂය තුළ වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தினுள் 1983ஆம் ஆண்டளவில் இருந்த மொத்த வீதிகளின் எண்ணிக்கை யாது;

(ii) அவற்றில் தார் இடப்பட்டிருந்த வீதிகளின் எண்ணிக்கை மற்றும் கிலோ மீட்டர் அளவு எவ்வளவு;

(iii) 1983 ஆம் ஆண்டு தொடக்கம் யுத்தம் முடிவடையும் வரை இம்மாவட்டத்தில் வீதிகளை நிர்மாணிப்பதற்காக அப்போதிருந்த அரசாங்கங்களினால் செலவு செய்யப்பட்ட நிதித் தொகை ஒவ்வோர் ஆண்டின் அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு;

(iv) யுத்தம் முடிவடைந்த பின்னர் இம்மாவட்டத்தில் வீதிகளை நிர்மாணிப்பதற்காக ஒவ்வோர் ஆண்டிலும் ஒதுக்கப்பட்ட நிதித் தொகை வெவ்வேறாக எவ்வளவு;

(v) இது தொடர்பான முழுமையான அறிக்கையை இச்சபையில் சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways :

(a) Will he inform this House -

(i) the total number of roads in the Batticaloa District as at 1983;

(ii) the number of tarred roads and the extent of those roads in kilometres;

(iii) the amount of money spent by the previous governments to construct the roads in that District during the period from 1983 to the end of war in respect of each year separately;

(iv) the amount of money spent in each year to construct roads in this District in the aftermath of the war; and

(v) whether a comprehensive report is submitted in this regard?

(b) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මහාමාර්ග දෙපාර්තමේන්තුව පැවති කාලයට අදාළ වර්ෂයක් වන 1983 දත්තයන් නොමැත.

1986න් පසු (එනම්, මාර්ග සංවර්ධන අධිකාරිය ස්ථාපනය කිරීමෙන් පසු)

A ශ්‍රේණියේ මාර්ග	-	කි.මී. 165.09
B ශ්‍රේණියේ මාර්ග	-	කි.මී. 55.40
AB ශ්‍රේණියේ මාර්ග	-	කි.මී. 05.12
C ශ්‍රේණියේ මාර්ග	-	කි.මී. 05.24 (පවරා ගන්නා ලද)

(ii) 1983 දත්තයන් නොමැත.

1986 දත්තයන්ට අනුව කි.මී. 221.60ක් තාර දමා ඇත.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

(iii) 1983 සිට 2005 දක්වා කාලයට අදාළ දත්තයන් නොමැත.

වියදම	
2006	රු. මිලියන 44
2007	රු. මිලියන 74
2008	`රු. මිලියන 87

(iv) වියදම

2009	රු. මිලියන 34
2010	රු. මිලියන 53
2011	රු. මිලියන 106
2012	රු. මිලියන 74
2013	රු. මිලියන 138
2014	රු. මිලියන 103
2015	රු. මිලියන 68
2016	රු. මිලියන 102

(2009 සිට 2016 දක්වා මාර්ග සංවර්ධන අධිකාරියේ විවිධ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් හරහා මඩකලපුව දිස්ත්‍රික්කය තුළ රුපියල් මිලියන 17,807.62ක වියදමක් අන්තර් දිස්ත්‍රික් මාර්ග ඉදිකිරීම වෙනුවෙන් දරා ඇත. ඇමුණුම* ඉදිරිපත් කරමි.

(v) ඔව්. (අදාළ තොරතුරු සහිත සම්පූර්ණ වාර්තාවක් ඇමුණුමෙහි දැක්වේ.)

(ආ) අදාළ නොවේ.

සේවක අර්ථසාධක අරමුදලට දායක පෞද්ගලික ආයතන: මාතර දිස්ත්‍රික්කය

ஊழியர் சேமலாப நிதியத்துக்குப் பங்களிக்கும் தனியார் நிறுவனங்கள் :மாத்தறை மாவட்டம்

PRIVATE INSTITUTIONS SUBSCRIBE TO EMPLOYEES' PROVIDENT FUND: MATARA DISTRICT

1306/'16

9. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු ඩලස් අලහප්පෙරුම මහතා වෙනුවට)

(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு டலஸ் அழஹப்பெரும சார்பாக)

(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. Dullas Alahaperuma)

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලට දායකවීම සඳහා ලියා පදිංචි වී ඇති මාතර දිස්ත්‍රික්කයේ පෞද්ගලික ආයතන සංඛ්‍යාව කවරේද;

(ii) ඉහත (i) හි සඳහන් ආයතන කවරේද;

(iii) සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබා ඇති මාතර දිස්ත්‍රික්කයේ සේවක සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) සේවක අර්ථසාධක අරමුදල සඳහා ලියාපදිංචි වීමට පැවතිය යුතු අවම තත්ත්වයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

தொழில், தொழில் சங்க உறவுகள் மற்றும் சப்ரகமுவ அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஊழியர் சேமலாப நிதியத்துக்கு பங்களிப்புத் தொகை செலுத்துவதற்காக மாத்தறை மாவட்டத்திலுள்ள பதிவு செய்யப்பட்டுள்ள தனியார் நிறுவனங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) மேலே (i) இல் குறிப்பிடப்பட்டுள்ள நிறுவனங்கள் யாவை என்பதையும்;

(iii) ஊழியர் சேமலாப நிதியத்தில் அங்கத்துவம் பெற்றுள்ள மாத்தறை மாவட்டத்தின் ஊழியர்களின் எண்ணிக்கை ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவுக்கமைய வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) ஊழியர் சேமலாப நிதியத்தில் பதிவுசெய்து கொள்வதற்காக காணப்படவேண்டிய குறைந்த பட்ச நிலைமைகள் யாவை என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour, Trade Union Relations and Sabaragamu Development :

(a) Will he inform this House -

(i) the number of private institutions in the Matara District that have been registered to subscribe for the Employees' Provident Fund;

(ii) the names of the institutions in above (i);

(iii) the number of employees in the Matara District who have obtained the membership of the Employees' Provident Fund in respect of each Divisional Secretary's Division separately; and

(iv) the minimum requirement needed to be registered in the Employees' Provident Fund?

(b) If not, why?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමා)

(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - தொழில், தொழிற்சங்க உறவுகள் மற்றும் சப்ரகமுவ அபிவிருத்தி அமைச்சர்)

(The Hon. W.D.J. Senewiratne - Minister of Labour, Trade Unions Relations and Sabaragamu Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලේ ලියා පදිංචි වී ඇති සේවා යෝජක සංඛ්‍යාව 8,536කි.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

(ii) සේවක අර්ථසාධක අරමුදලේ ලියා පදිංචි වී ඇති සේවා යෝජකයන් සංඛ්‍යාව වන 8,536කගේ ආයතනවල තොරතුරු ඇමුණුම 01න්* ඉදිරිපත් කරමි.

(iii) සේවක අර්ථසාධක අරමුදලේ සාමාජික ගිණුම් තොරතුරු කලාප අක්ෂර වශයෙන් වර්ගීකරණය කර ඇති බැවින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වර්ගීකරණය කර ලබා දීමට හැකියාවක් නොමැත.

මාතර දිස්ත්‍රික්කය එනම්, කලාප අක්ෂර H යටතේ සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබා ඇති සාමාජික සංඛ්‍යාව 457,915කි.

(iv) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 8වන වගන්තිය තුළ සේවක අර්ථසාධක අරමුදල සඳහා ලියා පදිංචි වීමට පැවතිය යුතු අවම තත්ත්වයන් දක්වා ඇත.

(ආ) පැන නොනඟී.

ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය: මහා භාණ්ඩාගාරය ලබා දුන් මුදල්

தேசிய நீர்வாழ் உயிரின வளர்ப்பு அபிவிருத்தி அதிகாரசபை: திறைசேரி வழங்கிய பணம்

NATIONAL AQUACULTURE DEVELOPMENT AUTHORITY : MONEY GRANTED BY TREASURY

1380/'16

11.ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු බන්දුල ගුණවර්ධන මහතා වෙනුවට)

(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு பந்துல குணவர்தன சார்பாக)

(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. Bandula Gunawardane)

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2016 අය වැයෙහි අංක 150 යෝජනාවට අනුව, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට (NAQDA) වෙන් කළ රුපියල් මිලියන 100න්, මහා භාණ්ඩාගාරය විසින් එම වර්ෂය තුළදී ලබා දුන් මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් එම මූල්‍ය ප්‍රතිපාදන වැය කිරීම සඳහා නිශ්චිත ව්‍යාපෘති සකසා තිබුණේද;

(iii) 2016 වර්ෂයට වෙන් කළ ඉහත රුපියල් මිලියන 100 වැය කළ ආකාරය පිළිබඳ වැඩසටහන් විස්තරයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016ஆம் ஆண்டுக்கான வரவு செலவு திட்டத்தின் 150ஆம் இலக்க முன்மொழிவின்படி தேசிய நீர்வாழ் உயிரின வளர்ப்பு அபிவிருத்தி அதிகாரசபைக்கு (NAQDA) ஒதுக்கப்பட்ட ரூபா 100 மில்லியனில், பொதுத் திறைசேரியினால் வருடத்தினுள் வழங்கப்பட்ட பணத்தொகை எவ்வளவென்பதையும்;

(ii) தேசிய நீர்வாழ் உயிரின வளர்ப்பு அபிவிருத்தி அதிகாரசபையினால் மேற்படி நிதி ஏற்பாட்டினை செலவு செய்வதற்காக திட்டவட்டமான கருத்திட்டங்கள் தயாரிக்கப் பட்டிருந்ததா என்பதையும்;

(iii) 2016ஆம் ஆண்டுக்காக ஒதுக்கப்பட்ட மேற்படி ரூபா100 மில்லியன் செலவு செய்யப்பட்ட முறை பற்றிய நிகழ்ச்சித்திட்ட விபரமொன்றைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House -

(i) the Rs. 100 million allocated to the National Aquaculture Development Authority (NAQDA) as per proposal No.150 of the 2016 Budget, the amount granted by the Treasury during the year;

(ii) whether the National Aquaculture Development Authority had drawn up specific projects to spend the said financial provision;

(iii) whether he will submit a programme description indicating as to how the aforesaid Rs. 100 million allocated for the year 2016 was spent ?

(b) If not, why?

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)

(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)

(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2016 අය වැයෙහි අංක 150 යෝජනාවට අනුව මත්ස්‍ය අභිජනන ධාරිතාව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත වෙන් කළ රුපියල් මිලියන 100න් ඒ සඳහා වියදම් වූ රුපියල් 93,716,966/-ක මුදල මහා භාණ්ඩාගාරය විසින් ලබා දී ඇත.

(ii) ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය එම මූල්‍ය ප්‍රතිපාදන වැය කිරීම සඳහා නිශ්චිත ව්‍යාපෘති වාර්තා සකස් කර තිබුණු අතර, ඒ අනුව නැවත අධිකාරිය වෙත පවරා ගන්නා ලද පෞද්ගලික අංශය මඟින් පාලනය වූ මුරුතවෙල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයෙහි මූලික පුනරුත්ථාපන කටයුතු සඳහා එම මුදල් යොදවා ගෙන ඇත.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සතුව තිබූ මිරිදිය අංශය මඟින් පාලන කරන ලද මුරුතවෙල මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය වර්ෂ 1990දී මිරිදිය මත්ස්‍ය අභිජනන කටයුතු වෙනුවෙන් රාජ්‍ය අනුග්‍රහය ලබාදීම නතර කිරීම නිසා අනතුරුව පෞද්ගලික අංශය වෙත දීර්ඝ කාලීනව බදු දෙන ලදි.

මුරුතවෙල මිරිදිය අභිජනන මධ්‍යස්ථානය පිහිටි සම්පූර්ණ ඉඩම හෙක්ටෙයාර 10.229 වේ. එහි පිහිටි සම්පූර්ණ මඩ පොකුණු 33,000m2 පමණ වේ. එම පොකුණු පද්ධතිය

[ගරු මහින්ද අමරවීර මහතා]

පෞද්ගලික අංශය විසින් විසිතුරු මත්ස්‍ය අභිජනන කටයුතු සඳහා භාවිත කරන ලදි.

දකුණු පළාතේ පිහිටි ජලාශ සඳහා අවශ්‍ය මිරිදිය මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය කිරීමට එම මධ්‍යස්ථානයේ කොටසක් එනම් හෙක්ටෙයාර 7.65ක් 2015.10.17 දින සිට නැවත ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත පවරා ගන්නා ලදි. එම කොටසට අයත් පොකුණු නව සැලැස්මකට ඉදි කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට මෙම මුදල් වැය කර ඇත.

මෙම කටයුතු සම්පූර්ණ කිරීමෙන් පසු වාර්ෂික මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 08ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර ඇත.

(iii)

ක්‍රියාකාරකම	සිදු කරනු ලැබූ වියදම (රු.මි.)
මුළු ව්‍යාපෘතිය සඳහා ව්‍යුහාත්මක සැලසුම්, ඇස්තමේන්තු පිළියෙල කිරීම, පළමු අදියර සඳහා ඉදිකිරීම් අධීක්ෂණය සහ කළමනාකරණය සිදු කිරීම. (Detail Design and Preparation of BOQs of Total Project and Construction Supervision for Stage 1 of the Project)	13.8
පොකුණු/ මත්ස්‍ය අභිජනනාගාර ජල සැපයුම් පද්ධතිය සහ අනෙකුත් ගොඩනැඟිලි ඉදි කිරීම.	67.0
යාන්ත්‍රික උපකරණ, කාර්යාලීය/ විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම.	12.9
එකතුව	93.7

(ආ) පැන නොනඟී.

බිත්තර වී මිලදී ගැනීම: ක්‍රමවත් වැඩ පිළිවෙළ
விதை நெல் கொள்வனவு : முறையான வேலைத்திட்டம்
PURCHASE OF SEED PADDY: METHODICAL PROGRAMME

1052/'16

12. ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා (ගරු බුද්ධික පතිරණ මහතා)
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி - மாண்புமிகு புத்திக பதிரண சார்பாக)
(The Hon. J.M. Ananda Kumarasiri on behalf of the Hon. Buddhika Pathirana)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) බිත්තර වී නිෂ්පාදනය කිරීම සඳහා ලියා පදිංචි වී සිටින ගොවීන්ගේ නිෂ්පාදන අළෙවි කිරීමේදී ගැටලු මතුවී ඇති බවත්;

(ii) එම නිෂ්පාදන සඳහා නිසි මිලක් නොලැබෙන බවත්;

(iii) එහෙයින්, ඔවුන් අධෛර්යවත්ව සිටින බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) බිත්තර වී ගොවීන්ගේ නිෂ්පාදන මිලට ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) விதை நெல் உற்பத்தி செய்வதற்காகப் பதிவு செய்துள்ள கமக்காரர்களின் உற்பத்திகளை சந்தைப்படுத்துவதில் சிக்கல்கள் எழுந்துள்ளன என்பதையும்;

(ii) மேற்படி உற்பத்திகளுக்கு உரிய விலை கிடைப்பதில்லை என்பதையும்;

(iii) எனவே அவர்கள் மனம் தளர்ந்துள்ளார்கள் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) விதை நெல் செய்கையாளர்களின் உற்பத்தியை கொள்வனவு செய்வதற்கான முறையான வேலைத்திட்டமொன்று தயார் செய்யப்படுமா என்பதையும்;

(ii) ஆமெனில், அது எவ்வாறு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he accepts that -

(i) issues have surfaced in selling the products of the registered seed paddy farmers ;

(ii) a proper price is not given for aforesaid products ;

(iii) they have become discouraged due to aforesaid reason?

(b) Will he inform this House -

(i) whether a methodical programme will be implemented in order to purchase the products of seed paddy farmers;

(ii) if so, of which manner?

(c) If not, why?

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture) **

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i), (ii) හා (iii) නැත.

එනමුත්, 2016/17 මහ සහ 2017 යල කන්න සඳහා ලැබුණු වර්ෂාපතනය අඩුවීම හේතුවෙන් රටෙහි වී වගා වපසරිය අඩු විය. මෙම

හේතුව මත නිපදවන ලද බීජ වී සඳහා ඉල්ලුම සහ මිලෙහි අඩුවීමක් ඇති විය. මෙම තත්ත්වය මත බීජ නිෂ්පාදනයෙහි යෙදී සිටින ගොවීන් තාවකාලික පසුබෑමකට ලක්වුව ද අධෛර්යවත් වී නොමැත.

(ආ) (i) විධිමත් බීජ වී නිෂ්පාදනයෙහි යෙදී සිටින කොන්ත්‍රාත් ගොවීන්ගේ නිෂ්පාදනය ක්‍රමවත් වැඩ පිළිවෙළක් යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මිලදී ගනු ලැබේ.

පුද්ගලික බීජ වී නිෂ්පාදනයෙහි යෙදී සිටින තනි ගොවීන්, ගොවි සමිති හා පෞද්ගලික අංශයේ සමාගම් ආදී කණ්ඩායම් විසින් නිපදවනු ලබන බීජ වී ඔවුන් විසින්ම අළෙවි කර ගනු ලැබේ. ඒ අනුව රටෙහි සියලු බිත්තර වී ගොවීන්ගේ නිෂ්පාදන රජය විසින් මිලදී ගැනීමේ අවශ්‍යතාවක් නොමැත.

(ii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් මියගිය පොලිස් නිලධාරින්: වව්නියාව දිස්ත්‍රික්කය

பயங்கரவாதிகளின் தாக்குதலினால் மரணமடைந்த பொலிஸ் உத்தியோகத்தர்கள் :வவுனியா மாவட்டம்

POLICE OFFICERS KILLED BY TERRORIST ATTACKS: VAVUNIYA DISTRICT

1259/'16

13. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Dinesh Gunawardena on behalf of the Hon.R.M. Padma Udhayashantha Gunasekera)

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 1983 වර්ෂය වනවිට වව්නියාව දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබූ පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොලිස් ස්ථානයන්හි සේවය කරන ලද පොලිස් නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(iii) එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983 න් පසුව 2009 වර්ෂයේ යුද්ධය අවසන් වන තෙක් වූ කාලය තුළදී විනාශ කරන ලද පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් මියගිය පොලිස් නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත (iii) හි සඳහන් විනාශ වූ දේපළ පිළිබඳ තක්සේරුවක් කර තිබේද;

(vi) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1983ஆம் ஆண்டளவில் வவுனியா மாவட்டத்தில் அமைந்திருந்த பொலிஸ் நிலையங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி பொலிஸ் நிலையங்களில் பணிபுரிந்த பொலிஸ் உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாது;

(iii) எல்.ரீ.ரீ.ஈ. பயங்கரவாதிகளினால் 1983ஆம் ஆண்டின் பின்னர் 2009ஆம் ஆண்டில் யுத்தம் முடிவடையும் வரையிலான காலப்பகுதியில் அழிவுக்குள்ளாக்கப்பட்ட பொலிஸ் நிலையங்களின் எண்ணிக்கை யாது;

(iv) பயங்கரவாதிகளின் தாக்குதலினால் மரண மடைந்த பொலிஸ் உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாது;

(v) மேலே (iii) இல் குறிப்பிடப்பட்ட அழிவுற்ற சொத்துக்கள் தொடர்பாக மதிப்பீடு செய்யப்பட்டுள்ளதா;

(vi) மேலுள்ள அனைத்து விடயங்கள் தொடர்பான முழுமையான அறிக்கையை சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Law and Order and Southern Development:

(a) Will he inform this House -

(i) how many Police Stations had been established within the Vavuniya District as at 1983;

(ii) how many Police officers had been serving at those Police Stations;

(iii) how many Police Stations were destroyed by the LTTE terrorists after the year 1983 until the end of the war in 2009;

(iv) how many Police officers were killed due to terrorist attacks;

(v) whether an assessment has been done with regard to the destruction of properties referred to in (iii) above; and

(vi) whether he will table a full report on all above?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතිය සහ සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පොලිස් ස්ථාන -01

(ii) අදාළ ලේඛන සොයා ගැනීමට නොහැකි බැවින් සේවය කළ නිලධාරින් කොපමණ ද යන්න තොරතුරු සොයා ගත නොහැක.

(iii) විනාශ කරන ලද පොලිස් ස්ථාන සම්බන්ධයෙන් තොරතුරු වාර්තා වී නොමැත.

(iv) පොලිස් නිලධාරින් 197 දෙනෙකු මිය ගොස් ඇත.

(v) අලාභ හෝ විනාශ කිරීම් සම්බන්ධව තක්සේරු වාර්තා

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

පිළිබඳ ලේඛන නොමැතිවීම හේතුවෙන් තොරතුරු සොයා ගැනීමට නොහැක.

(vi) නැත.

(ආ) අදාළ වකවානුවට අයත් ලේඛන නොමැතිවීම හේතුවෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට නොහැක.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 14-1381/'16(1), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟට, ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ යළි පදිංචි කළ ජනතාවට ඉඩම් ඔප්පු ලබාදීම
திருகோணமலை மாவட்டத்தில் மீள்குடியேறிய மக்களுக்குக் காணி உரிமம் வழங்கல்
PROVISION OF TITLE DEEDS TO RESETTLED PEOPLE IN TRINCOMALEE DISTRICT

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மாண்புமிகு காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சர் கயந்த கருணாதிலக அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்ததற்கு நன்றி.

திருகோணமலை, பட்டினமும் சூழலும் பிரதேச செயலாளர் பிரிவின்கீழ் புளியங்குளம் கிராம சேவையாளர் பிரிவுக்குட் பட்டதாக செல்வநாயகபுரம், தேவாநகர், ஆனந்தபுரி, நித்தியபுரி ஆகிய நான்கு கிராமங்கள் அமைந்துள்ளன. மேற்படி கிராமங்களில் சுமார் 2,200 குடும்பங்கள் வசித்து வருகின்றன. இப்பகுதியானது சுமார் 800 ஏக்கர் நிலப் பகுதியைக் கொண்டதாகவுள்ளது. சாம்பல்தீவு, சல்லி, நிலாவெளி, குச்சவெளி, கும்புறுப்பிட்டி, திரியாய், மூதூர் போன்ற பகுதிகளிலிருந்து யுத்த அனர்த்தம் காரணமாக இடம்பெயர்ந்திருந்த மக்கள் 1994ஆம் ஆண்டு மேற்படி கிராமங்களில் மீள்குடியேற்றம் செய்யப்பட்டனர்.

அம்மக்களில் பெரும்பாலானவர்கள் அன்றாட கூலித் தொழிலையே தங்களது ஜீவனோபாயமாகக் கொண்ட நிலையில், தாங்கள் குடியிருக்கின்ற மேற்படி காணிகளுக்கான உரிமம் கோரி, தொடர்ந்தும் உரிய தரப்பினர் பலரிடம் கோரிக்கை விடுத்தும் போராட்டங்களை நடத்தியும் இதுவரையில் அதனைப் பெற முடியாத நிலையிலேயே வாழ்ந்து வருவதாகவும் தங்களின் தொடர் போராட்டங்கள் காரணமாக 2009ஆம் ஆண்டு முகட்டு வரி, மின்சாரக் கட்டணப் பட்டியல், நீர்க் கட்டணப் பட்டியல் என்பன தங்களது சொந்தப் பெயர்களில் வழங்கப்பட்டு வருவதாகவும் காணி உரிமம் இன்மையால் தாங்கள் பல்வேறு பிரச்சினைகளுக்கு முகங்கொடுத்து வருவதாகவும் தெரிவிக்கின்றனர்.

மேலும், திருகோணமலை மாவட்டத்தில் திருகோணமலை பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட லிங்கநகர் கிராம சேவையாளர் பிரிவில் 70 குடும்பங்களும் மூதூர் பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட நல்லூர் கிராம சேவையாளர் பிரிவில் 327 குடும்பங்களும் குச்சவெளி பிரதேச செயலாளர் பிரிவில் 2,000 குடும்பங்களும் காணி உரிமம் இன்மை காரணமாகப் பாதிக்கப்பட்டுள்ளனர்.

மேற்படி மக்களின் பிரச்சினை தொடர்பில் கவனம் செலுத்தி, பாதிக்கப்பட்டுள்ள இம்மக்களுக்கான காணி உரிமங்களை வழங்கக்கூடிய வகையில் நடவடிக்கை எடுத்துதவ முடியுமா?

இம்மக்களுக்கு காணி உரிமங்களை வழங்குவதில் ஏதேனும் தடைகள் இருப்பின் அவற்றை நிவர்த்தி செய்து, அவர்கள் தொடர்ந்து 23 ஆண்டுகளாக வாழ்ந்துவருகின்ற மேற்படி காணிகளின் உரிமங்களை இம்மக்கள் பெறுவதற் கான வழிமுறைகள் குறித்து விளக்க முடியுமா?

கௌரவ அமைச்சர் அவர்கள் இதற்கான பதிலை வழங்குவார் என்று எதிர்பார்க்கின்றேன்.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් පිළිබඳ කාරක සභාවේ-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නයට පිළිතුරු දුන්නාට පසුව ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හොඳමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, පිළිතුර දෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 23(2) යටතේ අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

පුලියම්කුලම් ග්‍රාම නිලධාරි වසමේ සෙල්වනායගපුරම්, දේවනගර්, ආනන්දපුරි, නිත්‍යපුරි යන ගම්මානවල පදිංචි පුද්ගලයන් සඳහා ඉඩම් ලබා දීමේ කටයුතු සිදු කරමින් පවතිනවා.

සෙල්වනායගපුරම් - 2017 පෙබරවාරි 26 ඉඩම් කච්චේරි තබා ඇති අතර, ඒ සඳහා පුද්ගලයින් 46දෙනෙකු සහභාගි වී තිබෙනවා. ඉඩම් කච්චේරි අනුමැතිය ලබා ගැනීමට පළාත් ඉඩම් කොමසාරිස් වෙත දැනට ඉදිරිපත් කර තිබෙනවා.

ආනන්දපුරි - මෙම ගම්මානයෙහි ඉඩම් අක්කර 55ක් අත්පත් කර ගැනීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 4වන වගන්තිය යටතේ නියෝගය ප්‍රාදේශීය ලේකම් වෙත යවා තිබෙනවා. පවතින ඉඩම් පෞද්ගලික ඉඩම් වන බැවින් එම ඉඩම් අත්පත් කර ගත යුතුව තිබෙනවා. ඒ අනුව රජයට අත්පත් කර ගැනීමට ඉදිරි කටයුතු දැන් කරමින් පවතිනවා.

නිත්‍යපුරි - මෙම ගම්මානයෙහි ඉඩම් අක්කර 35ක් අත්පත් කර ගැනීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ 2 වන වගන්තිය යටතේ නියෝගය ප්‍රාදේශීය ලේකම් වෙත දැනට යවා තිබෙනවා.

දේවනගර් - ඉදිරියේදී ඉඩම් කච්චේරි තබා ඔප්පු ලබා දීමේ කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නවා.

ලිංගනගර් - ඉදිරියේදී ඉඩම් කච්චේරි තබා ඔප්පු ලබා දීමේ කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නවා.

නල්ලූර් - ඉදිරියේදී ඉඩම් කච්චේරි තබා ඔප්පු ලබා දීමේ කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නවා.

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ 2015 - 2016 වර්ෂවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි බෙදා දී ඇති බලපත්‍ර හා දීර්ඝ කාලීන බදු සංඛ්‍යාව පහත දැක්වේ.

නගර හා කඩවත් - බලපත්‍ර 11යි.

දීර්ඝ කාලීන බදු 23යි.

මුත්තූර් - බලපත්‍ර 2,926යි.

කුච්චවේලි - බලපත්‍ර 1,517

2017 වර්ෂයේ පළාත් ඉඩම් කොමසාරිස් අනුමැතිය මත 2008/04 චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර ඉඩම් අයදුම්කරුවන් ලියාපදිංචි කරලා ඉඩම් කච්චේරි පවත්වා බලපත්‍ර ලබා දීමට කටයුතු කරනවා. විශේෂයෙන්ම මම හෙට නව ඉඩම් ඇමති හැටියට වැඩ භාර ගන්නවා. ජනාධිපතිතුමාගේත්, අගමැතිතුමාගේත් උපදෙස් පරිදි අපේ මැතිවරණ පොරොන්දුවක් වුණු ලක්ෂ සංඛ්‍යාත පිරිසකට ඉඩම් ඔප්පු ලබා දීමේ ජාතික වැඩ පිළිවෙළ කඩිනමින් ක්‍රියාත්මක කරන බවත් මම මතක් කරන්න කැමැතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු ගයන්ත ඇමතිතුමා කියපු දේට අමතරව මම යමක් කියන්න කැමැතියි. මම ස්වාමීනාදන් මැතිතුමාගෙනුත් තොරතුරු ලබා ගත්තා. යහ පාලන රජය බලයට පත් වුණාට පස්සේ ඉඩම් අක්කර 5,000ක් අපි මුදා හැරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ උතුරු ප්‍රදේශයේ පමණක්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඉඩම් අක්කර 5,000ක්. ඇත්ත වශයෙන්ම හැම දාම පාර්ලිමේන්තුවේදී මේ ගැන ප්‍රශ්න අහනවා. අපි ඒකට විරුද්ධ නැහැ. නමුත් රටේ මතයක් ඇති වෙනවා, අපි ඉඩම් මුදා හරින්නේ නැහැ කියලා. අපි ඉඩම් අක්කර 5,000ක් මුදා හැරලා තිබෙනවා. තවත් ඉඩම් අක්කර 3,000ක් ඉදිරි කාලයේදී මුදා හරිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමන්ලා ඒ ගැන full-page advertisement දාන්නේ නැහැ නේ. ඒ නිසා මිනිසුන් දන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Every week, this question is asked. The Government is not refusing to give lands. ඉඩම් අක්කර 5,000ක් මුදා හැරලා තිබෙනවා. ඉතුරු ඉඩම් අක්කර 3,000 ඉතා ඉක්මනින් මුදා හරිනවා. We have released 5,000 acres.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා කලින් දැනුවත් කිරීමක් කරලා නැහැ. හැබැයි කෙටියෙන් කරුණු ඉදිරිපත් කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා පිළිගන්න ඕනෑ, ඉඩම් අක්කර 5,000ක් මුදා හැරියා කියන එක. You must accept the fact that we have released 5,000 acres of land.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Yes, there is no doubt about that. But, this is a different one.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
But, you must acknowledge that.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Yes, definitely.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
It should go on record.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I have no hard feelings but you must acknowledge that fact.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Douglas Devananda, what the Hon. Minister says is, it is better to acknowledge that you have already got more than 5,000 acres of land. You are asking for more.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Anyway, this is a different Question which is not connected to that.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය 22වැනි දා මුදල් පිළිබඳ කාරක සභාව රැස් වූ අවස්ථාවේදී සුමන්තිරන් මන්ත්‍රීතුමා ප්‍රමුඛ අපේ කාරක සභාව විසින් ගත්ත තීරණය ඔබතුමා පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීතුමන්ලාට දැනුම් දීලා තිබෙනවා. ගරු අමාත්‍යවරුන් විසින් වාහන මිලදී ගැනීම සඳහා කියලා,- [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා මේ කාරණය ඉදිරිපත් කරන්නේ පක්ෂ නායකයින් වෙනුවෙනුත් නොවෙයි, ස්ථාවර නියෝග 23 (2) යටතේත් නොවෙයි. මොන පදනමෙන්ද මේක ඉදිරිපත් කරන්නේ කියලා පැහැදිලි කරන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක point of Order එකක් හැටියටයි ඉදිරිපත් කරන්නේ. ඔබතුමා ඉදිරිපත් කරලා තිබෙන වාර්තාව අනුව ඇමතිවරුන්ගෙන් අපි ඉල්ලා සිටියේ එතුමන්ලාට සහායක් ලෙසයි. මොකද, එක පරිපූරක ඇස්තමේන්තුවකින් වාහන සඳහා මුදල වෙන් කළාම, ඒ අවුරුද්ද තුළදී ඒ වාහන ගත්තේ නැහැ කියලා ඒ ඇමතිවරයාගේ නමින් ඊළඟ අවුරුද්දේදීත් තව පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනවා. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභානායකතුමාට මේ ගැන,- [බාධා කිරීමක්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒ නිසා,- [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිරිත් පරිදි හැම දාම වැරැදි අදහසක් පාර්ලිමේන්තුවට දෙන්නයි මෙතුමා හදන්නේ. මේ වාහන ගන්නේ අමාත්‍යාංශයේ පාවිච්චියට. මේ වාහන ගන්නේ අමාත්‍යාංශයේ පාවිච්චියට, ඇමතිතුමාගේ පෞද්ගලික පාවිච්චියට නොවෙයි. අමාත්‍යාංශයට වාහනයක් ගන්නවා. එතුමා වෙනත් අමාත්‍යාංශයකට යන කොට ඒ වාහනය දීලා යන්න ඕනෑ. මේ ගොල්ලන් පෙන්වන්න හදන්නේ ඇමතිවරයාගේ පෞද්ගලික,- [බාධා කිරීමක්] They are always misleading.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා වෙන ප්‍රශ්නයක් කියන්නේ. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක ඇමතිවරයාට ගන්න වාහනයක් නොවෙයි; අමාත්‍යාංශයට ගන්න වාහනයක්. [බාධා කිරීමක්] ඒක අමාත්‍යාංශයට ගන්න වාහනයක්. මොකක්ද මේ? මේ විධියට හැම දාම නොමඟ අරින්නේ මොකද ? [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟ කාරණයට යන්න අපට සිද්ධ වෙනවා. අද දින,- [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැණී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා අහන්න හදපු ප්‍රශ්නයට නොවෙයි ගරු ලක්ෂ්මන් කිරිඇල්ල- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඔහොම ඉන්න කෝ. සභානායකතුමා කලබල වෙලා නේ. ඇමතිවරයෙකුට ගෙන්වන වාහනයක් ගැන නොවෙයි අපි අහන්නේ. මේ පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, මුදල් කොමිටියෙන්. වාහන ගණනාවක් ගෙන්වීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක දැන් මුදල් කොමිටියෙන් අත් හිටුවා තිබෙනවා. බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ සාමාජිකයින්ට හා ප්‍රධානින්ටත් ඒ මඟින් වාහන ගෙන්වනවා කියලායි. ඉතින් ඒක හරි බරපතළ දෙයක්. සභානායකතුමා කියවා බලන්න ඕනෑ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ ප්‍රධානින්ට කොහොමද මිලියන ගණන්වලට වාහන ගෙන්වන්න පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන්නේ කියලා. ඉතින් මේ ගැන පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ජයම්පති වික්‍රමරත්න මන්ත්‍රීතුමාට පුළුවන් නම් පැහැදිලි කරන්න. ඔබතුමාට කාර් එකක් ගෙනෙන්න කියලා නැහැ නේද? කියලා තිබෙනවාද? පුළුවන් නම් නැඟිටලා කියන්න කෝ. එතුමා දන්නවා, එතුමාට තමයි වාහන-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය පැහැදිලියි. සභානායකතුමනි, මේ පිළිබඳව පාර්ලිමේන්තුවට පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍ය නම්, ඔබතුමාට එය කරන්න පුළුවන්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මගේ තර්කය, මේ ගොල්ලන් කියන්නේ එක් අදහසක්. නමුත් මේ ගොල්ලන්ගේ යටි අදහස විධියට අපට පෙනෙන්නේ, මේ මඟින් ඇමතිවරුන්ට වාහන ගෙන්වනවා කියන එක පෙන්වීමයි. අමාත්‍යාංශවලටයි මේ වාහන ගෙන්වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතුමා වෙන ප්‍රශ්නයක් මතු කළේ. මම හිතන්නේ අද දින-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැණී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැනදී ප්‍රශ්නය පැන නැඟුණේ ඒ ගැන නොවෙයි. ඇමතිවරුන්ට වාහන ගෙන්වීම පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් මතු කරලා තිබෙනවා වාගේම රටෙත් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඒ ගැන අපි කලබල වෙන්න ඕනෑ නැහැ. හැබැයි මෙතැන නිශ්චිත ප්‍රශ්නයක් පැන නඟිනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා මෙහෙයුම් කමිටුවක් පත් කරලා තිබෙනවා. එහි කාර්ය භාරය සඳහා යයි කියමින් එහි ඉන්න යම් නියෝජිත මහත්වරුන්ට වාහන ගෙන්වීම සඳහා ආයෙත් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනවා. මොකක්ද මේ?

එතකොට ඔහුට මන්ත්‍රීවරයෙක් හැටියට වාහනයක් ලැබෙනවා; ව්‍යවස්ථාදායක කමිටුවේ වැඩ කිරීම වෙනුවෙනුත් වාහනයක් ලැබෙනවා. ඒ පිළිබඳ ප්‍රශ්නයයි මේ අහන්නේ. එතකොට මේකේ සීමාව මොකක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ප්‍රශ්නය පැහැදිලියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කොතැනින්ද තමුනාන්නාන්සේලාගේ මේ සීමාව නතර වෙන්නේ? "මෙයාට, මෙයාට" කියලා හිතුණු හිතුණු අය වෙනුවෙන් තනතුරු හදනවා; තනතුරු හදලා වාහන දෙනවා. ඒක නතර කරන්න කියලා කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. අපි අදට නියමිත කටයුතුවලට යමු. මීළඟට අමාත්‍යාංශ නිවේදන, ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා.

2017 මැයි මස 25වන දින "ලංකාදීප" පුවත් පතේ පළ වූ වාර්තාව: ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ ප්‍රකාශය

2017 மே 25ஆந் திகதிய 'லங்காதீப' அறிக்கை: காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரின் கூற்று

"LANKADEEPA" REPORT OF 25TH MAY, 2017: STATEMENT BY MINISTER OF LANDS AND PARLIAMENTARY REFORMS

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අමාත්‍යාංශ නිවේදන යටතේ පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඔබතුමා මට අවස්ථාව ලබාදීම පිළිබඳව මම සතුටු වෙනවා.

මම බොහොම ප්‍රිය කරන, අපි බොහොම ගරු කරන, ආදරය කරන "ලංකාදීප" පත්තරය බැලුවාම අද එම පුවත් පතේ පළමුවැනි පිටුවේ පොල්ගෙඩි අකුරෙන් තිබෙනවා, "ඉඩම් ඇමති ගයන්ත ආයතන තුනක් ඉල්ලයි" කියලා. ජනාධිපතිතුමාගෙන් ඉල්ලුවා කියලා තමයි එහි සඳහන් වෙන්නේ. මේක අමූලික, පට්ටපල් බොරුවක්. මේවා පත්තරවල පළවෙලා, ඊට පස්සේ උදේට රූපවාහිනී නාලිකාවල කියවන කොට ඒකට තව ටිකක් අයිසින් දාලා රස කරලා තමයි කියන්නේ. එතකොට ජනතාව අතරට යන්නේ වැරදි චිත්‍රයක්. මගේ ජීවිතේට මම තනතුරක් ඉල්ලලා නැහැ. මම ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක වුණේ ඉල්ලලා නොවෙයි; කැබිනට් මාධ්‍ය ප්‍රකාශක වුණේ ඉල්ලලා නොවෙයි; ජනමාධ්‍ය ඇමති වුණෙත් ඉල්ලලා නොවෙයි; ඒ වාගේම ඉඩම් ඇමති වුණෙත් ඉල්ලලා නොවෙයි. ඒ නිසා මම කියනවා, මේ ප්‍රවෘත්තිය නිසා ගොඩනැඟෙන්නේ වැරදි මතයක් කියා.

අනික් කාරණය තමයි, මේ පුවත් පතේ තිබෙනවා මම චිත්‍රපට සංස්ථාව ඉල්ලුවා කියලා. මගේ ඔළුවේ අමාරුවක් නැහැ, චිත්‍රපට සංස්ථාව ඉල්ලන්න. චිත්‍රපට සංස්ථාව ජනමාධ්‍ය අමාත්‍යාංශ යටතේ තිබෙන්නට ඕනෑ. එහෙම නැත්නම් සංස්කෘතික ඇමතිවරයා යටතේ තිබෙන්නට ඕනෑ. මේවා අමූලික බොරු. මම ඉඩම් ඇමති වුණාට පස්සේ ජනාධිපතිතුමා එක්ක වචනයක්වත් කථා කරලා නැහැ. දැත් එකතු කරලා ගෞරවාන්විත ලෙස කෘතවේදිත්වය ප්‍රකාශ කළා. එතැනින් පස්සේ මේවා ඉල්ලන්න තියා කිසි දෙයක් කථා කළේ නැහැ. මම කියනවා, කරුණාකරලා අපට සාධාරණයක් ඉටු කරන්න කියලා. අප ගැන දූෂණයක් ලියන්නත් බැරි නිසා මෙහෙම පැටලිලි හදනවා. ඒ නිසා වැරදි චිත්‍රයක් මැවෙන්නේ. දෙන ඕනෑ දෙයක් භාරගන්න මිනිස්සු අපි. අනික් එක, මට මෙච්චර හොඳ අමාත්‍යාංශයක් ලැබී තිබියදී තව මොනවාද මම කථා කරන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමා

(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Hon. Deputy Speaker)

හොඳයි. ඔබතුමාගේ පැහැදිලි කිරීම ගැන මාධ්‍ය විසින් අවශ්‍ය අවධානය යොමු කරයි කියා අපි විශ්වාස කරනවා.

මීළඟට, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍ය ඩී.එම්. ස්වාමිනාදන් මැතිතුමා.

උයිලන්කුලම් 'නිවාස පනහ යෝජනා ක්‍රමය' සඳහා මූලික පහසුකම්: බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

உயிலங்குளம் 'ஐம்பது வீட்டுத் திட்டத்திற்கான' அடிப்படை வசதிகள்: சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சரினது கூற்று

BASIC FACILITIES FOR "FIFTY-HOUSES SCHEME" IN UYLANKULAM: STATEMENT BY MINISTER OF PRISON REFORMS, REHABILITATION, RESETTLEMENT AND HINDU RELIGIOUS AFFAIRS

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා (බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு டி.எம். சுவாமிநாதன் - சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர்)

(The Hon. D.M. Swaminathan - Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs)

Hon. Deputy Speaker, this is in answer to the Question raised by the Hon. Douglas Devananda on 05th May, 2017 with regard to the Mullaitivu District.

முல்லைத்தீவு மாவட்ட துணுக்காய்ப் பிரதேச செயலர் பிரிவிலுள்ள உயிலங்குளம் கிராமத்தில் 25 குடும்பங்கள் வசித்து வருகின்றன. இக்கிராமத்திலுள்ள 25 குடும்பங்களுக்கும் இலவச மின் இணைப்பு வசதி வழங்கப்பட்டுள்ளது. இக்கிராமத்திலுள்ள 03 கி.மீ. உள்ளக வீதிகள் மற்றும் 04 culverts - மதகுகள் புனரமைக்கப்பட்டுள்ளன. இக்கிராமத்தில் 05 பொதுக் கிணறுகள், 06 குழாய்க் கிணறுகள் மற்றும் ஒரு விவசாயக் கிணறு என்பன அமைக்கப்பட்டுள்ளன. மேலும் 03 குடும்பங்களுக்கு வாழ்வாதார உதவித்திட்டங்கள் வழங்கப் பட்டுள்ளன.

இக்கிராம மக்களுக்குச் சொந்த வயல் நிலங்கள் இல்லாமையாலும் வேறு பொருத்தமான வாழ்வாதார வழிமுறைகள் காணப்படாமையாலும் அந்த மக்கள் இக்கிராமத்தை விட்டு வெளியேறும் நிலை ஏற்பட்டுள்ளது. எனினும் தற்போது அவர்களுக்குரிய வாழ்வாதார உதவிகள் வழங்குவதற்கு ஏற்பாடுகள் மேற்கொள்ளப்பட்டுள்ளன.

வீடு வழங்கப்பட்ட பயனாளிகளுக்குக் காணிக்கான அனுமதிப்பத்திரம் வழங்குவதற்கு நடவடிக்கைகள் மேற் கொள்ளப்பட்டன. ஆனால், அவர்கள் அவ்வீட்டில் நிரந்தர மாகக் குடியிருக்காத காரணத்தினால் அவர்களுக்கு அனுமதிப் பத்திரம் வழங்குவது தற்காலிகமாக இடைநிறுத்தி வைக்கப் பட்டுள்ளது. வீடு வழங்கப்பட்ட பயனாளிகளுக்குக்

காணிக்கான அனுமதிப்பத்திரம் இன்னமும் வழங்கப் படாததால், அவர்களுக்கு உத்தியோகபூர்வ அறிவித்தலை வழங்கிவிட்டு, வேறு பயனாளிகளுக்கு காணியுடன் வீட்டை வழங்கவும் இடமுள்ளது. அத்தகைய நடவடிக்கைகள் மேற்கொள்ளப்படும் பட்சத்தில் இந்த வீடுகளை மாற்றுத் திறனாளிகளுக்கோ அல்லது பெண் தலைமைத்துவக் குடும்பங்களுக்கோ மாற்றி வழங்க முடியும். இதற்கான மேலதிக நடவடிக்கைகள் மாவட்டச் செயலாளரால் மேற்கொள்ளப்பட்டு வருகின்றன.

කරඩිප්පූවල් ජනතාවගේ අවශ්‍යතා: බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

கரடிப்பூவல் கிராம மக்களின் தேவைகள்:சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சரினது கூற்று

NEEDS OF KARADIPPOOVAL COMMUNITY: STATEMENT BY MINISTER OF PRISON REFORMS, REHABILITATION, RESETTLEMENT AND HINDU RELIGIOUS AFFAIRS

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

Sir, this is in answer to the Question also raised by the Hon. Douglas Devananda on 08th February, 2017 with regard to the Trincomalee District.

திருகோணமலை மாவட்ட எல்லைக் கிராமங்களில் ஒன்றான கரடிப்பூவல் கிராமத்தில் 92 குடும்பங்களைச் சேர்ந்த 448 பேர் வசித்து வருகின்றனர். இம்மக்களின் பிரதான வாழ்வாதாரங்களாக மீன்பிடி மற்றும் செங்கல் தயாரிப்புக் காணப்படுகின்றன.

இக்கிராம மக்களுக்கு, 2013 ஆம் ஆண்டு 'தயட்டகிருல' திட்டத்தின்கீழ் 7,83,915 ரூபாய் பெறுமதியில் கரடிப்பூவல் வீதி புனரமைப்பு, இளைஞர் சேவையின்கீழ் ரூபாய் 1,00,000 பெறுமதியில் ஆலயம் புனரமைப்பு, மாகாண சபை அங்கத்துவ நிதியின்கீழ் ஒரு மில்லியன் ரூபாய் பெறுமதியில் கோவில் வீதி புனரமைப்பு போன்ற உட்கட்டமைப்பு அபிவிருத்தித் திட்டங்கள் மேற்கொள்ளப்பட்டுள்ளன. 2005ஆம் ஆண்டு LEADS நிறுவனத்தினால் 58 வீடுகள் கட்டப்பட்டுக் கிராம மக்களுக்கு வழங்கப்பட்டுள்ளன.

எனது அமைச்சின்கீழ் மேற்கொள்ளப்படும் வேலைத் திட்டங்களில் ஒன்றான வாழ்வாதார உதவித்திட்டத்திற்குத் தேவையான பயனாளிகளை அங்கு திருகோணமலை மாவட்டச் செயலாளரே தெரிவுசெய்கின்றார். இக்கிராமத் திலிருந்து பயனாளிகளை அரச அதிபர் தெரிவு செய்யும் பட்சத்தில் அவர்களுக்குரிய வாழ்வாதாரம் அமைச்சின் வாழ்வாதார உதவித்திட்டத்தின்கீழ் வழங்கப்படும். மேலும் இந்த நிதியாண்டில் இம்மாவட்டத்திற்கென வாழ்வாதாரத் திற்காக ரூபாய் 50 மில்லியனும் உட்கட்டமைப்புக்காக ரூபாய் 50 மில்லியனும் மற்றும் மீன்பிடிச் சமூகத்தின் வாழ்வாதாரத்திற் கென ரூபாய் 40 மில்லியனும் எனது அமைச்சினால் ஒதுக்கப்பட்டுள்ளது என்பதையும் அறியத் தருகின்றேன்.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

நன்றி! உங்களுடைய சேவைகள் தொடர்வதற்கு எனது வாழ்த்துக்கள்!

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

நன்றி!

පනත් කෙටුම්පත් පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்

BILLS PRESENTED

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත

குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (விசேட ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்

CODE OF CRIMINAL PROCEDURE (SPECIAL PROVISIONS) (AMENDMENT) BILL

"2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අධිකරණ අමාත්‍ය සහ බුද්ධශාසන අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා විසිනි.

2017 ජූනි 06 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

නීති අමෙච්චරුම් පුත්තසාසන අමෙච්චරුමානවරින් සාර්පිල් මාණ්ඩුමිකු කයන්ත කරුණාතිලක්ක අවර්කළාල් සමර්ප්පික්කප්පට්ටදු.

2017 யூன் 06, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Justice and Minister of Buddhasasana ; to be read a Second time upon Tuesday, 06th June, 2017 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

පාර්ලිමේන්තුවේ රැස්වීම්

பாராளுமன்ற அமர்வு

SITTINGS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

I move,

"That notwithstanding the provisions of the Standing Order No.7 of the Parliament and the motion agreed to by Parliament on

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

08.03.2016, the hours of sitting of Parliament on this day shall be 10.30 a.m. to 12.30 p.m. and 1.30 p.m. to 6.30 p.m.. At 11.30 a.m. Standing Order No. 7(5) of the Parliament shall operate. At 6.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු අනුර දිසානායක මහතා.

ඊට ප්‍රථමයෙන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

උක් වගාව සඳහා විදේශීය සමාගමකට ඉඩම් ලබාදීම
கரும்புப் பயிர்ச்செய்கைக்காக வெளிநாட்டுக் கம்பனிக்கு காணிகளை வழங்குதல்
LAND GRANT TO A FOREIGN COMPANY FOR SUGARCANE CULTIVATION

[පූ.භා. 11.08]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

"බොහෝ දේශීය, විදේශීය ආයෝජන ව්‍යාපෘති සංවර්ධනයේ නාමයෙන් ගෙන එනු ලබද්දී ඒවා ජනතාවට කෙතරම් හිතකරද, හානිකරද යන්න හෝ පරිසරයට හිතකරද, අහිතකරද යන්න පිළිබඳව නිසි සොයා බැලීමක් සිදුවන බවක් පෙනෙන්නට නැත. ඒ වෙනුවට ඒ මොහොතට අදාළව ලැබෙන මුදල මත පමණක් සලකා තීන්දු ගැනෙන අතිශය කනගාටුදායක තත්ත්වයක් ඇතිවී තිබේ.

කිසිදු පරිසර ඇගයීමකින් තොරව අවසර දෙනු ලැබූ ව්‍යාපෘති හේතුවෙන් විවිධ ප්‍රදේශවල ජනතාවටත්, පරිසරයටත් අර්බුද ගණනාවක් මතුව ඇත. මෙහි තවත් නිදසුනක් වන්නේ මොනරාගල, බදුල්ල ඉඩම් අක්කර දහස් ගණනක් කොම්පැනිවලට ලබාදී සිදුකිරීමට යන පරිසර විනාශයයි. මෙම උත්සාය මීට පෙර ද දියත් වූ අතර 2006-2007 වකවානුවේදී බිබිල, මැදගම, මඩුල්ල, බඩල්කුඹුර, රිදීමාලියද්ද, මීගහකිවුල, ලුණුගල, කන්දකැටිය, පදියතලාව, මහඔය යන ප්‍රදේශවලින් ඉඩම් අක්කර 65,000ක් විදේශීය සමාගමකට උක් වැවීම සඳහා දීමට එවකට ආණ්ඩුව තීරණය කර තිබුණි. එයට එරෙහිව නැගුණු විරෝධය හමුවේ ක්‍රියාත්මක නොවූ මෙම සැලැස්ම නැවත වරක් ක්‍රියාත්මකවීමට නියමිත බව දැන ගන්නට තිබේ.

මේ තත්ත්වය තුළ මෙම ප්‍රදේශයන්හි ඓතිහාසික වටිනාකමත්, පාරිසරික වටිනාකමත් හඳුනා නොගනිමින් සහ ජන ජීවිත විනාශ කරමින් නැවතත් එම උක් වගා ව්‍යාපෘතිය දියත් කිරීම සඳහා විදේශීය සමාගමකට ඉඩම් ලබා දීමේ තීරණය අත්හිටුවිය යුතු බවටත් මෙම ඉඩම් ප්‍රදේශයේ ජනතාවගේ ජීවිත සැබෑ ලෙසම නගා සිටුවන පරිසර මිතුරු සංවර්ධනයක් වෙනුවෙන් කළමනාකරණය කළ යුතු බවටත් යෝජනා කර සිටිමි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මූලික ප්‍රවේශයට එළැඹෙන්න පෙර සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා. අපේ පක්ෂය විසින් මේ කාරණය පිළිබඳව මාධ්‍ය සාකච්ඡාවක් පවත්වලා ආණ්ඩුවෙන් කරුණු ගණනාවකට නිශ්චිත වශයෙන් පිළිතුරු ඉල්ලා සිටියා. නමුත් ඇත්තටම තිබෙන කනගාටුදායක තත්ත්වය තමයි, ආණ්ඩුවක් විසින් ලබා දිය යුතු ඒ පිළිතුරු අද කොම්පැනියක් විසින් ලබා දෙන්නට පටන්ගෙන තිබීම. ඊයේ "දිවයින" පුවත් පත බැලුවොත් ඔබතුමාට පෙනෙයි, සම්පූර්ණ පිටුවක දැන්වීමක් දාලා ඒ සමාගම අපේ ප්‍රශ්නයට පිළිතුරු දෙන ආකාරය. "ඌව පළාත් සභාවේ පළාත් සභා මන්ත්‍රී ගරු සමන්ත විද්‍යාරත්න මහතා බිබිල සීනි කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳව නඟන චෝදනාවලට සීනි සමාගමේ පිළිතුරු" කියා එහි සඳහන් වෙනවා. අපි ඒ සමාගමෙන් පිළිතුරු බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපි ප්‍රශ්නයක් අහන්නේ ආණ්ඩුවෙන්. එවිට අදාළ විෂය භාර අමාත්‍යවරුන් හෝ ආණ්ඩුවේ යම් පාර්ශ්වයක් හෝ ඒවාට පිළිතුරු ලබා දිය යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙයින් පෙන්නුම් කරන්නේ මේ සමාගම් සතුව තිබෙන බලයයි. යම් මන්ත්‍රීවරයෙකු ප්‍රකාශයක් කළාට පසුව ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් ඒ සමාගම් පත්තරවල දැන්වීම් දානවා. ඒ විධියට ඊයේ "දිවයින" පුවත් පතේ පිටුවක දැන්වීමක් බිබිල ෂුගර් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් කියන සමාගමේ නමින් පළකර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි මේ සමාගම් මොන තරම් අධිපතිවාදීද කියලා පෙන්නුම් කරනවා නම්, එහි සඳහන් කරන්නේ සමන්ත විද්‍යාරත්න මහතා අහන ප්‍රශ්නයට කොම්පැනියෙන් පිළිතුරක් කියලා. එහෙම කිසිදු ප්‍රශ්නයක් අපි කොම්පැනියෙන් අහලා නැහැ. අපි ඒ ප්‍රශ්න ඇහුවේ ආණ්ඩුවෙන්. මේ සමාගම් හැම තැනකදීම තමන්ගේ මුදල් බලය උපයෝගි කර ගනිමින්, මුදල් මාධ්‍යවලට විසි කරමින්, මුදල් දේශපාලනඥයන්ට විසි කරමින්, පරිසර පද්ධතියත් විනාශ කරමින් ගෙන යන මේ ව්‍යාපෘති පිළිබඳව අපි මීට වඩා සැලකිල්ල ලක් කළ යුතුව තිබෙනවා.

මම මේ අදහස් ඉදිරිපත් කළාට පසුව ආණ්ඩුව පැත්තෙන් එන්න පුළුවන් පිළිතුර තමයි, "ආයෝජනවලට විරුද්ධ වෙනවා, සංවර්ධනයට විරුද්ධ වෙනවා" කියන එක. මේක තමයි ඉතිහාසය

පුරාවටම රටට අහිතකර, රටට විනාශකාරී ව්‍යාපෘතියක් එන හැම මොහොතකම ආණ්ඩු පාර්ශ්වයෙන් ඉදිරිපත් කරන ලද චෝදනාව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මම විශ්වාස කරනවා මේ කරුණ පිළිබඳවත් ආණ්ඩුවෙන් ඉදිරිපත් විය හැකි ප්‍රබලතම චෝදනාව විය හැක්කේ "සංවර්ධනයට විරුද්ධයි, ආයෝජනයට විරුද්ධයි" කියන කාරණයයි කියලා.

මම අපේ ස්ථාවරය පැහැදිලි කරන්නම්. විශේෂයෙන්ම අපේ රටේ දැවැන්ත ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා වූ ප්‍රාග්ධනයක් අපට නැහැ. ඒ වාගේම මේ ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අවශ්‍ය වන තාක්ෂණික ඥානය අපට නැහැ. ඒ නිසා ප්‍රාග්ධනය සපයා ගැනීමේ අරමුණින් සහ ඒ ක්ෂේත්‍රය පිළිබඳව තිබෙන තාක්ෂණික ඥානය සපයා ගැනීමේ අරමුණින් ඕනෑම ආයෝජනයක්, ඕනෑම ණයක් ගෙන්වා ගැනීමට අපේ එකඟතාවක් තිබෙනවා.

එම ආයෝජනයෙන් රටේ නිෂ්පාදනයේ ඉහළ දැමීමක් නිශ්චිත වශයෙන් සිදු විය යුතුව තිබෙනවා. එසේම එම ආයෝජනයත් එක්ක සම්බන්ධ වන අපේ රටේ සම්පත්වලට පොදු ජනයාට තිබෙන අයිතිය කිසිසේත්ම හානියකට භාජන නොවී, එම සම්පත්වලින් උපයන ධනය හරහා අපේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කළ යුතුව තිබෙනවා. ඒ වාගේම එය පරිසර මිතුරු සංවර්ධන ව්‍යාපෘතියක් බවට පත් විය යුතුව තිබෙනවා. ඕනෑම ආයෝජනයක් පිළිබඳව, ඕනෑම ණය ගැනීමක් පිළිබඳව, ව්‍යාපෘතියක් පිළිබඳව අප සැලකිල්ලක් දක්වන්නේ ඒ මූලධර්ම මත පිහිටලායි. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම ව්‍යාපෘතිය දෙස බැලුවාම අපට පෙනෙනවා, එය පාරිසරික වශයෙන් හානිකර, අපේ රටේ සම්පත් විශාල ප්‍රමාණයක් යොදවන, නමුත් ඒ සම්පත්වලින් උපයන ධනය අපේ ජනතාවගේ ජීවන තත්ත්වය කිසිසේත්ම ඉහළට ගෙන යන්නේ නැති, නව තාක්ෂණයක් කිසිසේත්ම නොකැඳවන ව්‍යාපෘතියක් බව. එම නිසා මෙම ව්‍යාපෘතිය අපේ රටේ ඉදිරියට ගෙන නොයා යුතු ව්‍යාපෘතියක් ලෙස මා කල්පනා කරනවා. මේ ව්‍යාපෘතියේ ඉතිහාසයත් සමඟ මා දැන් කරුණු කීපයක් ඉදිරිපත් කරන්නම්.

මුලින්ම අපි මෙහි ඉතිහාසය අරගෙන බලමු. මේ ව්‍යාපෘතිය සඳහා පළමුවැනි කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරනු ලැබුවේ 2006 දෙසැම්බර් මාසයේ 6වැනි දින, හිටපු වැවිලි කර්මාන්ත අමාත්‍ය මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමායි. එතුමා එම කැබිනට් පත්‍රිකාවේ පැහැදිලිවම සඳහන් කර තිබෙනවා. "ඌව- වෙල්ලස්ස සීනි සංවර්ධන ව්‍යාපෘතිය සම්පූර්ණ වීමේදී උක් වගාව හෙක්ටෙයාර 25,000ක් දක්වා ව්‍යාප්ත වන අතර, එමඟින් දේශීය සීනි අවශ්‍යතාවෙන් සියයට 15ත් 20ත් අතර ප්‍රමාණයක් -ඒ කියන්නේ, මෙට්‍රික් ටොන් 80,000ක්- නිෂ්පාදනය කරන්න බලාපොරොත්තු වෙනවා" කියලා. ඒ කියන්නේ, අක්කර 65,000ක වගාවකින් සීනි මෙට්‍රික් ටොන් 80,000ක් නිෂ්පාදනය කරන්න බලාපොරොත්තු වෙනවා.

ඊළඟට, මද්‍යසාර ලීටර මිලියන 10ක් -ආසන්න වශයෙන් ලීටර ලක්ෂ 100ක්- නිෂ්පාදනය කිරීමේ අරමුණත් මෙම ව්‍යාපෘතිය තුළ තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මිල්රෝයි ප්‍රනාන්දු හිටපු අමාත්‍යවරයා විසින් 2006දී ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවේ අරමුණ එයයි. එය හරි පැහැදිලියි. ඉඩම් අක්කර 65,000ක් යොදාගෙන සීනි මෙට්‍රික් ටොන් 80,000ක්, මද්‍යසාර ලීටර මිලියන 10ක් -ලක්ෂ 100ක්- නිෂ්පාදනය කිරීමේ අරමුණින් තමයි මෙම ව්‍යාපෘතිය ගෙන එනු ලැබුවේ. 2006දී මිල්රෝයි ප්‍රනාන්දු ඇමතිවරයා ඉදිරිපත් කළ එම කැබිනට් පත්‍රිකාව දැන් මා ළඟ තිබෙනවා. ඉන් පසුව, හිටපු අමාත්‍ය ආර්.එම්. ධර්මදාස බණ්ඩා මැතිතුමා 2009 වසරේ 9වැනි මාසයේදී ඉඩම් වෙන් කිරීම පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරනවා.

හිටපු සීනි කර්මාන්ත ඇමතිතුමා නම් මේ පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් දැම්මේ නැහැ. අපි ඒ පිළිබඳව එක් පැත්තකින් සතුටු වෙනවා. එතුමා අද මොනවා කියාවිද දන්නේ නැහැ. ඊට පසුව මෛත්‍රීපාල සිරිසේන අමාත්‍යවරයා තමයි මෙම කැබිනට් පත්‍රිකාව 2017 ජනවාරි මාසයේ 20වන දා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙන්නේ. මා ළඟ එම කැබිනට් පත්‍රිකාව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කැබිනට් පත්‍රිකාව බැලුවාම කලින් සඳහන් කොට තිබුණු සීනි මෙට්‍රික් ටොන් 80,000 ඒ විධියටම මෙහි සඳහන්ව තිබෙනවා. මද්‍යසාර කියන එක සඳහන් කර නැහැ. මොකද, මද්‍යසාර කිව්වොත්, යම් විරෝධයක් මතු වීමේ හැකියාවක් තිබෙන නිසායි. හැබැයි ඊට අමතරව මෙහි සඳහන් කර තිබෙනවා, සත්ත්ව ආහාර, පොහොර, වක්‍ර රැකියා, ඍජු රැකියා, molasses - ඒ නම් මත් ද්‍රව්‍ය - මත් පැන් - තමයි. ඒ සඳහා යෝජනාව ඇතුළත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම නම් 2006 කැබිනට් පත්‍රිකාවෙන් ඉදිරිපත් කරන ලද මෙට්‍රික් ටොන් 80,000ක් නිෂ්පාදනය කිරීම තමයි මෙම ව්‍යාපෘතියේත් අරමුණ. එදා මෙට්‍රික් ටොන් 80,000ක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් අක්කර 65,000ක් අවශ්‍ය වුණා නම්, අදත් ඒ භූමි ප්‍රමාණය අවශ්‍යයි. නමුත් සමාගම් විසින් කරුණු ඉදිරිපත් කර තිබෙනවා මම දැක්කා, අක්කර 60,000ක් නොවෙයි, හෙක්ටෙයාර 14,500යි කියා. නමුත් එදා කැබිනට් පත්‍රිකාවේ මෙට්‍රික් ටොන් 80,000ක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් අක්කර 65,000ක උක් වගාව ව්‍යාප්ත කරන්න ඕනෑ කියා යෝජනා කර තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අදත් එම ව්‍යාපෘති වාර්තාවම තමයි දිගට ඇදෙමින් එන්නේ. සමාගම් මාරු වුණා. සමහර සමාගම් එනවා; යනවා. සමාගම් මාරු වුණාට, සීනි මෙට්‍රික් ටොන් 80,000ක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය බවට එදා යෝජනා කළ අක්කර 65,000ක උක් වගාව අදත් අවශ්‍ය වෙනවා. එදා සීනි මෙට්‍රික් ටොන් 80,000ක් නිෂ්පාදනය කරන්න අක්කර 65,000ක් අවශ්‍ය බවට යෝජනා කරලා, අද අවශ්‍ය වන්නේ ඊට වඩා අඩු බිම් ප්‍රමාණයක් කියා කියන්න කිසිසේත්ම හේතු සාධක නැහැ. ආසන්න වශයෙන් ගත්තොත්, මෙය අක්කර 65,000ක ව්‍යාපෘතියක් මෙය, අපේ රටේ ඉඩම් සම්පත පරිහරණය කිරීමේදී ලංකාවේ ඉඩම්වලින් අක්කර 65,000ක් උක් වගාව සඳහා යොමු කරන ව්‍යාපෘතියක්. අපේ පැල්වත්ත, සෙවණගල, හිඟුරාණ, කන්තලේ කියන සියලුම සීනි සමාගම්වල භූමි ප්‍රමාණ එකතු කළත් අක්කර 40,000කට වඩා වැඩි වන්නේ නැහැ. එහෙම නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අක්කර 65,000ක් කියන්නේ අපේ රටේ එක තැනක, එක කර්මාන්තශාලාවකට අයිතිව වෙන් කරනු ලබන විශාලම භූමි ප්‍රමාණයයි. ඒ නිසා, ඒ පැත්තෙන් බැලුවත් මේ පිළිබඳව අපේ අපේ සැලකිල්ලට ලක් කරන්න ඕනෑකම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2006 කැබිනට් පත්‍රිකාවෙන් මෙම භූමි ප්‍රමාණය ඉල්ලුවේ කොහොමද? ගොවි ජනතාවට වගා කිරීම සඳහා හෙක්ටෙයාර් 20,000කුත්, කේන්ද්‍රීය වගාව සඳහා හෙක්ටෙයාර් 3,000කුත්, කර්මාන්තශාලාව ඉදි කිරීම වෙනුවෙන් හෙක්ටෙයාර් 200කුත්. ඔක්කොම හෙක්ටෙයාර් 23,200යි. ගොවි ජනතාවට උක් වගා කිරීම සඳහා හෙක්ටෙයාර් 20,000ක්, කර්මාන්තශාලාවේ කේන්ද්‍රීය වගාව සඳහා හෙක්ටෙයාර් 3,000ක් සහ කර්මාන්තශාලාව ඉදි කිරීම සඳහා හෙක්ටෙයාර් 200ක්. මේක තමයි 2006 ඉදිරිපත් කරන ලද යෝජනාව. හැබැයි, දැන් තමුන්නාන්සේලාගේ කැබිනට් පත්‍රිකාවෙන් කියනවා, කර්මාන්තශාලාව සඳහා ගනු ලබන්නේ හෙක්ටෙයාර් 149.3යි කියලා. හරි, කමක් නැහැ. එතකොට හෙක්ටෙයාර් 200, හෙක්ටෙයාර් 149.3 දක්වා අඩු වී තිබෙනවා.

[ගරු අනුර දිසානායක මහතා]

දැන් අපි අහනවා, මේ කර්මාන්තශාලාවේ කේන්ද්‍රීය වගාව සඳහා ඉඩම් ලබා දෙනවාද කියලා. මේ කැබිනට් පත්‍රිකාවේ කිසි තැනක එම සමාගම සතු කේන්ද්‍රීය වගාවක් පිළිබඳව සඳහන් වී නැහැ. හෙක්ටෙයාර් 3,000ක් කේන්ද්‍රීය වගාව සඳහා වෙන් කරන්න පළමු කැබිනට් පත්‍රිකාවෙන් යෝජනා කර තිබෙනවා. මේ කැබිනට් පත්‍රිකාවේ කේන්ද්‍රීය වගාව සඳහා හෙක්ටෙයාර් බින්දුවයි. සෙවනගල බැලුවත්, පැල්වත්ත බැලුවත්, හිඟුරාන බැලුවත්, කන්තලේ බැලුවත් ඒ හැම සීනි කර්මාන්තශාලාවකටම, ඒ කර්මාන්තශාලාව විසින් නඩත්තු කරන යම් භූමි ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා තමයි ඒ සමාගම හෙක්ටෙයාර් 3,000ක් ඉල්ලුවේ. මේ අවස්ථාවේ කේන්ද්‍රීය වගාව සඳහා කොච්චර ඉඩම් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක විශාලම ව්‍යාපෘතියක්. මේක විශාලම ව්‍යාපෘතියක් නම් අතිශය වැදගත් වන්නේ මෙම කර්මාන්තශාලාව ඉදි කරන භූමිය පමණක් නොවෙයි. ඔවුන් කියනවා, අක්කර 65,000ක් නොවෙයි කියලා. නමුත් සීනි මෙට්‍රික් ටොන් 80,000ක් නිෂ්පාදනය කරන්න අක්කර 65,000ක් අවශ්‍ය බව කලින් කියා තිබෙනවා. අක්කර 65,000ක් කියන්නේ විශාල භූමි ප්‍රමාණයක්. එවැනි භූමියක ඒකීය වගාවක් වන උක් වගා කරන්න යෝජනා කරනවා නම්, මේ මුළු ව්‍යාපෘතිය පිළිබඳවම පරිසර ඇගයීම් වාර්තාවක් ලබා ගත යුතුව තිබෙනවා. ෆැක්ටරිය ඉදි කරන භූමිය පිළිබඳව පමණක් නොවෙයි.

2006 කැබිනට් පත්‍රිකාවේ, 2009 කැබිනට් පත්‍රිකාවේ, 2013 යෝජනාවේ, මේ හැම යෝජනාවකම තිබෙනවා සීනි මෙට්‍රික් ටොන් 80,000ක් නිෂ්පාදනය කරන්න අක්කර 65,000ක් අවශ්‍ය වන බව. ඒ සියල්ලම මා ළඟ තිබෙනවා. අද තමුන්නාන්සේලා කියනවා ඊට වඩා අඩු ප්‍රමාණයක් කියලා. අඩු ප්‍රමාණයක් වුණත්, එම ප්‍රමාණය අක්කර 50,000 ඉක්මවනවා. අක්කර 50,000ක් කියන කොට ඒ ප්‍රමාණය ගැන ඔබතුමන්ලා හිතලා බලන්න. අපේ රටේ භූමියෙන් අක්කර 50,000ක් ඒකීය වගාවක් වන උක් වගාව සඳහා තෝරා ගන්නවා නම්, කර්මාන්තශාලා භූමිය විතරක් නොවෙයි මුළු භූමිය සඳහාම පරිසර ඇගයීම් වාර්තාවක් සකස් කළ යුතුයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම මුළු භූමිය - මුළු ව්‍යාපෘතිය -පිළිබඳවම පරිසර ඇගයීම් වාර්තාවක් සකස් කර නැහැ. හැබැයි, කර්මාන්තශාලාව ඉදිකරන භූමිය පිළිබඳව පරිසර ඇගයීම් වාර්තාවක් සිදු කළා. එම පරිසර ඇගයීම් වාර්තාව තුළින් මෙම කර්මාන්ත භූමිය ඉදිකිරීම සඳහා එක වෙලාවකදී නිල්ගල කැලයෙන් ඉඩම් ඉල්ලුවා. ඊළඟට, ගල්ඔය රක්ෂිතයෙන් ඉඩම් ඉල්ලුවා. ඒ වෙලාවේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු නිලධාරින්ට; වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට අපි ස්තුතිවන්ත වෙනවා. නිල්ගල කැලය ලබා දීම ප්‍රතික්ෂේප කළා. ඒ වාගේම ගල්ඔය රක්ෂිතයෙන් ඉඩම් දීමත් ප්‍රතික්ෂේප කළා. තුන්වැනි ඉඩම හැටියට තමයි මෙම ඉඩම ඉල්ලුවේ. දැන් තමුන්නාන්සේලා යෝජනා කර තිබෙන ඉඩම තමයි ඇකිරියන්කුඹුර බිම් කොටස. මෙම ඇකිරියන්කුඹුර බිම් කොටසින් ඉස්සෙල්ලා හෙක්ටයාර් 300ක් ඉල්ලුවා. මේ හෙක්ටයාර් 300 පිළිබඳව පරිසර ඇගයීම් වාර්තාවක් හැදුවා. ඒ පරිසර ඇගයීම් වාර්තාවේ අවසානයේදී මොකක්ද කියන්නේ? ඒ පරිසර ඇගයීම් වාර්තාවේ තිබෙනවා, "ඇකිරියන්කුඹුර බිම් කොටස මෙම ව්‍යාපෘතිය සඳහා ලබාදීමට නිර්දේශ නොකරන බව කාරුණිකව දන්වා සිටිමි" කියලා. "මෙයට හේතුව වනුයේ මෙය ජලපෝෂක ප්‍රදේශයක් නිසාත්, මින් සෑහෙන ප්‍රමාණයක ස්වාභාවික වන ආවරණයක් ඇති නිසාත්" කියලා ඒ වාර්තාවේ සඳහන් කොට තිබෙනවා. කවුද එහෙම කියන්නේ? වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වන සරත් ප්‍රනාන්දු මහත්මයා. ඇකිරියන්කුඹුර හෙක්ටයාර් 300ක් ඉල්ලපු වෙලාවේ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සරත් ප්‍රනාන්දු මහත්මයා කියා තිබෙනවා, "මෙම ඉඩම කිසිසේත්ම නිදහස් නොකළ යුතුයි" කියලා. එතුමා කියා තිබෙන්නේ මොකක්ද? එතුමා කියා තිබෙනවා, "ඇකිරියන්කුඹුර බිම් කොටස මෙම ව්‍යාපෘතිය සඳහා ලබාදීම නිර්දේශ නොකරන බව කාරුණිකව දන්වා සිටිමි. මෙයට හේතුව වනුයේ, මෙය ජලපෝෂක ප්‍රදේශයක් නිසාත්, මින් සෑහෙන භූමි ප්‍රමාණයක ස්වාභාවික වන ආවරණ ඇති නිසාත්" කියලා. නමුත් දැන් හෙක්ටයාර් 300 හෙක්ටයාර් 149 දක්වා අඩුවීම නිසා මේ පාරිසරික හානිය නැහැ කියන එක තමයි තමුන්නාන්සේලා යෝජනා කරන්න හදන්නේ. මම කියනවා, හෙක්ටයාර් 149.3ක මෙම ෆැක්ටරිය ඉදිකිරීම සඳහා වෙන් කරන භූමියේ නව පරිසර ඇගයීම් වාර්තාවක් හැදුවා නම්, ඒ පරිසර ඇගයීම් වාර්තාව ඉදිරිපත් කරන්න කියලා. ඒ වාගේම මම තමුන්නාන්සේලාට පෙන්වන්නම්, මෙම පරිසර ඇගයීම් වාර්තාවලට බලය ලැබුණේ කොහොමද කියලා. අපි දන්නවා, මේ නිලධාරින් භය කරලා සමහර ඒවාට අනුමැතිය ගත්තේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බදුල්ලේ දිසා වන නිලධාරි එස්.සී. පාලමකුඹුර මහතා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට යවපු ලිපියේ පිටපතක් මා ළඟ දැන් තිබෙනවා. එම ලිපියේ ශීර්ෂ පාඨය හැටියට තිබෙනවා, "ඌව-වෙල්ලස්ස සීනි කර්මාන්ත ව්‍යාපෘතිය සඳහා ඉඩම් නිදහස් කරගැනීම" කියලා. එම ඉඩම් නිදහස් කර ගැනීම පිළිබඳව සාකච්ඡාවක් තිබුණා. මා මේ කියන්නේ පසු ගිය රජය කාලයේ වූ සිදුවීමක් ගැනයි. එම සාකච්ඡාවේ දී නිලධාරින්ට තර්ජනය කර තිබුණා. ඉහත ලිපියේ එම නිලධාරියා කියා තිබෙනවා, "එම තීරණය පිළිබඳව මා දැනුවත්ව නොසිටි බැවින් ඉහත රැස්වීමේ දී මවිසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ සහ අනෙකුත් කැබිනට් අමාත්‍යවරුන් සහ රාජ්‍ය නිලධාරින්ගේ දැඩි දෝෂ දර්ශනයට මා ලක් වූ අතර, රාජකාරිය අවංකව ඉටු කිරීමට යාම තුළින් එම තත්ත්වය ඇතිවූ බව මා විශ්වාස කරන අතර එහිදී දැඩි අපහසුතාවට සහ බලවත් සිත්වේදනාවට මා පත්වූ බව කාරුණිකව දන්වා සිටිමි" කියලා.

ඒ කියන්නේ හිටපු ජනාධිපතිවරයාත්, කැබිනට් ඇමතිවරුත් රැස්වීමේදී එම නිලධාරියාට තර්ජනය කරලා තමයි මේ අවසරය ගත්තේ. තමුන්නාන්සේලා දැන් එම ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන්නද ඉන්නේ? එසේ තර්ජනය කරලා ගත් එකඟතාවන්ටද, තමුන්නාන්සේලා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය තිබෙනවා කියලා කියන්නේ? ඔහු මේකට "එපා" කිව්වාය කියලා ජනාධිපතිතුමාගේ, කැබිනට් අමාත්‍යවරුන්ගේ සහ රාජ්‍ය නිලධාරින්ගේ දැඩි දෝෂ දර්ශනයට ලක් වුණාය කියලා කියනවා. "ඉහත ව්‍යාපෘති සඳහා යෝජිත ඉඩම් එම කාරණය සඳහා සුදුසු බැවින් එය නිදහස් කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තීරණය කරලා තිබෙනවා"ය කියනවා. තවද, එහිදී උපදෙස් පරිදි අදාළ ව්‍යාපෘති යෝජනා ඇතුළු අනෙකුත් නිලධාරින්ගේ සහභාගිත්ව රැස්වීමක් පවත්වා තිබෙනවා. "ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කළාට, මෙම ඉඩම සුදුසු නැති බව ඔහු කිව්වා"ය කියනවා. එහෙම නම් පසුගිය ආණ්ඩුවේ ජනාධිපතිවරයාත්, ඇමතිවරුත් ඒ වාගේම ඉහළ නිලධාරිනුත් බල කරලා ගත් අවසරයටද, තමුන්නාන්සේලාත් "අවසරයක් තිබෙනවා" කියන්නේ කියන එක අපි දැන ගන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇකිරියන්කුඹුරේ හෙක්ටෙයාර 149ක් -ෆැක්ටරිය ඉදි කිරීම වෙනුවෙන්- මෙම ව්‍යාපෘතියට වෙන් කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරය නැහැ.

ඊළඟට, මේ සඳහා වෙන් කරනු ලබන අනෙක් ඉඩම් මොනවාද කියලා මම දැන් තමුන්නාන්සේලාගෙන් දැන ගන්න කැමැතියි. අනෙක් ඉඩම් හොයා ගන්නේ කොහොමද? මම දැක්කා "මෙම ඉඩම් ගොවීන් සඳහා බෙදන්නේ" කියලා ඉතා පැහැදිලිව පෙන්නුම් කර තිබෙන බව. නැහැ. මේවා ගොවීන් සඳහා බෙදන්නේ නැහැ. මෙන්න බලන්න. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ජනවාරි මාසයේ 20 වැනි දා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරපු කැබිනට් පත්‍රිකාව තමයි මේ මගේ අතේ තිබෙන්නේ. "දැනට මහවැලි ඉඩම් අනවසරයෙන් අත්-පත් කරගෙන හේන් ගොවිතැනෙහි යෙදෙන 7,500ක් පමණ වූ ගොවීන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ගොවීන් හා...." - ඒ අතර ගිවිසුමක් අත්සන් කරනවා. එසේ අත්සන් කරලා උක් වගාව සඳහා පමණක් තම ඉඩම් යොදා ගැනීමේ පදනම මත සෑම ගොවියෙකුටම හෙක්ටෙයාර දෙක බැගින් දෙනවා. හැම ගොවියෙකුටම හෙක්ටෙයාර දෙකක් -අක්කර පහක්- දෙනවා. හැබැයි, ගිවිසුමක් අත්සන් කරනවා, වගා කරන්න පුළුවන් උක් විතරයි කියලා. මෙම ගරු සභාවට ගොවි ජනතාව පැමිණ සිටිනවා. ගොවි ජනතාවට තමන් තීරණය කරන වගාවක් කිරීමේ අයිතිය තිබෙනවා. හැබැයි, අද කරලා තිබෙන්නේ මොකක්ද? තමන් වගා කරමින් ඉන්නා ඉඩම් කොම්පැනියට දෙනවා. ඔය ගොල්ලන් කියනවා, කොම්පැනියට දෙන්නේ හෙක්ටෙයාර 149යි කියලා. හැබැයි, මේ ඉඩම් මොනවාද? මේවා ඌව-වෙල්ලස්සේ අතීත මුතුන්-මිත්තන්ගෙන් පැවත එන, ඒ පොළොවේ ඉපදුණු, ඒ පොළොවේ පස් වෙන, එයට තමන්ගේ ජීවිත සාරය පරිත්‍යාග කරන ලද මිනිසුන්ගේ ඉඩම්. තමුන්නාන්සේලා ඒ ඉඩම්වලට මොකද කරන්නේ? හෙක්ටෙයාර දෙකක් ගොවියාට දෙනවා කියනවා. හැබැයි, ගොවියාට කොන්දේසියක් දමනවා. ඒ, මොකක්ද? හෙක්ටෙයාර දෙකක් ගොවියාට දෙනවා; එහි උක් වගාව හැර වෙන වගාවක් කරන්න බැහැ කියනවා. අවුරුදු පහකට පසුව සමාලෝචනය කරනවා. උක් වගාව කළේ නැත්නම් අයින් කරනවා. මොකක්ද මේ කරන්න හදන්නේ? ගොවීන් ස්වාධීනව තමන්ගේ වගාව තීරණය කරමින් තමන්ගේ ආර්ථිකයක් පවත්වා ගෙන ආවා. හැබැයි, අද මොකක්ද කරන්න හදන්නේ? මේ ගොවීන් බලහත්කාරයෙන් කොම්පැනිවල -සමාගම්වල- සේවකයන්, කම්කරුවන් බවට පත් කරන්නයි මේ හදන්නේ.

එතැන් සිට ගොවියා නොවෙයි; එතැන් සිට කොම්පැනියක කම්කරුවෙක්. එම නිසා මේ ගොවි ජනතාව තමන්ගේ ගොවි වෘත්තියේ සිට කොම්පැනියක ශ්‍රමය විකුණන කම්කරුවෙක් බවට පත් කරන යෝජනාවක් තමයි මේක.

ඊට පසුව මොකක්ද කියන්නේ? තව කියනවා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය භාවිත කරන ඉඩම් බැහැර කිරීමේ ක්‍රමවේදය භාවිත කරමින් වාණිජ බද්දක් පනවනවා කියලා. දැන් මොකක්ද කියන්නේ? මේ ගොවි ජනතාවට දෙන ඉඩම් නැවත වාණිජ බද්දකටත් යටත් කරනවා. වාණිජ බද්දකට යටත් කරනවා විතරක් නොවෙයි. මේ ගොවි ජනතාව ඉඩම්වල උක් වගා කරලා, අස්වැන්න අරගෙන ෆැක්ටරියට විකුණලා ලැබෙන ආදායමෙන් සියයට එකක් තියා ගන්නවා. ගොවියාට රුපියල් ලක්ෂයක් ලැබුණොත් ෆැක්ටරි එක මහවැලි අධිකාරියට දෙන්න කියලා සියයට එකක් තියා ගන්නවා. ඒ සඳහා ගොවියාගේ ආදායමින් සියයට එකක බද්දක් ගන්නවා. ඒ වාගේම ගොවියාගෙන් වාණිජ බද්දක් අය කරනවා. ඒ වාගේම ගොවීන්ට උක් හැර වෙන මොකුත් වගා කරන්න දෙන්නේත් නැහැ. එතකොට, මේ කොම්පැනිවල ඉඩම් නොවෙයිද? ගොවි ජනතාව උක්වලට බඳිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ගොවි ජනතාවට අයිතිව තිබුණු ඉඩම්. ගිවිසුමක් අත්සන් කරනවා, වාණිජ බද්දක් අය කරනවා, ආදායමෙන් සියයට එකක් ගන්නවා. මම මේ ව්‍යාපෘතිය පිළිබඳ මීට කලිනුත් මතු කළා. 1980 අංක 47 දරන පාරිසරික පනත අනුව මේ භූමි ප්‍රමාණයට EIA එකක් කළ යුතුව තිබෙනවා. හැබැයි, මේ සමස්ත වගාවට පරිසර ඇගැයීම් වාර්තාවක් සිදු කරලා නැහැ. ෆැක්ටරිය ඉදි කරන භූමියට පමණක් බලහත්කාරයෙන් අනුමැතිය අරගෙන තිබෙනවා. මම කලින් ඒක පෙන්නුවා. මේ සමස්ත ව්‍යාපෘතියටම පරිසර ඇගැයීම් වාර්තාවක් කරන්න ඕනෑ. පරිසර ඇගැයීම් වාර්තාවක් පමණක් නොවෙයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සඳහා පුරා විද්‍යාව පිළිබඳ ඇගැයීම් වාර්තාවක් කරන්නත් ඕනෑ. මම ඔබතුමාට පෙන්නුම් කරන්නම්.

විශේෂයෙන් පුරාවිද්‍යා වටිනාකම් සහිත ස්ථාන හතක් මෙම ප්‍රදේශයේ තිබෙන බව හඳුනා ගෙන තිබෙනවා. ඒ ස්ථාන පොඩිපට්ටම් කරමින් තමයි මේ ව්‍යාපෘතිය දියත් වෙන්නේ. එතකොට, අපේ රටේ ඉඩම් සම්පත විනාශ කරනවා; පරිසර පද්ධතිය විනාශ කරනවා; පුරාවිද්‍යා වටිනාකම් සහිත ස්ථාන විනාශ කරනවා. කොම්පැනිය පුවත්පත්වල දැන්වීම් දමලා තිබෙනවා. ඇමැතිවරු, මන්ත්‍රීවරු උත්තර දෙන්න ඕනෑ එකට කොම්පැනිවල සල්ලිවලින් පුවත්පත්වල දැන්වීම් දමනවා. මන්ත්‍රීවරයෙක් ප්‍රකාශයක් කළාම ආණ්ඩුව උත්තර දෙන්න ඕනෑ. අද ආණ්ඩුව උත්තර දෙනවා වෙනුවට කොම්පැනි සල්ලිවලට පිළිතුරු දෙන්න ඇවිත් තිබෙනවා. ඒකෙන් තේරුම් ගන්න පුළුවන් මේ කොම්පැනි ඒ විනාශකාරි ව්‍යාපෘතිය වෙනුවෙන් මොන මොන අතට සල්ලි විසි කරන්න සූදානම්ද කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට මම ඔබතුමාගේ අවධානය තවත් කරුණකට යොමු කරන්න කැමැතියි. නිල්ගල රක්ෂිතයත්, මාදුරුඔය රක්ෂිතයත් අතර තමයි මේ ඉඩම් ප්‍රමාණය තිබෙන්නේ. නිල්ගල රක්ෂිතය කියලා කියන්නේ අපේ රටේ තිබෙන වටිනාම ඖෂධ වනාන්තරය. මාදුරුඔය රක්ෂිතය කියලා කියන්නේ අපේ රටේ විශාල ජල පෝෂක ප්‍රදේශයක්. මේ මැදින් තමයි උක් වගා කරන භූමිය වෙන් කරන්න හදන්නේ. මෙයින් ජාතික වනපද්ධතිය දෙකට වෙන් වෙනවා. වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස සරත් කොටගම මහත්මයා කටයුතු කරමින් සිටි කාලයේ එතුමා යෝජනා කළා, මෙතැනින් අලිමංකඩක් හදන්න ඕනෑ කියලා. මේ වනාන්තර දෙක යා කිරීමට අලිමංකඩක් හැදීමෙන් පමණයි වල් අලි අනතුරට මුහුණ දෙන්න පුළුවන් කියලා එතුමා කිව්වා. හැබැයි, අලි මංකඩක් හදනවා වෙනුවට අද මුළු උක් යායක්ම මේ මුළු ප්‍රදේශයේ හදනවා. එම නිසා මෙම වැදගත් රක්ෂිත පද්ධතිය බෙදා වෙන් කරනවා. මෙම බිම් ප්‍රදේශයේ තමයි තිබෙන්නේ ලංකාවේ තිබෙන විශාලතම කටු උණ ප්‍රජාව. ඒක හඳුනා ගෙන තිබෙනවා. මේ ප්‍රදේශයේ උක් හැදීම නිසා ඒ කටු උණ ප්‍රජාව විනාශයට පත්වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනෙක් උක් කර්මාන්තශාලාවලට ජලය ලබා ගැනීමේ ක්‍රමවේදයක් තිබුණා. උඩවලවෙන් තමයි සෙවනගලට ජලය දෙන්නේ. කන්තලේ ඉඩම්වලට කන්තලේ ජලාශයෙන් වතුර දෙනවා. හිඟුරානට සේනානායක සමුද්‍රයෙන් ජලය දෙනවා. පැල්වත්තට පමණයි ජල ප්‍රශ්නය තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පැල්වත්තේත් අද අස්වැන්න අඩු වී තිබෙන්නේ ජලය නොමැති වීම හේතුකොටගෙනයි. එම නිසා පැල්වත්තේ අද හෙක්ටෙයාරයකට ලැබෙන්නේ ආසන්න වශයෙන් ගත්තොත් මෙට්‍රික් ටොන් 60ක් පමණ. ඒ ඇයි? ජලය දෙන්න විධියක් නැහැ. මේ සඳහා ජලය දෙන්නේ කොහෙන්ද? අපි තමුන්නාන්සේලාගෙන් දැනගන්න කැමැතියි, මේ හදන

[ගරු අනුර දිසානායක මහතා]

ව්‍යාපෘතිවලට ජලය ලබා ගන්නේ කොහෙන්ද කියලා. ෆැක්ටරියේ වාර්තා අනුව කියනවා, ෆැක්ටරියට පමණක් දවසකට ජල ලීටර් 2,830,000ක් ඕනෑය කියලා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன) - விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - State Minister of Science, Technology and Research)
ඒක වැරදියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම කියන්නම්. දැන් මේ එක්තරා පත්තරයක දමා තිබෙන දැන්වීම බලන්න කෝ. මේ සමාගම විසින්ම කියනවා, "ආරම්භක දවසට ජලය ලීටර ලක්ෂ 28ක් ඕනෑ"ය කියලා. මම වැඩිපුර කිව්වා නම්, කිව්වේ 30,000යි. හරිද? ඒ 30,000 මම කියන්නේත් මේ කොම්පැනිය උපයෝගී කර ගෙනයි.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඔබතුමා දන්නවාද, මේ ෆැක්ටරිය තිබෙනවා, pooling ක්‍රමය කියලා එකක්. එතකොට වෙන්නේ මේ වතුරම recycle කරන එකයි. එතකොට නැවත සියයට 20ක්වත් ජලය ඕනෑ නැහැ. සියයට 10යි ජලය අවශ්‍ය වන්නේ. මේ ඔක්කෝම recycle වනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පොඩ්ඩක් ඉන්න. මම කියන්නම්. කර්මාන්තශාලාව ආරම්භ කළාම පළමුවෙනි දවසට ඕනෑ, ජලට ලීටර 2,830,000ක්. එතැන් සිට හැම දිනම 2,830,000ම අවශ්‍ය වන්නේ නැහැ. හැබැයි, ආරම්භයට 2,830,000ක් ඕනෑ. එතැන් සිට ආසන්න වශයෙන් ඒ ප්‍රමාණයෙන් සියයට 20කට වඩා වැඩි ප්‍රමාණයක් ඕනෑ. මේක තමයි කොම්පැනිය කියන්නේ. මා කොම්පැනිය කියන එක පිළිගන්නේ නැහැ. ප්‍රමාණය ඊටත් වඩා වැඩියි හානිය. පළමුවෙනි දවසට ලීටර් 2,830,000ක් ඕනෑ. ඊට පස්සේ ජලය ඕනෑ කරන්නේ නැවත නැවත නැවත දිනපතා මේ කර්මාන්තශාලාව ක්‍රියාත්මක කර ගෙන යන්නයි. මේ සඳහා ජලය කොහෙන්ද ගන්නේ? මා දුරු ඔයෙන්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජූලි අගෝස්තු වනකොට මා දුරු ඔයේ ජලයත් හිඳෙනවා. මේ ගොවි මහත්වරු ඒ සම්බන්ධයෙන් දන්නවා. අදත් ඒ පළාත්වල ජනතාව මා දුරු ඔය ඇතුළේ ළිඳක් හාරා තමයි වතුර ටිකක් ගන්නේ. එහෙම නම්, නළ ළිං ගහන්න ඕනෑ. මෙතැනදි අනිවාර්යයෙන්ම භූගත ජලය ගන්න ඕනෑ. දැන් කොම්පැනිය කියන සාධකය මොකක්ද? ඔවුන් කියන්නේත් මේ කියන එකම තමයි. මේ කොම්පැනියේ හඬ නේ? ජලය ගන්නවා. ඊට පස්සේ ජලය එළියට දමනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හැබැයි භූගත ජලය අරගෙන මතුපිටට විසි කළාම ඒ ජලය නැවත භූගත ජලය වන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ගරු මන්ත්‍රීතුමනි, මෙම කර්මාන්තශාලාව ආරම්භ කරන්න ජලය ලීටර් දෙලක්ෂ අසූදාහක් ඕනෑ. ඒක ඇත්ත. ඒකට වැව් හරිගස්සන්න ඕනෑ. පැල්වත්තේ කරන්නෙත් එහෙමයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ජලය ලීටර් දෙලක්ෂයක් නොවෙයි, විසිඅට ලක්ෂයක්.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
නැහැ. නැහැ. අසත්‍ය. ඕක වැරදියි. සම්පූර්ණයෙන් අසත්‍යයි. මම කරපු මනුෂ්‍යයා; ඕකේ හිටපු කෙනා. විශ්වාස කරන්න. ඕක සම්පූර්ණ අසත්‍යයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම ඒක කියන්නම්. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මම කියන්නම්. දැන් ඔබතුමා ඒක කිව්වා නේ. එතකොට මම කියන්නේ කර්මාන්තශාලාව ආරම්භක දිනයට ජලය ලීටර් 2,830,000ක් අවශ්‍යයි කියලායි. [බාධා කිරීමක්] අසත්‍ය කියන්න එපා. මම ඔබතුමාට නිවැරදිවම හොයලා දෙන්නම්. එම කොම්පැනියෙන් පළ කළ පත්තර දැන්වීම මම ඔබතුමාට පෙන්වන්නම්. හැබැයි, එතකොට ඔබතුමා කියන ලද ජල ප්‍රමාණයට වඩා ඒ ජල ප්‍රමාණය වැඩි නම් ඔබතුමා මෙම ව්‍යාපෘතිය නතර කරනවාද? දැන් මම කියන්නේ කර්මාන්තශාලාව ආරම්භක දිනයේ ජල ප්‍රමාණය 2,830,000යි කියලා. ඔබතුමා කියනවා 280,000යි කියලා. මම කියන එක නිවැරදි නම් ඔබතුමා ව්‍යාපෘතිය නතර කරනවාද?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මම එම ව්‍යාපෘතිය නතර කරන්න මේ කොම්පැනිය මගේ නොවෙයි නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අසත්‍ය කියන්න එපා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
දැන් මම තමුන්නාන්සේගෙන් ප්‍රශ්නයක් අහන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇත්ත කියන්නේ මමයි. මම ඔබතුමාට පෙන්වන්නම්. මිලියන 2.8ක්; දෙලක්ෂ අසූදාහක් නොවෙයි. මිලියන 2.8ක් කියන්නේ, ලක්ෂ විසිඅටක්.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඔබතුමා මම කියන කථාවත් පොඩ්ඩක් අහ ගන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි. ඔබතුමා කථාව කරන වෙලාවට මම ඔබතුමාගේ කථාව අහන්නම්. [බාධා කිරීමක්]මම ඔබතුමාගේ පරණ කථාවත් කියන්නම්. ඔබතුමාගේ පරණ කථාවත් මා ළඟ තිබෙනවා. ඒකත් මම කියන්නම්.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
හොඳයි කියන්න. අපි ඉඩම් දෙන්නේ මහජනතාවට.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මහජනතාවට ඉඩම් දෙනවා කියන්නේ මොකක්ද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහජනතාවට ඉඩම දෙනවා. හැබැයි, උක්වලට වඩා වැඩි දෙයක් වගා කරන්න බැහැ, උක් ටික ඒ ගොල්ලන් ගන්නවා. උක් වගා කළේ නැත්නම් ඒ ගොවියාගේ ඉඩම ආපහු ගන්නවා. වාණිජ බද්ද ගෙවන්නේ මොකටද? මේවා ගොවීන්ගේ ඉඩම්. මතක තබා ගන්න. [බාධා කිරීමක්] ඒ විතරක් නොවෙයි, මම කියන්නම්.

දැන් මම තමුන්නාන්සේට දෙයක් කියන්නද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා මට බාධා කරන නිසා මම එතුමාට උත්තරය දීලාම ඉන්නම්. මේක කියන්නේ ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඔබතුමා වෙනුවෙන් මම ඔබතුමාගේ කථාව කියන්නම්. "1988 දී සුද්දෝ ඌව වෙල්ලස්සට තවත් විනාශයක් කරන්න යනවා. මගේ මිත්‍ර ධර්මදාස බණ්ඩා අමාත්‍යතුමා කරුණු කාරණා රාශියක් ඉදිරිපත් කළා. නමුත් එතුමා ඉදිරිපත් කළ කිසිම කරුණකින් සඳහන් වුණේ නැහැ, මේ කොම්පැනිය මොකක්ද, මේක කොහේද තිබෙන්නේ. මේ රිදීමාලියද්ද කියන ප්‍රදේශයේ උක් වගා කළා. ඒ ප්‍රදේශයේ ගොවි ජනතාවට රජයෙන් රුපියල් 500 ගණනේ ණයක් දුන්නා. මේ හේතුව නිසාම රිදීමාලියද්ද කෘෂි සේවා මධ්‍යස්ථානයේ ලංකා බැංකු ශාඛාවකුත් පිහිටෙවුවා. ඒ කාලයේ රුපියල් 500ක් කියන්නේ විශාල මුදලක්. ඒ ගොවි මහත්තුරුන්ට රුපියල් 500 ගණනේ දීලා ඒ ප්‍රදේශයේ විශාල වශයෙන් උක් වගා කළා. අන්තිමේදී මොකද වුණේ? ඒ ප්‍රදේශයේ උක් වගාව සම්පූර්ණයෙන්ම අසාර්ථක ව්‍යාපාරයක් බවට පත් වෙලා නැතිවෙලා ගියා. මිනිස්සු අදත් අනාථයි."

උක් වගාව අසාර්ථක වුණා, ණය වුණා, විනාශ වුණා. මේකෙන් අපට තේරෙන්නේ මොකක්ද කියා දන්නවාද? විපක්ෂයේ මන්ත්‍රීවරයකුට ඇමතිකමක් ලැබුණාම, මන්ත්‍රීවරයා ඇමති වුණාම කට කොයි පැත්තටද හැරෙන්නේ කියා පෙන්නුම් කරන්න පුළුවන් නේද? එතුමාම තමයි මෙහෙම කිව්වේ. ඒක මතක තබා ගන්න. මේවා අපි කියපුවා නොවෙයි. එතුමාම කියනවා, විනාශයක් වුණා; උක් වගාව හරි යන්නේ නැහැයි කියලා. එහෙමයි කිව්වේ. [බාධා කිරීමක්] එතුමා ගොඩක් දේවල් කිව්වා. "මගේ බල්ලාවත් යන්නේ නැහැ"යි කියා එතුමා කිව්වා. අන්තිමට බල්ලා ගෙදර, එතුමා ගියා. [බාධා කිරීමක්] ඒවා මා කියන්නේ නැහැ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. වාඩි වන්න. මා කියන්නම්. [බාධා කිරීමක්] ඔන්න අහගන්න. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] වාඩි වෙන්න කෝ. මා කියන්නම්. මෙන්න බලන්න. ඔබතුමා අහගන්න. මෙන්න ඔබතුමා කිව්ව සමාගම දීපු උත්තරය.

"දිවයින" පත්‍රය අරගෙන කියවන්න. "නවීන සීනි කම්හලක් සඳහා දිනකට අවශ්‍ය ජල ප්‍රමාණයෙන් සියයට 90ක් නැවත චක්‍රීයකරණය කරයි. එම නිසා දිනකට අලුතින් අවශ්‍ය වන්නේ සියයට 10ක් පමණි. උදාහරණයක් වශයෙන් යෝජිත බිබිල සීනි සමාගමේ දිනකට උක් මෙට්‍රික් ටොන් 40,000ක් අඹරන කර්මාන්තශාලාව පටන් ගන්නා පළමු දිනයේදී අවශ්‍ය වන ජල ප්‍රමාණය ලීටර මිලියන 2.8කි." ඒ කියන්නේ ලීටර් ලක්ෂ 28යි. ඒක දන්නේත් නැහැ නේ. අඩුම තරමේ කොම්පැනිය හරියට පාඩම් කරල දීලා නැහැ. කොම්පැනිය හරියට පාඩම් කරලා දුන්නා නම් හරියට කියයි. මා නොවෙයි, මෙහෙම කියන්නේ. කොම්පැනිය කියනවා, දවසකට ලීටර් ලක්ෂ 28ක් ඕනෑය කියලා. ඉස්සෙල්ලා මෙතැන බෙරිහන් දුන්නා, ලීටර් 2,80,000යි කියලා. මොනවාද මේ කියන්නේ? ඒ නිසා එතුමා කියන දේවල් තවත් පිළිගන්න ඕනෑද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා කියනවා, ලීටර් 2,80,000යි කියලා. එය ලීටර් ලක්ෂ 28ක් කියා ඔප්පු කළොත්, ව්‍යාපෘතිය නතර කරනවාද කියලා මා ඇසුවා. මා ඔප්පු කරනවා, දිනකට ලීටර් ලක්ෂ 28ක් ඕනෑය කියලා. දැන් එය ඔප්පු කළා. දැන් ඒ ව්‍යාපෘතිය නතර කරනවාද?

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Ajith Mannapperuma, what is your point of Order?

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
නොමඟ යැවීමක් කරන්නේ. මේ ප්‍රදේශයේ වර්ෂාපතනය මිලි ලීටර් 1200ත් - 1500ත් අතර ප්‍රමාණයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
There is no point of Order in that.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විවාදය බලාගෙන හිටපු හැමදෙනාටම මෙය තේරුණා. මා කිව්වා ආරම්භක දිනයේ ලීටර් ලක්ෂ 28ක් ඕනෑය කියලා. හැබැයි එතුමා කිව්වා, ඒ ප්‍රමාණය අවශ්‍ය නැහැයි කියලා. දිවයින පත්‍රයේ දැන්වීම බලන්න. කොම්පැනියෙන් කියනවා, ලීටර් ලක්ෂ 28ක් ඕනෑය කියලා. ඒක මතක තබා ගන්න. ඒ විතරක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම ප්‍රදේශයේ තිබෙන ඊළඟ ප්‍රශ්නය මෙයයි. පාරිසරික වශයෙන් ඉතා වැදගත් ස්ථානයක් මේ ප්‍රදේශයේ පිහිටා තිබෙනවා. මෙම ක්‍රියාවලිය හේතුකොටගෙන එය විනාශයට භාජන කරනවා.

ඊළඟට ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අලි ප්‍රශ්නය පිළිබඳව අවධානය යොමු කරන්න මා කැමැතියි. වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්වරයා යෝජනා කළා, නිල්ගල රක්ෂිතය හා මාදුරුඔය රක්ෂිතය එක්කොට මේක ගොඩ නඟන්න. හැබැයි, මොකක්ද වුණේ? මේක ගොඩ නැඟුවේ නැහැ. හැබැයි මේ උක් වගාව නිසා අද ඒ පළාත්වලට මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? දැන් ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමා කියනවා, අලි ප්‍රශ්නය නිසා එක ඝාතනයක්වත් සිද්ධ වුණේ නැහැයි කියලා කොම්පැනිය පත්තරේ දැන්වීමක් දමා තිබෙනවා කියා. මේ ගොල්ලනුත් කියයි, කොම්පැනියේ හඬ. මා ළඟ තිබෙනවා, ඌව කලාපයේ සිදු වූ අලි, මිනිස් මරණ සම්බන්ධයෙන් සංඛ්‍යා ලේඛන. ඌව කලාපයේ 2013 වර්ෂයේ වල් අලි පහර දීමෙන් දෙදෙනෙක් මිය ගිහින් තිබෙනවා; අලි 21දෙනකු මිය ගිහින් තිබෙනවා. 2014

[ගරු අනුර දිසානායක මහතා]

වර්ෂයේ මිනිසුන් 4 දෙනෙක් මිය ගිහින් තිබෙනවා; අලි 16දෙනකු මිය ගිහින් තිබෙනවා. 2015 වර්ෂයේ මිනිසුන් දෙදෙනකු මිය ගිහින් තිබෙනවා; අලි 9දෙනකු මිය ගිහින් තිබෙනවා. ඒ විතරක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොනරාගල සහ වැල්ලවාය ප්‍රදේශයේ 2010 සිට 2015 දක්වා අලි-මිනිස් ගැටුමට අදාළ තොරතුරු මා ළඟ තිබෙනවා. පැල්වත්ත සීනි සමාගම හේතුකොටගෙන ඇති වී තිබෙන විනාශය මා ඔබතුමාට පෙන්නුම් කරන්නම්. 2010දී අලි මරණ සංඛ්‍යාව 7යි; මිනිස් මරණ 3යි; ශාරීරික හානි 2යි. 2011දී අලි මරණ 6යි; මිනිස් මරණ 2යි; ශාරීරික හානි 2යි; දේපොළ හානි 51යි. 2012දී අලි මරණ 6යි; මිනිස් මරණ 1යි; ශාරීරික හානි 4යි; දේපොළ හානි 55යි. 2013දී අලි මරණ 2යි; දේපොළ විනාශ 115යි. 2014දී අලි මරණ 6යි; මිනිස් මරණ 1යි; ශාරීරික දුබලතා 3යි; දේපොළ හානි 116යි. 2015දී මිනිස් මරණ 3යි; අලි මරණ 3යි; ශාරීරික හානි 5යි; දේපොළ හානි 92යි. කල්පනා කරලා බලන්න. වන්දි ගෙවීමට විතරක් රුපියල් ලක්ෂ 200කට වැඩි මුදලක් ගිහින් තිබෙනවා.

වනාන්තර එළි කරලා, ජනතාව අලි වාසය කරන කැලෑ ආක්‍රමණය කරලා, මේ කරන ලද විනාශයේ ප්‍රතිඵල තමයි, මිනිසුන් මැරෙනවා; අලි මැරෙනවා; ගෙවල් විනාශ කරනවා. ඒ කොම්පැනි අයිතිකාරයන්ගේ ගෙවල් මෙහෙ නැහැ. ඒකෙන් වරදාන ලබන අයගේ ගෙවල් මෙහෙ නැහැ. කොම්පැනියෙන් සල්ලි විසි කළාම, විසි කරන සල්ලි ගන්න අයගේ දේපළ මෙහෙ නැහැ. මෙහි තිබෙන්නේ, සාමාන්‍ය මිනිසුන්ගේ ජීවිත. නැති වුණේ, සාමාන්‍ය මිනිසුන්ගේ ජීවිත. නැති වුණේ, සාමාන්‍ය මිනිසුන්ගේ දේපළ. මැරුණේ, අපේ රටේ අලි සම්පත. තමුන්නාන්සේලා එවැනි විනාශකාරී ව්‍යාපෘතියක් තමයි කැඳවලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද උක් වගාව ආර්ථික වශයෙන් ශක්තිමත් ව්‍යාපෘතියක්ද කියන කාරණය මා ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා. මා පෙන්නුම් කරනවා, සරත් කොටගම මහත්මයා ඉතාමත් වැදගත් සමීක්ෂණයක් කරලා ඉදිරිපත් කරන ලද වාර්තාවක්. ඒ වාර්තාවට අනුව, ලෝකයේ වැඩියෙන්ම උක් වගා කරන රට බ්‍රසීලය. බ්‍රසීලයේ අඩුම ජීවන තත්ත්වයක් පවතින හා උක් වගා කරන දිස්ත්‍රික්ක අතර සම්බන්ධයක් තිබෙනවා. බ්‍රසීලයේ ජනතාවගෙන් අඩුම ජීවන තත්ත්වයක් උසුලන්නේ, උක් වගා කරන ප්‍රදේශවල ජීවත් වන ජනතාව. ඒ දෙක අතර ඍජු සම්බන්ධයක් තිබෙනවා. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ -UNDP- මානව සංවර්ධන දර්ශකයන්ට අනුව "ප්‍රනම්බුකෝ" කියන දිස්ත්‍රික්කයේ එම අගය සියයට 0.438යි. සීනි නිෂ්පාදනය කරන "අලගවුස්" කියන කලාපයේ එම අගය සියයට 0.358යි. සාමාන්‍යයෙන් ජීවන තත්ත්වය සියයට 0.5ට වඩා අඩුයි කියන්නේ, අසාධ්‍ය තත්ත්වයේ ප්‍රදේශ. බ්‍රසීලයේ මෙම කලාප දෙක වෙනම රටවල් ලෙස සැලකුවොත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝකයේ දුප්පත්ම රටවල් 20 අතරට "ප්‍රනම්බුකෝ" කියන ජනපදය ඇතුළත් වනවා. ඒ ඇයි? ප්‍රධාන වගාව, උක් වගාව. ඒ වාගේම ලෝකයේ දුප්පත්ම රටවල් 10 අතරට "අලගවුස්" කියන කලාපය පත් වනවා. ඒ අනුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට මෙම උක් වගාව කිසිසේත්ම භාජන වෙලා නැහැ. භාජන කළේ කොතැනකටද කියා මා ඔබතුමාට පෙන්නුම් කරන්නම්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උක් වගාවේ ආදායම කොහොමද එන්නේ කියා බලමු.

එදා කිව්වා, "මෙම සමාගම මිලියන 175ක් ආයෝජනය කරනවා." කියලා. අද කියනවා, ඒ ප්‍රමාණය ඩොලර් මිලියන 152ක් කියලා. හැබැයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උක් පර්යේෂණ ආයතන කියනවා, මේ ආයෝජනය අනුව සාමාන්‍යයෙන් මෙම ප්‍රදේශයෙන් හෙක්ටෙයාරයකට මෙට්‍රික් ටොන් 65ක උක් අස්වැන්නක් ගන්න පුළුවන් කියලා. හෙක්ටෙයාර දෙකකටම අස්වැන්න එන්නේ, මෙට්‍රික් ටොන් 130යි. අද තිබෙන වටිනාකම අනුව උක් මෙට්‍රික් ටොන් එකක් රුපියල් 5,000 ගණනේ විකුණන්න පුළුවන් කියා සිතමු. හෙක්ටෙයාර දෙකක් වගා කිරීම සඳහා මිනිසුන් 7දෙනෙක් අවශ්‍යයි. එනම්, හෙක්ටෙයාර දෙකක් වගා කිරීම වෙනුවෙන් මිනිසුන් 7දෙනෙකුගේ අවශ්‍යතාව තිබෙනවා.

එතකොට ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙට්‍රික් ටොන් 130 පන්දාහෙන් වැඩි කර හතෙන් බෙදුවාම, 92,857යි. ඒ කියන්නේ එක්කෙනෙකුගේ වාර්ෂික ආදායම රුපියල් 92,857යි. ඒ අනුව දෛනික ආදායම රුපියල් 254යි. මේ උක් සියල්ලම විකුණුවත්, සියල්ලම ආදායම ලෙස සැලකුවත්, කෙනෙකුට දවසකට රුපියල් 254යි හම්බුවෙන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අද තමුන්නාන්සේලා පැල්වත්තේ ගිහින් බලන්න. මා ළඟ තිබෙනවා, ඒ අයගේ පඩිනඩි ලේඛනය. තමුන්නාන්සේලා කියනවා, උක්වලින් ඒ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් වුණාය කියා. මා මේ පෙන්නුම් කරන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පැල්වත්තේ, නිෂ්පාදකයන් උක් විකුණා ලැබුණු ආදායමයි. පැල්වත්තේ, මෛත්‍රීනන්ද මහත්මයා උක් විකුණුවාට පස්සේ ලැබුණු ආදායම් වාර්තාව මෙසේයි; ඔහු උක් මෙට්‍රික් ටොන් 3.4ක් නිෂ්පාදනය කර තිබෙනවා. ඒ උක්වල වටිනාකම රුපියල් 1,34,892යි. ඔහුගේ වගාවෙන් ලැබුණු ආදායම රුපියල් 1,34,892යි. ඔහු ඒ රුපියල් 1,34,892ම කොම්පැනියට ගෙව්වාට පස්සේ තව ඔහු ණයයි, රුපියල් 12,318ක්. අඩුම තරමේ උක් ටික අරගෙන විකුණුවාට පස්සේ ඒ මහත්මයාට කොම්පැනියේ ණය ගෙවන්නවත් පුළුවන් වෙලා නැහැ. ඔහු කොම්පැනියට ණයකාරයෙක්. මා ළඟ තිබෙනවා, ඔහුගේ ආදායම් වාර්තාව. ඒ ආදායම් වාර්තාව අනුව එක කන්නයක් ඉවර වෙලා අනෙක් කන්නයට යනකොට පසුගිය කන්නයට ගිය වියදම කොම්පැනියට ගෙව්වාම ඉතිරි ණය ගෙවා ගන්න රුපියල් දෙළොස් දහස් තුන්සිය දහසයක් මදි.

තවදුරටත් මා ළඟ තිබෙනවා, අබේසිංහ මහත්මයාට උක් විකුණුවාට පස්සේ තිබෙන ආදායම පිළිබඳ වාර්තාවකුත්. ඔහු උක් විකුණා තිබෙනවා. අද වෙනකොට මොකද වෙලා තිබෙන්නේ? අවසානයේදී ඔහු රුපියල් 1,257ක ණයකරුවෙක් වී තිබෙනවා. තවත් ගොවි මහත්මයෙකුගේ ආදායම් වාර්තාවක් මා ළඟ තිබෙනවා. ඒ වාර්තාව අනුව උක් ටික විකුණුවාට පස්සේ ඔහුත් රුපියල් 31,300ක ණයකරුවෙක්. ඒ වාගේම මා ළඟ තිබෙනවා, ශාන්තිලතා මහත්මිය උක් විකුණුවාට පසුව ලැබුණු ආදායම පිළිබඳ වාර්තාවක්. ඇය කන්න කිහිපයක් ණය වෙලා තිබෙනවා. අද වෙනකොට ඇය කොම්පැනියට 2,93,921ක ණයකාරියක්. ඇය තව කන්න හත අටක් උක් වගාකර විකුණුවත් කොම්පැනියේ ණය ටික ගෙවා ගන්නට විධියක් නැහැ. එම නිසා කොහොමද ජනතාවගේ ජීවන තත්ත්වය උසස් වුණේ? ඊළඟට අබේසිංහ මහත්මයාගේ ආදායම් වාර්තාව මා ළඟ තිබෙනවා. ඔහු නම් පොඩි උක් තොගයක් විකුණා තිබෙන්නේ. රුපියල් 8,000යි, ආදායම ලබා තිබෙන්නේ. ඒ රුපියල් 8,000ම කොම්පැනියට ණය ගෙවා තිබෙනවා. ඒත් රුපියල් 1,45,000ක් ණය ගෙවන්නට තිබෙනවා. මේ ස්වාධීනව වැඩ කරගෙන සිටි ගොවි ජනතාව අද කොම්පැනිකාරයාගේ ණය කාරයන් බවට පත් වෙලා තිබෙනවා. මා ළඟ තිබෙනවා, මෛත්‍රානන්ද මහත්මයා උක් විකුණුවාට පස්සේ ලැබුණු ආදායම පිළිබඳ විස්තරයක්. ඔහු උක් විශාල ප්‍රමාණයක් එනම් මෙට්‍රික් ටොන් 88.2ක් නිෂ්පාදනය කර

තිබෙනවා. ඔහුගේ ආදායම රුපියල් 4,14,251ක්. නමුත් ඔහු ඒ මුළු ආදායමම කොම්පැනියට ගෙව්වාට පස්සේ ඔහු අදත් ණයයි, රුපියල් 2,17,510ක මුදලක්. උක් ටික ගන්නවා, කොම්පැනියට දෙනවා. අඩුම තරමේ කොම්පැනිය පොහොරවලට, බීජ වලට, හාන්න දුන් සල්ලි ටිකවත් ගෙවා ගන්නට නොහැකි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තවදුරටත් මා ළඟ තිබෙනවා, සිරියාවති මහත්මියගේ ආදායම් වාර්තාව. ඇය නිෂ්පාදනය කර තිබෙනවා, උක් මෙට්‍රික් ටොන් 23.29ක්; පිළිස්සුණු ඒවා මෙට්‍රික් ටොන් 13.1ක්. ඇය රුපියල් 1,54,000ක උක් නිෂ්පාදනය කර තිබෙනවා. ඇයට මොකද වෙලා තිබෙන්නේ? අදත් කොම්පැනියට රුපියල් 1,34,000ක ණයකාරියක්. මොකද මේ වෙලා තිබෙන්නේ? බ්‍රසීලයේත් උක් වගා කරන ප්‍රදේශවල තමයි අඩුම ජීවන තත්ත්වය තිබෙන්නේ. අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? අදත් පැල්වත්ත ආශ්‍රිත ගොවි ජනතාවගේ තත්ත්වය ගිහින් බලන්න. ඔවුන්ගේ ජීවිතවලට සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? ඔවුන් අදත් සමාගමේ ණයකාරයන් බවට පත් වෙලා තිබෙනවා. එම නිසා මේ සමාගමේ ණයකරුවන් බවට පත් වෙන එක හැර වෙන කිසිවක් මෙයින් සිද්ධ වෙලා නැහැ. හැබැයි තිබෙන ප්‍රශ්නය මොකක්ද ගරු නියෝජ කාරක සභාපතිතුමනි? ඉඩම් අක්කර දහස් ගණනක් තමුන්නාන්සේලා කොම්පැනිවලට දෙනවා.

2015 වර්ෂයේ, මේ ආණ්ඩුවට කලින් ආණ්ඩුව, ඩෝල් ලංකා සමාගමට පරිහරණය සඳහා දෙමෝදරින් හෙක්ටයාර් 200ක් - අක්කර 500ක්- දුන්නා. ඩෝල් ලංකා සමාගමට පරිහරණය සඳහා කුඩාවැවෙන් හෙක්ටෙයාර් 400ක් - අක්කර දාහක්- දුන්නා. ඒ අනුව මොනරාගල දිස්ත්‍රික්කයෙන් අක්කර 1,500ක් දුන්නා. හැබැයි මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාවගේ තත්ත්වය මොකක්ද?

මෙතැන තිබෙනවා, නිවාස සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් කළ සමීක්ෂණයක වාර්තාවක්. "මොනරාගල පවුල් 2,644කට ගෙයක් හදා ගන්නට තැනක් නැහැ. ඉලුක්, පොල් අතු, ඉටිරෙදි පැල්පත් 947ක්. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මොනරාගල කාර්යාලය හෙළි කරයි. " කියලා එහි සඳහන් වනවා. මොනරාගල දිස්ත්‍රික්කයේ ජීවත්වෙන පවුල් 2,644කට ගෙයක් හදා ගන්න ඉඩම් නැහැ. නමුත් තමුන්නාන්සේලා මොකද කරන්නේ? ගොවි ජනතාවට ඉඩම් දෙනවාය කියා ඒ ඉඩම් කොම්පැනිවලට ගැට ගහලා, තමුන්නාන්සේලා ගොවි ජනතාව කොම්පැනිවල වහල් ශ්‍රමිකයන්, කම්කරුවන් බවට පත් කර තිබෙනවා. හැබැයි මොනරාගල ජීවත් වෙන්න ගෙයක් නැති මිනිස්සු ඉන්නවා. මොනරාගල දිස්ත්‍රික්කයේ, 2,644කට ගෙයක් හදා ගන්නට ඉඩමක් නැහැ. හැබැයි, තමුන්නාන්සේලා ඉඩම් අක්කර දහස් ගණනක් කොම්පැනිවලට දෙනවා. කොම්පැනිවලට දෙනවා විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මා ඉතාම වග කීමෙනුයි කියන්නේ, ඌව පළාතේ විතරක් මේ සමාගම්වලට දීපු ඉඩම්වලින් අවුරුදු හත, අටක් තිස්සේ බදු ලැබිලා නැහැ. සතයක් බදු ලැබිලා නැහැ! හැබැයි, බදු ලැබිලා තිබෙන්නේ ඉහළ නිලධාරින්ට සහ දේශපාලකයන්ට. කොම්පැනිය ඉඩම ගන්නවා, දේශපාලකයාට බද්ද ගෙවනවා. කොම්පැනිය ඉඩම ගන්නවා, ඉහළ නිලධාරින්ට බද්ද ගෙවනවා. හැබැයි, කොම්පැනිවලට ජනතාවගේ සම්පත් පවරලා ජනතාවට සිදු වුණු සෙතක් නැහැ කියලා මතක තබා ගන්න. මේවා අපේ රටේ උපන්-නූපන් පරම්පරාවට අයිති ඉඩම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒක නිසා කිසිසේත්ම මෙම ඉඩම් සම්පත විවිධ සමාගම්වලට දෙන එක සුදුසු නැහැ. මම දැන ගන්න කැමැතියි, මේ විධියට ලබා දුන්නු සමාගම් මොනවාද කියලා. මේ සමාගම සිංගප්පූරුවේ සමාගමක්ය කියලා කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ගත්තා, විස්තරයක්. සිංගප්පූරුවේ ලියා පදිංචි කරපු විස්තරයක් තිබෙනවා, ඊට අමතරව කිසිවක් නැහැ. මේ සමාගම කොහෙන්ද ආවේ කියලා කියන්න. තමුන්නාන්සේලා කියනවා, සිංගප්පූරු සමාගමට මේකේ කොටස්වලින් සියයට 89ක් අයිතියි කියලා. හැම දාමත් මේ විනාශකාරී ව්‍යාපෘතිය පිටිපස්සේ හිටපු ලාංකීය සමාගමට සියයට 10ක් අයිතියි. මහවැලි අධිකාරියට සියයට 1ක් අයිතියි කියලා එක තැනක කියනවා. තව තැනක කියනවා, "සියයට 8ක් කොම්පැනියට අයිතියි, සියයට 10ක් ලංකාවේ සමාගමට අයිතියි, සියයට 1ක් ගොවි ජනතාවට අයිතියි, සියයට 1ක් මහවැලි අධිකාරියට අයිතියි." කියලා. මහවැලි අධිකාරිය කොම්පැනිවල කොටස් ගන්න එක නොවෙයි තිබෙන්නේ. ඒ පළාත්වල ඉඩම් සම්පත ජනතාවට කළමනාකරණය කරලා, ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම වෙනුවෙන් ඉඩකඩ ලබා දීම තමයි මහවැලි අධිකාරියේ කාර්ය භාරය විය යුතු වන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වෙනුවට සිදු වෙලා තිබෙන දේ මොකක්ද? මේ ඉඩම් සම්පත - පරිහරණය කරලා අපේ රටේ ජනතාවගේ ජීවිතය ඉස්සරහට ගෙන යන්න පුළුවන් වැදගත්ම සම්පත.- මෙතුමන්ලා සමාගම්වලට පවරමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රට කියලා කියන්නේ සම්පත් විශාල ප්‍රමාණයක් තිබෙන රටක් නොවෙයි. අපට මහා දැවැන්ත ආර්ථික සම්පත් නැහැ. අපේ රටේ වැදගත්ම සම්පත තමයි, ඉඩම් සම්පත. මේ ඉඩම් සම්පත ඉතා හොඳින් කළමනාකරණය කළේ නැත්නම්, මේ ඉඩම් සම්පත ඉතා හොඳින් අපි උපයෝගි කර ගත්තේ නැත්නම් මොකක්ද අපේ රටට සිදු වෙන්නේ? මේ රටේ ජනතාවගේ නිවාස අවශ්‍යතාව වෙනුවෙන්, ඔවුන්ගේ අනෙකුත් පරිහරණ අවශ්‍යතා වෙනුවෙන්, වන සංරක්ෂණය වෙනුවෙන්, වන ජීවීන්ගේ අවශ්‍යතා වෙනුවෙන්, ජල පෝෂක ප්‍රදේශ වෙනුවෙන් සහ වගාවන් වෙනුවෙන් ඉතා හොඳින් මේ ඉඩම් සම්පත කළමනාකරණය කළ යුතුව තිබෙනවා. අපි වන සම්පත ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ඉඩම් කළමනාකරණය කරන්න ඕනෑ. අපි වන සතුන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ඉඩම් සම්පත කළමනාකරණය කරන්න ඕනෑ. අපි ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම වෙනුවෙන් ඉඩම් සම්පත කළමනාකරණය කරන්න ඕනෑ. අපි මිනිසුන්ගේ නිවාස සහ අනෙකුත් අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත කළමනාකරණය කරන්න ඕනෑ. අපි නගර, පාරවල්, මං-මාවත් වෙනුවෙන් මේ ඉඩම් සම්පත කළමනාකරණය කරගන්න ඕනෑ.

අපේ රටේ තිබෙන්නේ වර්ග කිලෝමීටර් 65,610යි. අපේ රට, ලෝකයේ රටවල් අතර විශාල ජන ඝනත්වයක් තිබෙන රටක්. අපේ රටේ වර්ග කිලෝ මීටර එකක මිනිසුන් 343ක් ජීවත් වෙනවා. එය ඇමෙරිකාවටත් වඩා වැඩියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කැනඩාවේ ගත්තොත් වර්ග කිලෝ මීටරයක එකොළොස් දෙනයි ජීවත් වෙන්නේ. ඕස්ට්‍රේලියාවේ වර්ග කිලෝ මීටරයක තුන්දෙනයි ජීවත් වෙන්නේ. අපේ රටේ ජීවත් වෙනවා, 343ක්. අපේ රට, විශාල ජන ඝනත්වයක් තිබෙන රටක්. ඒක නිසා අපේ රටේ ඉඩම් සම්පත අතිශය වැදගත්. මේ වැදගත් ඉඩම් සම්පත කළමනාකරණයේදී මීට වඩා වැදගත් විධියට එය කළමනාකරණය කිරීම කෙරෙහි තමුන්නාන්සේලා අවධානය යොමු කළ යුතු නැද්ද?

මම තමුන්නාන්සේලාගෙන් අහන්නේ එක කාරණයයි. මේ විධියට ඉඩම් අක්කර දහස් ගණන් කොම්පැනිවලට ලබා දීලා වෙච්ච සෙත මොකක්ද? තමුන්නාන්සේලාට කියන්න පුළුවන්ද, පැල්වත්ත කර්මාන්තශාලාවෙන්, පැල්වත්ත ජනතාවගේ ජීවිතය උසස් වුණා කියලා. සෙවනගල කර්මාන්තශාලාවෙන්, සෙවනගල ජනතාවගේ ජීවිත උසස් වුණා කියලා? එහෙම උසස් වුණේ නැහැ.

[ගරු අනුර දිසානායක මහතා]

ඒක මතක තබා ගන්න. අදත් ඒ ජනතාව කොම්පැනිවල ණයකරුවන් බවට පත් වෙලා තිබෙනවා. ඩෝල් සමාගම කෙසෙල් වගා කළා. කෙසෙල් වගාකරුවන් ළඟ වැඩ කරපු කම්කරුවන්ගේ ජීවිත උසස් වුණාද? නැහැ. අපේ රටේ ඉඩම් අක්කර දහස් ගණනක් කෙසෙල් වගා කරන්න ඩෝල් සමාගමට දුන්නා කියලා ඒ ජනතාවගේ ජීවිත උසස් වුණේ නැහැ. කොම්පැනිකාරයන්ගේ සහ කොම්පැනිකාරයන්ගේ පගාවට, කොම්පැනිකාරයන්ගේ කොමිස් මුදලට, කොම්පැනිකාරයන්ගේ ධනයට යටත් වුණු දේශපාලකයෝ, කොම්පැනිකාරයන්ගේ ධනයට යටත් වුණු ඉහළ නිලධාරීන් විතරයි සංවර්ධනය වී තිබෙන්නේ. මෙයිනුත් සිද්ධ වෙන්නේ ඒකම තමයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රට ඉඩම් අඩු රටක්; වැඩි ජන ඝනත්වයක් තිබෙන රටක්. අපි අහන්නේ, එවැනි රටක් විසින් මෙවැනි දැවැන්ත ඉඩම් යට කිරීමේ ව්‍යාපෘතියක් කොම්පැනියක් හරහා අපි ලබා දිය යුතුද කියලායි. ඒක තමුන්නාන්සේලා අනුමත කරනවාද?

මා දැක්කා, මහින්ද අමරවීර ඇමතිතුමා හම්බන්තොට ඉඩම් පිළිබඳ ප්‍රශ්නයේදී , -එතැන අක්කර 15,000ක් පිළිබඳ ප්‍රශ්නයේදී- ඒ ගොවි ජනතාවගේ පැවැත්ම පිළිබඳවත්, ඔවුන්ගේ ගොවිතැන් කටයුතු සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය නහාසිටුවීම සඳහා මේ ඉඩම්වල අවශ්‍යතාව පිළිබඳවත් කථා කළා. හැබැයි, මෙතැන අක්කර 65,000ක්. කොම්පැනිය කියන කථාව වන්නේ ඒ ප්‍රමාණය අක්කර 65,000ක් නොවෙයි කියලායි. උක් මෙට්‍රික් ටොන් 80,000ක් හදන්න අක්කර 65,000ක් ඕනෑ බව 2006 තමුන්නාන්සේලාමයි කිව්වේ. මෙට්‍රික් ටොන් 80,000ක් හදන්න අක්කර 65,000ක් ඕනෑ කියලා 2009දී තමුන්නාන්සේලාමයි කිව්වේ. මෙට්‍රික් ටොන් 80,000ක් හදන්න අක්කර 65,000ක් ඕනෑ බව 2013දී තමුන්නාන්සේලාමයි කිව්වේ. අද තමුන්නාන්සේලා කියනවා, "නැහැ, අක්කර 50,000ක් ඇති" කියලා. අක්කර 50,000ක් වුණත් මේ රටේ ඉපදුණු මිනිසුන්ගේ ඉඩම්.

විශේෂයෙන්ම ඌව-වෙල්ලස්සේ ඉන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට එරෙහිව සටන් කරපු මුතුන් මිත්තන්ගෙන් පැවත එන, මහා සංස්කෘතියක්, ඉතිහාසයක්, ප්‍රෞඪත්වයක් තිබෙන ජනතාවක්. ඒ ජනතාව සිංගප්පූරු කොම්පැනියක වහල් කම්කරුවන් බවට පත් කරන්නට තමුන්නාන්සේලා ඉඩ දිය යුතුද? මා කියන්නේ, නැවත ආයෝජනයන් පිළිබඳ තමුන්නාන්සේලා කල්පනා කරලා බැලිය යුතු බවයි. ඇයි, තමුන්නාන්සේලාට බැරි? ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය අමාත්‍යතුමා එදා විවාදයේදී කිව්වා, මේ උක් වගාව වෙනුවෙන් කන්තලේ ඉඩම් වෙන් කරලා තිබෙනවා. කන්තලේ වාරිමාර්ග තිබෙනවා. කන්තලේ තිබෙනවා මහා ජලාශයක්. එහෙම නැත්නම්, ඒ හරියෙන් යනවා, මහවැලි ගඟේ අතු ගංගාවක් "කළු ගඟ" කියලා. ඒ කළු ගඟෙන් අවශ්‍ය නම් කන්තලේට වතුර ගෙනෙන්න පුළුවන්. ඒ නිසා වතුර ප්‍රශ්නයක් මතු වෙන්නේ නැහැ. ඉඩම් ප්‍රශ්නයක් මතු වෙන්නේ නැහැ. Factory එකක් තිබෙනවා. එතැන තමුන්නාන්සේලා දශක ගණනාවක් තිස්සේ,- [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

මම හිතන්නේ, දැනට මාස ගණනකට ඉස්සරලා රජයෙන් දීලා තිබෙනවා ආයෝජකයෙකුට ආයෝජනය කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මම අහන්නේ මෙච්චරයි. [බාධා කිරීමක්] ඔබතුමා කියන එක හරි. දැන් දීලා තිබෙනවා කියලා අපි උපකල්පනය කරමු. හැබැයි, තමුන්නාන්සේලා මේ සම්පත ගැන මෙවැනි උනන්දුවක් දැක්වුවේ නැහැ නේ? දැන් දශක කීයක්ද? අවුරුදු විස්සකට වඩා වැඩි කාලයක් මේ ඉඩම් සම්පත කැලෑවට ගිහින් තිබුණා. Factory එකේ machines දිරුවා. තමුන්නාන්සේලා ව්‍යාපෘතියක් හැදුවේ නැහැ, මේක ගොඩ ගන්න ඕනෑ, මේ කර්මාන්තශාලාව ඉදිරියට ගෙනෙන්න ඕනෑ,- [බාධා කිරීමක්] ඔව්. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

අපි උක් කර්මාන්තය භාර ගන්න කොට කන්තලේට ව්‍යාපෘති ගණනාවක් හැදුවා. එහෙම හැදුවේ නැත්තේ නැහැ. ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා. ඒකේ ඇත්ත තත්ත්වය ඒකයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මම කියන්නේත් ඒක තමයි. බැරි වුණේ වෙන මොකක්වත් නිසා නොවෙයි. ඒ කොම්පැනිවලින් ඇහුවා, කීයක් දෙනවාද කියලා. ඒකට මේ රටේ ජනතාව වග කියන්න ඕනෑද? තමුන්නාන්සේ ඒක දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි පහක කාලයක් තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔව්, මම කථාව අවසන් කරනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, හරි වැදගත් ලෙස කිව්වොත් ඔබතුමා දන්නවා, කන්තලේ සීනි factory එක ආරම්භ කිරීම සඳහා චීන සමාගමක් ආව බව. ඒ චීන සමාගමෙන් ඉස්සර වෙලාම ඇහුවේ, දෙන රැකියා ගණන ගැන නොවෙයි; හදන factory එක ගැන නොවෙයි; factory එකට යොදන සල්ලි ගැන නොවෙයි. "ඇමතිවරයාට කීයද?" කියලායි ඇහුවේ. ඒක තමයි සිද්ධ වුණේ. [බාධා කිරීමක්] ඔව්. ඊටත් වඩා උඩට. මම දන්නවා. මම 'ඇමතිවරයා' කියා කිව්වේ ටිකක් බේරෙන්නයි. එයාට කීයද කියලා ඇහුවා. මේ රටේ කර්මාන්ත පද්ධතියටයි, ඉඩම් සම්පතටයි සිද්ධ වුණේ ඕක තමයි. තමන්ට ලැබෙන කුට්ටිය මත තමයි සංවර්ධනය තීරණය වුණේ. මම අහන්නේ මේ ව්‍යාපෘතියත් ඊට වඩා වෙනස් වෙන්නේ කොහොමද කියලායි. පැරණි උදාහරණ දෙස බැලූ කලම මේ ව්‍යාපෘතියත් ක්‍රියාත්මක කිරීමේ යටි අරමුණ තිබෙන්නේ තමන්ට ලැබෙන කොමිස් කුට්ටිය මතයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පළාත විශාල දෙහි වගාවක් තිබෙන පළාතක්. හැබැයි, මොකක්ද වෙන්නේ? දෙහි කුණු වෙලා විසි කරනවා. හැබැයි, තමුන්නාන්සේලා දෙහි කල් තබා ගැනීම සඳහා දෙහි ඇඹුල් කර කල් තබා ගැනීමේ factory එකක් ගැන යෝජනා කරන්නේ නැහැ. එහෙම කළා නම් ඒ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් මට්ටමකට ගෙන එන්න පුළුවන්. බිබිලේ තිබුණු දැවැන්ත, ඉතාම රසවත් සහ වටිනාම දොඩම් සම්පත අද විනාශ වෙලා තිබෙනවා. කෘෂිකර්ම

දෙපාර්තමේන්තුව අදත් අනුමත කරලා තිබෙනවා, මේ පළාත්වල දොඩම්වලට ඉඩ තිබෙනවා කියලා. ඒ වාගේම තමයි රඹුටන්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගම්පහ වැනි පළාත්වල රඹුටන් හැදෙන වාරයට වඩා වෙනස් වාරයක තමයි මොණරාගල රඹුටන් හැදෙන්නේ. කාලයකට ඉහතදී රඹුටන් වගාව පිළිබඳ ව්‍යාපෘතියක් ගෙන ගියා. අද ඒ ව්‍යාපෘතිය කොහේද තිබෙන්නේ කියලා බැලුවොත්, අද ඒ රඹුටන් වගා ව්‍යාපෘතිය තිබෙන්නේ ධර්මදාස බණ්ඩා හිටපු අමාත්‍යතුමාගේ හේනේ -වත්තේ- විතරයි. ඒ පැළ ගොවි ජනතාවට බෙදුවේ නැහැ. අදත් ධර්මදාස බණ්ඩා හිටපු අමාත්‍යතුමාගේ ගෙදර රඹුටන් වත්තක් තිබෙනවා. හැබැයි, ඒ රඹුටන් ඒ පළාතේ හදන්න පුළුවන්. ඒ වාගේම රබර් කියන්නේත් ඒ පළාතේ පතුරුවන්න පුළුවන් වගාවක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ඒ පළාතට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද භෝග විශාල ප්‍රමාණයක් තිබෙනවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඒ භෝග පිළිබඳව තමුන්නාන්සේලා ව්‍යාපෘතියක් අරගෙන එන්න. ඒ ජනතාවගේ රඹුටන් වගාව ව්‍යාප්ත කරන්න. එහෙම නැත්නම් අඩුම තරමේ රබර් වගාව, එහෙම නැත්නම් දොඩම් වගාව එතැන ප්‍රචලිත කරන්න තමුන්නාන්සේලාට පුළුවන්. දෙහි කල් තබා ගැනීමේ ව්‍යාපෘතියක්, අන්නාසි වගාවක් ඇති කරන්න පුළුවන්. පාරිසරික වශයෙන් හිතකර, රටට හානි නොවන, ගොවි ජනතාවගේ ජීවන තත්ත්වයත් උසස් වන මෙවැනි ව්‍යාපෘති ගණනාවක් මෙම පළාත්වල ක්‍රියාත්මක කළ යුතුව තිබෙනවා. ඒ සඳහා හැකියාව තිබෙනවා. හැබැයි, තමුන්නාන්සේලා ඒ කිසිවක් ක්‍රියාත්මක කරන්නේ නැහැ. හැබැයි, තමුන්නාන්සේලා මේකට ඇතුළත් කරලා තිබෙනවා, උක් විතරක් නොවෙයි, ගිනිසීරියාත් වවන්න. ගිනිසීරියාවලින් විදුලිය හදන්න මහියංගනේ කර්මාන්තශාලාවක් හැදුවා; ක්‍රියාත්මක වෙනවාද? කල්පනා කරලා බලන්න.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ගිනිසීරියා වවලා විදුලිය හදන කර්මාන්තශාලා තුනක් තිබෙනවා. එකක්-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්. තුනක් තිබුණා. හැබැයි මතක තබා ගන්න, දෙකක් වැහුවා කියලා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඒ, මහියංගනයේ නොවෙයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හේවාහැට කර්මාන්තශාලාව වැහුවා. මා මේ කියන්නේ,-[බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඒ කියන්නේ, කර්මාන්තශාලා පහක් ආරම්භ කළා. දෙකක් වහලා තිබෙනවා. [බාධා කිරීමක්] මහියංගනයේ නොවෙයි, රටේම.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
හේවාහැට එකක් වහලා තිබෙනවා. [බාධා කිරීමක්] කර්මාන්ත ශාලා දෙකක් දැන් හොඳටම කරගෙන යනවා. බතලයායේ එකක් කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මා කියන්නේ එකක් වහලා තිබෙනවා කියන එකයි. මා ඒක සම්බන්ධයෙන් වාදයකට පැටලෙන්න යන්නේ නැහැ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්නකෝ. තමුන්නාන්සේලා ගොවි ජනතාවට හෙක්ටෙයාර් දෙකක් දෙන්න agreement එකක් ගහනවා, වගා කරන්න පුළුවන් උක් විතරයි කියලා. දැන් ගිනිසීරියාවලට වෙනම ඉඩම් දෙනවාද? කොහෙද මේකේ එහෙම සඳහනක් තිබෙන්නේ? කැබිනට් පත්‍රිකාවේ තිබෙන්නේ ගොවි ජනතාවට හෙක්ටෙයාර් දෙක බැගින් දෙනවා කියලා. හැබැයි, ගිවිසුමක් අත්සන් කරනවා උක් විතරයි වගා කරන්න ඕනෑ කියලා. තමුන්නාන්සේලා පත්තරවල දමනවා, " නැහැ, මේකේ ගිනිසීරියාත් හදනවා ලයිට් හදන්න, මේකේ කිරි ගවයින් පාලනය කරන්නත් දෙනවා, මේකේ තෘණ භූමිත් හදනවා" කියලා. හැබැයි, ඒ කිසිවක් කැබිනට් පත්‍රිකාවේ නැහැ. කැබිනට් පත්‍රිකාවේ පැහැදිලිව තිබෙන්නේ ගොවි ජනතාවට හෙක්ටෙයාර් දෙකක් දෙනවා, හැබැයි වගා කරන්න පුළුවන් වන්නේ උක් විතරයි කියලායි. මට කියන්න, ගිනිසීරියාවලට ඉඩම් දීලා තිබෙනවාද, වෙන් කරලා තිබෙනවාද කියලා. කිරි ගවයින් පාලනයට ඉඩම් වෙන් කරලා තිබෙනවාද කියලා කියන්න. කොතැනද ඉඩම් දෙන්නේ? එතකොට ගිනිසීරියාවලට ඉඩම් දෙන්නේ ගිනිසීරියා විතරක් හදන්න ඕනෑයි කියලා ගිවිසුමක් ගහලාද? කිරි ගවයින් පාලනයට ඉඩම් දෙන්නේ කිරි ගවයින් විතරක් ඇති කරන්න ඕනෑයි කියලා ගිවිසුමක් ගහලාද? එහෙම ඒවා නැහැ. ඒවා නිකම් ජනතාව දැනුවත් කිරීම සඳහා හදලා තිබෙන-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, වෙලාව අවසානයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලබන මාසයේ තුන්වැනි දා නැවත මහියංගනයේ ලොකු රැස්වීමක් කැඳවා තිබෙනවා, මේ මෙහෙයුම ඉස්සෙල්ලා වනජීවී සම්පත් සංරක්ෂණ ඇමතිතුමා හැටියට කටයුතු කරපු දැන් වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ ඇමතිතුමා හැටියට කටයුතු කරන අපේ ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා ඇමතිතුමාට භාර දෙන්න. මොකද, එතුමාට පුළුවන් වේවිලු, මේක ජනතාවත් එක්ක තල්ලු කර ගෙන යන්න. අපි සහතිකයක් දෙනවා, මේ ආකාරයේම විනාශකාරී ව්‍යාපෘති මේ රටට ගෙනැල්ලා රටේ පරිසර පද්ධතියටත්, රටේ ආර්ථිකයටත්, ජනතාවගේ ජීවන තත්ත්වයටත් කරන ලද හානිය නැවතත් කරන්න ඉඩ නොදෙන බවට. මේ ව්‍යාපෘතිය වෙනුවට ඒ ගොවි ජනතාවගේ ජීවිත උසස් කිරීම වෙනුවෙන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අනුමත කර තිබෙන, පරිසර පද්ධතිය ආරක්ෂා වන, ජෛව විවිධත්වය ආරක්ෂා කරන, ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා වන, වනගහනය ආරක්ෂා වන, අලි සහ මිනිස් ගැටුම් අවම වන, ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය උසස් වන ව්‍යාපෘතියක් තමුන්නාන්සේලා යෝජනා කරන්න. එවැනි ව්‍යාපෘතියක් සාර්ථක කර ගැනීම වෙනුවෙන් අපේ පැත්තෙන් සහය දෙන්න සූදානම්. හැබැයි, මෙවැනි ව්‍යාපෘතියකට අපි සහය දෙනවා වෙනුවට, මේක නතර කිරීම සඳහා ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගන්නා බව ප්‍රකාශ කරමින් මා නතර වෙනවා. බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
යෝජනාව ස්ථිර කිරීම, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඌව වෙල්ලස්ස ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙනෙන ලද මේ විශිෂ්ට යෝජනාව මා ඉතා කැමැත්තෙන් ස්ථිර කරනවා.

[අ.භා. 12.01]

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විවාදය ආරම්භයේදීම මා එක කාරණයක් සඳහන් කරන්න ඕනෑ. ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා අද දින "ලංකාදීප" පත්තරයේ තිබුණු වාර්තාවක් නිවැරදි කළා. ඒක මමත් තහවුරු කරනවා. ජනාධිපතිතුමාගෙන් එතුමා එහෙම ආයතන ඉල්ලීමක් සිදු කර නැහැ. අමාත්‍යාංශවලට ගැළපෙන්නේ නැති ආයතන ඉල්ලා තිබෙනවා, ඒවා දෙන්න යනවා කියලා වැරදි ප්‍රවෘත්තියකුයි ඒ පළ වෙන්නේ.

ඒ විතරක් නොවෙයි. "අද" පත්තරයේ මුල් පිටුවේම තිබෙනවා, "පළාත් සභාවලටත් හවුල් පාලනයක්" කියලා. ඒ වාගේම ප්‍රාදේශීය සභා, නගර සභා, මහනගර සභාවලටත් හවුල් පාලනයක් අනුගමනය කරන්න යනවායි කියලා සඳහන් වෙනවා. මේකත් සම්පූර්ණ අසත්‍ය ප්‍රවෘත්තියක්. මේ පිළිබඳව කිසිදු සාකච්ඡාවක් කර හෝ එහෙම වැඩ පිළිවෙළක් ඇත්තේ නැහැ. අපි එක්සත් ජනතා නිදහස් සන්ධානය විධියටයි තරග කරන්නේ. එහෙම හවුල් පාලනයක් ඇති වෙන්න අවස්ථාවක් නැහැයි කියන එකත් මා සඳහන් කරනවා. අපි ජයග්‍රහණය කිරීම වෙනුවෙන් අපි කටයුතු කරනවා. අපි එය ජයග්‍රහණය කරනවා.

අද දින වැදගත් සාකච්ඡාවක් පවතින වෙලාවේ ලැබී තිබෙන කෙටි වේලාව ඇතුළත මා කාරණා කිහිපයක් පිළිබඳව සඳහන් කළ යුතු වෙනවා. එකක් තමයි උක් කර්මාන්තශාලාව නැත්නම් සීනි නිෂ්පාදන කර්මාන්තශාලාව පිළිබඳව කථා කරන කොට මොන තත්ත්වයන් තුළ වුණත් අපට අමතක කරන්න බැහැ, පැල්වත්ත සහ සෙවණගල කර්මාන්තශාලා දෙකක් ආරම්භ වෙලා තිබෙනවා, ඒ කර්මාන්තශාලා දෙක හරහා සාධනීය ලක්ෂණ විශාල ප්‍රමාණයක් වාගේම අසාර්ථක වූ අවස්ථාත් අපට වාර්තා වෙලා තිබෙනවා කියන එක. ඒ වාගේම වැල්ලවාය නගරය නිර්මාණය වෙලා තිබෙන්නේ, ඒකේ සාර්ථකත්වය තිබෙන්නේ පැල්වත්ත සීනි කර්මාන්තශාලාව සහ ඒ වගාකරුවන් හරහාය කියන එකත් අපි සඳහන් කළ යුතු වෙනවා. සෙවණගල නගරය නිර්මාණය වෙලා තිබෙන්නේත් ඒ ආශ්‍රිතව ජනතාව ජීවත් වෙන්නේත් ඒ කර්මාන්ත දෙක ආශ්‍රිතවයි කියන එකත් අපි පිළිගන්නවා. ඒ විතරක් නොවෙයි. මේ රටට ගෙන්වන සීනි ප්‍රමාණය යම් ප්‍රමාණයකින් අවම කර ගන්න මේ කර්මාන්තශාලා දෙකම ප්‍රයෝජනවත් තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

අපි වාර්ෂිකව ඇමෙරිකානු ඩොලර් මිලියන 300ත් - 400ත් අතර මුදලක් සීනි ආනයනය කිරීම සඳහා වැය කරනවා. මේක අතිවිශාල මුදලක්. 2016 වර්ෂයේ විතරක් යූ එස් ඩොලර් මිලියන 343ක සීනි අපි මේ රටට ගෙනැල්ලා තිබෙනවා. අපේ රටේ මේ කර්මාන්තය කරගත හැකිව තිබියදී තමයි මේ රටට මේ තරම් සීනි ප්‍රමාණයක් ආනයනය කරන්නේ.

මේ වනකොට අපේ සීනි කර්මාන්තශාලා වැහිලා තිබෙන බව සඳහන් වුණා. හිඟුරාන සීනි කර්මාන්තශාලාව ආදී කර්මාන්තශාලා සියල්ලමත් දැන් පටන් ගන්න අවශ්‍ය බව මා හිතනවා. දැනටමත් ඒ කර්මාන්තශාලා පටන් ගන්න අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. සමහර කර්මාන්තශාලා පටන් අරගෙන තිබෙනවා. මේ රටට අවශ්‍ය සීනිවලින් සැලකිය යුතු ප්‍රමාණයක් මේ රට තුළ නිෂ්පාදනය කරලා, අපේ විදේශ විනිමය ඉතුරු කර ගැනීමත්, ඒ ආශ්‍රිතව රැකියා නිර්මාණය කර ගැනීමත් තමයි අපේ රජයේ බලාපොරොත්තුව බවට පත්වෙලා තිබෙන්නේ. [බාධා කිරීමක්] 2016 වර්ෂයේ යූ එස් ඩොලර් මිලියන 343ක සීනි ආනයනය කළා කියලා තමයි අපට දැනගන්න ලැබිලා තිබෙන්නේ. ඒ ප්‍රමාණය ඊට වඩා වැඩි වෙන්න පුළුවන්. මට ලැබිලා තිබෙන වාර්තාව අනුවයි මා කිව්වේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

යූ එස් ඩොලර් මිලියන 343ට වඩා වැඩියි.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

වෙන්න ඇති. සීනි ආනයනය කරන ප්‍රමාණය දැන් එන්න එන්නම වැඩිවෙලා තිබෙනවා. 2017 අවුරුද්ද වනකොට ඒ ප්‍රමාණය මීටත් වඩා වැඩි වෙනවා. මොකද, අද වෙළෙඳ පොළේ සීනිවල මිල වැඩිවෙලා තිබෙන නිසා. මේ අභියෝගයට අපට දිගින් දිගටම මුහුණ දෙන්න සිදු වනවා. ලෝකයේ රටවලින් සීනි වැඩියෙන්ම පාවිච්චි කරන රටක් තමයි අපේ රට. අපි ඒවායින් වාර්තා තියලා නේ තිබෙන්නේ. වැඩියෙන්ම බත් කන රට තමයි අපේ රට; අපේ රට තමයි වැඩියෙන්ම මිරිස් කන රට; අපි වැඩියෙන්ම පොල් කන රට; අපි වැඩියෙන්ම සීනි පාවිච්චි කරන රට. ඒවා නවත්වන්න කටයුතු කරන්න බැරි බව අපි දන්නවා. හැබැයි, මේ රටට ඒ හුඟක් දේවල් ගෙනැල්ලා තමයි අපි පාවිච්චි කරන්නේ. එයින් සීනි ප්‍රධානයි. අපි වැඩිපුර බත් කෑවාට කමක් නැහැ, අපේ රටේ වැඩිපුර නිෂ්පාදනයක් තිබෙන නිසා. හැබැයි, සැලකිය යුතු ප්‍රමාණයක් - වැඩිම ප්‍රමාණයක් - සීනි මේ රටට ගෙනැල්ලා තමයි අපි පාවිච්චි කරන්නේ. මේ සඳහා වැය වන අතිවිශාල ධනස්කන්ධය - විදේශ විනිමය ප්‍රමාණය - ඉතිරි කර ගැනීම පිළිබඳව සැලකිල්ලට ලක් කිරීම කෙරෙහි තමයි රජය වැඩිපුර උනන්දුවක් දක්වන්න ඕනෑ.

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කාරණා කීපයක් සඳහන් කළා. එතුමාට වැරැදි තොරතුරු ලැබුණාද කියන එක පිළිබඳව එතුමා නැවත සොයා බැලීම වැදගත් වනවා. අක්කර 65,000ක් අපි මේ කටයුතු සඳහා යොදා ගන්නේ නැහැ. අක්කර 40,000ක් තමයි දැනට මේ සඳහා ලබා දෙන්න කටයුතු කරන්නේ. මෙවැනි ව්‍යාපෘතියක් අවස්ථා කීපයකදී ආරම්භ කරන්න කටයුතු කරලා තිබෙනවා. 2006 අවුරුද්දේ මේ වාගේ ව්‍යාපෘතියක් පටන් ගන්න සූදානම් වෙලා තිබෙනවා. ඒ වාගේම 2009 අවුරුද්දේත් මේ වාගේ ව්‍යාපෘතියක් පටන් ගන්න සූදානම් වෙලා තිබෙනවා. ඒ දෙකටම වැඩිය රටට වඩා ඵලදායී ව්‍යාපෘතියක් බවට මේ ව්‍යාපෘතිය පත් කරන්න අපි කටයුතු කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔබතුමා අක්කර 40,000ක් කියලා කියනවා නම් අපි ඒක පිළිගන්න ලෑස්තියි. නමුත් 2006, 2009 අවුරුදුවල කැබිනට් පත්‍රිකා මා ළඟ තිබෙනවා. ඒ කැබිනට් පත්‍රිකා දෙකේම කියලා තිබෙනවා, "මෙට්‍රික් ටොන් 80,000ක් නිෂ්පාදනය කළ යුතුයි. ඒ

මෙට්‍රික් ටොන් 80,000 නිෂ්පාදනය කරන්න අක්කර 65,000ක් අවශ්‍යයි" කියලා. මෙවර කැබිනට් පත්‍රිකාවේ සඳහන් වෙලා තිබෙන්නේ මෙට්‍රික් ටොන් 80,000ක් නිෂ්පාදනය කරන්න ඕනෑ කියලායි. නමුත් ඒ සඳහා අවශ්‍ය ඉඩම් ප්‍රමාණය මෙවර කැබිනට් පත්‍රිකාවේ සඳහන් වෙලා නැහැ. ඉඩම් ප්‍රමාණය කොපමණද කියලා මේ වතාවේ කැබිනට් පත්‍රිකාවේ සඳහන් වෙලා නැහැ නේ. මේ වතාවේ කැබිනට් පත්‍රිකාවේ සඳහන්වෙලා තිබෙන්නේත් මෙට්‍රික් ටොන් 80,000ක් නම් අපි උපකල්පනය කරනවා, එදා මෙට්‍රික් ටොන් 80,000 නිෂ්පාදනය කරන්න අක්කර 65,000ක් අවශ්‍ය වුණා නම්, -

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

මම ඔබතුමාගේ උපකල්පනය පිළිබඳව වැරැද්දක් කියන්නේ නැහැ. මොකද, මාත් මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විධියට පත් වුණේ මීට දවස් කීපයකට පෙරයි. ඒ තනතුරේ වැඩ බාර ගන්නත් කලින් තමයි මා මේ විවාදයට සම්බන්ධ වෙන්නේ. ඒ අවස්ථා දෙකටම වැඩිය, අපේ රටට වාසිදායක වන විධියට තමයි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙන්නේ. ඔබතුමාම සඳහන් කළ ආකාරයට ඒ වෙලාවේ හෙක්ටෙයාර 3,000ක් කේන්ද්‍රීය වගාවට දෙන්න තීන්දු කරලා තිබුණා. නමුත් මේ වෙලාව එකම හෙක්ටෙයාරයක්වත් කේන්ද්‍රීය වගාවකට දෙන්න බලාපොරොත්තු වන්නේ නැහැ ඒක අපි ලබපු එක ජයග්‍රහණයක් කියලා මා කියනවා. ඒ වාගේම සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය හැටියට ලබා දෙන්න යන්නේ හෙක්ටෙයාර 149යි. හෙක්ටෙයාර 149ක් තමයි මේ වතාවේ ලබා දෙන්නේ. 2006 යෝජනාවටත්, 2009 යෝජනාවටත් වඩා අඩු ඉඩම් ප්‍රමාණයක් තමයි මේ වතාවේ ලබා දෙන්නේ. අනික් සියලු ඉඩම් ලබා දෙන්නේ ඒ ප්‍රදේශයේ ජනතාවට. ඒ අයට තමයි වගා කරන්න අවස්ථාව ලබා දෙන්නේ. එක් කෙනෙකුට හෙක්ටෙයාර දෙක බැගින් ලබා දෙන්න කටයුතු කරනවා.

ඒ අයට වාර්ෂිකව රුපියල් ලක්ෂ 9ක විතර ආදායමක් ලබාගන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. එයින් රුපියල් ලක්ෂ 5ක පමණ මුදලක් ලාභය ලෙස ලබාගන්න පුළුවන් වෙයි කියලා අපි උපකල්පනය කරලා තිබෙනවා. ඒක තවත් සරල විධියට කිව්වොත්, මේ තුළින් පවුල් 10,000ක පමණ ආර්ථික තත්ත්වය සරි කරන්න පුළුවන් තත්ත්වයට පත්කරන්න අපට පුළුවන්කම තිබෙනවා. දැනට දුප්පත්කම වැඩිම පළාතක් තමයි ඌව පළාත. ඒ පළාතේ ජනතාවට තමයි මෙහි සම්පූර්ණ වාසිය ලැබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිවන කර්මාන්තශාලාව තුළත් රැකියා නිර්මාණය වනවා. ඌව පළාතේ ජනතාවට තමයි ඒවායිනුත් වැඩි අවස්ථා ප්‍රමාණයක් ලැබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මතකයි, මීට අවුරුදු ගණනාවකට කලින් පැල්වත්ත කර්මාන්තශාලාව විදේශ රටක් විසින් පාලනය කරන කොට, රජයේ සේවයේ සිට පැල්වත්ත සීනි කර්මාන්තශාලාවේ වැඩ කරන්න ගිය පිරිසක් හිටපු බව. පැල්වත්ත සීනි කර්මාන්තශාලාව විදේශ සමාගම යටතේ පවතින කාලයේ රජයේ සේවයෙන් ලබා ගන්නවාට වඩා වැඩි වැටුපක් සීනි කර්මාන්තශාලාවේ සේවය කිරීමෙන් ඒ අය ලබා ගත්තා. මම දන්නා අපේ හිතවත් අයත් ඒ ආයතනය තුළ වැඩ කරලා ඔවුන්ගේ ජීවිතය සාර්ථක කරගන්න, වැඩි ආදායමක් ලබාගන්න කටයුතු කළා. මෙම කර්මාන්තශාලාව තුළිනුත් එවැනි අවස්ථාවක් උදාවෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ හරහා ඍජු සහ වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් නිර්මාණය කරගන්න හැකියාව ලැබෙයි කියලා අපි හිතනවා.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙම ගිවිසුම සම්බන්ධයෙන් කියපු කාරණය ගැන, -උක් පමණක්ම වගා කරන්න ඕනෑය කියන කාරණය- කිව්වොත්, ඒක ඉතාම පැහැදිලියි. යම් කෙනෙක් උක් කර්මාන්තශාලාවක් ආරම්භ කරනවා. නමුත් ඒ අය එම කර්මාන්තශාලාව සඳහා ඉඩම් ලබාගැනීමක් කරන්නේ නැහැ. එතකොට ඒ අයට උක් වගා කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ ප්‍රදේශයේ පොල් වගා කරනවා නම් කවුරුවත් උක් කර්මාන්තශාලාවක් ආරම්භ කරන්නේ නැහැ. ඒක තමයි සාමාන්‍ය ව්‍යාපෘතියක ස්වභාවය. මහවැලි ව්‍යාපාරය ආරම්භ කරනකොට කුඹුරු ලබාදුන්නා; ඉඩම් ලබා දුන්නා. ඒවායේ වී පමණයි වගා කරන්න පුළුවන්. ඒ ඉඩම් ගොඩ කරලා ගෙවල් හදන්න ඉඩ දෙන්නේ නැහැ. ඒ ඉඩම්වල පොල් වගා කරන්න ඉඩ දෙන්නේ නැහැ. රජයේ අවසරය මත පමණයි අතිරේක බෝග වගාවක් හෝ වෙනත් වගාවක් කරන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඕනෑම කර්මාන්තශාලාවක් එනවා නම්, ඒ කර්මාන්තශාලාවට අවශ්‍ය ධාරිතාව එළියෙන් ලබා දෙන්න ඕනෑ, ඒ Agreement එකේ තිබෙන විධියට. ඒ කාරණය නොවෙයි මම මතු කරන්නේ. මම මතු කරන්න හැදුවේ, මේ කර්මාන්තශාලාවට ඉඩම් ලබා නොදුන්නාට, ඒ ඉඩම් දෙන්නේ ගොවීන්ට කියලා කිව්වාට, ඇත්තටම ඉඩම ගොවීන් සතුව තිබුණාට වක්‍රාකරයෙන් කොම්පැනියට බැඳිලා තිබෙනවා. ඒ ගැනයි මම තර්කය ගෙනාවේ. සීනි කර්මාන්තශාලාවක් ආවාට, ඒ පළාතේ උක් නැත්නම් වැඩක් නැහැනේ. ඒ ගැන Agreement එකක් තිබෙන්න ඕනෑ. ඒ ගැන නොවෙයි මම කියන්නේ. ගොවීන්ගේ ඉඩම් කිව්වාට, ඇත්තටම අවසානයේ වක්‍රාකාරයෙන් ගොවීන් සහ ඉඩම් සමාගමට බැඳිලා තිබෙනවා කියන එකයි මගේ තර්කය.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

හරි. ගොවීන් මේ ඉඩම් වගා කරනවා. මම අලුතින් වගකීම භාරගන්නා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයත් සමහර ප්‍රදේශවල ඉඩම් වැඩිම ප්‍රමාණයක් දීලා තිබෙන්නේ කුඹුරු වගාවට. තවත් ප්‍රදේශවල දීලා තියෙනවා අතිරේක බෝග වගාවට. ඊට පරිබාහිරව කටයුතු කරන්න ඉඩ දෙන්නේ නැහැ. ඒ ඉඩමක පොල් හිටුවන්න අවසරයක් ඉල්ලුවාට කිසිසේත් දෙන්නේ නැහැ. ඒ ඉඩමක වෙනත් වගාවක් කරන්න කටයුතු කරනවා නම්, මහවැලි අධිකාරියේ අනුමැතිය සහිතව තමයි ඒ කටයුත්ත කරන්නේ. ඒ නිසා මේ ප්‍රදේශවල ජනතාව පීඩනයට පත් වෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ. ඒ අයට ඊට වඩා ඵලදායී කටයුත්තකට ඉඩමක් යොදා ගන්න පුළුවන් නම් ඒ ගැනත් සාකච්ඡා කරලා තීන්දු කර ගැනීමේ හැකියාවක් අපට තිබෙනවා. හැබැයි, අපි අවංකව පිළිගත යුතුව තිබෙනවා, කවුරු හරි උක් වගාව ඉලක්ක කරගෙන සීනි කර්මාන්තශාලාවක් ආරම්භ කරනවා නම් සහ අපි ඒ අයට යම් ඉඩම් ප්‍රමාණයක් වෙන් කරලා දෙන්නේත් නැත්නම්, ගොවි ජනතාවට දෙන ඉඩම්වල උක් වගා කිරීමේ අවශ්‍යතාව තිබෙන බව. ඉතින් මේ කාරණය අපි පිළිගන්න ඕනෑ. ඒ නිසා මම ඉතාම පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ, මේ ව්‍යාපෘතිය තුළ රජයට යටි අරමුණක් නැහැ කියන කාරණය. ජනාධිපතිතුමා මේ පිළිබඳව ඉතාම සංවේදීව කල්පනා කරලා තිබෙනවා. ඒ වාගේම රජය මේ පිළිබඳව පුළුල්ව සාකච්ඡා කරලා තිබෙනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු අමාත්‍යතුමනි,-

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු මන්ත්‍රීතුමා, මට ලබා දුන් විනාඩි 13 අවසන්වී ගෙන යනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු ඇමතිතුමනි, මේ කොම්පැනිය ඉදිරිපත් කරපු Annual Profit and Monthly Income කියන මේ Report එකේ ගොවියෙකු ලබන ලාභය පිළිබඳව ඒ කොම්පැනිය සඳහන් කරනවා, රුපියල් 448,540යි කියලා. Monthly income එක පෙන්වලා තිබෙනවා රුපියල් 37,378යි කියලා. ඔබතුමා ඔය කියන රුපියල් ලක්ෂ 9 කියන එක වාර්තාවේ කොහේද තිබෙන්නේ?

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමා වැරැදියි නේ. මම කිව්ව දේ ඔබතුමා අහගෙන ඉන්න ඇති. මම කිව්වේ, රුපියල් ලක්ෂ 9ට ආසන්නව මුළු ආදායම ලැබෙනවා, ඒකෙන් ලාභය විධියට රුපියල් ලක්ෂ 5ක් පමණ ලැබෙනවා කියලා. ඔබතුමා කියන විධියට ඒක සුළු ගණනක වෙනසක් නම් මම ඒක පිළිගන්නම්. මොකද, ඉතා සුළු ගණනක වෙනසක් පිළිබඳව නේ ඔබතුමා කථා කරන්නේ. [බාධා කිරීමක්] නැහැ. මම කිව්වේ රුපියල් ලක්ෂ 5ක් කියලා. ඔබතුමා කීයද කියන්නේ?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඒ ගොල්ලන් කියනවා, monthly income එක 37,378යි, ලාභය 448,540යි කියලා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මම ඔබතුමා කියන කාරණය පිළිගන්නවා. ආදායම රුපියල් 448,000යි. මම කිව්වේ රුපියල් ලක්ෂ 5ට ආසන්නව කියලා. හැබැයි, මේ තුළ තවත් ආදායම් ලබා ගන්න වෙනත් විකල්ප මාර්ග තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමා,-

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මට නියමිත කාලය අවසන් වෙගන යනවා. මම ඔබතුමන්ලා කියන කාරණය පිළිගන්නවා. රුපියල් 44,8540ක් කියනවා නම්, මම ඒක පිළිගන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු අමාත්‍යතුමනි, දැන් මේ කොම්පැනියේ වාර්තාව නේ මේ තියෙන්නේ. දැනට පැල්වත්ත සහ සෙවණගල කර්මාන්තශාලා ක්‍රියාත්මක වෙන නිසා, ඔබතුමන්ලා එවැනි ආයතනයක ආදායම් වාර්තා අරගෙන සංසන්දනය කරලා පෙන්නුවා ද? මම ආදායම් වාර්තා පෙන්නුවා නේ. හැම කන්නයකදීම ගොවියා කොම්පැනියට ණයයි. ඒ නිසා ආදායම් වාර්තා අරගෙන ඔබතුමා පෙන්වන්න.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මට වේලාව ලබා දුන්නොත් ඒවා පෙන්වන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව කොපමණ වේලාවක් තිබෙනවාද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, you have one more minute.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
සෙවණගල කරපු වගාවටත්, පැල්වත්තේ කරපු වගාවටත් වඩා හොඳ තත්ත්වයේ උක් වගාවක් කරන්න තමයි මෙහිදී බලාපොරොත්තු වන්නේ. වැඩි අස්වැන්නක් ගන්න පුළුවන්, වැඩි ආදායමක් ගන්න පුළුවන් වගාවක් කිරීම තමයි මේ කර්මාන්තයේ බලාපොරොත්තුව. කර්මාන්තයේ නිෂ්පාදන වියදම අඩු කරලා, ආදායම වැඩි කර ගැනීමේ පරමාර්ථයකුත් ක්‍රියාත්මක වෙනවා.

මට නියමිත අවසාන විනාඩියයි දැන් තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විනාඩිය තුළ මම මේ කාරණය කියන්න කැමැතියි. අපි රජය විධියට රැකියා අවස්ථා නිර්මාණය කරන්න ඕනෑ. අපි රජය විධියට මේ ජනතාවගේ ආදායම වැඩි කරන්න ඕනෑ. ඔබතුමන්ලාම සඳහන් කරන විධියට වී ගොවියාට අද වී වගාව කරලා මේ වාගේ ලාභයක් ලබා ගන්න බැහැ. අපි දන්නවා, එච්චර ලාභයක් ලැබෙන්නේත් නැති බව. ඒ ප්‍රදේශයේ ජීවත්වෙන පුද්ගලයකු හැටියට මා ඒ බව දන්නවා. හැබැයි, ඊට වැඩිය ආදායමක් මේ තුළින් ලබා ගන්න පුළුවන්. ඒ වාගේම මේ වගාව කරන කාලය තුළ ඒ අයට වෙනත් රැකියාවල යෙදීමේ හැකියාවකුත් තිබෙනවා. මේ වගාව දිනපතා නඩත්තු කරන්න ඕනෑ නැහැ. කුඹුරට ගිහිල්ලා දවස ගණනේ වතුර බඳිනවා වාගේ නඩත්තු කරන්න ඕනෑ නැහැ. ඒ වාගේම තෙල් ගහනවා වාගේ මහන්සියක් වෙන්න ඕනෑ නැහැ. ඒ නිසා වෙනත් විකල්ප රැකියාවල යෙදෙන්න මේ අයට පුළුවන්. ඒ නිසා අනිවාර්යයෙන්ම රුපියල් ලක්ෂ 5 ඉක්මවූ ආදායමක් ලබා ගැනීමේ හැකියාව මේ අයට තිබෙනවා. ඒ වාගේම මේ ප්‍රදේශ තුළ පශු සම්පත ඇති කරන්නත් පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම මුල් කාලයේ වෙනත් බෝග වගා කිරීමේ හැකියාවත් තිබෙනවා. ඒ නිසා මේ ව්‍යාපෘතිය ගැන අපි ඉතාම හොඳින් සොයා බලනවා. පරිසරය පිළිබඳවත් අපේ අවධානය යොමු කරලා, සියලු අනුමැතිය අරගෙන තමයි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන්නේ කියන කාරණය මම සඳහන් කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, ජූනි 05වෙනි දාට මුල් ගල් තැබීමේ කටයුත්තක් සූදානම් කරලා තිබුණා. එය සිද්ධ වෙනවාද?

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
දැනට බලාපොරොත්තු වෙන්නේ වැඩ පටන් ගන්න. මුල් ගල කියන එක-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ජූනි 05 දින මේ කර්මාන්තශාලාව ගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් ආරම්භ කරන්නයි සිටියේ. එතකොට ඒක

ඔබතුමා කියනවා වාගේ, "කොහොමත් පටන් ගන්නවා" වාගේ එකක් නොවෙයි නේ. ගරු ජනාධිපතිතුමා සහභාගිවෙලා උත්සවයක් පවත්වලා කර්මාන්තශාලාව ආරම්භ කරන්නට කටයුතු කරනවා කියලා තිබුණා. ජුනි 05 එය සිද්ධ වෙනවාද?

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු ජනාධිපතිතුමා එදිනට සම්බන්ධ වන්නේ නැහැ. නමුත් කර්මාන්තශාලාව පටන් ගැනීමේ කටයුත්ත ක්‍රියාත්මක වේවි. ගරු මන්ත්‍රීතුමා, මුල් ගල තැබීම හෝ උත්සවය කියන එක අපි අදාළ කර ගන්නට ඕනෑ නැහැ. අපි ඒවායින් අමාරුවේ වැටිලා තිබෙනවා නේ. ඔය මුල් ගල් තියන්නට ගිහින් අපි අමාරුවේ වැටිලා තිබෙනවා. අපි ඔබතුමා කියන කාරණා සැලකිල්ලට ගන්නම්. අපි ඒවා බැහැර කරන්නේ නැහැ. ඔබතුමා කියන පාරිසරික ප්‍රශ්න, ඔබතුමා කියන ගැටලු ගැන අපි නරක විධියට හිතන්නේ නැහැ. ඔබතුමන්ලා රටට බොහොම ආදරෙයි, ඒ වාගේම මේ පිළිබඳව බොහොම සංවේදියි. අපි මේවායේ තිබෙන හොඳ කාරණා පිළිබඳව සැලකිලිමත් වෙලා යම් අඩු පාඩුවක් තිබෙනවා නම් ඒවාත් නිවැරදි කරගෙන සාධාරණ විධියට, ජනතාවට හිතකර විධියට මේවා පටන් ගන්නට කටයුතු කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 12.18]

ගරු හරින් ප්‍රනාන්දු මහතා (විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு ஹரின் பர்னாந்து - தொலைத்தொடர்புகள் மற்றும் டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. Harin Fernando - Minister of Telecommunication and Digital Infrastructure)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ විසින් ගෙන එන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට සම්බන්ධවීමට අවස්ථාව ලැබීම ගැන ඌව පළාත නියෝජනය කළ මන්ත්‍රීවරයකු හැටියටත්, ඒ පළාතේ හිටපු ප්‍රධාන අමාත්‍යවරයා හැටියටත් මම සතුටු වෙනවා. මේ රිදීමාලියද්ද කියන ප්‍රදේශය පිළිබඳව හොඳින් දන්නා ඒ ප්‍රදේශයේ මන්ත්‍රීවරුන් දෙපොළක්ම මේ අවස්ථාවේ ගරු සභාවේ රැඳී සිටිනවා. මහියංගනය ආසනය නියෝජනය කරන ගරු තේනුක විදානගමගේ මන්ත්‍රීතුමාත්, ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මන්ත්‍රීතුමාත් සභාවේ ඉන්නවා. මේ ප්‍රදේශය ගැන ගරු සභාවේ සිටින කාටත් වඩා හොඳ අවබෝධයක්, හැඟීමක් ඒ දොපොළට තිබෙනවා කියලා මම හිතනවා. මේ ප්‍රදේශයේ ජීවත් වන ජනතාව ගැනත්, මේ ජනතාව එදිනෙදා ජීවත් වන ආකාරය ගැනත් ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා මොන ආකාරයෙන් කරුණු පෙන්වා දෙන්නට හැදුවත්, මේ දොපොළ හදවතින්ම කථා කරනවා නම්, එහි ඇත්ත තත්ත්වය පිළිබඳව කියයි. දේශපාලන වාසියක් ගැනීමේ අරමුණින් නොවෙයි, එතුමන්ලා හදවතින්ම කථා කරනවා නම් එහි ඇත්ත තත්ත්වය මොකක්ද කියලා කියයි.

සමන්ත විද්‍යාරත්න මන්ත්‍රීවරයා මගේත් හොඳ මිත්‍රයෙක්. ඒ වාගේම ඒකාබද්ධ විපක්ෂයත් මේකට joint එකක් ගහගෙන තිබෙනවා. මොකද, දේශපාලන වාසියක් ගන්න. මම අද උදේ සභාවට එන විට මෙතුමා සඳහන් කළ ඔය ඇකිරියන්කුඹුර කියන ප්‍රදේශයෙන් තරුණයෝ කිහිප දෙනෙකු කථා කරලා මට කිව්වා, මේ සීනි කර්මාන්තශාලාවට විරුද්ධව හෙට උද්ඝෝෂණයක් ලැහැස්ති කරන්න හදනවා කියලා. වෙන කිසිම හේතුවක් නිසා නොවෙයි, මේ තිබෙන්නේ දේශපාලන වෛරයක් විතරයි.

ගරු අනුර දිසානායක මන්ත්‍රීවරයා කියන්නේ මම බොහොම ආදරය කරන, ගරු කරන චරිතයක්. නමුත් දැන් මෙතුමාත් අහන්නේ, -ඉස්සර අපෙන් අහනවා වාගේ- "හරකාගේ පුල්ලි කීයද, මූට පියාඔන්න පුළුවන්ද, පියැඹුවාම මූ වැටෙයිද, හති කොච්චර වැටෙයිද, වතුර කොච්චර බොන්න පුළුවන්ද" කියලායි. මොන ලජ්ජා නැති කථාවක්ද? රිදීමාලියද්ද කියන්නේ ලංකාවේ තිබෙන දුප්පත්ම දෙවැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය. ලංකාවේ තිබෙන පළමුවැනි දුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සියඹලාණ්ඩුව. දෙවැනි එක රිදීමාලියද්ද, තුන්වැනි එක කන්දකැටිය. මේ තුනම තිබෙන්නේ ඌව පළාතේ. ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ, සේවකයන් 25දෙනෙකුට වඩා වැඩ කරන කර්මාන්තශාලා තිබෙන්නේ 80යි. මොනරාගල දිස්ත්‍රික්කයේ තිබෙන්නේ 25යි. එහෙම තිබෙන ප්‍රදේශයකට කර්මාන්තශාලාවක් එනකොට සතුටු නැද්ද?

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කියනවා නම් ප්‍රශ්නයක් තිබෙනවා කියලා, අපි සාකච්ඡා කරමු. මේවා ගැන සාකච්ඡා කිරීම සම්බන්ධයෙන් කිසිම ප්‍රශ්නයක් නැහැ. මම ඔබතුමා කියපු සියලුම කාරණා පිළිගන්නවා. මෙතුමා කිව්වා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් මෙහෙම කථාවක් කියනවා කියලා. අනේ! වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සමහර නිලධාරින් ලියුමක් ලියන්න අවස්ථාවක් එනකම් බලාගෙන ඉන්නවා, "මේක නොකරන්" කියලා. එහෙම "නොකරන්" කිව්වාම තමයි ඒගොල්ලන්ට පොඩි market එකක් එන්නේ. අනේ! සමන්ත විද්‍යාරත්න මහත්මයා එතකොට දුවලා ගිහින් කොහොම හරි ඒ ලියුම ගන්නවා. ඒක තමයි එයාගේ ක්‍රමය. උමා ඔය ව්‍යාපෘතිය සම්බන්ධයෙනුත් සමන්ත විද්‍යාරත්න මහත්මයා තරම් එතැනට ගිහින් මහන්සි වුණු වෙනත් කෙනෙක් නැහැ. හැබැයි අපි සමන්ත විද්‍යාරත්න මහත්මයා කියපු හැම දෙයක්ම ඇහැව්වා. එතුමා කියපු හැම දේකටම ගිහින් සහභාගි වුණා. ඒ ගමට ගිහිල්ලා කරන්න ඕනෑ හැම දෙයක්ම කරන්න, ලබා දෙන්න උත්සාහ කළා. දියුණුවක් සිදු කරන්න උත්සාහ කරන අවස්ථාවක ඒ දියුණුව වෙන්න ඉඩ නොදෙන්නේ ඇයි කියලායි අපි අහන්නේ. ඇමෙරිකානු ඩොලර් මිලියන 152ක ආයෝජනයක් බදුල්ල දිස්ත්‍රික්කයට කවදාවත් ඇවිල්ලා නැහැ. ඇමෙරිකානු ඩොලර් මිලියන 152ක් කියන්නේ විශාල මුදලක්. හම්බන්තොට වරායේ පළමුවෙනි අදියරට ගියේ ඇමෙරිකානු ඩොලර් මිලියන 330යි. අපේ බදුල්ල දිස්ත්‍රික්කයේ රිදීමාලියද්දට ඇමෙරිකානු ඩොලර් මිලියන 152ක කර්මාන්තශාලාවක් එනවා නම්, ගරු තේනුක විදානගමගේ මන්ත්‍රීවරයා කවදාවත් විරුද්ධ වන එකක් නැහැ කියලා මම හිතනවා. ඒකෙන් කාට හරි වාසියක් සිදු වෙනවා නම් අපි දේශපාලන වශයෙන් හිතන එක අත් හැරලා, යම් අඩු පාඩුවක් තිබෙනවා නම් එය නිවැරදි කර ගන්නට කටයුතු කරමු.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා අද තරුණයන් ගැන කථා කළා. රිදීමාලියද්දේ තරුණයන් මොනවාද කරන්නේ? ඒ අය ගොවිතැන් කරනවාද? ඔබතුමා දන්න මඟුලක් ගැන කථා කරන්න. ඒ පැත්තේ තරුණයෝ ගොවිතැන් කරන්නේ නැහැ. ඔක්කොම අය කොළඹ ඇවිත් සිමෙන්ති අනනවා. ඔවුන් මෙහේ ඇවිත් සිකියුරිටි අංශයේ රක්ෂා හොයනවා. ඒ කාලයේ ඒ පැත්තේ කොල්ලෝ ඔක්කොම හමුදාවට ගියා. දැන් තරුණයෝ ගොවිතැන් කරන්න යන්නේ නැහැ. හේන් ගොවිතැන පාඩුයි. තාත්තා කොටපු කුඹුරට පුතා බහින්නේ නැහැ. තාක්ෂණය නැහැ. අඩු පාඩු ගොඩයි. එහෙම නම්, අලුත් තාක්ෂණය යොදා ගනිමින් මෙවැනි වගාවක් එක්ක කර්මාන්තශාලාවක් එන එක හොඳ නැද්ද? ඒ වාගේම එතුමා කිව්වා, "මේකට අක්කර මෙච්චර, අච්චර ගන්නවා" කියා. එතුමා මේ ඔක්කොම දේවල් කිව්වා. අලුත් තාක්ෂණයත් එක්ක ඒ තරම් අවශ්‍ය වන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය ඇමතිතුමනි, ඉස්සර අපිත් ඔබතුමාට "සීනි ඇමති" කියා විහිළු කළා තමයි. නමුත්, ඔබතුමා මේ subject එක ගැන දන්නවා. මොකක්ද වෙන්නේ, කොහොමද

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

වෙන්නේ කියා එතුමා ඔබතුමන්ලාට කියාවි. අපි හොයමු. මේ ආණ්ඩුව තුළ මිනිසුන්ගේ ඉඩම් අරගෙන ඔවුන්ව අපහසුතාවට පත් කරන්න අපට වුවමනාවක් නැහැ. ඒ මොන හේතුවකටද? මොන මිනිහෙකුගේ ඉඩමක් අරගෙන අපි මොන වාසියක් ගන්නද? අපි ඒ ඉඩම වෙන මිනිහෙකුට විකුණලා කොමිස් ගන්නද? අපි කොමිස් ගන්නේ කොහොමද? මම නියෝජනය කරන්නේ එක පක්ෂයක්, අපේ ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය ඇමතිතුමා නියෝජනය කරන්නේ තව පක්ෂයක්. අපේ ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය ඇමතිතුමා කොමිස් ගන්න කොට මම බලාගෙන ඉඳිවිද? මම කොමිස් ගන්න කොට එතුමා බලාගෙන ඉඳිවිද? එහෙම වුණොත් වැඩේ මාට්ටු වෙනවා නේ. මේක ඇතුළේ එහෙම කරන්න බැහැ. ඒක හොඳට මතක තියාගන්න. ඔබතුමන්ලාට හරි ආසාවක් තිබෙනවා ඉස්සර ආණ්ඩුව වාගේ අපවත් ලසු කරන්න. එහෙම කරන්න අමාරුයි. ඒ නිසා මේ ගැන ඔබතුමන්ලා හොඳින් කල්පනා කරලා බලන්න. මේ හැම දේකම අඩුවක් හොය හොයා කථා කරන්න එපා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, එහෙම නම් අපටත් ඔබතුමන්ලාගේ කාලයේ කළ ඒවා ගොඩක් කියන්න පුළුවන්. එහෙම නම් ඒ කාලයේ බදුල්ල දිස්ත්‍රික්කයේ තේ කර්මාන්තශාලා කීයක් විනාශ වුණාද? බස් කීයක් විනාශ වුණාද? අප ඒ පරණ අතීතය අමතක කර තිබෙන්නේ. ඒ අතීතය අමතක කරලා අප අලුතින් හිතන්න, අලුතින් දකින්න පටන්ගෙන තිබෙනවා. අලුත් වෙනසක් වෙන්න කියා ප්‍රාර්ථනා කරන්න පටන්ගෙන තිබෙනවා. අපේ පළාත දියුණු වෙන්න ඕනෑය කියා අප හිතා තිබෙනවා. එහෙම නැතිව මේ වැඩ ටික කරන්න හම්බ වන්නේ නැහැ.

මේ ඉඩම් අපි කුණු කොල්ලයට දුන්නේ නැහැ. කුණු කොල්ලයට ඉඩම් දීපු ඒවා ගැන විස්තර කියනවා නම් මට ඒ ගැන ලැයිස්තුවක්ම ඉදිරිපත් කරන්න පුළුවන්. ඒත් මම ගිය ආණ්ඩුව කළ වැරැදි ගැන කියන්න යන්නේ නැහැ. ඒක වැඩක් නැහැ. ඒක නොවෙයි අවශ්‍යතාව. කාටද දුන්නේ? අනූනව අවුරුදු බද්දටද දුන්නේ? තිස්තුන් අවුරුදු බද්දටද දුන්නේ? සින්නක්කරවද දුන්නේ? ඒවා ගැන නොවෙයි අප සෙවිය යුත්තේ. කඩදාසි කර්මාන්තශාලා විකුණපු හැටි, ඇඹිලිපිටියේ වික්කේ කොහොමද, අනෙක් පැතිවල වික්කේ කොහොමද කියා අපට ඒ සියලුම විස්තර කියන්න පුළුවන්. නමුත්, ඒවා අවශ්‍ය නැහැ. ගිය දේවල් ගියා. අපි අලුතින් අවස්ථාවක් ලබා ගනිමු. රිදීමාලියද්ද කියන්නේ දියුණු විය යුතුම පැත්තක්. රිදීමාලියද්දේ තිබෙන ප්‍රශ්න ගැන දන්නේ අප විතරයි.

දැන් මේ ගරු සභාවේ ඉන්න ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය ඇමතිතුමා, ගරු සුමේධා ජී. ජයසේන නියෝජ්‍ය ඇමතිතුමිය කියන දෙපළ මටත් වඩා ඒ ගැන දන්නවා. අපි දේශපාලන ප්‍රශ්න අමතක කර කථා කරමු. ඇත්ත, සමන්ත විද්‍යාරත්න මන්ත්‍රීතුමාගේ ගම රිදීමාලියද්ද තමයි. ඒක එතුමාගේ ගම වුණාට එතුමා දැන් හදන්නේ මේ කාරණය දඩමීමා කරගෙන දේශපාලන වශයෙන් වාසියක් ලබා ගන්නයි. ඒක සම්පූර්ණයෙන්ම වැරැදියි. එහෙම කරන්න එපා කියන එකයි මගේ ඉල්ලීම. යම්කිසි කෙනෙක් එය දේශපාලන වාසියක් කර ගන්නවා නම් ඒක වැරැදියි කියන එකයි මගේ අදහස. [බාධා කිරීමක්] ගරු තේනුක විදානගමගේ මන්ත්‍රීතුමාට අවස්ථාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එතුමා අපේ ගමේ මන්ත්‍රීතුමා නේ.

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)

ගරු ඇමතිතුමනි, මේක දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. ගමේ ජනතාවගේ ලොකු විරෝධයක් තිබෙනවා, සීනි කර්මාන්තශාලාවක් එන එක ගැන. ඒ ගමේ මිනිසුන් ඉල්ලන්නේ සීනි කර්මාන්තශාලාවක් නොවෙයි. ඔබතුමා කියනවා වාගේ රිදීමාලියද්ද දියුණු වෙනවා නම් ඒ ගමේ ජීවත් වන මිනිසුන් විධියට අප හදවතින්ම සන්තෝෂ වෙනවා. ඔබතුමා යෝජනා කරන සීනි කර්මාන්තශාලාවට වඩා එහෙම නම් බඩ ඉරිඟු වගා කිරීමේ ව්‍යාපෘතියක් අපට දෙන්න. මොකද, ඒ ගමේ ජනතාව මේ වෙන කොටත් බඩ ඉරිඟු වගා කරගෙන ජීවත් වෙනවා.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉදිරියේ දී ආයෝජකයන් ගෙන්වන කොට, බඩ ඉරිඟු වගා කිරීමේ ව්‍යාපෘතියක් සඳහාත් ආයෝජකයෙක් ගෙන්වන්න අපට අවස්ථාවක් ලැබේවි.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ලංකාවට බඩ ඉරිඟු ටොන් ලක්ෂ හතරහමාරයි එන්නේ.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

ගරු මන්ත්‍රීතුමනි, දැනට ලංකාවට අවශ්‍ය ප්‍රමාණයත්, අපට තිබෙන ඉල්ලුමත්, සැපයුමත් කියන සියලු දේ ගැනම කල්පනා කර බැලිය යුතුයි.

ඊළඟට, මම ඊයේ පෙරේදා මෙන්න මේ කාරණය පිළිබඳව අපේ ගරු අගමැතිතුමා සමඟත් කථා කළා. ලොග්ගල් ඔය ආශ්‍රිතව තරු පහේ විශාල හෝටලයක් හදන්නත් මහියංගණය ආසනය තුළ අප දැනට ඉඩමක් හොයාගෙන යනවා. මොකද, ලංකාවේ ආදිවාසීන් ඉන්න ප්‍රදේශය අඩුම ගණනේ සුද්දන්ටවත් ඇවිත් බලන්න තරු පහේ හොඳ හෝටලයක් නැහැ. මහියංගණය ඉතාම හොඳ ස්ථානයක් ලෙස දියුණු කළ යුතුය කියා අප හිතනවා. හැබැයි, මේ කර්මාන්තශාලාව අවට තව පුනර්ජීවන බලශක්ති බලාගාර දෙකකුත් ස්ථාපනය වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේක සීනි කර්මාන්තශාලාවක්ද? ආයෝජකයෙක් තමන්ට වාසියක් නැත්නම්, මිනිසුන්ට ලාභයක් ලබා දෙන්නත් බැරි නම් මිලියන 152ක් ආයෝජනය කරන්නේ නැහැ. එම නිසා මෙහිදී අප දෙපැත්තක් ගැන හිතන්න ඕනෑ.

දැන් ආයෝජකයන් එන්නේ නැති කොට, අහන්නේ මොකක්ද? බන්දුල ගුණවර්ධනලාත් එක්ක, දිනේෂ් ගුණවර්ධනලාත් එක්ක විවාදවලට ගියාම අපෙන් අහනවා, "මේ රටට ආපු කෙනා කවුද? කවුද මේ රටට සල්ලි ගෙනෙන්නේ?" කියා. ජනතා විමුක්ති පෙරමුණේ මහත්වරු අහනවා, "කෝ අර කතා කරපු මහා මොළය? මොළකාරයාගේ මොළය නිසා මේ ලංකාවට ගෙනත් තිබෙන්නේ මොනවාද? ගෙනාපු එක්කෙනෙක් ගැන කියන්න." කියලා. එහෙම ගෙනාපු ගමන් ඒකට විරුද්ධව පොල්ලක් දමනවා; පෙළපාළියක් යනවා; උද්ඝෝෂණ කරනවා; කුපිත කරවනවා; ගල් ගහනවා; වට්ටනවා. මොන ලජ්ජා නැති දේශපාලනයක්ද මේ? අනේ, පෙළපාළි යන්න නම්, ඒකාබද්ධ විපක්ෂයත් හොඳයි. "අනේ අම්මප!" කියලා තමයි කියන්න තිබෙන්නේ. එතකොට ලජ්ජාවක් නැහැ. එතකොට මොන හොරාත් එක්ක හෝ ඒ පෙළපාළියේ යන්න එකතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Minister, you have only three more minutes.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මා කතාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

එතකොට ඕනෑ හොරෙකු එක්ක වුණත්, "හොරා" කියලා එළවපු හොරාත් එක්ක වුණත් අත් අල්ලාගෙන පෙළපාළි යන්න ලෑස්තියි. හැබැයි මෙහි පිටුපස තිබෙන්නේ මොකක්ද? දියුණුවක් වෙන්න මේ රටට කිසිම විධියකින් අවස්ථාවක් දෙන්න ඔවුන් කැමැති නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා හදවතින්මයි මේ කියන්නේ. පරිසර හානි සම්බන්ධයෙන් මේ ආණ්ඩුව සම්පූර්ණයෙන් විරුද්ධයි. මම පැහැදිලිව මේ කාරණය කියනවා. පරිසර හානියක් වනවා නම්, පරිසරයට විශාල හානියක් කරමින් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වනවා නම් ජනාධිපතිවරයා කොහෙත්ම මෙයට සහයෝගයක් ලබා දේවි කිය, මේ සම්බන්ධ කිසිම යෝජනාවකට එතුමා උදව්වක්, උපකාරයක් කරාවි කියා මා හිතන්නේ නැහැ. මම දන්නවා, හෙට දවසේදී ජනතා විමුක්ති පෙරමුණේ කණ්ඩායමක් සහ ඒකාබද්ධ විපක්ෂය මේ සම්බන්ධයෙන් ඇකිරියන්කුඹුරේදී විශාල කුපිත කරවීමක් කරන්න උත්සාහ කරනවා කියා. හැබැයි, මම එක දෙයක් කියනවා. මම පැහැදිලිව කියනවා ඇකිරියන්කුඹුර ජනතාව අතර මේ සම්බන්ධයෙන් විරෝධතාවක් නැති බව. ජනතාව කැමැතියි- [බාධා කිරීමක්]

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
අසත්‍ය කියන්න එපා.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ආ, ඒකාබද්ධ විපක්ෂය එයට සම්බන්ධ නැද්ද? [බාධා කිරීම්]

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
ඔබතුමාට ඡන්දය දීපු ජනතාවත් එතැන ඉන්නවා. ඔබතුමා එන්න යන්න.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ඒකාබද්ධ විපක්ෂය සම්බන්ධද, නැද්ද? [බාධා කිරීම්]

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
ඔබතුමාගේ අයත් එතැන ඉන්නවා. ඔබතුමා එන්න යන්න.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ඒකාබද්ධ විපක්ෂය එයට සම්බන්ධද, නැද්ද?

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
ඔබතුමා පක්ෂපාතීව කතා කරන්න එපා.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
හරි, හරි, ඔබතුමා - [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමන්ලා, කරුණාකර වාඩි වෙන්න.

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
ගරු ඇමතිතුමා, ගමේ ප්‍රශ්නයක් මේ කතා කරන්නේ.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
හරි, හරි. ඉඳගන්න කෝ. [බාධා කිරීම්] ඉඳගන්න, ඉඳගන්න. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බුද්ධිය නැති සමහර මිනිසුන්ට පොඩ්ඩක් අවස්ථාව දුන්නාම එයින් ප්‍රයෝජන ගන්න තේරෙන්නේ නැහැ. [බාධා කිරීම්] ඒ බව හොඳින්ම ඔප්පු කර පෙන්නුවා. ඒ නිසා හොඳට පරිප්පුව කාලායි තිබෙන්නේ. තිබුණු සංවිධායකකමත් නැති කරලා, අයියාට තිබුණු චාන්ස් එකත් නැති කරපු මනුස්සයෙක්, ඔය. ඒ නිසා එතැනින් එහාට කතා කරලා වැඩක් නැහැ, එතුමා ගැන. [බාධා කිරීම්]

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
මඩ ගහන දේවල් අරගෙන මෙතැන කතා කරන්න එපා.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
කරුණාකර ඉඳගන්න කෝ. [බාධා කිරීම්] අයියාට පින් සිද්ධ වෙන්න පාර්ලිමේන්තු ආපු මනුස්සයා. අයියාගේ තැනත් නැති කරගත් කෙනා. [බාධා කිරීම්] ඉඳගන්න කෝ. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේවා තමයි සමහර මිනිසුන්ට තමන්ගේ තනතුර දරාගන්න බැරි වීම තුළ කරන කතා. මම තවත් එක කාරණයක් කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණයත් කියා මා කතාව අවසන් කරන්නම්. මහියංගණයේ කරන ඔය ව්‍යාපෘතියට විරුද්ධව කතා කරන්නේ සම්පූර්ණයෙන්ම ඊර්ෂ්‍යාව, ක්‍රෝධය නිසායි. මෙතුමන්ලා තුළ වෛරයක් තිබෙනවා, මෙතුමන්ලාට දියුණු කරන්න බැරි වූ ඒ පළාත් දියුණු වේවි කියා. හැබැයි මම එකක් කියනවා. ඒ පළාතේ සිටින ජනතාව මේ කණ්ඩායම පරාජය කළේ දූෂණය, වංචාව ආදි සියලු දේ පරාජය කරන්නයි. අපි පැහැදිලිව කියනවා, ඔය කියන රිදීමාලියද්ද කර්මාන්තශාලාව විතරක් නොවෙයි, තවත් කර්මාන්තශාලා රාශියක් හදලා, මෙතුමන්ලාට -අඩුම ගණනේ මෙතුමාට- නැවත කවදාවත් බලයට එන්න බැරි වෙන්න ඒ ප්‍රදේශ අනිවාර්යයෙන් දියුණු කරනවා කියා. මා එය මේ අවස්ථාවේදී පැහැදිලිව ප්‍රකාශ කරනවා. බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you very much. The Sitting is suspended till 1.30 p.m.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා.1.30ට නැවත පවත්වන ලදී.
அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.
Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

[අ.භා. 1.30]

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජූනි මාසයේ 05වැනිදා ලෝක පරිසර දිනය. මේ රටේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා; පරිසර විෂය භාර ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද, පරිසරය නසන; ඌව වෙල්ලස්ස නසන; ඌව - වෙල්ලස්සේ සශ්‍රීක මහපොළොව විනාශ කරන; එදා ඉතිහාසයේ පෙරදිග ධාන්‍යාගාරය කියලා විරුදාවලී නාමය ලැබුණ ඌව - වෙල්ලස්ස කියන ධාන්‍යාගාරයට විත කටින යෝජනාවක් ඇතුළත් කැබිනට් පත්‍රිකාවක් ඇවිල්ලා තිබෙනවා. කැබිනට් පත්‍රිකාව ඇවිල්ලා තිබෙන්නේ 2017 පෙබරවාරි මාසයේ 22වැනිදා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2017 පෙබරවාරි මාසයේ 22වැනිදා එන අංක එම්ඩීඊ/ඒඩී/03/සීඒබී-පීඒ/ 2017 දරන කැබිනට් පත්‍රිකාවෙන් බිබිල සීනි කර්මාන්ත සමාගම සඳහා යෝජිත බිබිල සංවර්ධන ව්‍යාපෘතියට පහසුකම් සැලසීම යටතේ සිංගප්පූරුවේ පිහිටි "ගැසල් වෙන්චර්ස්" නැමති සමාගමටයි මේ අක්කර 62,500 දෙන්න යන්නේ. ඒ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණනාවකට, රිදීමාලියැද්දේ දෙහිගම කියන ප්‍රදේශයට මෙය අදාළ වෙනවා. එහි මව් සමාගම වන්නේ ඇමෙරිකාවේ නිව්යෝර්ක්වල, අංක 475, රිවර් සයිඩ් පිහිටි CDVCA නම් බහු ජාතික සමාගමයි. අක්කර 62,500ක් "Gazelle Ventures (Pvt.) Limited " කියන සිංගප්පූරු සමාගමටයි දෙන්න යන්නේ. IMS Holdings සමාගම තමයි දේශීය නියෝජිතයා. එදා 2006දී ආවා "බුකර් ටේට්"ලා. එදා ඌව - වෙල්ලස්සේ ගොඩනැඟුණු මහා විරෝධය හමුවේ මේ රටේ මහා සංසරත්නය, පරිසරවේදීන්, මේ රටේ විද්‍යාඥයින්, දේශපාලන පක්ෂ භේදයෙන් තොරව මේ රටේ සියලු දෙනා එකතු වෙලා එදා ඇති කළ මහා අරගළය තුළින් ඒ බුකර් ටේට්ලා ගෙනා කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළ, බ්‍රිතාන්‍යයේ යකඩ සපත්තුවට නැවත ඌව - වෙල්ලස්ස යටත් කරන්න හදපු ඒ ව්‍යාපෘතිය හකුළා දමන්න පුළුවන් වුණා. එදා බ්‍රිතාන්‍ය හකුළා ඒක ගන්නකොට දැන් ඇමෙරිකාව දත නියවනවා. දැන් ඇමෙරිකාව මේ සමාගමට සම්බන්ධයි.

"Gazelle Ventures (Pvt.) Limited " කියන්නේ ඇමෙරිකානු සමාගමට සම්බන්ධ සිංගප්පූරු සමාගමක්. ඒ සමාගම හරහා ඇමෙරිකාවේ නිව්යෝර්ක් පිහිටි සමාගමටයි දෙන්නේ. ඌව - වෙල්ලස්සේ පිහිටි වනාන්තර, ලඳු කැලෑ, වැව් අමුණු, වැව් පෝෂක ප්‍රදේශ, ගංගා, ඇළ දොළ සහිත ගොවීන්ගේ වගා ඉඩම්, හේන් ඉඩම්, මහවැලිය සතු වටිනා ඉඩම් ඇතුළුව අක්කර 62,500ක් තමයි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ සිංගප්පූරු සමාගමට දෙන්න යන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකා නියෝජිත IMS Holdings සමාගමයි. ඒ අනුව මහඔය, රිදීමාලියැද්ද, පදියතලාව, මහියංගනය, බිබිල, මැදගම, මඩුල්ල, කන්දකැටිය වැනි ප්‍රදේශවලින් කැලෑ ඉඩම් ඇතුළු ඉඩම් මේ උක් වගාව සඳහා ගන්න සැලසුම් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එයට අමතරව මාදුරුඔය රක්ෂිතයෙන් ඉඩම් අක්කර 373ක් - හෙක්ටෙයාර 149ක් මේ ව්‍යාපෘතියට අවශ්‍ය කර්මාන්තශාලාව ඉදි කිරීම වෙනුවෙන් වෙන් කරන්න 1979 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත අනුව දැන් පිඹුරුපත් සකස් වෙමින් යනවා. ඌව - වෙල්ලස්සට මේ ව්‍යාපෘතිය ආවේ වරක් දෙවරක් නොවෙයි. 2006දී පළමුවැනි කැබිනට් පත්‍රිකාව ආවා.

මා ළඟ සියලුම කැබිනට් පත්‍රිකා තිබෙනවා. කැබිනට් පත්‍රිකාවල ඉතිහාසය කිව්වොත් 2006.12.06වැනිදා මුල්ම කැබිනට් පත්‍රිකාව ආවා. ඊට පස්සේ 2008.03.04වැනිදා ආවා. ඊට පස්සේ 2008.10.24වැනිදා ආවා. ඊට පස්සේ 2009.09.09වැනිදා ආවා. ඊට පස්සේ 2015.04.01වැනිදා IMS Holdings සමාගමත් එක්ක සීනි ව්‍යාපෘතිය කරන චීනයේ සීමාසහිත "ගුආන් කන්" සමාගම ආවා. ඒ මේ ආණ්ඩුව බිහි වුණාට පස්සේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට පක්ෂ භේදයක් නැහැ. එදා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය කාලයේ එනකොටත් අපි මේකට විරුද්ධවයි පෙනී සිටියේ. අපි ඒ දේශපාලන සන්ධානය ඇතුළේ සිටිද්දීත් ඌව - වෙල්ලස්සට සිදු වන පරිසර හානිය, ජල උල්පත්වලට සිදු වන හානිය, උක් කර්මාන්තයත් එක්ක ඒ ප්‍රදේශවලට සිදු වෙලා තිබෙන අගතීන් දිහා බලලා, තර්ක විතර්ක කරමින් ඒ ව්‍යාපෘතියට විරුද්ධ වුණා. ඒ ආපු විරෝධය හමුවේ මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒක කළේ නැතිවා විතරක් නොවෙයි, ඌව - වෙල්ලස්ස තුළ ඒ කර්මාන්තශාලා බිහි කරන්න පුළුවන් වුණේ නැහැ.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අවසානයේ දී ඌව-වෙල්ලස්ස ජනතාවගේ හඬට ඇහුම්කන් දීලා ඒ ව්‍යාපෘතිය නවතා දමන්න කටයුතු කළා. මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ 2015.04.01වැනිදා නැවතත් කැබිනට් පත්‍රිකාවක් එනවා. ඊට පස්සේ, 2015.05.20වැනිදා නැවත කැබිනට් පත්‍රිකාවක් එනවා. ඒ කැබිනට් පත්‍රිකාවට අනුව චීනයේ "ගුආන් කන්" කියන සීනි සමාගම වෙනුවට සිංගප්පූර්වේ "Gazelle Ventures (Pvt.) Limited" කියන සමාගම එනවා. මම මුලින් කිව්වා වාගේ ඇමෙරිකාවේ නිව්යෝර්ක් නුවර පිහිටි "Gazelle Ventures (Pvt.) Limited" කියන සමාගම ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමනි. මේ එන ව්‍යාපෘතිය අනුව කැබිනට් පත්‍රිකාව අනුව දැන් සූදානම් වෙනවා. රිදීමාලියැද්ද, දෙහිගම ප්‍රදේශයෙන් හෙක්ටෙයාර 149ක් සම්ප්‍රදායික හේන් ගොවිතැන් කරන කුරක්කන්, මෙනේරි, තල වගා කරන, බඩඉරිඟු වගා කරන, වී වගාවෙන් ස්වයංපෝෂිත වුණු මහා නාගදීපය තිබෙන, සොරබොරවැව තිබෙන, මාදුරුඔය ජලාශය තිබෙන, රඹකැන්ඔය ජලාශය තිබෙන, අනෙක් පැත්තෙන් ගල්ඔය ගලා බසින සේනානායක සමුද්‍රය තිබෙන මේ රක්ෂිත අභය භූමියට මේ මහා රකුසා එන්න නියමිතයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මාදුරුඔය රක්ෂිතයට මේ වෙන්න යන විනාශය පිළිබඳව එදා මොනරාගල දිස්ත්‍රික්කයේත්, බදුල්ල දිස්ත්‍රික්කයේත් දිසා වන නිලධාරීන් කියපු ප්‍රකාශ මා සතුව තිබෙනවා. එදා මොනවාද කිව්වේ?

එදා ඒ ක්‍රියාවලිය එනකොට ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමා මොකක්ද කිව්වේ? ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමනි, ඔබතුමාටම විරුද්ධ වුණු ඔබතුමා 2007 ජූලි මස 17වැනිදා

හැන්සාඩ් වාර්තාවේ මෙහෙම කියනවා. [බාධා කිරීමක්] ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමනි, මගේ කථාවෙන් පසුව ඔබතුමා කථා කරන්න. එම හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 94හි මෙන්න මෙහෙම සඳහන් වෙනවා:

"1818 සුද්දෝ වෙල්ලස්සට කරපු විනාශයෙන් පස්සේ, අද බුකර් කියන සුද්දෙක් ඇවිත් වෙල්ලස්සට තවත් විනාශයක් කරන්න යනවා. මගේ මිත්‍ර ධර්මදාස බණ්ඩා අමාත්‍යතුමා කරුණු රාශියක් ඉදිරිපත් කළා."

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, what is your point of Order?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඕකට මම විරුද්ධ වුණේ මගේ නම සඳහන් කරපු නිසායි. ඔය ඉඩම් එදා දෙන්න ගියේ කොම්පැනියටයි. අද ඒ ඉඩම් දෙන්නේ මහජනතාවටයි. ඒක තමයි වෙනස.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
වැරැදියි. ඒ ගැනත් මම කියන්නම්. ඒක තමයි සැලසුම. මේ විරෝධය හමුවේ චොකලට් තවරන, සීනි අයිසින් තවරන සැලසුම තමයි තමුන්නාන්සේලාගේ උපාය වෙලා තිබෙන්නේ. සම්පූර්ණයෙන්ම සමාගමට ඉඩම් දෙනවා වෙනුවට අක්කර 62,500ක ගොවීන් බලහත්කාරයෙන් උක් වගාවට යොමු කරවන ව්‍යාපෘතියක වැඩ පිළිවෙළක් තමයි මේ ඇවිල්ලා තිබෙන්නේ. තමුන්නාන්සේලා කියනවා ගොවීන් 10,000කට මහවැලි අධිකාරියෙන් ඉඩම් දෙනවා කියලා. හෙක්ටෙයාර දෙකහමාරක් දෙනවා කියන ගමන් මොකක්ද කියන්නේ? හෙක්ටෙයාර දෙකහමාරක් දෙන ගමන්, "ඒ ඉඩමේ හෙක්ටෙයාර දෙකක් අනිවාර්යයෙන්ම උක් වගා කරන්න ඕනෑ." කියලා තමුන්නාන්සේලා වාණිජ බදු ගිවිසුමක් හදනවා; ගොවියා හිර කරනවා; ඉඩමට බැඳ තියනවා. මොකක්ද වෙන්නේ? මහවැලි නිම්නයේ වගා කරන ගොවියා; මහා කන්දකැටියේ වගා කරන ගොවියා; පදියතලාව මහියංගනය මහඔය වගා කරන ගොවියා; බිබිල, මැදගම වගා කරන ගොවියා; දොඩම් වවන ගොවියා, බඩ ඉරිඟු වවන ගොවියා, දෙහි වගා කරන ගොවියා, කුරක්කන් වගා කරන ගොවියා, තල, මෙනේරි වගා කරන ගොවියා ඒ සියල්ල වගා කරන ගොවියාට කියනවා, "උඹලා හෙක්ටෙයාර දෙකහමාරෙන් බාගයක ඉතිරි දේවල් කරපල්ලා. නමුත්, හෙක්ටෙයාර දෙකකම උක් වගා කරපල්ලා." කියලා කියන්නයි මේ යන්නේ. මේ එන ව්‍යාපෘතියේ ඉතා පැහැදිලිව පේන්න තිබෙන්නේ ඒකයි. ඌව-වෙල්ලස්සේ ඉතිහාසය පිළිබඳව මේ වෙලාවේදී තමුන්නාන්සේලාට පැහැදිලිව කියන්න ඕනෑ. එදා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් මොකක්ද කිව්වේ? තමුන්නාන්සේලාගේ මේ ව්‍යාපෘතියේ IMS Holdings සමාගම "බුකර් ටෙට්"ලා විධියට ඒ වෙලාවේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගෙන් බදුල්ලෙන් සහ මොනරාගලින් ස්ථාන තුනක් පිළිබඳව ඉල්ලුවා. Site (A), Site (B), Site (C) කියලා. Site (A) කියන එක ඉල්ලනකොට මොනවාද කිව්වේ? මැදගම බිට්ටුවේ මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොටබෝව ග්‍රාම නිලධාරි වසමෙන් ඉල්ලුවා. ඒක ඉල්ලනකොට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් මොකක්ද කිව්වේ? "ඉල්ලා ඇති ඉඩම් කොටස තුන්ගල්තොට කඳුවැටිය හා ගොඩිගමුව කන්දට මායිම්වූ තැනතලා භූමියකි. ඉහිනියාගල සේනානායක සමුද්‍රය පෝෂණය කරන ජල පෝෂක ප්‍රදේශ ඉල්ලා ඇති භූමිය පුරාම විහිදී පවතින අතර, එම ජලය පෝෂණය කරන ප්‍රධාන ගංගා වන දඟමොල්ඔය, මහවෙලකඳුර, සීතලකඳුර, වහලතැන්නකඳුර, වැනි දිය කඳුරු රාශියක් ඉල්ලා තිබෙන ඉඩම හරහා ගලා බසී. එයින් සලකුණුකොට ඇති මෙම ඉඩම් කොටස පාරිසරික සංවේදී කලාපයට අයත්ව පිහිටා ඇත." කියා.

ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමනි, මේක පරිසර විරෝධී ව්‍යාපෘතියක් කියලා කියන්නේ ඒකයි. ඉල්ලා ඇති ඉඩම ගල්ඔය ජාතික වනෝද්‍යානයේ ස්වාරක්ෂක කලාපයට මායිම්ව පිහිටා ඇත. තමුන්නාන්සේලා දැන් රිදීමාලියැද්දේ දෙහිගමට යන ගමන් මේ මැදගම, මඩුල්ල, බිබිල මේ කියන ප්‍රදේශවල ගොවිතැන් කරන්න ගොවීන්ගේ ඉඩම්වලම තමයි උක් වගා කරන්න හදන්නේ.

එම රක්ෂිත ප්‍රදේශයට, සංවේදී කලාපයට තමයි මේ එන්නේ. අවශේෂ කැලෑ ඉඩම් ටිකට තමයි එන්නේ. අනවසරයෙන් වගා කරන ගොවීන්ට මහවැලි කලාපයෙන් ඉඩම් දෙනවාය කියලා කියන්නේ මොකක්ද? 1948 වසරේ ඉඳලා මෙපමණ කාලයක් මේ ගම්බිම්වල වගා කරපු ගොවීන්ට ඉඩම් ටික ලැබී තිබුණේ නැහැ. ඒක මේ රටේ ඉතිහාසයේම තිබුණු දේශපාලන ප්‍රශ්නයක් හා ඉඩම් ප්‍රතිපත්තිය පිළිබඳ ගැටලුවක්.

එම ගොවීන් වගා කළේ අනවසරයෙන් තමයි. හේන කැපුවේ, හේන කෙටුවේ, ඒ අල-කොළ ටික වැව්වේ, බඩඉරිඟු ටික වැව්වේ, තල ටික වැව්වේ, මෙනේරි ටික වැව්වේ අනවසරයෙන් තමයි. හැබැයි, ඉතිහාසය පුරාම රජ්ජුරුවෝ තමයි අවස්ථාව දුන්නේ, එම ගොවිබිම්වල ඉඳගෙන හේන් ගොවිතැන් කරන්න; කුඹුරු ගොවිතැන් කරන්න. නමුත් ඔවුන් හේන විනාශ කළේ නැහැ. එම හේන ආරක්ෂා කළා; මහ වනය ආරක්ෂා කළා; මහ ගස් ටික ආරක්ෂා කළා; ඇළ-දොළ-ගංගා ටික අපේ පරිසරවේදීන්, ඒ ගම්වල හිටපු ගම් නායකයෝ ආරක්ෂා කළා. මේ කියන්නේ මොකක්ද? "ඒ කියන ඉඩම් ටික උඹලාට දෙන්නම්" කියනවා. 1948 සිට දුන්නේ නැති මේ ඉඩම් ටික දෙන්න දැන් කැවුත්ත උණු වෙලා තිබෙන්නේ මොකද? ඒක උණු වෙලා තිබෙන්නේ වෙන මොකක් නිසාවත් නොවෙයි.

බහුජාතික සමාගම් ටික සතුටු කරන්න තමයි ඒ අක්කර 10,000ක් ගොවීන්ට දෙන්නම් කියලා කියන්නේ. ගරු රතන හාමුදුරුවනේ, එසේ 10,000 දෙන කොට, එක් ගොවියෙකුට හෙක්ටෙයාර දෙකහමාරක් දෙන කොට කියනවා, එයින් හෙක්ටෙයාර දෙකක උක් වවන්නය කියලා. අන්න ඒක තමයි අපි කියන්නේ, මේ ගොවියා හිර කරන උක් වගාවට පැල්වත්තෙයි, හිඟුරාණෙයි, කන්තලෙයි, සෙවනගලයි කළේත් ඕක තමයි කියා. අද කන්තලේ අක්කර විසිපන්දහසක් තිබෙනවා. මොකක්ද, වෙලා තිබෙන්නේ? කන්තලේ අක්කර විසිපන්දහසේ උක් වැවෙන්නේ නැහැ. අද කන්තලේ වතුර ප්‍රශ්නයක් විතරක් නොවෙයි - ඒ වතුර ප්‍රශ්නයට යෝජිත විසඳුම තමයි කළුගඟ ව්‍යාපෘතිය ආරම්භ කරන එක. කළුගඟ ව්‍යාපෘතියෙන් යෝධ ඇළ නිර්මාණය කරලා කළු ගඟ වේල්ල හදලා, ඒ කළුගඟ වේල්ලෙන් කන්තලේට වතුර දෙන්න පුළුවන්. වතුර දීලා උක් හදන්න පුළුවන්. ෆැක්ටරිය තිබෙනවා, ගොඩනැඟිලි තිබෙනවා, පහසුකම් තිබෙනවා, නිලධාරින් ඉන්නවා, මිනිස්සු ඉන්නවා, උක් වවපු පළපුරුදු ගොවීන් ටික ඉන්නවා. ඒක කරන්න පුළුවන්. නමුත් ඒක කරන්නේ නැහැ. ඒකට අත ගහන්නේ නැහැ. හිඟුරාණේත් තවම මැරි-මැරී, වැටි-වැටී අක්කර විසිපන්දහසක් තිබෙනවා. සෙවනගලත් අක්කර විසිපන්දහසක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි, පැල්වත්තේත් අක්කර විසිපන්දහසක් තිබෙනවා.

[ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

පසුගිය කාලයේ -මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ- රාජ්‍ය සමාගම් බවට පත් කරලා මේවායෙන් ලාභාංශත් හොයලා ගොවීන්ටත් බෙදුවා. හැබැයි, මේ ආණ්ඩුව යටතේ රවි කරුණානායක ගෙනා පසු ගිය අය වැයෙන් කිව්වේ මොකක්ද? ඒ අය වැයෙන් විකිණෙන ආයතන ලැයිස්තුවට මහජන බැංකුව, ලංකා බැංකුව, ඉතිරි කිරීමේ බැංකුව, චෝටර්ස් එජ් වාගේම සෙවනගල හා පැල්වත්තත් ලැයිස්තුගත කරලා තිබෙන්නේ, ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය ඇමතිතුමනි. ලාභාංශත් හෙව්වා නම්, ලාභෙත් හෙව්වා නම් මොකටද විකුණන්නේ? ආනයනික ආහාර ද්‍රව්‍ය අතර වැඩිම පංගුව තිබෙන්නේ සීනිවලට තමයි කියලා අපි කියනවා. ආසන්න වශයෙන් වසරකට සීනි මෙට්‍රික් ටොන් 612.4ක් අපේ රටට අවශ්‍ය වනවා.

මම මේ කියන්නේ 2015 මහ බැංකු වාර්තාව අනුවයි. නමුත් ඇත්තම දෙය මොකක්ද? අපේ රටේ උක් පර්යේෂණ ආයතනවලින් හොයා ගත් තොරතුරු අනුව තවම අක්කරයකින් ලබා ගන්න පුළුවන් වන්නේ උක් මෙට්‍රික් ටොන් 80යි. නමුත් ඉන්දියාව, බ්‍රසීලය, වියට්නාමය හා චීනය වාගේ රටවල අලුතින් උක් ප්‍රභේද හඳුන්වා දීලා, විද්‍යාත්මක සැලසුම්කරණය අනුව කළමනාකරණය ඉතා ඉහළ තැනට ගෙනැල්ලා, ජල පහසුකම් ටික දීලා, වාරි ක්ෂේත්‍රය දියුණු කරලා අක්කරයකින් මෙට්‍රික් ටොන් 120ක් -සියයටත් වඩා- ලබා ගන්නවා. අන්න ඒ නිසායි අපි මෙහෙම කියන්නේ. මේ රටේ ඉතිහාසය පුරාම අක්කර ලක්ෂයක් සීනි කර්මාන්තය වෙනුවෙන් උක් වගාව සඳහා වෙන් කරලා තිබෙනවා. ඒ ලක්ෂය තුළ අක්කරයකින් ලබා ගන්නා උක් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 100ක් - 120ක් අතරට ගෙනෙන්න ජාතික වැඩ පිළිවෙළක් හදන්න, ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය ඇමතිතුමනි. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට කියන්න, එම ජාතික ප්‍රතිපත්තිය හදන්න කියලා. අපි අන්න ඒකට එකඟයි. මේ රටේ සීනි නිෂ්පාදනය කරන එම කර්මාන්තශාලා හතර දියුණු කරනවාට අපි එකඟයි.

සෙවනගල කර්මාන්තශාලාවේ උක් වවන මිනිසුන්ගේ කථාව කිව්වානේ. අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ අතට ගොවීන්ගේ තොරතුරු වගයක් ඇවිල්ලා තිබුණා නේ. ඒවා සාධාරණ ප්‍රශ්න. අද පැල්වත්තේ තිබෙන්නේත් ඒ ප්‍රශ්නය. අවුරුද්දේ කන්න දෙකේ උක් ටික කපා දුන්නාට පසුව අතිනුත් රුපියල් 10,000ක්-15,000ක් සමාගමට ණය වෙන තත්ත්වයකයි, උක් ගොවියා ඉන්නේ. ඒ නිසා අපි කියන්නේ වැඩිපුර පර්යේෂණ කරලා අලුතින් උක් ප්‍රභේද හඳුන්වා දීලා ඒ හරහා එම ගොවීන්ට එකී ඉඩම් ටිකේ වගා කිරීමට අවශ්‍ය උපරිම සහාය රජයෙන් දුන්නොත්, අනිවාර්යයෙන්ම මේ රටේ සීනි අවශ්‍යතාව සම්පූර්ණයෙන්ම මෙම ෆැක්ටරි හතරෙන් නිෂ්පාදනය කරන්න පුළුවන් කියලායි.

දැනට සීනි අවශ්‍යතාවෙන් සියයට 10.5ක ප්‍රමාණයකුයි මෙහි නිෂ්පාදනය වෙන්නේ. දැනට කන්තලේ සම්පූර්ණයෙන් මේ සඳහා යොදා ගන්නේ නැහැ. අපේ රටේ උක් වගාව සඳහා යොදා ගත හැකි ඉඩම්වලින් -අක්කර ලක්ෂයෙන්- සියයට 40ක් දැනට භාවිත කරන්නේ නැහැ. රතන හාමුදුරුවනේ, භූමියෙන් සියයට 40ක් තවම උක් වගාවට යොදවන්නේ නැහැ. ඔබ වහන්සේලාගේ කටහඬ අවධි කරන්න ඕනෑ කියන්නේ ඒකයි. මේ ආණ්ඩුවේ -ජාතික ආණ්ඩුවේ- ඇමැතිකම් අරගෙන ඉන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඔබතුමන්ලා නිහඬව නොසිට හඬ අවධි කරන්න කියලා අපි කියන්නේ ඒකයි.

මේ රටේ ජාතික ආර්ථිකයේ පංගුවට දායක විය හැකි, වැඩියෙන්ම සීනි නිෂ්පාදනය කරන්න පුළුවන් මේ කර්මාන්ත ශාලා 4 දියුණු කරන්න වැඩ පිළිවෙළක් හදන්න. ඒක කරන්නේ නැතිව මොකුත් කරලා වැඩක් වෙන්නේ නැහැ. තවමත් කන්තලේ කර්මාන්තශාලාව සීනි නිෂ්පාදනය සඳහා සම්පූර්ණයෙන්ම යොදවා ගන්නේ නැහැ. එනම් එයින් සියයට 25ක් යොදා ගන්නේ නැහැ. ඉඩම්වලින් අක්කර ලක්ෂයක් උක් වගාව වෙනුවෙන් කරලා තිබෙනවා. එයිනුත් සියයට 40ක් පමණයි යොදා ගෙන තිබෙන්නේ. මේ වන විට සීනි මෙට්‍රික් ටොන් ලක්ෂ 5ක්, 6ක් ලංකාවට ආනයනය කරනවා. හැබැයි, එම සීනි ප්‍රමාණයෙන් සියයට 20 - 30 අතර ප්‍රමාණයක් යොදවා ගන්නේ නීති විරෝධී මත්පැන් නිෂ්පාදනය කිරීමටයි, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමනි. මේ රටේ සීනි අවශ්‍යතාවට සරිලන සීනි ප්‍රමාණය නිෂ්පාදනය කරන්න අපට පුළුවන්.

එදා - 1990 ගණන්වල- මේ රටේ සීනි කර්මාන්තය දියුණු තැනක තිබුණා; අපි දියුණු තැනක හිටියා. අපි කියන්නේ එදා රොබට් බ්‍රවුන්රිග්ලා කරපු දේ අද රොබට් බ්‍රවුන්රිග්ලා කරන්න එපා කියලායි. එදා සුදු ආණ්ඩුව කාලයේ ඩොයිලිට තමයි ඌව-වෙල්ලස්ස මර්දනය කරන්න දුන්නේ. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලනවා, එදා රොබට් බ්‍රවුන්රිග්ලා කරපු දේ, මේ ඌව-වෙල්ලස්සට විත කටින ව්‍යාපෘතිය එන වේලාවේ ඩොයිලිගේ භූමිකාව, ඔබතුමන්ලා කරන්න යන්න එපා කියලා. ඩොයිලිගේ භූමිකාව කරන්න යන්න එපා! මේ ජනතා විරෝධී අරගළයට ඇහුම් කන් දෙන්න; මේ ජනතා සටනට ඇහුම් කන් දෙන්න.

ඒ විතරක් නොවෙයි, මේ ඉල්ලන ඉඩම පිළිබඳ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් කියපු කාරණා මා සතුව තිබෙනවා. එදා වන සංරක්ෂණ නිලධාරින් කිව්වේ මොකක්ද? "යෝජිත බිම් කොටසේ බිබිල-පදියතලාව ප්‍රධාන මාර්ගයට ආසන්නව ඇති මායිමට සමාන්තරව මාදුරු ඔය නමැති බහු වාර්ෂික ජල මාර්ගයක් පවතින අතර..."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 5ක් තිබෙනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඒකාබද්ධ විපක්ෂයේ තවත් මන්ත්‍රීතුමන්ලා කථා කිරීමට ඉන්නවා. එතුමන්ලාගේ කාලයෙනුත් අරගෙන මට උපරිම වේලාව දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
කවුරුවත් ඉන්නවාද?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු තේනුක විදානගමගේ මන්ත්‍රීතුමාත්, ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමාත් ඉන්නවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
හොඳයි.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

යෝජිත බිම් කොටස පිළිබඳ මම මේ කියන්නේ. මේ යෝජිත බිම් කොටස ගැන මොකක්ද කියන්නේ? එදා බදුල්ල දිස්ත්‍රික්කයේ දිසා වන නිලධාරින් කිව්වා, "... මේ යෝජිත බිම් කොටස තුළ මීගහකඳුර නමැති තරමක විශාල ජල මාර්ගයක් තිබෙනවා. ඊට අමතරව කුඩා ස්වභාවික ජල මාර්ග කිහිපයක් දක්නට ලැබෙනවා. ඒ සියල්ල ඉහත මාදුරු ඔය පෝෂණය කරන අතර, ඒ අනුව එම ප්‍රදේශය මාදුරු ඔයේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශයක් බව නිගමනය කළ හැකියි. එසේම යෝජිත බිම් කොටසේ කෙළවරක උලුල්ල හා වල්ලිහෙල යනුවෙන් කුඩා කඳු වැටි දෙකක් තිබෙන අතර, උලුල්ලේ කන්දෙන් පෝෂණය වන ඇල්ලේකඳුර උපයෝගි කරගෙන ඇල්ලේවැව යනුවෙන් ගොවිතැන් කටයුතු සඳහා ජලය ලබා ගැනීමට කුඩා වැවක් ඉදි කර ඇති බවත් වල්ලිහෙල කන්දෙන් මීගහකඳුර එකතුව මාදුරුඔය පෝෂණය කරන බවත් නිරීක්ෂණය විය." කියලා.

මේ සමාගම එක පැත්තකින් කියනවා, මාදුරු ඔයේ ජලය ගන්නේ නැහැ කියලා. නමුත් දිසා වන නිලධාරි කියනවා, "මේ මාදුරු ඔයෙන් පෝෂණය වන වතුර ටික තමයි මේ ප්‍රදේශවලින් ගලා බසින්නේ" කියලා. එසේම "යෝජිත බිම් කොටස මීගහකඳුර හා ඇල්ලේකඳුර අතර ප්‍රදේශය පුරා හෙක්ටයාර 80ක් පමණ බිම් කොටසක ස්වභාවිකව වර්ධනය වුණු උණ ශාක ප්‍රජාවක් පවතින බව නිරීක්ෂණය වූ අතර, එය මේ රටේ ඇති එම වර්ගයේ එකම ස්වභාවික උණ ශාක ප්‍රජාව විය හැකියි." කියලා කියනවා. අනේ! ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ කියලා තිබෙනවා කියලා සමාගම ඊයේ පත්තරේට කියලා තිබෙනවා, "මේ කටු උණ ශාක ප්‍රජාව ලෝකයේ හැම තැනම තිබෙනවා, ලංකාවේ හැම තැනකමත් තිබෙනවා." කියලා. දැන් මේ කියන්නේ මොකක්ද? බදුල්ල දිසා වන නිලධාරි පාලමකුඹුර මහත්මයා එදා කියනවා, "මේ ස්වභාවික කටු උණ ප්‍රජාව තිබෙන්නේ ලංකාවේම එතැන විතරයි." කියලා. එහෙම කියන ගමන් ඊටත් එහාට ගිහින් පරිසර වාර්තා හදලා තිබෙනවා. එම නිසා අපි අහන්නේ මේ පරිසර විද්‍යාත්මක ඇගයීම් වාර්තා කරන කොට එදා වන සංරක්ෂණ නිලධාරින් කියපු කාරණා ගැන හෙව්වේ නැද්ද, බැලුවේ නැද්ද, පුරාවිද්‍යා සමීක්ෂණ හරියට කළේ නැද්ද කියලායි. බ්‍රෝහියර්ගෙන් පස්සේ ඒ ප්‍රදේශවල පුරාවිද්‍යාත්මක සමීක්ෂණ හරියට සිදු වෙලා නැහැ. මහියංගණය ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක සමීක්ෂණ සිදු වෙලා තිබෙනවා, බිබිල ප්‍රදේශය පුරාවිද්‍යාත්මක සමීක්ෂණ සිදු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ, ගැමුණු රජතුමා, එළාර රජතුමා එක්ක ඓතිහාසික සටන කිරීමට මහවැලි ගංතොටින් එතෙර වෙලා මහියංගණය මහා විහාරය, නාගදීපය, බිබිල, මැදගම, අයිවෙල, සේනාපතිය, රිදීමාලියද්ද යන ප්‍රදේශ හරහා ඒ ඓතිහාසික ගමන ගිය භූමියයි.

ඒ විතරක් නොවෙයි, සද්ධාතිස්ස කුමාරයා ඌව වෙල්ලස්ස ශ්‍රීක කරලා දිසවාපිය දක්වා ශ්‍රීක කළ භූමිය. ඒ නිසා මේ ප්‍රදේශය පුරාවිද්‍යාත්මක ඓතිහාසික භූමියක්. බලන බලන තැන කැණීම් කළොත් අනිවාර්යයෙන්ම පුරාවිද්‍යාත්මක ඓතිහාසික විද්‍යාත්මක කාරණා අහු වෙන භූමියක්. එම නිසා මේ ඉතිහාසය යටපත් වෙන මෙවැනි ව්‍යාපෘති ගෙනෙන එක ගැන අපි පරිසර විද්‍යාත්මකව සොයා බලන්න ඕනෑ; පුරාවිද්‍යාත්මක සමීක්ෂණ කරලා බලන්න ඕනෑ; නිවැරදි තක්සේරුවක් කරන්න ඕනෑ; නිවැරදි විද්‍යාත්මක ඇගැයීමක් කරන්න ඕනෑ. මෙම කාර්යය සමාගම්වලට විතරක් භාර දෙන්න එපා. වන සංරක්ෂණ නිලධාරින් කියන දේ අහන්න. මධ්‍යම පරිසර අධිකාරිය කියා තිබෙන දේ අහන්න. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් සැබෑ සමීක්ෂණයක් කරන්න; විද්‍යාත්මක ඇගැයීමක් කරන්න. මහවැලි අධිකාරියෙන් සොයා බලන්න. මේ පෝෂක ප්‍රදේශවලට මෙම මහා උක් කර්මාන්තය ආවොත් මාදුරු ඔයට මොකද වෙන්නේ?

ඒ විතරක් නොවෙයි. පදියතලාවේ මහඔයෙන් ආරම්භ කරපු රඹකැන්ඔයට මොකද වෙන්නේ? ගලඔයෙන් ගලා බසින සේනානායක සමුද්‍රයට මොකද වෙන්නේ? ඒ විතරක් නොවෙයි. නාගදීපයට මොකද වෙන්නේ? බුලතා හදපු සොරබොර වැවට මොකද වෙන්නේ? වාරිමාර්ග විශේෂඥවරුන්ගෙන් ඒවා ගැන සොයා බලා සමීක්ෂණ කරලා මෙවැනි ව්‍යාපෘතිවලට අත ගහන්න. අපට වෙල්ලස්සේ නැවත වනාන්තරයක් හම්බ වෙන්නේ නැහැ. "නිල්ගල" කියන්නේ බුද්ධදාස රජතුමා හදපු වනය. එදා රොබට් බ්‍රවුන්රිග්ගේ ආණ්ඩුව යටතේ -සුදු ආණ්ඩුව යටතේ- මේ වනාන්තර පිළිබඳව, වාරිමාර්ග පිළිබඳව අධීක්ෂණය කරපු එක්තරා විශේෂඥයෙක් කිව්වේ, මේක "ආදම්ගේ උයන" කියලා.

විජයමුණි සොයිසා මැතිතුමනි, ඔබතුමා මුල්ලේගම රාළහාමි මහත්තයා දන්නවා. එක්තරා කාලයකට කලින් එතුමා මිය ගියා. මුල්ලේගම රාළහාමි කියන්නේ, බිබිල නිල්ගලට එහා පැත්තේ වැඩිම දොඩම් ටික වවපු ගොවි මහතා. එදා බිබිලේ ජෙන්ඩ්‍රල් නමින් හෝටලයක් තිබුණා. ඒ ජෙන්ඩ්‍රල් හෝටලයේ අයිතිකාරයා හිටියේ බිබිලේ, ඇල්කුඹුරේ -මා ඉපදුණු ගමේ-. මේක මම විජයමුණි සොයිසා මැතිතුමාට කියන්නේ මොකද, මගේ තාත්තාත් ඔබ සමඟ එක කාලයක එකට දේශපාලනය කරපු කෙනෙක් නිසායි. බිබිල කොටගම මධ්‍ය බල මණ්ඩලයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එක වෙලාවක වගකීම දරපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගුරු යූනියන් එකේ නායකයෙක් හැටියටත්, 1980 ගුරු වර්ජනයෙන් වැඩ තහනම් කරපු ගුරුවරයෙක් හැටියටත් වැඩ කරපු ඒ තාත්තාගේ පුතායි මේ කථා කරලා කියන්නේ බිබිලට එන මෙම ව්‍යසනය නවත්වන්න ඕනෑ කියා.

හරින් ප්‍රනාන්දු මැතිතුමාට මම එක කාරණයක් කියන්න ඕනෑ. එතුමා නැවෙන් බැහැලා බදුල්ලට ආවාට තේනුක විදානගමගේලා කියන්නේ මේ බිම නිජභූමිය කරගත්ත මිනිස්සු. විජිත බේරුගොඩ කියන්නේ, බිබිල නිජභූමිය කර ගත්ත මිනිස්සු. විමලවීර දිසානායක නැහෙනහිර පත්තුවේ බිම්තැන්නේ ජන්ම ලාභය ලබපු මිනිස්සු. උදයශාන්තලා කියන්නේ, බිබිලේ ජන්ම ලාභය ලබපු මිනිස්සු. ඒ අය කොහෙන්වත් ආදේශ කරපු මිනිස්සු නොවෙයි; කොහෙන්වත් ආනයනය කරපු මිනිස්සු නොවෙයි.

සමන්ත විද්‍යාරත්න කියන්නේත් රිදීමාලියද්දේ උපන්න කෙනෙක්. සමන්ත විද්‍යාරත්නත් එක්ක මට දේශපාලන ප්‍රශ්න තිබෙන්න පුළුවන්. හැබැයි, සමන්ත විද්‍යාරත්නට මේ ඇහෙන මානේ කියන්න ඕනෑ, සමන්ත විද්‍යාරත්න එදාත් හිටපු සටනේද අපි එදාත් හිටියා සමන්ත විද්‍යාරත්න හිටපු මන්ත්‍රීතුමනි. එදා, සමන්ත විද්‍යාරත්න ගෙන ගිය සටනේදී පාර්ලිමේන්තුවේදී මේ ගැන හඬ නගන කොට ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු හැටියට අපි හැමෝම හිටියා. දේශපාලන පක්ෂ භේදයෙන් තොරව කුහකත්වයෙන් තොරව මම එකක් කියන්න ඕනෑ. සමන්ත එදාත් හිටිය සටනේ, එදාත් උදයශාන්ත හිටියා; අදත් උදය ශාන්ත ඉන්නවා. සමන්ත එදාත් සටනේ හිටියා; අදත් සටනේ ඉන්නවා. ඒ නිසා සමන්තට කියන්න ඕනෑ, සමන්ත ඉන්නේ නැති සටන්වලටත් අපි නායකත්වය දෙනවාය කියලා. සමන්ත විද්‍යාරත්න, රට බෙදන ව්‍යවස්ථාව ගෙනෙන කොට සමන්තලාගේ කට හඬ ඇහෙන්නේ නැහැ.

ඊළාම්වාදි සිහින ඒ පැත්තේ නැහෙන කොට ඒකට සමන්තලාගේ කට හඬ නැහෙන්නේ නැහැ. ජිනීවාවලින් අර්බුද එනකොට අධිරාජ්‍යවාදී සපත්තුවට මේ රට යටත්වන සැලසුම් එනකොට, එදා ඉන්දියන් ව්‍යාප්තවාදයට කථා කරපු ජනතා විමුක්ති පෙරමුණේ හඬ නැහෙන්නේ නැහැ. හැබැයි ගරු

[ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

මන්ත්‍රීවරුනි, මේ යෝජනාවේදී, ඌව-වෙල්ලස්ස විනාශ කරන මේ ව්‍යාපෘතිය ගෙනෙන අවස්ථාවේදී, අත් දෙකම උස්සා ජනතා විමුක්ති පෙරමුණත් එක්ක එක දේශපාලන වේදිකාවක ඉඳගෙන මේ සටන කරන්න උදයශාන්තලා ලැහැස්තියි කියන එක මේ වෙලාවේදී ජනතා විමුක්ති පෙරමුණට කියන්න ඕනෑ. ඒ නිසා තමයි ඌව-වෙල්ලස්ස බින්තැන්න පළාත වෙනුවෙන් ගොවි බිම් සුරකින ජනතා ව්‍යාපාරයක් හැදුවේ. ඒ නිසා අපි කියන්න ඕනෑ, දිසා වන නිලධාරි මහත්වරුන් කියපු කාරණා ගැන සොයන්නය කියලා.

ඒ විතරක් නොවෙයි. මේ ලැබී තිබෙන ආර්ථික දත්ත අනුවත් මේ රටේ ආර්ථිකය සඳහා සීනි නිෂ්පාදනය කරන්න පුළුවන්. උක් කර්මාන්තය සඳහා වෙන්කර තිබෙන අක්කර ලක්ෂයක භූමියේ උක් වවන්නේ නැත්තේ ඇයි? අපේ රටේ උක් කර්මාන්තයේ මෙට්‍රික් ටොන් 80යි නිෂ්පාදනය වන්නේ. උක් පර්යේෂණ ආයතනය කඩා වැටිලා. උක් පර්යේෂණ ආයතනය අලුතින් උක් ප්‍රභේද සොයාගෙන නැහැ, අලුතින් විද්‍යාත්මක ඇගැයීමක් නැහැ, යටිතල පහසුකම් නැහැ. විජයමුණි සොයිසා ඇමතිතුමනි, සුමේධා ජයසේන නියෝජ්‍ය ඇමතිතුමියනි, ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය ඇමතිතුමනි, ඌව-වෙල්ලස්සේ හරින් ප්‍රනාන්දු ඇමතිතුමනි, ඌව-වෙල්ලස්සේ නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමනි, ඔබතුමන්ලාට මේ කාරණය කියන්න ඕනෑ. ඌව-වෙල්ලස්ස අපි කාගේත් භූමියයි. එදා ලංකාවේ දුප්පත්ම පළාත වෙලා තිබුණු ඌව පළාත මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේදී එයින් නිදහස් කරගන්න අපට පුළුවන් වුණා. ඔබතුමන්ලා සියලු දෙනාම එදා සිටියා. දුප්පත්කම හිණිපෙත්තේ තිබුණු රිදීමාලියැද්ද ලංකාවේ විසිවන ස්ථානයට පත්වුණේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය කාලයේදීයි.

ඒ විතරක් නොවෙයි. සියඹලාණ්ඩුව දුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වුණත්, අද එය වෙනස්වෙලා දර්ශකවල විසිවන, තිස්වන ස්ථානයට පැමිණ තිබෙන්නේ ඒ පළාතට ග්‍රාමීය යටිතල පහසුකම් දුන්නු නිසායි; දුප්පත්කම නැති කරන්න අවශ්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක වුණු නිසායි; පාරවල්, මං මාවත්, බෝක්කු, ඇළ දොළ, වැව් අමුණු ටික හැදුණු නිසායි. අපේ ගොවි බිම්වල කුරහන් ටික, මෙනේරි ටික, තල ටික, වී ටික නිෂ්පාදනය වුණා. එහි උපරිම ප්‍රතිඵල ගෙනෙන්න තිබුණු වෙලාවක තමයි 2015 ජනවාරි මාසයේ 08වන දා ජාතික ආණ්ඩුව කියන ක්‍රියාවලියට, මේ ප්‍රපාතයට වැටුණේ. අද මොකද වෙලා තිබෙන්නේ? ඌව-වෙල්ලස්ස මහා නියඟයකට නැවතත් ගොදුරු වෙලා. ඌව-වෙල්ලස්සේ කුඹුරුවලින් වී නිෂ්පාදනය සිද්ධ වන්නේ නැහැ. යල - මහ දෙකන්නයට වතුර තිබුණේ නැහැ. පසු ගිය නියඟයෙන් මොකද වුණේ? ඒ කුඹුරුවල, ගොවි බිම්වල අස්වැන්න, වී අස්වැන්න, නිෂ්පාදනය ඉහළට ගියේ නැහැ. ඒ ගොවීන් පොහොර සහනාධාරයෙන් බැට කනවා. රබර් ගොවියා ඒ සහනාධාරයෙන් බැට කනවා. අද ඒ ප්‍රදේශවල යල - මහ දෙකන්නය අතරේ අහස් දියෙන් වවනවා. ඒ මොනවාද? ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ ගමේ බඩ ඉරිඟු වවනවා, සියඹලාණ්ඩුවේ බඩ ඉරිඟු වවනවා. උක්වලින් විනාශ වුණු අපේ ගොවි බිම්වල දැන් බඩ ඉරිඟු වවනවා. බඩ ඉරිඟු නිෂ්පාදනයෙන් ලබන ආදායමෙන් අපේ මිනිස්සු යම් තරමක් ආර්ථිකය ගැට ගහගෙන ඉන්නවා. අපි දැක්කා, ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව අපේ රටට තවම මිරිස් ටික ගෙනෙනවා; ලූනු ටික ගෙනෙනවා; පරිප්පු ටික ගෙනෙනවා -පරිප්පු නම් අපේ රටේ හදන්න බැහැ නේ-; මුං ඇට ගෙනෙනවා; මෑ ගෙනෙනවා; කඩල ගෙනෙනවා; කුරහන් ගෙනෙනවා; කුළු බඩු ගෙනෙනවා. මේ පළාත් මේ හැම දෙයක්ම නිෂ්පාදනය කරන්න පුළුවන් පළාත්. මොනරාගල දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, අම්පාර දිස්ත්‍රික්කයේත් එහෙමයි.

විමලවීර දිසානායක මන්ත්‍රීතුමාගේ දිස්ත්‍රික්කයේත් එහෙමයි. විමලවීර දිසානායක මන්ත්‍රීතුමා හිඟුරාණේ උක් ගොවියෙක්. එතුමා කියයි, හිඟුරාණේ උක් ගොවීන්ට සිදුවෙලා තිබෙන සන්තෑසිය. ඒ විතරක් නොවෙයි. තේනුක විදානගමගේලා දන්නවා, ගොවීන්ට තිබෙන ගැටලු. විජිත බේරුගොඩලා දන්නවා, ඒ ප්‍රදේශයේ ගොවීන්ට තිබෙන ගැටලු. සෙවණගල පැල්වත්ත කියන්නේ අලි-මිනිස් ගැටුමට ලක් වී තිබෙන ප්‍රදේශයෙක්. ඩොක්ටර් ජයන්ත අතපත්තුගෙන් අපි ඇහුවා, ලංකාවේ අලි-මිනිස් ගැටුමට ලක්වන ප්‍රදේශවල වැඩිම අලි-මිනිස් ඝාතන සිදුවන්නේ - අලින් ඝාතනය වන්නේ, මිනිසුන් මියැදෙන්නේ- කොහේද කියලා. හඳපානාගල, උඩවලවේ, තණමල්විල හා බෙරලිහෙළ තමයි වැඩිම ඝාතන සිද්ධ වන්නේ.

ඒ විතරක් නොවෙයි. බිබිල, මැදගම, හිඟුරාණ හා කන්තලේ යන ප්‍රදේශවල තමයි අලියා ගහලා මැරෙන්නේ. ඊට පස්සේ පුවක්පැලේ ප්‍රදේශයේ අලියා ගහලා මැරෙනවා. පුවක්පැලේ කියන්නේ ඇකිරියන්කුඹුර වන බීට්ටුවේ තිබෙන ස්ථානයක්. ඇකිරියන්කුඹුර වන බීට්ටුවේ තිබෙන මේ ස්ථානය ගලඔයත්, නිල්ගලත්, මාදුරුඔයත් අතර තිබෙන අලි මං කඩයි. මේ අලි මං කඩට තමයි මේ සීනි ව්‍යාපෘතිය එන්නේ. තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමියනි, අදටත් උඩ වලවේ, හඳපානාගල තිබෙන මේ ප්‍රශ්නය විසඳා ගන්න බැහැයි කියලා ඔබතුමිය දන්නවා.

අලි මිනිස් ගැටුම අපට තවම විසඳා ගන්න බැහැ; විදුලි වැටවල් ගහලාත් තවම විසඳ ගන්න බැහැ. අලි මිනිස් ගැටුමට වැඩියෙන්ම ලක් වෙලා තිබෙන බ්ලොක්වල, තණමල්විල ප්‍රදේශවල- [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය ඇමතිතුමියනි, ඔබතුමියත් එක්ක මට වාදයක් නැහැ.

තණමල්විල ඇතුළු ඒ ප්‍රදේශවල වෙලා තිබෙන්නේ උක් ගහේ පැණි රස නිසා අලි ගම් වැදීමයි. ඒ නිසා ඒ ප්‍රදේශවල අලි මිනිස් ගැටුම වළක්වන්න පුළුවන්කමක් නැහැ. දැන් මේ ව්‍යාපෘතියෙන් මොකද වෙන්නේ? මාදුරුඔය ප්‍රදේශයේ ඉන්න අලි ටික එයි බිබිලට. මාදුරුඔය ප්‍රදේශයේ ඉන්න අලි ටික එයි පදියතලාව නගරයට. මාදුරුඔය රක්ෂිතයේ, ගල්ඔය, නිල්ගල ඉන්න අලි ටික එයි බිබිලට.

ඒ විතරක් නොවෙයි, මහඔය, රඹකැන්ඔය, මාදුරුඔය ජලාශවල වතුර ටික හිඳී යයි. ඒ විතරක් නොවෙයි. නාගදීප වැව් ඉහත්තාවේ උක් වැව්වාට පස්සේ නාගදීප වැවේ වතුර ටික අඩු වෙලා යයි. බුලතා හඳපු සොරබොර වැවේ ඉහත්තාවේ අක්කර 62,500ක උක් වැව්වාම මොකද වෙන්නේ? බුලතා හඳපු සොරබොර වැව හිඳී යයි. ඒ නිසා මේ ඓතිහාසික විනාශයට වග කියන්න ඕනෑද? අන්න ඒ නිසා තමයි අපි අහන්නේ, මේ ඓතිහාසික විනාශයට අපි වග කියන්න ඕනෑද කියලා. එදා රොබට් බ්‍රවුන්රිග් කරපු වැඩේ තමයි තමුන්නාන්සේලා අද කරන්නේ කියලා අපි කියන්නේ ඒකයි. රොබට් බ්‍රවුන්රිග් ඇවිල්ලා මොකක්ද කළේ? ඌව වෙල්ලස්ස යටත් කළා; 1815දී කන්ද උඩරට ගිවිසුමෙන් යටත් කළා. ඌව වෙල්ලස්සට විතරක් නොවෙයි, මුළු රටටම රජෙක් අහිමි කළා. 2015 ජනවාරි 8වන දාත් කළේ ඒක නොවෙයිද? 2015 ජනවාරි 8වැනි දාත් මේ රටේ සිද්ධ වුණේ ඒක නොවෙයිද? රටට පාලකයෙක් නැහැ; පාලක පෙළැන්තියක් නැහැ; ප්‍රතිපත්තියක් නැහැ; දර්ශනයක් නැහැ; වැඩ පිළිවෙළක් නැහැ. සැලැස්මක් නැතුව යන ගමනක් අපට පෙනෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 4ක පමණ කාලයක් ඉතිරිව තිබෙනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එවැනි ගමනකට සේන්දු වුණේ මොකද? මේ කාරණය කියලා මම කථාව අවසාන කරනවා.

එදා වඩුග රජෙක් කියලා ශ්‍රී වික්‍රම රාජසිංහ එළවලා ඇහෙලේපොළට රජකම අරගෙන දෙන්න අපේ සමහර සිංහල උඩරැටියෝ ඉංග්‍රීසින් එක්ක එකතු වුණා. ඒ වාගේ, මෙදාත් කළා මහින්ද රාජපක්ෂ එළවන්න. දැන් ආර්ථිකය හමස් පෙට්ටියේ. ඒ නිසා තමයි ලංකාවේ ආර්ථිකය කඩා වැටීගෙන යන්නේ. මා ළඟ තිබෙනවා ආර්ථික දත්ත. මේ ආර්ථික දත්ත අනුව මොකක්ද වෙලා තිබෙන්නේ? ලංකාවේ ආර්ථික දත්ත අනුව, මහ බැංකු වාර්තාවට අනුව මේ රටේ ඒක පුද්ගල ආදායම සියයට 4.5ට බැහැලා; ජාතික ආර්ථිකය වැටිලා; ජාතික නිෂ්පාදනය කඩා වැටිලා. මෙවර නිකුත් කරපු මහ බැංකු වාර්තා අනුවත්, සියලු ආර්ථික දත්ත අනුවත් අපට පැහැදිලියි රටට සිදු වෙලා තිබෙන විපත මොකක්ද කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1854දී රතු ඉන්දියානු නායක සියැටල් ඇමෙරිකා එක්සත් ජනපදයේ හිටපු ජනාධිපතිවරයෙකු වූ ෆ්‍රැන්ක්ලින් පියර්ස්ට ලියුමක් යැව්වා. ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා ඇමතිතුමනි, ඔබතුමා පොත පත කියවනවා; ඔබතුමාට සාහිත්‍ය දැනුම තිබෙනවා. ඔබතුමා, බණ පොත දන්නවා; පිරිත් පොත දන්නවා; රතන සූත්‍රය දන්නවා; මහා මංගල සූත්‍රය දන්නවා; මහා පරිනිබ්බාන සූත්‍රය දන්නවා. ඔබතුමා ඒ රතු ඉන්දියානු නායකයාගේ කථාවත් අහගන්න.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා (වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா - நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa - Minister of Irrigation and Water Resources Management)
ගරු මන්ත්‍රීමා, මා ඒ කථාව දන්නවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු ඇමතිතුමනි, මට කථාව අවසන් කරන්න අවස්ථාව දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රතු ඉන්දියානු නායකයා එදා කියනවා, "නිල් අහසත් පොළොවේ උණුසුමත් විකිණීම හෝ මිලදී ගැනීම සඳහා වූ ඔබගේ අදහස අපට නුහුරු වන්නේය. සුළඟේ නැවුම් බව හෝ ජලයේ කාන්තිය අපට අයිති නොවේ නම් ඒවා මිල කිරීමට හෝ මිලදී ගැනීමට ඔබට හෝ අපට හැකියාවක් නැත. අපගේ භූමිය මිලට ගැනීමට කැමැත්ත පළ කරමින් ඔබ කරන ඉල්ලීම අපට දරා ගන්නට නොහැක්කකි..."

අනේ! ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට මේකත් දරා ගන්නට බැහැ. මොකද, අපි වෙල්ලස්සේ ඉපදුණු පුතුන්. ඒ නිසා අපට දරා ගන්න පුළුවන්කමක් නැහැ. එතුමා වැඩි දුරටත් කියනවා, "ගංගා දිගේ ගලා බස්නා දිදුළන දිය දහර හුදු ජලයම නොව අපගේ මුතුන් මිත්තන්ගේ රුධිරයයි." කියලා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමනි, දහමල්ඔයේ, ගලඔයේ, මාදුරුඔයේ රඹකැන්ඔයේ, රන්දෙණිගල, රන්ටැඹේ ඇතුළු මේ ගංගා, ඇළ දොළවල ගලා ගෙන යන්නේ අපේ මීගහපිටියේ රටේ රාළගේ රුධිරයයි; කැප්පෙට්පොළ රටේ රාළගේ රුධිරයයි; කොහුකුඹුරේ රටේ රාළගේ රුධිරයයි. ඒ හැම තැනම ගලාගෙන යන්නේ ඌව වෙල්ලස්සේ මුතුන් මිත්තන්ගේ රුධිරයයි.

එදා සියැටල් තවදුරටත් මෙහෙම කියනවා. "ගංගාවෝ අපගේ සොහොයුරෝ වෙති. ඔවුහු අපගේ පිපාසය සංසිඳුවති. අපගේ දරුවන් පෝෂණය කරවති. සුදු මිනිසුන් වන ඔබ අපගේ සිරිත් විරිත් නොදන්නා බව අපි දනිමු."වෙල්ලස්සේ ජනතාව හැටියට අපි කියනවා, අපේ සිරිත් විරිත් මේ රටේ පාලකයන්ට තවම තේරිලා නැහැ කියලා. මේ රටේ පාලකයන්ට තේරුණා නම්, පරිසර දිනයේදී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ අතින් එහෙම දෙයක් වෙන්න පුළුවන්කමක් නැහැ. එතුමා පොළොන්නරුවෙන් ඉපදුණු කෙනෙක්. පොළොන්නරුවේ ගොවි පුතෙකුගෙන් ඉපදුණු සරල සුගම නායකයාය කියන ජනාධිපතිගේ අතින් එහෙම දෙයක් වෙන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රතු ඉන්දියානු නායකයා මෙසේ කියනවා.

"අපගේ දරුවන් පේෂණය කරවති. සුදු මිනිසුන් වන ඔබ අපගේ සිරිත් විරිත් නොදන්නා බව අපි දනිමු. ඔබට එක් බිම් කඩක් තවත් බිම් කඩකට වඩා වෙනස් නොවන බව අපි දනිමු. භූමියේ තිබිය යුතු දේ පැහැර ගෙන පලා යන ඔබගේ මිනිස්සු මේ භූමියට පිටස්තරයෝ වන්නාහ. පොළොව ඔවුන්ට සහෝදරයකු නොව සතුරෙකි. භූමිය අත්පත් කර ගැනීමෙන් පසු ඔවුන් එය අමතකකොට තවත් නැවුම් බිම් යටත් කර ගනිමින් ඉදිරියට ඇදෙති. ඔවුන්ගේ කෑදරකම විසින් මේ භූමියේ සාරය උරා බොනු ලැබීමෙන් පසු ඉතිරි වන්නේ හිස් කාන්තාරයක් පමණි. අපගේ සිරිත් විරිත් ඔබගේ සිරිත් විරිත්වලට වඩා වෙනස් වන්නේය. මව් බිමට සිදුවන ඕනෑම හොඳක් හෝ නරකක් එහි ජීවත්වන දරුවන්ටත් උරුම වන්නේය. අපි දන්නා පරිදි මේ මහ පොළොව මිනිසාට අයිති නැත. එහෙත් මිනිසා මහ පොළොවට අයත් වන්නේය."

ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමනි, අපට මේ පොළොව අයිති වන්නේ නැහැ. විජිතමුනි සොයිසා මැතිතුමනි, අපට මේ පොළොව අයිති වන්නේ නැහැ. නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමනි, අපට මේ පොළොව අයිති වන්නේ නැහැ. හරින් ප්‍රනාන්දු මැතිතුමනි, අපට මේ පොළොව අයිති වන්නේ නැහැ. මිය ගිය ධර්මදාස බණ්ඩා ඇමතිතුමනි, අපට මේ පොළොව අයිති වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
අපට අයිති වන්නේ අනාගත දරු පරම්පරාවට අයිති මේ මහ පොළෙව ආරක්ෂා කර දීමයි. ඒ නිසා ජූනි 5 වෙනි දා ආරම්භ කිරීමට නියමිත මේ පරිසර විරෝධී ව්‍යාපෘතිය වහාම නවත්වන්න කියලා අපි කියනවා.

ඒ සමඟම මම අවසාන වශයෙන් කියනවා, ජනප්‍රවාදයේ එන කථාවක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මිනිත්තුවක් දෙන්න මේ ජනප්‍රවාදයේ කථාව කියන්න. අපේ ගම්වල කථාවක් තිබෙනවා,"ඇතැම් යකුන් දුම්මල ගහලාවත් පන්නන්න බැහැ" කියලා. මේ ආණ්ඩුවටත් දැන් යකා වැහිලා. මේ ආණ්ඩුවේ

[ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

ඉන්නවා, රීරි යකා. මේ ආණ්ඩුවේ ඉන්නවා, මහසොහොන් යකා. මේ ආණ්ඩුවේ ඉන්නවා හූනියම් යකා. මේ ආණ්ඩුවේ ඉන්නවා, සන්නි යකා. මේ ආණ්ඩුවේ ඉන්නවා, ගරා යකා. මේ ආණ්ඩුවේ ඉන්නවා, රට යකා. මේ ආණ්ඩුවේ ඉන්නවා, කළුකුමාර යකා. කළුකුමාර යකා වැහුණාට පස්සේ මොකක්ද කරන්න ඕනෑ? යකැදුරා ගෙනෙන්න ඕනෑ. අපි ලෑස්තියි ඒකාබද්ධ විපක්ෂය හැටියට මේ ජනතා අරගලයේදී සියලු දේශපාලන මිතුරන් එකට එකතු කර යක්දෙස්සා නටලා, යකා නටලා, යකා බැඳලා, යකා ගස් බැඳලා හෝ මේ ආණ්ඩුව පලවා හරින්න. මේ ජනතා ද්‍රෝහී ආණ්ඩුව පලවා හරින්න අපි කටයුතු කරනවාය කියන සහතිකය දළදා හාමුදුරුවන්ගේ නාමයෙන් ලබා දෙමින් මේ ව්‍යාපෘතියට අපි විරුද්ධයි, විරුද්ධයි, විරුද්ධයි කියන කාරණය මතක් කරමින් මම නවතිනවා. සියලුදෙනාටම ස්තූතියි.

[අ.භා. 2.06]

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින ඌව වෙල්ලස්ස උක් වගාව සම්බන්ධයෙන්, ගැසල් වෙන්චර්ස් සමාගමට ඉඩම් ලබා දීම සම්බන්ධ කල්තැබීමේ යෝජනාවට අදාළ විවාදයයි පැවැත්වෙන්නේ. මේ ගැන නිවැරදි කිරීමකින් පසුව මගේ කථාව පටන් ගන්න ඕනෑය කියලා මම අදහස් කරනවා.

පළමුවෙන් මම කියන්න ඕනෑ, 2015 ජනාධිපතිවරණයේදී අපි ජනතාවට දුන් පොරොන්දුව ගැන. මොකක්ද අපි ජනතාවට දීපු පොරොන්දුව? ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව රටට කිව්වා, තිරසාර සංවර්ධනය ඉලක්ක කර ගත් වගාව සඳහා අපේ භූමිය යොදා ගන්නවා කියලා. තිරසාර සංවර්ධනය කියන්නේ මොකක්ද? තිරසාර සංවර්ධනය කියන්නේ ඒක බෝග වගාවෙන් බහුවිධ බෝග වගාවට පරිවර්තනය වීමයි. යම් කිසි රටක අක්කර සියයක් නොවෙයි, අක්කර දහස් ගණනක්, දස දහස් ගණනක් ඒක බෝග වගා කරනවා නම් එය අද සලකන්නේ පරිසර විරෝධී , පරිසර හිතකාමී ගොවිතැනට විරුද්ධ ප්‍රතිපත්තියක් හැටියටයි. ඒ අනුව, මේ යෝජනාව තිරසාර ගොවිතැනේ ප්‍රතිපත්තියට පටහැනි යෝජනාවක් බව මම මුලින්ම ප්‍රකාශ කරන්නට ඕනෑ.

මේ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ආණ්ඩුව පැත්තෙන් හා විරුද්ධ පක්ෂයෙන් විශාල අදහස් ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබෙනවා. මොකක්ද ආණ්ඩුව පැත්තෙන් ගෙනා යෝජනාව? ආණ්ඩුව කිව්වේ රටේ සීනි නිෂ්පාදනය මදි, විශාල ප්‍රමාණයක, මිලියන හාරසියයක, පන්සියයක පමණ ප්‍රමාණයක සීනි පිටරටින් ගෙන්වනවා, සීනි ගෙන්වා ගැනීමෙන් රටේ සල්ලි පිටරට යනවා කියන එකයි. ඒ නිසා රටේ සීනි නිෂ්පාදනය කරන්න ඕනෑය කිව්වා. ඒ සීනි නිෂ්පාදනය කිරීම සඳහා තමයි අපි මේ කර්මාන්ත ශාලාව ආරම්භ කරන්න අපි කල්පනා කර තිබෙන්නේ කියලා කිව්වා.

ඊළඟට, "මේ ඉඩම් දෙන්නේ ජනතාවටයි, අපි ආරම්භ කරන්නේ කර්මාන්තශාලාව පමණයි "කියලා ආණ්ඩුව පැත්තෙන් ප්‍රකාශ කළා. විරුද්ධ පක්ෂය පැත්තෙන් කිව්වා, මේ ආණ්ඩුව ජනතා ද්‍රෝහී ප්‍රතිපත්තියක් ගෙනැවිත් තිබෙනවා කියලා. ඒ නිසා මේ සම්බන්ධයෙන් මගේ අදහස් සභාවට ප්‍රකාශ කරන එක හොඳයි කියා මා අදහස් කරනවා.

ඔබ හැම දෙනාම දන්නවා, පසුගිය ආණ්ඩු කාලයේ, 2006 වර්ෂයේදීත් ඊට පසුවත් ස්ථාන කිහිපයකම මේ වාගේ ඉඩම් දුන්නා; ඉඩම් දීමේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැඟුවා. උදාහරණයක් හැටියට ගත්තොත් පසුගිය රජය කාලයේ ඩෝල් සමාගමට සෝමාවතියේ ඉඩම් ලබා දුන්නා. අලි විශාල වශයෙන් ගැවසෙන කැලෑවේ විශාල භූමි ප්‍රමාණයක් එළි පෙහෙළි කළා. ඒ වාගේම ඩෝල් සමාගමට වාණිජ වශයෙන් කෙසෙල් වගා කිරීම සඳහා මේ වාගේම ඉඩම් ලබා දුන්නා. උක් වගාව සඳහාත් මේ වාගේම සැලැසුම් සකස් කළා.

අත්තනෝමතික පසුගිය ආණ්ඩුව පරාජය කිරීමට දායක වෙච්ච අයගේ නොයෙක් බලාපොරොත්තු තිබෙන්න ඇති. පරිසරවේදියෙකු හැටියට වාගේම පරිසරය ගැන සංවේදී කෙනෙකු හැටියටත්, මේ රටේ ගහ කොළ, පරිසරය ගැන හිතන කෙනෙකු හැටියටත් පසු ගිය ආණ්ඩුවට විරුද්ධ වුණා. ප්‍රධාන වශයෙන්ම අපි පරිසර හිතවාදී ඇසකින් පසුගිය ආණ්ඩුවට විරුද්ධ වුණා. මේ ආණ්ඩුව පළවා හැර අලුත් ආණ්ඩුවක් යටතේ අපි බලාපොරොත්තු වුණේ, මේ රටේ සංවර්ධනය යම්කිසි ආකාරයකින් ජාතික සංවර්ධනයක් කරා මෙහෙය වන්නයි. මේ ව්‍යාපෘතිය අපි හිතන ජාතික සංවර්ධන ව්‍යාපෘතියට පරස්පරයි කියන කාරණය මුලින්ම ප්‍රකාශ කිරීම මගේ යුතුකමක් වනවා. මොකද, අපි ජන මතය වෙනුවෙන් පෙනී සිටිනවා නම්, ඒ ජන මතයට විරුද්ධ යම්කිසි දෙයක් සිදු වන කොට ඒ පිළිබඳව දෙවිධියකට කථා කරන්නේ නැතිව අවංකව, සත්‍යගරුකව අපේ අදහස ප්‍රකාශ කර සිටීම යුතුකමක් හැටියට මම කල්පනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහවැලියෙන් බෙදා දෙන ඉඩම්වල ප්‍රමාණය කොපමණද කියන කාරණයේ දී මන්ත්‍රීවරුන් නොයෙක් ඉලක්කම් කිව්වා. ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන් හැටියට කීප දෙනෙකුම කිව්වා, "මේකේ ඉලක්කම් වැරදියි" කියලා. අපේ විජිත් විජයමුණි සොයිසා මැතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. සමස්තය ගත්තාට පස්සේ අක්කර 40,000ක් පමණ ජනතාවට බාර දෙන්න නියමිතයි. එම අක්කර 40,000 අපි බාර දෙන්නේ ගිවිසුමක් යටතේ. මොකක්ද, ඒ ගිවිසුම? "මේ ඉඩම්වල උක් පමණක් වගා කළ යුතුයි" කියන කොන්දේසිය යටතේ තමයි අපි මේ ඉඩම් බාර දෙන්නේ. ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, මේ ව්‍යාපෘතිය සමාගමෙන් වියෝග වෙච්ච එකක් කියලා. ඒ කියන්නේ, සමාගමේ අවශ්‍යතාව මත අපි ඉඩම් ජනතාවට බාර දෙනවා. ජනතාව විසින් කළ යුත්තේ සමාගමට අවශ්‍ය විධියට උක් වගා කරලා බාර දීමයි. උක් වගා කරන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් ස්ථාවර භාවයක් නැහැ.

සාමාන්‍යයෙන් අපි ඒක බෝග වගා කරනවා. දැනටත් ඒක බෝග වගාවක් හැටියට, වී වගාව කරනවා. තේ වගාව ඒක බෝග වගාවක් හැටියට කඳුකර ප්‍රදේශවල විශාල වශයෙන් කරනවා. බහුල වශයෙන්, එනම් සියයට 95ක්ම අපි මේ වගා කටයුතු කරන්නේ විෂ රසායනික ද්‍රව්‍ය විශාල වශයෙන් පාවිච්චි කරමිනුයි. ලෝකය මේ වකවානුවේ දී විෂ රසායන භාවිතයෙන් අයින් වෙන්න තීරණය කරලා තිබෙනවා. මීට මාසයකට පමණ පෙර හේග් නුවර තිබෙන අන්තර්ජාතික අධිකරණයෙන් තීරණයක් ලබා දුන්නා. මොකක්ද, මේ තීරණය? ඒ තීරණය තමයි, මේ මොන්සැන්ටෝ සමාගමේ ප්‍රධාන වල් නාශකයක් වෙච්ච රවුන්ඩප් තහනම් කරන්න තීරණය කිරීම. ඒ රවුන්ඩප් වල් නාශකය පරිසර විරෝධී, මානව හිමිකම් කඩ කරන බව අන්තර්ජාතික අධිකරණයෙන් අද වනකොට පිළිගෙන තිබෙනවා. අක්කර 40,000ක් 50,000ක් වගා කරනකොට අනිවාර්යයෙන්ම ඒ ගොවියන්ට සමාගම විසින් ධෛර්යය ලබා දෙන්නේ විශාල වශයෙන් වල් නාශක ගහන්නයි. මේ වල් නාශක ගහලා, අපි උක් වගා කිරීම සඳහා කපා දමන්නේ කුමන වර්ගයේ ගස්ද කියලා විශේෂයෙන්ම විජිත් විජයමුණි සොයිසා ඇමතිවරයා ඒ ප්‍රදේශයේ ඇමතිතුමා හැටියට හොඳට දන්නවා.

"සියඹලාණ්ඩුව" කියලා ඒ පැත්තේ ගමක් තිබෙනවා. ඒ නම ලබා දීලා තිබෙන්නේ ඒ ප්‍රදේශයේ සියඹලා ගස් තිබෙන නිසයි. ලංකාවට බහුල වශයෙන්ම අවශ්‍ය කරන ඖෂධවලින් සියයට 70ක් පමණ වැවෙන්නේ මොනරාගල දිස්ත්‍රික්කයේ. අරළු, බුළු, නෙල්ලි විතරක් නොවෙයි, අපි නීති විරෝධි කියන ගංජා වැඩිපුරම වැවෙන්නේත් මොනරාගල දිස්ත්‍රික්කයේ. ගංජා කියන්නේ ලෝකයේ බොහෝ රටවල තහනම් දෙයක් නොවෙයි. ලංකාවේ සුද්දන්ගේ කාලයේ ගංජා තහනම් කරලා තිබෙනවා. ගංජා පිළිබඳව මගේ තිබෙන අදහස මේ අවස්ථාවේ දී මා ප්‍රකාශ කරන්න යන්නේ නැහැ, මෙම විවාදය වෙනත් පැත්තකට මාරු වන නිසා. කෙසේ වෙතත් ආයුර්වේදයට අනුව ගංජා ඖෂධයක්. මට අවශ්‍ය වුණේ මොනරාගල දිස්ත්‍රික්කය ජෛව විවිධත්වයෙන් ඉතා බහුල ප්‍රදේශයක් කියන කාරණය තහවුරු කරන්නයි. විශාල වශයෙන් ඖෂධ වැවෙන, ඖෂධ වනාන්තරයක් තමයි මොනරාගල දිස්ත්‍රික්කය. මේ ඖෂධ වනාන්තරය සම්පූර්ණයෙන්ම බෝග වගාවකට යොමු කිරීම සුදුසු ක්‍රියාවක් නොවන බවයි මම හිතන්නේ. උක් වගාව සඳහා අක්කර 40,000ක් අවශ්‍ය නම්, උක් වගා කළ හැකි භූමි මොනවාද කියන කාරණය සම්බන්ධයෙන් අලුත් සාකච්ඡාවක් කරන්න ඕනෑ. අපි උක් වගාව කරන්න ඕනෑ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් මට අදහසක් තිබෙනවා.

ලංකාවේ සීනි අවශ්‍යතාව සපුරා ගැනීමේදී විශේෂයෙන්ම දැනට අපට සක්‍රීය කර්මාන්තශාලාවක් තිබෙනවා. එක කර්මාන්තශාලාවක ගොඩනැගිලි සහ අවශේෂ ද්‍රව්‍ය තිබෙනවා. ඒ කන්තලේ කර්මාන්තශාලාවේ. මේ කර්මාන්තශාලා හතර ක්‍රියාත්මක කිරීමෙන් තවත් කිසිම කර්මාන්තශාලාවක් නැතුව ලංකාවේ සම්පූර්ණ සීනි අවශ්‍යතාව සම්පූර්ණ කර ගන්න පුළුවන්. ඒ කියන්නේ අපට වර්ෂයකට මෙට්‍රික් ටොන් ලක්ෂ හතරක පමණ සීනි අවශ්‍ය වෙනවා. අපි සාමාන්‍යයෙන් ලබා ගන්නේ මෙට්‍රික් ටොන් පනහක්, හැටක් අතර ප්‍රමාණයක්. ඒ අනුව අපට සීනි විශාල ප්‍රමාණයක් පිට රටින් ගෙන්වන්න සිදු වෙලා තිබෙනවා. එතකොට මෙට්‍රික් ටොන් හතරක් වන සීනි නිෂ්පාදනය ලංකාවේ අවශ්‍යතාවට සරිලන විධියට ලංකාවේම නිෂ්පාදනය කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තිබෙනවා. මගේ ස්ථාවරය නම් මේ තිබෙන කර්මාන්තශාලා හතර පණ ගැන්වීමෙන් පසු අලුතෙන් කර්මාන්තශාලාවක් බිහි කිරීමේ අවශ්‍යතාවක් නැති බවයි. ඔබතුමන්ලාට මේ පිළිබඳව දැන ගන්න අවශ්‍ය නම්, මේ කර්මාන්තශාලාවල ධාරිතාව අධ්‍යයනය කරලා මේ පිළිබඳව විධිමත් සාකච්ඡාවක් කරමු.

විශේෂයෙන්ම අපි කන්තලේ අපේ කර්මාන්තශාලාව සක්‍රීය කරනවා නම් අපි උක් වගා කළ යුත්තේ යම් කිසි ආකාරයක බහු භෝග වගාවක් හැටියටයි. ඒ කියන්නේ අක්කරයක්, අක්කර දෙකක් තිබෙන භූමියක පර්චස් 20ක තමයි අපි උක් වගා කරන්න ඕනෑ. එතකොට අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පොළොන්නරු දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සෑම තැනම කුඩා පරිමාණයෙන් උක් වගා කරනවා. එතකොට ඒ උක් වගාව අපට පුළුවන් කන්තලයට ලබා දෙන්න. එතකොට වතුර විශාල ප්‍රමාණයක් අවශ්‍ය වෙන්නේ නැහැ. නඩත්තුව පහසු වෙනවා.

අපේ ප්‍රමුඛ අවශ්‍යතාව මේ අක්කර 40,000න් මෙට්‍රික් ටොන් වැඩි ප්‍රමාණයක් ලබා ගන්න එකද? දැනටමත් අක්කර 40,000ක් පමණ උක් වගා කර තිබෙනවා. අපට පැල්වත්ත සීනි කර්මාන්තශාලාවට අයත් අක්කර 25,000ක උක් වගාවක් තිබෙනවා. මේ තිබෙන ප්‍රමාණයෙන් අපට ලබා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ මෙට්‍රික් ටොන් 50ක - 60ක අතර ප්‍රමාණයක්. මේ ප්‍රමාණය ප්‍රමාණවත් වෙන්නේ නැහැ. එහෙම නම් අපි තවත් වගා කළත් උපරිම වශයෙන් තවත් මෙට්‍රික් ටොන් 100ක් වැඩි කරන්න පුළුවන් කියලා කියන්න පුළුවන්. දැනට තිබෙන කර්මාන්තශාලා තුනක් සක්‍රීයයි. තව එකක් සක්‍රීය නැහැ. ඒක සක්‍රීය කිරීමෙන් අපට ඒ අවශ්‍ය කරන ධාරිතාව ලබා ගන්න පුළුවන් වෙනවා.

ඊළඟ කාරණය මෙයයි. මේ අවස්ථාවේ මට මතක් වෙනවා, එදා රත්න ශ්‍රී විජේසිංහ ලියපු ලස්සන ගීතයක්. ඒක ලංකාවේ හුඟක් ජනප්‍රිය වුණා. ඒ සින්දුව තමයි, "බිම්බරක් සෙනඟ ගැවසුණු චන්ද්‍ර සූර්යයා ඉපදුණු රම්‍ය භූමියේ මනරම් මාළිගාව කෝ...." කියන සින්දුව. ඒ සින්දුවේ අන්තිමට එක තැනක ලිව්වා, "ට්‍රැක්ටරේ යකඩ ගජසෙන් කුංචනාදයෙන් ඇළලුණු වෘක්ෂ දේවතාවුන් බිම වැටී පණගසයි" කියලා. එදා රත්න ශ්‍රී විජේසිංහ ලියපු සින්දුව අදටත් ඉතාම වටිනවා. අපි ගොවියන්ට මේ අක්කර ප්‍රමාණය වගා කරන්න දුන්නොත්, අර වෘක්ෂ දේවතා ගස් නැත්නම් අපේ සියඹලා ගස්, අපේ අරළු, බුළු, නෙල්ලි වගාවන් - සියලු ඖෂධ- ගොවියන්ට සම්පූර්ණයෙන්ම විනාශ කරන්න සිදු වෙනවා. අපට කිසිම වචනයක් දෙන්න බැහැ, මේක විනාශ කරන්නේ නැහැය කියලා. කොම්පැනියක් දැමීම නොවෙයි ප්‍රශ්නය. අක්කර 150ක් කොම්පැනියකට දීම ගැන මගේ විරුද්ධත්වයක් නැහැ. මම හිතන්නේ නැහැ, ඒකේ විශාල ගැටලුවක් තිබෙනවා කියලා. මම ඒක ප්‍රශ්නයක් හැටියට දකින්නේ නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ මොනරාගල දිස්ත්‍රික්කයේ සහ-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ස්වාමීන් වහන්ස, ඔබතුමාට විනාඩි පහක කාලයකුයි තිබෙන්නේ.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
බොහොම ස්තූතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අද මහ පොළොවේ තිබෙන වටිනාකම තිබෙන්නේ ජීව විවිධත්වය මත. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද තේ වගාවේ ඇති වී තිබෙන කනගාටුදායක ඉරණම පිළිබඳව මා කියා සිටින්න කැමැතියි. අද අක්කර ලක්ෂ දෙකක පමණ ප්‍රමාණයක් කඳුකර ප්‍රදේශයේ අපි තේ වගා කරලා තිබෙනවා. එදා සුද්දන්ගේ කාලයේයි තේ වගාව ආරම්භ කළේ. අද අක්කර 80,000ක් විතර තිබෙනවා, ඇට තේ වගා කරපුවා. දැන් රිකිලි තේ වගා කරන්නත් බැහැ. වෙන භෝගයක් වගා කරන්න බැරි තරමට අවුරුදු 50ක්, 60ක් අතරතුර මේ ජල පෝෂක ප්‍රදේශ අද සම්පූර්ණයෙන් විනාශ වෙලා අපේ ලංකාවට විශාල බලපෑමක් ඇතිවෙලා තිබෙනවා.

ගරු විජිත් විජයමුණි සොයිසා මැතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. මම ඒ වාර්තාව ගැන කියන්නම්. මධ්‍යම කඳුකරයේ තේ වගාවන්ට ගහන තෙල්, පොහොරවල වස විෂ නිසා අද මධ්‍යම කඳුකරයේ දිස්ත්‍රික්ක පහක වැව්වල තිබෙන ජලය බීමට නොවෙයි, ගොවිතැනටවත් පාවිච්චි කළ නොහැකි තරම් අතිවිශාල ප්‍රමාණයෙන් දූෂණය වෙලා තිබෙනවා. ලංකාවේ වකුගඩු රෝගීන් ලක්ෂයක් සිටින බවට හඳුනාගෙන තිබෙනවා. තවත් ලක්ෂ දෙකකට වැඩි ප්‍රමාණයක් සිටින බවට වාර්තා වෙලා තිබෙනවා. එහෙම නම් බහුවිධ භෝග වගාවක් වෙනුවට ඒක භෝග වගාවක්, ඒ කියන්නේ තනි උක් වගාවන්ට අපි ජනතාව පෙලඹෙව්වොත් ඒ වගා කරන්න වෙන්නේ කාබනික ක්‍රමයටවත්, පොහොර යොදලාවත් නොවෙයි. අනිවාර්යයෙන්ම කරන්න වෙන්නේ ක්ෂණිකව තෙල් පොහොර විශාල ප්‍රමාණයක් භාවිත කරලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මේ ගැන සාකච්ඡා කරන්න ඕනෑ. මේක බහුවිධ භෝග වගාවක් හැටියට අපට හරවන්න පුළුවන්ද?

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

ඊළඟට, ඒ ප්‍රදේශවල තිබෙන වැව් පිළිබඳවත් සිතන්න වෙනවා. මට තිබෙන ඉතාම සුළු කාලය තුළ මම ඒ ගැනත් කියන්න කැමැතියි. අපි ගංගා හරවලා වතුර ගන්න ක්‍රමයක් තිබුණේ නැහැ.

අපේ අතීත මුතුන් මිත්තෝ හදපු ක්‍රමය තමයි, අද තිරසර සංවර්ධනයේ හොඳම ක්‍රමය. ඒ කියන්නේ, වියලි කාලයේ අහසින් වැටෙන සියලුම වතුර සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ සහ මහා පරිමාණ වැව්වල විශාල වශයෙන් අපි ගබඩා කර ගත්තා. එහෙම ගබඩා කර ගත්තාම පොළොවේ තෙතමනය සදාකාලිකව රැඳිලා තිබුණා. එතකොට වගාවට අමුතුවෙන් වතුර දෙන්න කියලා ක්‍රමවේදයක් අපට අවශ්‍ය වෙන්නේ නැහැ. මක්නිසාද කියනවා නම්, මේ පොළොව ජල පෝෂණයෙන් සදාකාලික යුක්ත වන නිසා.

පොළොන්නරු දිස්ත්‍රික්කයේ පරාක්‍රම සමුද්‍රය හදලා තිබෙන්නේ වතුර දෙන්න නොවෙයි, ජල පෝෂක තත්ත්වය මහ පොළොවේ ආරක්ෂා කරන්නයි. අද විද්‍යාත්මකව ඒක තහවුරු කරලා තිබෙනවා. අද ගෝලීය උණුසුම්වීම යටතේ ඇති වෙලා තිබෙන කාලගුණ විපර්යාස යටතේ පසුගිය කන්නයේදී අපේ ගොවි ජනතාවගෙන් සියයට පනහකට වතුර නැති වුණා. එහෙමනම් මොනරාගල මේ වාගේ අක්කර තිස් හතළිස් දහසක අපි උක් වගා කරනවා නම් , මේ කාලගුණ විපර්යාස යටතේ මේවා නඩත්තු කරන්නේ කොහොමද? මහ පොළොව යටින් වතුර ගන්න වෙනවාද? විශේෂයෙන්ම, විදේශීය බහු ජාතික සමාගම් අද කාන්තාරයේ මහා විශාල වගාවන් කළා. ඒ නිසා ඇති වෙච්ච මහා දැවැන්ත පාරිසරික ප්‍රශ්න ගැන ලෝකයේ සාකච්ඡා කරලා, ඒවා අතහැර දාන්න කියලා අද යෝජනා වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම මොනරාගල කියන්නේ, අපි ආරක්ෂා කර ගත යුතු ලංකාවේ තිබෙන අපේ පරම, පූජනීය භූමියක්. එහි තිබෙන ජෛව විවිධත්වය අපට කාටවත් මිල කරන්න පුළුවන්කමක් නැහැ; එහි තිබෙන ඖෂධවල වටිනාකම කිසිම කෙනෙකුට මිල කරලා සීමාවක් කරන්න පුළුවන්කමක් නැහැ. ගහක් කපන කොට ඒකට අපි වටිනාකමක් දෙන්න ඕනෑ. අපේ fridge එකකින් අපට සියයට 14ක් සීතල ලැබෙනවා නම්, අපට ගහකින් සියයට 32ක් සීතල හම්බ වෙනවා. අපි fridge එකට වටිනාකමක් දෙනවා. හැබැයි, මහ පොළොවේ හැදෙන ගහකින් කරන සේවාවට අපි වටිනාකමක් දෙන්නේ නැහැ. ඒකෙන් ලැබෙන ඔක්සිජන්වලට, ඒක මහ පොළොව ජීව චක්‍රයක් බවට පත් කිරීම වෙනුවෙන්, ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වය වැඩි කිරීම වෙනුවෙන් අපි සත පහක් ගහකට දෙන්නේ නැහැ. ඒ නිසා පරිසර චක්‍රයේ තිබෙන ජල චක්‍රය ආරක්ෂා කිරීම, බහුවිධ ඒ ඒ ජෛව පද්ධති ආරක්ෂා කිරීම පදනම් කර ගෙන තමයි අපි මහ පොළොව සංවර්ධනය කරන්න ඕනෑ. මේ කරන්න යන්නේ එවැනි ඉලක්කයක් මත මහ පොළොව සංවර්ධනය කිරීමක් නොවෙයි. මේක ජනාධිපතිතුමා එකඟ වෙච්ච ප්‍රතිපත්තියත් නොවෙයි.

මේ ආකාරයට උක් වගාව වෙනුවෙන් කර්මාන්තශාලාවකට අක්කර 150ක් ලබාදීම ගැන මට නම් කිසිම ප්‍රශ්නයක් නැහැ. සමහරවිට අද අපට කර්මාන්තශාලාවක් ඕනෑ වෙයි. කර්මාන්තශාලා තුනක් ක්‍රියාත්මක බව මම මුලින් කිව්වා. කන්තලේ කර්මාන්තශාලාව නැහැ. ඒක දාන්න ඕනෑ කන්තලේද, මොනරාගලද කියලා අපි තීරණයක් ගන්න ඕනෑ. මගේ අදහස අනුව, මොනරාගල කියන්නේ උක් වගා කරන්න සුදුසු භූමියක් නොවෙයි කියන එකයි. මොනරාගල අපි ආරක්ෂා කළ යුත්තේ පුණ්‍ය භූමියක් හැටියටයි. ජෛව විවිධත්වය අනර්ඝව ඇති මහ පොළොවක් හැටියට ඒ පොළොව සදාකාලිකව අපි ආරක්ෂා කර ගත යුතුයි. එදා බදුල්ල දිස්ත්‍රික්කය සම්පූර්ණයෙන්ම මහ ජනතාවත් එක්ක සංහාරය කළා. මොකටද මේ සංහාරය කළේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ස්වාමීන් වහන්ස, කාලය අවසානයි.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කථාව අවසන් කරනවා.

ඒ සංහාරය කළේ වෙන මොකටවත් නොවෙයි. එදා ඉඩම් මං කොල්ල කන්න අපේ ජල චක්‍රය විනාශ කළා. ඒකභෝග වගාවට මහ පොළොව යොමු කළා. අපේ මහ පොළොව එදා විනාශ කිරීම හේතුවෙන් අද අපේ ජලය, වායුව, මහ පොළොව දූෂණය වෙලා පරම්පරා ගණනකට මේක නිවැරැදි කරන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

මම හිතනවා, මේ ව්‍යාපෘතිය අනුව කර්මාන්තශාලාව දෙන එක නොවෙයි ප්‍රශ්නය; අක්කර 150 ප්‍රශ්නයක් නොවෙයි කියලා. මේ ප්‍රතිපත්තිය ඒකභෝග වගාව මුල් කර ගත්ත ප්‍රතිපත්තියක්. අපට සීනි අවශ්‍ය නම්, සීනි නිෂ්පාදනය කිරීමේ ක්‍රමවේදයක් අප හඳුනා ගත යුතු බවයි මගේ ස්ථාවරය. බොහොම ස්තූතියි.

[පි.ප. 2.23]

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய இந்த விவாதத்திலே நிலத்தை விற்பனை செய்வது பற்றியோ, அதைக் கொள்வனவு செய்வது பற்றியோ அல்லது அதற்காக நான் ஆத்திரப்பட்டோ, ஆவேசப்பட்டோ இங்கு உரையாற்ற விழையவில்லை. நாட்டினுடைய அபிவிருத்திக்கும் நிலைபேறான ஓர் அபிவிருத்தியைப் பெற்றுக் கொள்வதற்கான திட்டங்களை வகுப்பதற்கும் நாங்கள் எதிர்மாறானவர்கள் அல்லர். ஆனால், இந்த நிலம் கைமாறுதல் தொடர்பான இன்றைய இந்த விவாதத்திலே வடக்கு, கிழக்கு மக்களுக்குச் சொந்தமான நிலங்கள் அவர்களிடமிருந்து கைமாறியிருப்பது பற்றிய மிகவும் வேதனையான சில கருத்துக்களை இச்சந்தர்ப்பத்தில் மிகவும் அமைதியாகவும் விநயமாகவும் முன்வைக்க விரும்புகின்றேன்.

30 வருட கால யுத்தத்திலே தோற்றுப்போன, அனைத்தையும் இழந்துபோன எமது மக்கள் மீண்டும் தங்களது பூர்வீகக் காணிகளுக்குள் செல்லமுடியாத வகையில், அந்தக் காணிகளில் இராணுவத்தினர் முகாம்களிட்டுத் தரித்திருப்பதும் கடற்படையினரும் விமானப்படையினரும் கையகப்படுத்தி வைத்திருப்பதும் இன்று யுத்தம் முடிவடைந்து 8 வருட காலமாகியும் தொடர்ந்துகொண்டேயிருக்கின்றது. இந்தக் காணிகளுக்குரிய ஆவணங்களை எமது மக்கள் வைத்திருந்தும் அந்தக் காணிகள் அவர்களிடம் கையளிக்கப்படாத நிலையில் அவர்கள் தங்களது காணிகளுக்கு முன்பாகவே தகரக் கொட்டகைகளை அமைத்து, அந்தக் காணிகளை விடுவித்துத் தருமாறு சாத்வீக ரீதியாகப் போராடிக்கொண்டிருக்கிறார்கள். 2 மாத காலத்துக்கு மேலாக வீதியோரங்களிலே தமது குழந்தை குஞ்சுகளோடு அவர்கள் போராடுவதை நீங்கள் அனைவரும்

அறிவீர்கள். அந்தவகையிலே முல்லைத்தீவு மாவட்டத்தின் கேப்பாப்புலவு காணியை விடுவிக்குமாறு எமது மக்கள் தொடர்ந்து போராடிக்கொண்டு வருகிறார்கள். இதனை விடுவிப்பது தொடர்பாக கடந்த 17ஆம் திகதி பாதுகாப்பு அமைச்சில் நடைபெற்ற கூட்டத்தின் தொடராக 19ஆம் திகதி அந்த மக்களின் 5 பிரதிநிதிகளும் ஏனைய அதிகாரிகளும் அந்தக் காணிகளைச் சென்று பார்வையிட்டதன் பின்னர், அதனை விடுவிப்பதற்குக் கோரிக்கைகள் விடப்பட்டன. ஆனால் இன்றுவரை எதுவிதமான முன்னேற்ற நடவடிக்கைகளும் இல்லாது அந்த மக்கள் தொடர்ந்தும் போராடிக் கொண்டிருக்கிறார்கள். அந்தக் காணிகளை அவர்களிடம் உடனடியாகக் கையளிப்பதற்குரிய நடவடிக்கைகளை எடுக்கவேண்டுமென்று இந்த அரசை மிகவும் விநயமாகக் கேட்டுக்கொள்கின்றேன்.

அதுமட்டுமல்ல, மகாவலி "L" வலயத் திட்டத்தின் கீழ் கொக்கிளாய், கொக்குத்தொடுவாய், கருநாட்டுக்கேணி போன்ற பகுதிகளிலுள்ள காணிகள் குறிப்பாக, அவர்களது வயல் நிலங்கள், கையகப்படுத்தப்பட்டு, அங்கு வெலிஓயா என்னும் பிரதேச செயலகத்தைத் தாபித்து, அவை அங்கு குடியேற்றப்பட்ட சிங்கள மக்களுக்குப் பாரப்படுத்தப் பட்டுள்ளன. இந்தக் காணிகள் அந்த மக்களிடம் காணப்பட்ட உற்பத்திக்குரிய, வருமானத்தைப் பெற்றுத்தருகின்ற காணிகளாகவே அமைந்திருக்கின்றன. இதனைவிட, வட்டுவாகல் காணியை விமானப்படை கையகப்படுத்தி யிருப்பதனால், மக்களுடைய தொழில்கள், குறிப்பாக கடற்றொழில், பாதிக்கப்பட்டிருக்கின்றது. அதுமட்டுமல்ல, அவர்களுக்கு வருமானத்தைத் தந்துகொண்டிருந்த கால்நடைகள்கூட அந்த விமானப்படை முகாமுக்குள் அகப்பட்டிருக்கின்றன. இவ்வாறாக அந்த மக்களுக்கு வருமானத்தைத் தந்த தொழில் முயற்சிகளை முறியடிக்கின்ற வகையிலே, அவர்கள் தொடர்ந்து பூர்வீகமாக வாழ்ந்து வந்த காணிகளைக் கையகப்படுத்தி, அவற்றில் முகாம்களை அமைத்திருப்பதானது, யுத்தத்திலே பாதிக்கப்பட்ட மக்களை மேலும் பாதிப்புக்கு உட்படுத்துகின்ற ஒரு காரியமாகவே அமைந்திருக்கின்றது. காணிக்குரிய ஆவணங்கள் வைத்திருப்பவர்களுக்கு அந்தக் காணிகளைக் கையளிப்பதற்கு இந்த அரசு நடவடிக்கை எடுப்பதை விடுத்து, வலுக்கட்டாயமாக, நிலைபேறான ஓர் அபிவிருத்தியை நோக்கிய செயற்பாடு என்று கூறி, பெரும் கைத்தொழிற் சாலைகளை அமைப்பதையும் அவற்றுக்குக் காணிகளைப் பிரித்து வழங்குவதற்கு நடவடிக்கை எடுப்பதையும் இந்த மக்களை - தமிழர்களை - மாற்றாந்தாய் மனப்பான்மையுடன் அணுகும் நடவடிக்கைகளாகவே கருதவேண்டியுள்ளது.

இதுமட்டுமல்ல, இன்று மிகவும் அவசர அவசரமாக வனவளத் திணைக்களம், தொல்பொருள் ஆராய்ச்சித் திணைக்களம் என்பவற்றுக்கு உரிய காணிகள் என்று மக்களது காணிகள் எல்லையிடப்படுகின்ற நடவடிக்கை தொடர்ந்து நடைபெற்றுக்கொண்டு வருகின்றது. அவர்களுக்கு வருமானம் தரும் பயிர்கள் இருக்கின்ற காணிகளை வனவளத் திணைக்களம் எல்லையிட்டுச் செல்வது, மிகவும் துரிதமாக நடைபெறுகின்ற ஒரு செயலாகக் காணப்படுகின்றது. இதன் பின்னணி என்ன? ஏன், இவ்வாறு அந்த மக்கள் பூர்வீகமாக வாழ்கின்ற காணிகளை வனவளத் திணைக்களத் துக்குரியதென்று எல்லையிடப்படுகின்றது? என்பது ஒரு புரியாத புதிராகவே உள்ளது. இதன்மூலமாகவும் எமது மக்கள் மேலும் பாதிக்கப்படுகின்ற ஒரு நிலையே காணப்படுகின்றது.

மேலும், அபிவிருத்தியை நோக்கிய நிலைபேறான அபிவிருத்தித் திட்டங்களை ஏற்படுத்த நினைக்கின்ற இதே அரசு, யுத்த காலத்தில் கைவிடப்பட்ட குளங்களை அபிவிருத்தி செய்யாதிருப்பதும், அந்தக் குளங்களுக்குக் கீழுள்ள வயல் களில் மக்கள் பயிர்செய்யக்கூடிய வகையிலே செயற்பாடு களைச் செய்யாதிருப்பதும் இங்கே குறிப்பிட்டுக் கூற வேண்டிய ஒரு விடயமாகும். குறிப்பாக, முல்லைத்தீவு மாவட்டத்தின் ஒட்டுசுட்டான் பிரதேச செயலகப் பிரிவிலுள்ள முறிகண்டிக்குளத்தின் குளக்கட்டை வெட்டிவிட்டு இராணுவம் அங்கு முகாமிட்டிருப்பதனால், அந்தக் குளத்தில் தேங்கவேண்டிய நீர், அந்த மக்கள் வாழ்கின்ற நகர்புறங் களுக்குள் செல்வதனாலும் அந்தக் குளத்துக்குக் கீழ் பயிர் செய்யப்பட வேண்டிய வயல்கள் தொடர்ந்து 09 வருடங் களாகப் பயிர்செய்யப்படாத நிலை நீடித்திருப்பதனாலும் அந்த மக்களுடைய வாழ்வாதாரம் பாதிக்கப்பட்டிருக்கின்றது. இதேபோல், மாந்தை கிழக்குப் பிரதேச செயலகத்திலுள்ள துவரமோட்டை என்னும் குளம் துப்புரவு செய்யப்பட்டு அது புனரமைக்கப்பட்ட பின்பும் அதன்கீழ் பயிர்செய்யப் படவேண்டிய காணிகள் அந்த மக்களுக்கு இதுவரை கையளிக்கப்படவில்லை. இவ்வாறான செயற்பாடுகள் தொடர்ந்து எமது பிரதேசங்களில் நடைபெற்றுக் கொண்டிருப் பதனால், எமது மக்களது வருமானம், வாழ்க்கைத்தரம், அவர்களது உற்பத்திகள் தொடர்ந்து பாதிக்கப்படுகின்ற ஒரு நிலைமையே காணப்படுகின்றது.

வடக்கு, கிழக்குப் பகுதியில் கடல் வளங்களைச் சரியான முறையிலே மக்கள் பெறமுடியாத வகையில் - கடற் றொழிலைச் செய்யமுடியாத வகையில், அங்கு இராணுவம் மக்களைத் தடுப்பதும் தென்பகுதியிலிருந்து வருகின்ற மீனவர்களை ஊக்குவிப்பதும் அங்கிருக்கின்ற அரச அதிகாரிகள் தங்களுடைய கடமைகளைச் சரியான முறையிலே செய்வதற்குத் தடைவிதிப்பதுமான செயற்பாடுகள் தொடர்ந்து இடம்பெற்று வருகின்றன. அதனால்தான், இன்றும் ஒப்பீட்டு ரீதியிலே எமது வடக்கு, கிழக்குப் பகுதிகள் மிகவும் ஏழ்மையான பிரதேசங்களாகத் தொடர்ந்தும் இருந்து வருகின்றன. எனவே, பெரும் திட்டங்களையும் பெரிய தொழிற்சாலைகளையும் முன்னெடுக்க எண்ணுகின்ற இந்த அரசு, யுத்தம் நடைபெற்ற பிரதேசத்திலே ஓர் இயல்புநிலையை ஏற்படுத்தி, அவர்களுக்கான காணிகளைத் திரும்பக் கையளித்து, அந்த மக்கள் இயல்பாகவே பயிர்ச்செய்கையில் ஈடுபடுவதற்குரிய நடவடிக்கைகளை முன்னெடுக்க வேண்டு மென்று மிகவும் விநயமாகக் கேட்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

[අ.භා. 2.31]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2016 වර්ෂයේ අපේ රටේ සීනි පරිභෝජනය මෙට්‍රික් ටොන් 651,181යි. නමුත්, 2016 වර්ෂයේ අපේ රටේ නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 62,048යි. ඒ කියන්නේ අපේ රටේ පාවිච්චි කරන සීනි ප්‍රමාණයෙන් සියයට 9.5යි අපේ රටේ නිෂ්පාදනය කළේ. නිෂ්පාදනය ගැන බලද්දී, එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් 1984-1986 කාලයේ සෙවනගල හැදුවා, පැල්වත්ත හැදුවා. කොහොම වුණත් මේ දෙකෙන් විතරක් මෙට්‍රික් ටොන් 50ක් එනවා. ඊට අමතරව එන්නේ, 1950 නිර්මාණය කරපු ගල්ඔය කර්මාන්තශාලාවෙන්. මේ රටේ සීනි පරිභෝජනය වැඩි වුණාට, 1986ට පස්සේ, -අවුරුදු තිහකින්- සීනි කර්මාන්තශාලාවක් මේ රටේ ඇති කරලා නැහැ. නමුත්, වරායට ගිහින් බැලුවොත් අපේ රටේ පරිභෝජනය සඳහා සීනි මෙට්‍රික් ටොන් හතළිහේ containers 15ක් දවස ගානේම ගොඩ බානවා. ඒ කියන්නේ,

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

අපේ රටේ සල්ලි, බදු මුදල්, ජනතාවගෙන් ගන්නා මුදල් රුපියල් කෝටි 10ක් සීනි ගෙන්වන්න කියලා විදේශ රටවලට යවනවා.

අපේ රටේ තිබෙන්නේ එහෙම තත්ත්වයක්. මහවැලි ව්‍යාපාරය -කඩිනම් මහවැලි යෝජනා ක්‍රමය- සඳහා, අවුරුදු පහේ ඒ යෝජනා ක්‍රමය සඳහා ඇමෙරිකන් ඩොලර් මිලියන 263යි අපට වැය වුණේ. නමුත් සීනි සඳහා අපි ඇමෙරිකන් ඩොලර් මිලියන 300කට වඩා පිට රටට යවනවා. අපේ රටේ කිරි නිෂ්පාදනය, සීනි නිෂ්පාදනය හදා ගත්තොත් සීනි මිලදී ගැනීමට, කිරි පිටි මිලදී ගැනීමට වැය වන විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අපේ රටේ ඉතුරු වෙනවා.

අපි දන්නවා, සීනි ගෙන්වන්න රුපියල් බිලියන 36.12ක් -කෝටි 3612ක්- අවුරුද්දකට වියදම් කරන බව. සීනි ගෙන්වනවා විතරක් නොවෙයි, ඒ අස්සේ ජාවාරමකුත් වෙනවා. සීනි containers අස්සේ තමයි කුඩු ගෝනි -පැකට්- එන්නේ. ඒ වාගේම අපේ රට දවසකට රුපියල් කෝටි 10ක කිරි පිටි ආනයනය කරනවා. කිරි ආශ්‍රිත නිෂ්පාදන සඳහා 2016 වර්ෂයේදී රුපියල් බිලියන 37.39ක් -කෝටි 3739ක්- විදේශ විනිමය වශයෙන් අපේ රටෙන් ගලා ගෙන ගියා. වර්ෂයකට සීනි මෙට්‍රික් ටොන් 72,000-80,000 අතර ප්‍රමාණයක් නිෂ්පාදනය සඳහා තමයි මේ කර්මාන්තශාලාව හදන්නේ. අපේ මුළු සීනි පරිභෝජනයෙන් සියයට 9.5ක් දැනට දේශීයව නිපදවනවා. තවත් සියයට 14ක් හදන්න තමයි මේ කර්මාන්තශාලාව නිර්මාණය වෙන්නේ. ඒ වාගේම කිරි අපට ප්‍රශ්නයක්. දවසකට රුපියල් කෝටි 10ක කිරි පිටි ගෙන්වනවා. මේ කර්මාන්තශාලාව ආශ්‍රිතව වර්ෂයක් තුළ කිරි ලීටර මිලියන 15,000ක් නිෂ්පාදනය කරන්න සැලසුම් සකස් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ කර්මාන්තශාලාව ආශ්‍රිත රොඩු, කාබනික ද්‍රව්‍ය පාවිච්චි කරලා විදුලි බලය මෙගා වොට් 28ක් නිෂ්පාදනය වෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ නිෂ්පාදනය කරන විදුලියෙන් මෙගා වොට් අටක් පාවිච්චි කරලා තමයි මේ කර්මාන්තශාලාව තනිකර ක්‍රියාත්මක වන්නේ.

අපි දන්නවා, අද අපි අපනයනය සඳහා ගම්මිරිස් වගාව promote කරන බව. ගම්මිරිස් වගාව ව්‍යාප්ත කරද්දී මේ ව්‍යාපෘතිය තුළ අවුරුද්දකට ගම්මිරිස් මෙට්‍රික් ටොන් 637ක් සහ මුං ඇට, කව්පි වැනි ධාන්‍ය මෙට්‍රික් ටොන් 1,500ක් අපි බලාපොරොත්තු වෙනවා. පවුල් 7,500ක් සමඟ එකතු වෙලා තමයි බිබිලේ මේ සීනි කර්මාන්තශාලාව ආරම්භ කරන්නේ. හන්දි ගානේ කියව කියවා ඉන්නවාට වඩා, මේ යෝජනාව මේ උත්තරීතර සභාවට -පාර්ලිමේන්තුවට- ඉදිරිපත් කරලා විවෘතව කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ගරු අගමැතිතුමාටත්, අතිගරු ජනාධිපතිතුමාටත්, ඒ වාගේම මේ රජයටත් මා ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා, 2007 වර්ෂෙයේදී මේ යෝජනාව ගෙනා බව. ඒකේ අඩු පාඩු තිබුණා. අපි ඒවාට විරුද්ධ වුණා. අඩු පාඩු හදා ගන්න කියලා අපි කිව්වා.

2007 ජූලි 17 වන අඟහරුවාදා මේ යෝජනාව ගෙනාවාම ඌව නවෝදයට විරුද්ධ වූ සමන්ත විද්‍යාරත්න හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට සිදු වුණේ, ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණයෙන් ගෙදර ඉන්න. ඔහුට ජනතාව කැමැත්ත දුන්නේ නැහැ. ඌව දියුණු වෙනවාට විරුද්ධ කුහක දේශපාලනඥයන් පිරිසක් වශයෙන් ඔවුන් හංවඩු ගැහුණා. ජනතාව ඔවුන්ට ඡන්දය දුන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි. ඒ වාගේ කුහක දේශපාලනයක් කරලා ඌවේ නවෝදයට බාධා කළ නිසා ජනතා විමුක්ති පෙරමුණේ එක මන්ත්‍රීවරයෙක් ඌවෙන් බිහි කළේත් නැහැ. ඒ නිසා මම කියනවා, තවදුරටත් මේ විධියට යන්න ගියොත් අනුර කුමාර දිසානායක මැතිතුමාත් පාර්ලිමේන්තුවේ ඉඳියිද දන්නේ නැහැ කියලා. මොකද, රටේ නවෝදය සඳහා විරෝධතා ඉදිරිපත් කිරීම නිසා. මේ ව්‍යාපෘතියෙන් මොකක්ද කරන්නේ? මහා ලොකු අක්කර ගණන් ගැන කිව්වා. තනිකර පට්ටපල් බොරු තමයි කිව්වේ. කොරහේ කිඹුල්ලු පෙන්වනවා. හැබැයි කොරහේ කිඹුල්ලු නැහැ; ඉන්න බැහැ. ඒක දැන දැන කොරහේ කිඹුල්ලු ඉන්නවා කියලා පෙන්වන කණ්ඩායමක් තමයි මේ විරෝධය ගෙනාවේ. මේ ව්‍යාපෘතිය වෙනුවෙන් පෞද්ගලික සමාගම්වලට ඉඩම් විකුණන්නේ නැහැ. ඉඩම් විකුණනවා කිය කියා පසු ගිය දවස්වල කෑ ගසමින් ඇවිද්දා. ආයෝජකයින්ට -විදේශිකයින්ට- ඉඩම් විකුණනවා කියා කිව්වා. මේ ව්‍යාපෘතිය වෙනුවෙන් එහෙම ඉඩම් විකුණන්නේ නැහැ. අවුරුදු 33කට බදු දෙනවා විතරයි. ඒ දෙන්නේත් හෙක්ටෙයාර 149යි. අක්කර 25,000ක්, 30,000ක් දෙනවා කිව්වා. විදේශ සමාගමකට බදු දෙන්නේ හෙක්ටයාර 149යි. ඒ කියන්නේ අක්කර 370යි. බොරු කිය කියා ජනතාව මුළා කරන කටයුත්තක් තමයි කරන්නේ. ඒ දෙන්නේත් වාණිජ බදු ක්‍රමයට. බද්දට අමතරව මේ කොම්පැනිය හැම සීනි ටොන් එකකටම රුපියල් 2,500ක් රජයට ගෙවන්න ඕනෑ.

මේ සල්ලි විදේශ විනිමය වශයෙන් එන්න ඕනෑ. එහෙම නැතිව රටේ බැංකුවලින් ගන්නා ණයවලින් මේ කර්මාන්තශාලාව විදේශිකයන්ට හදන්න දෙන්නේ නැහැ. මේවා රටට විදේශ විනිමය වශයෙන් එන්න ඕනෑ. ඒ නිසා මේකට කුහකකම් කරන්න එපා; අසත්‍ය මත ඉදිරිපත් කරන්න එපා.

ඒ විතරක් නොවෙයි, මේ තුළින් දිනකට සීනි ටොන් 360ක් -400ක් විතර නිෂ්පාදනය වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මෙතුමන්ලා ලොකු තර්ක ඉදිරිපත් කළා. මේකෙන් සීනි හදන්නේ කොහොමද කියලා ඇහුවා. මේගොල්ලන් ඒක දන්නේ නැහැ. තවම මේගොල්ලන් ඉන්නේ ගල් යුගයේ. අද වන කොට පර්යේෂණවලින් අලුත් උක් ප්‍රභේද හොයා ගෙන තිබෙනවා. වැසි ජලය උපයෝගී කරගෙන වගා කොට, හෙක්ටෙයාර් එකකට මෙට්‍රික් ටොන් 90ක් හදන්න පුළුවන් උක් ප්‍රභේද අද වන කොට සාර්ථකව හොයා ගෙන තිබෙනවා. ඒ, වැසි ජලයෙන්. මේ වගාවට irrigation water දෙන්න පටන් ගත්තොත් මීටත් වඩා නිෂ්පාදනය වැඩි වෙනවා. එහෙම නම් ගණන් හදලා බැලුවාම හෙක්ටෙයාර් 15,000කින් සීනි මෙට්‍රික් ටොන් 7,125ක් හදන්න පුළුවන්. මේ කර්මාන්තශාලාවට ඕනෑ වන්නේ දිනකට උක් මෙට්‍රික් ටොන් 4,000යි. වැඩ කරන්නෙ දවස් 200යි. මෙහෙම ගණන් හදලා බැලුවාම මේ භූමි ප්‍රමාණය අපේ අවශ්‍යතාවට ඉහටත් වඩා වැඩියි. මේක දෙන්නේ කොම්පැනියට නොවෙයි. මේක දෙන්නේ වටේ ඉන්න ගොවීන්ටයි. නමුත්, මේගොල්ලන් කැමැති නැහැ, ඌවේ ජනතාව දියුණු වෙනවාට; ඌවේ ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් වෙනවාට. මේ ගොල්ලන්ට අවශ්‍ය වෙලා තිබෙන්නේ, හැමදාම ඌව ප්‍රදේශය-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Edward Gunasekara to the Chair?

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் பிரதி அமைச்சர்)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Deputy Minister of Sustainable Development and Wildlife)

I propose that the Hon. Edward Gunasekara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වගාව සඳහා අවශ්‍ය ජලය ගැන කථා කළා. මේ උක් වගාව ට ලැබෙන්නේ වැසි ජලයයි. එහෙම නැතිව irrigation මඟින් ජලය ලබා ගන්නවා නොවෙයි. උක් වගා කරන්නේ කොම්පැනිකාරයින් නොවෙයි. කොම්පැනිකාරයින්ට ඉඩම් දෙන්නේ නැහැ. ඉඩම් දෙන්නේ ඌවේ ජනතාවටයි. පවුල් 7,500කට හෙක්ටෙයාර් 2ක බැගින් ලබා දෙනවා. මේවා කොම්පැනියකට දෙන ඉඩම් නොවෙයි කියන එක මතක තියා ගන්න.

උක් වගා කිරීම තුළින් ඒ ජනතාවට යම් ආදායමක් ලබා ගන්න පුළුවන් වෙනවා. මතක තියා ගන්න, උක්වලට දෙන මිල ගණන තීරණය කරන්නේ කොම්පැනිකාරයා නොවෙයි; රජයයි. උක් මෙට්‍රික් ටොන් එකකට රුපියල් 5,000ක් දෙනවා කියලා රජයයි තීරණය කර තිබෙන්නේ. දැන් අහනවා, ජලය කොහෙන්ද කියලා. මේ ගැන විද්‍යාත්මකව හිතන්න. විරුද්ධ වෙන්නන් වාලේ විරුද්ධ වෙන්න එපා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේගොල්ලන් කථා කරන විධියට කටුනායක ගාමන්ට් ඉදි වෙන්නෙත් නැහැ; බියගම වෙළඳ කලාප හැදෙන්නෙත් නැහැ. මේ විධියට කථා කළොත් රැකිරක්ෂා ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. හැමදාම මේ රට ගල් යුගයේ තියාගෙන ඉන්න වෙනවා. සීනි ටිකත් පිට රටින් ගෙනැල්ලා හිඟා කන රටක් බවට පත් කරන්නයි මේ අය හදන්නේ. ඒ නිසා මේවා ඉගෙන ගන්න. ඒ ප්‍රදේශයේ වර්ෂාපතනය කීයද? මිලිමීටර් 1200 සිට 1500 දක්වා වාර්ෂික වර්ෂාපතනයක් එහි තිබෙනවා. එවන් වර්ෂාපතනයක් තිබෙන කොට වැව් උතුරනවා; ඔයවල් උතුරනවා. නමුත්, විශේෂයෙන්ම කියන්න ඕනෑ මේකට අවශ්‍ය වැව් ප්‍රමාණය මේ කර්මාන්තශාලා භූමිය තුළ නිර්මාණය කරන බව. ඒ වැව් පිරෙනවා. වැසි කාලයට වතුර ටික යන්නේ මුහුදටයි. ඒ මුහුදට යන වතුර ටික නවත්වලායි මේක කරන්නේ. මතක තියා ගන්න. අලුතින් වැව් හදලයි මේක කරන්නේ. ඊට පස්සේ අපට මේකට කියලා වෙනම වතුර අවශ්‍ය වෙන්නේ නැහැ. ජලය සෙන්ටිමීටර් 1.075ක ප්‍රමාණයක් වී වගාවට ඕනෑ; උක් වගාවට ඕනෑ වෙන්නේ සෙන්ටිමීටර් 0.6යි; දැන් කරන බඩඉරිඟු වගාවට ඕනෑ වෙන්නේ සෙන්ටිමීටර් 0.45යි. නමුත්, බඩඉරිඟු වගාවෙන් ජනතාවට මේතරම් ආදායමක් ලැබෙන්නේ නැහැ.

දැන් බලන්න, හේන් ගොවිතැන් කරනවා කියලා මිනිස්සු කැලේ අක්කර හත, අට කපා දමනවා. එහෙම කරලා ඊළඟ තැනට යනවා. ඒක නොවෙයිද පරිසර විනාශය? අද හේන් ගොවිතැන් කරනවාටත් වඩා දියුණු කෘෂිකර්මයක් මේ රටේ තිබෙන්නේ. මේ ලෝකයත් එක්ක අපි ඉදිරියට යන්න ඕනෑ. හේන් ගොවිතැන් කරපු යුගය අයින් කරලා මේ ලබා දෙන හෙක්ටෙයාර් දෙකක ඉඩම්වලින් උපරිම එළ නෙළන්න ඕනෑ. මේගොල්ලන් කියනවා, උක් වගා කරන්න විතරයිලු මේක දෙන්නේ කියලා. නැහැ, මේ හෙක්ටෙයාර් දෙක තුළ මොනවාද කරන්නේ කියන එක සම්බන්ධයෙන් සැලැස්මක් හදලා තිබෙනවා. ඒ හෙක්ටෙයාර් දෙකක ඉඩම හතරට බෙදලා කටයුතු කරන ආකාරය කියලා තිබෙනවා. අවුරුද්දක හැමදාම පැළ වැවීගෙන එන ආකාරයට එක කොටසක් තිබෙන්න ඕනෑ. එතකොට පළමු මාස හතරක කාලය තුළ ඒ අවට මුං වගා කරන්න පුළුවන්; ගම්මිරිස් වගා කරන්න පුළුවන්; විදුලිය නිපදවන්න යොදා ගන්නා ග්ලිරිසීඩියා වගා කරන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි. අපි අද කථා කරනවා, රසායනික පොහොර යෙදීම වගාවට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා කියලා. නමුත්, මේ කරගෙන යන වැඩ පිළිවෙළ තුළ මේ වගාවන්වල රොඩුවලින් කාබනික පොහොර නිෂ්පාදනය කරන්නත් අවස්ථාව හදලා තිබෙනවා.

මේ ක්‍රියාවන්ගෙන් අලිමංකඩවලට බාධා වෙන්නේ නැහැ. අසත්‍ය මත ප්‍රකාශ කරන්න එපා. අසත්‍ය කියන්න එපා. ජනතාවට තොරතුරු දැනගැනීමේ අයිතිය තිබෙනවා. ජනතාව හැමදාම රවටන්න බැහැ. අසත්‍ය කිය කියා සටන් පාඨ කියන්න බැහැ. ඔය සටන් පාඨවලට සීමා වුණු දේශපාලනය අයින් කරලා, බුද්ධිමත්ව හිතලා රට දියුණු කරන්න, රට නිර්මාණය කරන්න අපත් එක්ක එකතු වෙන්නය කියා අප කියනවා.

මේ කුහක දේශපාලනයෙන් අපි ඈත් වෙමු, ඌව-වෙල්ලස්ස දියුණු ප්‍රදේශයක් බවට පත්කරමු. මේ කුහක දේශපාලනය නිසා ඌව-වෙල්ලස්ස රටේ තිබෙන දුප්පත්ම ප්‍රදේශය බවට පත්වෙලා තිබෙනවා. ඌව-වෙල්ලස්ස දියුණු ප්‍රදේශයක් බවට පත් කරලා, ඒ මිනිසුන්ටත් කාලා ඇඳලා ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කරමු. ඒ විතරක් නොවෙයි, මම මේ අවස්ථාවේ රජයට යෝජනාවක් කරනවා. අලුතින් එන පවුල් 7,500 සඳහා අවශ්‍ය කරන රෝහලක්, පාසලක් ඇති කරලා, ඒ ප්‍රදේශය දියුණු ගම්මානයක් බවට පත් කරන්න කියලා කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 2.43]

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා (වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா - நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa - Minister of Irrigation and Water Resources Management)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම විවාදය ඉතාමත්ම බරපතළ විවාදයක්. මොකද, මේ රටේ ගහ කොළ, මහ පොළොව, සතා සිව්පාවා, ප්‍රජාව එකට සම්බන්ධ වෙලා,- [බාධා කිරීම්]

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
පැත්ත මාරුවෙලා වාගේ.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

පැත්ත විතරක් නොවෙයි, තව ඒවාත් මාරු වෙනවා. ඒක නිසා අමාරු කරගන්නේ නැතුව ඉන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගහ කොළ, මහ පොළොව, සතා සිව්පාවා, ප්‍රජාව, ඒ වාගේම ප්‍රජාවගේ ප්‍රගමනය, ඒ සියලු කාරණා සම්බන්ධයෙන් රජයකට ලොකු වගකීමක් තිබෙනවා. මම මතක් කරන්නට ඕනෑ, මේ පාර්ලිමේන්තුවේ, අපේ කැබිනට් මණ්ඩලයේ ඉන්නවා, ජලය විකිණීමේ ඇමතිවරයෙක්. ඒ තමයි

[ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා]

ජල සම්පාදන ඇමතිවරයා. ජලය සුරැකීමේ ඇමතිවරයා තමයි විජයමුණි සොයිසා. ඒ නිසා මට ලොකු වගකීමක් තිබෙනවා, භූගත ජලයත්, මතුපිට ජලයත් ආරක්ෂා කිරීම වාගේම කරදිය බැහැර කිරීමත් ගැන. විශේෂයෙන්ම අද අපි භයානක තැනක ඉන්නේ. අද අපේ ගංගා ද්‍රෝණි 10ක් සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙනවා. මුහුදු ජලය ඇතුළට එන නිසා අද කැලණි ගඟේ bund එකක් බැඳලා තිබෙනවා. මොකද, එහෙම නැතිව අපට පානීය ජලය ලබාගන්න පුළුවන්කමක් නැහැ. ඒ bund එක බඳිනවාට අපි විරුද්ධ වුණා. මොකද, ගංවතුරට ඒක බාධාවක් වන නිසා. එතකොට කළු ගඟේ තත්ත්වයත් එහෙමයි. මහවැලි ගඟ ගත්තොත්, අපට මහියංගනයෙන් මුහුදු ජීවීන් හම්බවෙනවා. ඒ විධියට ගංගා ද්‍රෝණි 10ක් අද බරපතළ අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. එවැනි අර්බුදයක් තිබෙන වෙලාවේ, අපි කොහොමද භූගත ජලය ආරෝපණය කරන්නේ? එහෙම නම් අපට තිබෙන ප්‍රධානම අභියෝගය තමයි, අවුරුද්දක පඩිය එක මාසෙකදී ගෙවනවා වගේ අවුරුද්දේම වහින වැස්ස එක මාසයකදී වහන එක. ඒක තමයි ඇත්ත තත්ත්වය. අපට එකම අවුරුද්දක භයානක නියඟයක් හා භයානක ගංවතුරක් පවතිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ ජලය රැස් කිරීම පිළිබඳව ගත්තොත්, ලෝකයේ ප්‍රථම ස්ථානයේ ඉන්නේ තායිලන්තය. දෙවැනි තැන ඉන්නේ අපි. නමුත් අපි ලෝකයෙන්ම පළමුවැනි තැන සිටියේ. අපේ රටේ වැව් පද්ධතියක් තිබුණා. කුළු වැව් තිබුණා, මහ වැව් තිබුණා, එල්ලංගා වාරි පද්ධතියක් තිබුණා, පොකුණු තිබුණා, ඒ වාගේම කුලම් තිබුණා. අපට වහින වැස්ස නිකරුණේ මුහුදට ගලාගෙන යන්න නොදී ඒ විධියට අපි ආරක්ෂා කර ගත්තා.

අපේ දිස්ත්‍රික්කය ගත්තොත්, ලංකාවේ ලොකුම ජලාශය තමයි අක්කර අඩි ලක්ෂ 7ක් ඇති ඉඟිනියාගල සේනානායක සමුද්‍රය. හැබැයි, ඒකෙන් වතුර බිංදුවක්වත් අපට ලැබෙන්නේ නැහැ. පසු ගිය ආණ්ඩුව කාලයේ මමයි, හිටපු ජනාධිපතිතුමායි, අපි එකට වොපර් එකේ ගිහිල්ලා රඹකැන් ඔය ජලාශය විවෘත කළා. රඹකැන් ඔය ජලාශයේ වතුර ටිකත් යන්නේ නැඟෙනහිර පළාතට. ඒ වාගේම බිබිලේ නාමල්ඔය තිබෙනවා, ඒකේ වතුර ටික යන්නෙත් නැඟෙනහිර පළාතට. උඩවලව පැත්තෙන්, එහෙම නැත්නම් දකුණු පළාතට මායිම්ව ගත්තත් අපට ගැටලුවක් තිබෙනවා. ඒ දවස්වල වෙහෙරගල ජලාශය හැදුවා. එදා අපි ඒකට විරුද්ධ වුණා. අපි විරුද්ධ වුණාම වාරිමාර්ග දෙපාර්තමේන්තුව මොනරාගල දිසාපතිත් එක්ක අවබෝධතා ගිවිසුමක් ගැහුවා. අපට වැව් 65ක් දුන්නා. සුගලාදේවි වැව එයින් ප්‍රධාන වැවක්. ඊළඟ එක තමයි බිබිලේ මාලිප්පොත වැව. සුගලාදේවි වැව තිබෙන්නේ මොනරාගල. සුගලාදේවි වැව අවුරුදු 22ක් හැදුවා. එහෙම නේද? මාලිප්පොත වැව අවුරුදු 15ක් හැදුවා. ඒත් හදලා ඉවර නැහැ. මම මහ ඇමති කාලයේ අලුගල්ගේ වැව හැදුවා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්නකෝ. බාධා කරන්න එපා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට වගේ අසීමිත කාලයක් මට වෙන්කරන්නේ නැහැ නේ. ඔබතුමාට නම් හැමදාම කථා කරන්න කාලය ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වැව්වල සම්පූර්ණ ජලය ටික යන්නේ දකුණු පළාතට. අපි එදා විරුද්ධ වෙලා, ඊට පස්සේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ නායකත්වයෙන්, අගමැතිතුමාගේ මඟ පෙන්වීමෙන් දින 100 ආණ්ඩුව යටතේ සුගලාදේවි වැවේ ඉතිරි වැඩ ටික කරන්න අපට පුළුවන් වුණා. දැන් එය අවසාන අදියරේ පවතින්නේ. මාලිප්පොත වැව අපි දැන් හදලා ඉවරයි. ඊළඟට ඌරුසිටා වැව, කිරිඉබ්බන් වැව, උඩවලව ජලාශය, ලුණුගම්වෙහෙර ජලාශය, ඒ සියල්ලම තිබෙන්නේ මොනරාගල දිස්ත්‍රික්කයේ. හැබැයි, ඒවායේ වතුර ටික ඔක්කෝම දකුණු පළාතටයි. මේ ඔක්කෝම කරලා අන්තිමට මොකක්ද කළේ? අන්තිමට ගත්තා උමා ඔය ඉහළ කොටස ව්‍යාපෘතිය. ඇත්ත වශයෙන්ම අපේ මධ්‍යම කඳුකරයේ සහෝදර ජනතාවට එයින් අසාධාරණයක් සිද්ධ වුණා. ඒක අපි පිළිගන්නවා. නමුත් ඒ ප්‍රජාව ගැන, එයින් සිදුවන පාරිසරික හානිය පිළිබඳව ඇගයීමක් නැතුව එය කළා. ඒ නිසා මෙය තහනම් කරලා තිබුණා. නමුත් දින 100 ආණ්ඩුව යටතේ අපි ඒක යථාවත් කරලා මෙය අනිවාර්යයෙන් කළ යුතු ව්‍යාපෘතියක් හැටියට හඳුනාගත්තා. දින 100 ආණ්ඩුව කාලයේ අලිකොටේ වැව හදන්න පටන් අරගෙන අද මේ වනකොට අපි අක්කර අඩි 9,000ක් හදලා ඉවරයි. ඊළඟට අපි අලිකොටේ වැවෙන් සිංහලයාගම හරහා බලහරුව කුඩා ඔය ජලාශයට කිලෝමීටර 38ක ඇළ මාර්ගයක් කපන්න පටන් ගත්තා. එය දැන් වැල්ලවාය ටවුම ළඟට ඇවිල්ලා තිබෙනවා. අපට දැන් එතැන උමගක් ඉදිකරන්න තිබෙනවා. බලහරුව ජලාශය අක්කර අඩි 25,000යි. දැන් bund එක ගලට හාරලා, ගලේ ඉඳලා අපේ මට්ටමට ඇවිල්ලා තිබෙනවා. හඳපානගල අක්කර අඩි 5,000යි තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒක අක්කර අඩි 15,000 දක්වා වැඩි කරලා තිබෙනවා. අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ සහ ගරු අගමැතිතුමාගේ මඟ පෙන්වීම යටතේ මේ ජල පෝෂකය අපි ආරෝපණය කර තිබෙනවා. ඒ ව්‍යාපෘති තුනට අමතරව අපි හඳපානගල වම් ඇළ මාර්ගය පටන් ගත්තා. අද උක් වගාව සශ්‍රීක කරන්න උක් වගාව හරහා ඒ ඇළ මාර්ගය ගමන් කරනවා. උක් වගාවට සම්බන්ධ පුංචි වැව් ටික පුරවන්න ලැහැස්ති කරලා තිබෙනවා. පැල්වත්තේ උක්වගාවට ඩෝසර් කරපු වැව් ටික හදන්න රුපියල් මිලියන 400ක් වෙන් කරලා තිබෙනවා. සෙවණගල උක් වගාව කරන්නේ වාරි කර්මාන්තයෙන්. සෙවණගල ඇළ මාර්ගවල වැඩ කටයුතු කරන්න දින 100 ආණ්ඩුවේදී රුපියල් මිලියන 300ක් දුන්නා. අද ඒ ඇළ මාර්ගවල වැඩ අවසන් කරලා තිබෙනවා.

ඊළඟට, කතරගම දෙටගමුව වැව සම්පූර්ණයෙන්ම ආක්‍රමණය කරලා වැව මැද්දේ swimming pools හදලා තිබුණා; වැව මැද්දේ හෝටල් හදලා තිබුණා. මේ වැව නිසා කතරගම පූජා භූමියට ගංවතුර තර්ජනයක් ඇති වුණා. එය වළක්වා ගන්න අපි රුපියල් මිලියන 600ක්, 700ක් පමණ වියදම් කරලා වැඩි වතුර කොච්චිපතාන වැවට ගෙනියන්න ඇළක් කැපුවා. ඊළඟට මූලිකව හඳපානගල, බලහරුව කුඩා ඔය ජලාශය, අලිකොටේ ජලාශය හදන්න පටන් ගත්තා. මීට අමතරව වැව් 200ක එල්ලංගා පද්ධතියක් හදන්න පටන් අරගෙන ඒ වැව් 200න් මේ වනකොට වැව් 65ක් හදලා ඉවරයි. නව ඌව වෙල්ලස්ස හදන්න නොවෙයි, පැරැණි වෙල්ලස්ස කොහොමද හදන්නේ කියන එක ගැන හිතලා සංවර්ධනය නියම විධියට ඉෂ්ට කරන්න මේ රජය සමත්වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම මම සඳහන් කරන්න ඕනෑ, උක් වගාව සම්බන්ධයෙන් අපි කථා කරන භූමි ප්‍රදේශය ගැන. එහි රඹකැන් ඔය හදලා තිබෙනවා. මේ භූමි ප්‍රදේශයේ ඔයවල් තුනක් හැදෙනවා. මහ ඔය හැදෙනවා; ගල්ඕඩේආරු හැදෙනවා; රඹකැන් ඔයහැදෙනවා. රඹකැන් ඔය ජලාශය දැන් හදලා ඉවරයි. නමුත් මහ ඔය වැව හදන්න අපි දැන් ආරම්භ කරලා තිබෙනවා.

ඊළඟට, ගල්ඕඩේආරු අපි වැවක් හදන්න සූදානම්. මේ ජලාශ තුනම ගෙනිහිල්ලා මේ භූමි ප්‍රදේශයට කිලෝමීටර 25ක් ඈතින් තිබෙන මඩකලපුවේ රූගම්, කිතුල කියන ජලාශ දෙක ඒකාබද්ධ කරලා දැවැන්ත ජලාශයක් හදන්න අපි සූදානම් කරලා තිබෙනවා. එතකොට මේ උක් වගාව සිද්ධ වෙන ප්‍රදේශයේ අද රඹකැන් ඔය තිබෙනවා. ඊළඟට ගල්ඕඩේආරු හදනවා. ඊළඟට අපි මහ ඔය හදනවා. ජලාශ හතරක් හැදෙනවා. එතකොට අපට වෙච්ච

සංසිද්ධිය තමයි මහපොළොව, ගහකොළ, සතා සිව්පාවා, ප්‍රජාව කළමනාකරණය කිරීම.

අලි, අද සංවර්ධන ප්‍රදේශයට එනවා. ඒ වාගේම සංරක්ෂිත කැළේට අලි එනවා. වනජීවී ප්‍රදේශයේ කැළේට එනවා. අද මේ අලි එක තැනක නැහැ. ඊළඟට මිනිස්සුත් එක තැනක නැහැ. සත්තුත් එක තැනක නැහැ. ඒ නිසා මේක කළමනාකරණය කරන්න අවශ්‍ය වෙනවා. විශේෂයෙන්ම බිබිල, මැදගම, මඩුල්ල, තවම මෙයට ඇතුළත් වෙලා නැහැ. [බාධා කිරීමක්] මම එතැනට එනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ දුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරක් තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති තිරසර සංවර්ධනය පිළිබඳ වූ සාකච්ඡාවට මම ගියා. බැලුවාම අපට තරු හතරක් තිබෙනවා.

ඒ කියන්නේ දුප්පත්කමේ උපරිමයක අපි ඉන්නවා. දුප්පත්කමේ උපරිමයක තරු හතරක් අපට තිබෙනවා. මේ තරු හතර තිබෙන ප්‍රදේශ මොනවාද? සියඹලාණ්ඩුව, මඩුල්ල, රිදීමාලියද්ද සහ කන්දකැටිය. මේ අයගේ ප්‍රධාන ජීවිකාව මොකක්ද? දෙවියනේ! මේගොල්ලන්ගේ ප්‍රධාන ජීවිකාව කන්න භෝග වගාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ජනතාවට භූමියේ අයිතිය නැති වෙනවා නම් ඒ කිසිම ව්‍යාපාරයකට අපි හවුල් වෙන්නේ නැහැ; උදවු කරන්නේ නැහැ. අපි කියන්නේ මේ ගොවි ජනතාවට භූමියේ අයිතිය ලැබෙන්නට ඕනෑ කියලායි. ඇළ දිගේ වතුර එනකොට ඉඩම් ඔප්පුවත් එන්න ඕනෑ, වතුර දිගේ. ඒක තමයි අපේ තර්කය. මේ ගොවි ජනතාව උඩ බැලුවාම අහස; බිම බැලුවාම මහ පොළොව. පැල්පත්වල ජීවත් වන අහිංසක ගොවි ජනතාව දහඩිය මුගුරු හෙළාගෙන වැඩ කරනවා. ඒ ජනතාවගේ ජීවන තත්ත්වය නහා සිටුවීමේ වගකීම මේ ආණ්ඩුවට තිබෙනවා; මේ රජයට තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

උක් වගාවේ ක්‍රම දෙකක් තිබෙනවා. එකක් තමයි පිටස්තර ගොවීන් කරන වගාව. අනෙක් එක කේන්ද්‍රීය වගාව. කේන්ද්‍රීය වගාව සම්බන්ධයෙන් කියනවා නම් කොම්පැනියකට අක්කර දහස් ගණනක් දෙනවා; ඒ අක්කර දහස් ගණනේ සම්පූර්ණ බලය ඒ කොම්පැනියට දෙනවා. පැල්වත්ත සීනි සමාගමට එහෙම දීපු ඉඩම් අක්කර 3,000ක් තිබෙනවා. මොකක්ද ඒවායේ තත්ත්වය? අපි ඇත්ත කථා කරන්නට ඕනෑ. පැල්වත්තේ උක් ටොන් එකක් මෝල ගාවට එන විට සීනි සමාගමට රුපියල් 8,000ක් යනවා. උක් ටොන් එකකට රුපියල් 8,000ක් යනවා. නමුත් පිටස්තර ගොවියා ඇඹරුම් මැෂින් එක ළඟට උක් ටොන් එකක් රුපියල් 4,000කට ගෙනැල්ලා දෙනවා. මේ අහිංසක ගොවියාගේ තත්ත්වය මීට වඩා දියුණු කරන්නට ඕනෑ.

අපි දන්නවා, සෙවනගල උක් වගාව වර්ෂා පෝෂිතව නොවෙයි කෙරෙන්නේ කියා. සෙවනගල සම්පූර්ණයෙන්ම වගා කරන්නේ වාරි ජලය හරහා. හැබැයි මතක තියා ගන්න, පැල්වත්තේ උක් වගා කරන්නේ වර්ෂා පෝෂිතව බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සීනි සමාගම් දෙකේ පසුගිය වසරේ ලාභය රුපියල් මිලියන 1,080යි. පසුගිය කාලයේ යම් ප්‍රමාණයක් පාඩු වුණා. මේ සමාගම් රුපියල් මිලියන 604ක බදු ගෙවලා තිබුණේ නැහැ. මේ වසරේ ලාභය රුපියල් මිලියන 1,008යි. පසුගිය වසරේ ලාභය රුපියල් මිලියන 1,080යි, මේ වසරේ ලාභය රුපියල් මිලියන 1,008යි. මතක තියා ගන්න බදුත් ගෙවලා, ලාභත් අරගෙන මේ පළාතේ ජනතාවට රුපියල් බිලියන 3ක් දීලා තිබෙනවා. මේ සා විශාල මුදලක් අපේ දිස්ත්‍රික්කයට එන නිසා ඇඹිලිපිටිය නගරය මහා විශාල වටිනාකමක් එන නගරයක් විධියට හැදිලා, මහා ව්‍යාපාර මධ්‍යස්ථානයක් බවට පත් වෙලා තිබෙනවා. බුත්තල නගරයත් එහෙමයි. අද පැල්වත්තේ නිෂ්පාදන ධාරිතාව සියයට 22කිනුත්, සෙවනගල නිෂ්පාදන ධාරිතාව සියයට 17කිනුත් වැඩි වෙලා තිබෙනවා.

ඊළඟට, මම තව කාරණයක් කියන්නට ඕනෑ. මේ වාරි පද්ධතිවලට අමතරව අපි කුඹුක්කන් ඔය ජලාශ යෝජනා ක්‍රමය ආරම්භ කළා. අතිගරු ජනාධිපතිතුමා ගිහින් කුඹුක්කන් ඔය ජලාශ යෝජනා ක්‍රමයට මුල් ගල තිබ්බා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුඹුක්කන් ඔය වම් ඇළෙන් අපට ඉත්තෑකටුව, තෙනගල්ලන්ද, මාරාව, කහම්බාන, කොටියාගල, ඇතිමලේ සහ නැව්ගල දක්වා අක්කර 13,000ක් සංවර්ධනය කරන්නට පුළුවන්. දකුණු ඇළෙන් ඔක්කම්පිටියේ තිබෙන සියලු වැව් ටික පුරවනවා. ඊටත් වඩා වැදගත් දේ තමයි මොනරාගල දිස්ත්‍රික්කයෙන් වකුගඩු රෝගය සම්පූර්ණයෙන්ම තුරන් කරන්නට මේ හරහා මොනරාගල දිස්ත්‍රික්කයෙන් තුනෙන් දෙකකට පානීය ජලය ලබාදෙන්නට ලැහැස්තියි. කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය හරහා පානීය ජලය දෙන්නට බැරි කොටස තමයි සියඹලාණ්ඩුව සහ මඩුල්ල. ඒ සඳහා අපි හැඩ ඔය ජලාශ ව්‍යාපෘතිය ආරම්භ කරනවා. අපි ඒ සඳහා කැබිනට් පත්‍රිකා දාලා තිබෙන්නේ. හැඩ ඔය ජලාශ ව්‍යාපෘතිය හරහා අපට නැඟෙනහිර පළාතේ සංචාරක කලාපයට පානීය ජලය ලබා දෙන ගමන් සියඹලාණ්ඩුවේ සහ මඩුල්ලේ සෑම ගෙදරකටම පිරිසිදු පානීය ජලය සහිත ජල කරාමයක් ලබා දෙන්නට අපට පුළුවන්කම තිබෙනවා.

වකුගඩු රෝගය මොනරාගල දිස්ත්‍රික්කයෙන් සම්පූර්ණයෙන්ම තුරන් කරන්න අද අප කටයුතු කරමින් සිටිනවා. අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ නායකත්වයත්, ගරු අග්‍රාමාත්‍යතුමාගේ මහ පෙන්වීමත් තුළ අපට අද ඒ දෙය කරන්න ශක්තිය ලැබී තිබෙනවා. මේ රජය යටතේ ඒ සඳහා කැබිනට් පත්‍රිකා පහක් මම ඉදිරිපත් කර තිබෙනවා.

අලි ඉන්න තැනත්, මිනිසුන් සිටිය යුතු තැනත්, වනාන්තරය වනාන්තරය හැටියටත්, සංවර්ධන කලාප සංවර්ධන කලාප ලෙසත් අප නිවැරදිව හඳුනා ගත යුතුයි. ප්‍රජාව සොබා දහම වෙනුවෙන් පරිත්‍යාග කරන්න ඕනෑ. ඒ වාගේම සොබා දහමත් ප්‍රජාව වෙනුවෙන් යම් පරිත්‍යාගයක් කරන්න ඕනෑ. ඒ පරිත්‍යාග තුළ තමයි අපට රැකෙන්න පුළුවන්. ඒ පරිත්‍යාග තුළ තමයි කළමනාකරණයක් කරන්න පුළුවන්. එම නිසා භූමියේ කළමනාකරණයක් අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඌව පළාතේ ජනතාවට, මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාවට පංචවිධ ඉඩම් ප්‍රශ්නයක් තිබෙනවා. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත්ය කියන ඉඩම්වල ප්‍රශ්නය අපට තිබෙනවා; වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත්ය කියන ඉඩම්වල ප්‍රශ්නය තිබෙනවා. මොකද, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ප්‍රදේශ ගැසට් කරන කොට අපේ පැරණි ගම්මාන ඒ තුළට දමලා, ඒ ගම්මාන කොටු කර තමයි ගැසට් කර තිබෙන්නේ. නමුත්, අද ඒ ගම්වල මිනිසුන් ජීවත් වෙනවා. තවම ඒවා නිවැරැදි කර නැහැ. ඒ වාගේම ජනවසමට, උක් සමාගම්වලට, LRC එකට අයත් ඉඩම්වල ප්‍රශ්න අපට තිබෙනවා. මේ විධියට ඌවේ ජනතාව ඉඩම් ප්‍රශ්නයෙන් පෙළෙනවා. මේ ජනතාවගේ ආර්ථිකය දියුණු කරන්න, මේ ජනතාවගේ සා පිපාසාව නිවන්න මොකක්ද අපට කරන්න පුළුවන්? ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග අප ගන්න ඕනෑ. අපි අද වර්ෂයකට ඇමෙරිකන් ඩොලර් මිලියන 300ක් 400ක් සීනි සඳහා වියදම් කරනවා. මහවැලි ව්‍යාපාරයටත් ගියේ ඇමෙරිකන් ඩොලර් 263යි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට ගැන අපි බොහොම ආඩම්බරයෙන් කථා කරනවා. මුත්තාගේ කාලයේ ඉඳලා, සීයාගේ කාලයේ ඉඳලා වංශය කබල් ගගා, පරම්පරා උරුමය ගැන කිය

[ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා]

කියා අපට ඉන්න පුළුවන්. නමුත් අද අපි මේ සැබෑ අභියෝගවලට ලෙස මුහුණ දී තිබෙනවා. අපේ දුප්පත්කම, සා පිපාසාව, වකුගඩු රෝගය, වෙනත් රෝග කියන මේ හැම ප්‍රශ්නයකටම අද අපි මුහුණ දීලා සිටිනවා.

ඊළඟට, මම තව වැදගත් කාරණයක් කියන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
මට තව විනාඩි දෙකක් විතර දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට තව විනාඩි දෙකක් දෙන්න.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
මේ ව්‍යාපෘතිය සඳහා පාවිච්චි කරන ජල ප්‍රමාණය ගැන මම දැන් කියන්නම්. [බාධා කිරීමක්] ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමනි, ගරු තේනුක විදානගමගේ මන්ත්‍රීතුමනි, මම ඔබතුමන්ලා කථා කරන කොට කෑ ගැහුවේ නැහැ නේ. ඔබතුමන්ලා ඔක්කොම ඉතින් මගේ මල්ලිලා නේ. [බාධා කිරීමක්] ඔබතුමන්ලා පොඩ්ඩක් කෑ නොගහ ඉන්නකෝ. නවීන සීනි කම්හලකට ජලය ඒකක සියයක් අවශ්‍යයි කියලා අපි හිතමු. එයින් සියයට 90ක් ප්‍රතිචක්‍රීකරණය වෙනවා. එම නිසා ඒ සඳහා දිනකට වතුර සියයට දහයක ප්‍රමාණයක් තමයි අවශ්‍ය වන්නේ. යෝජිත බිබිල උක් සමාගමේ දිනකට උක් ටොන් 4,000ක් අඹරන කොට ජලය ලීටර් මිලියන 2.8යි ඕනෑ වන්නේ. ඒක හරියටම ගෙවල් 500ක් පරිභෝජනය කරන ජල ප්‍රමාණයට සමානයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඊයේ තව සාකච්ඡාවක් පැවැත්වූවා. වනජීවී කලාපවලත් ඒ මූලික වැව් ටික හදලා, සතා සීපාවාට ආහාර, ජලය ලබාගන්න පහසුකම් සලසන්න ඕනෑ. ඒ වන ජීවීන්ගේ පැවැත්ම ශක්තිමත් කරන්න අපි මේ අලි වැට ගහන්න ඕනෑ. මේ අලි වැට ගහන්න අපට ක්‍රමයක් නැහැ. අද අලි ගම් වැදිලා. ජනතාව හැම දාම අඳෝනා නඟනවා. හැම දාම මිනිසුන් මැරෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නයට උත්තරයක් දෙන එක අපේ වගකීමක්.

කෙරවල ඔයේත්, මාදුරු ඔයේත් පිටාර ගලන ජල ප්‍රමාණය දිහා බැලුවාම පෙනේවි, වතුර ලීටර් මිලියන 2.8ක් කියන්නේ මහ කජ්ජක් නොවන බව. මාදුරු ඔයෙන් සහ කෙරවල ඔයෙන් පිටාර ගලන ජලය රැස් කරලා, ඒ ජලය භූගත ජලය සමඟ ආරෝපණය වන විධියට එලන්ගා පද්ධතිය -වැව් පද්ධතිය- සකස් කරන්න ඕනෑ. අපි මේක නිකම් ආවාට ගියාට කරන කාර්යයක් නොවෙයි. ඔබතුමන්ලා මේ කාරණය මතක තියාගන්න. අපේ රටේ කෘෂිකර්මාන්තය ශක්තිමත් වෙලා තිබෙන්නේ යැපීම් පදනම මත කරන කෘෂිකර්මාන්තයෙන්. ඒ යැපීම් පදනම මත කෙරෙන කෘෂිකර්මාන්තයේ අපට දෙන්න තිබෙන හොඳම නිදසුන තමයි, පහත රට තේ ගොවියා. මේ ගොවියා ඒ තේ වගාව කරන්නේ තමන්ගේ මුළු පවුලම එකතු කරගෙනයි. මතක තියාගන්න, මේක සීනි හදන, මොලෑසස් හදන කර්මාන්තයක් නොවෙයි. මේ සඳහා විදුලි බලය නිපදවන්නේ මොනවායින්ද? නන්විවලින්. මේවායින් අපේ පස සාරවත් වෙනවා. නන්වි කපලා, ඒ අතු වැටිලා, ඒ කොළ වැටිලා අපේ පස සාරවත් වෙනවා. මේ කර්මාන්තය හරහා කාබනික පොහොර මෙට්‍රික් ටොන් 12,000ක් නිෂ්පාදනය කරන්නත් අපට පුළුවන්කම ලැබෙනවා.

වසරකට සීනි මෙට්‍රික් ටොන් 80,000ක්, පුනර්ජනනීය විදුලි බලය මෙගාවොට් 20ක්, මොලෑසස් මෙට්‍රික් ටොන් 36,000ක්, කාබනික පොහොර මෙට්‍රික් ටොන් 12,000ක් මේ ව්‍යාපෘතියෙන් නිපදවීමට බලාපොරොත්තු වෙනවා. මෙය පරිසර හිතකාමී ව්‍යාපෘතියක්. අපේ ගරු අතුරලියේ රතන හාමුදුරුවෝ කිව්වා, මෙය මහා පරිමාණයේ කේන්ද්‍රීය වගාවක්, ඒකීය වගාවක් කියලා. නැහැ, ඒක එහෙම වෙන්නේ නැහැ. හෙක්ටෙයාර දෙකහමාරේ ජීවත් වන ගොවියාට කිරි හරකා, පුනර්ජනනීය විදුලිය, සීනිවලින් ආදායම ආදිය ලැබෙනවා. මා හිතන විධියට ඒ ගොවියකුගේ මාසික ආදායම රුපියල් 50,000ට කිට්ටු වනවා.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු අමාත්‍යතුමා, 1970 දශකයේ සෙවණගල, පැල්වත්ත, කන්තලේ, හිඟුරාණ කර්මාන්තශාලා හදද්දීත් ඔය විධියටම කිව්වා.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
කිව්වා.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
නමුත්, මා කියන්නේ ඒ කියපු ඒවා මහ පොළොවේ නැහැ කියලායි. ඔබතුමාත් ඒ බව දන්නවා. කලින් ඔබතුමා බිබිල සීනි කර්මාන්තශාලාවට විරුද්ධ වුණා.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
අන්න හරි! මගේ සහෝදර මන්ත්‍රීතුමා, ඔබතුමා හොඳම ප්‍රශ්නයයි මගෙන් ඇහුවේ. [බාධා කිරීමක්] ඔබතුමා දැන් වාඩි වෙන්න. ඔබතුමා හොඳම ප්‍රශ්නයයි මගෙන් ඇහුවේ.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඔබතුමා විරුද්ධ වුණේ නැද්ද?

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමා දැන් ප්‍රශ්නය ඇහුවා නේ. මට උත්තර දෙන්න ඉඩ දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඔබතුමා විරුද්ධ වුණේ නැද්ද?

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ඔව්, මම විරුද්ධ වුණා. මා විරුද්ධ වුණාම මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා තමයි මට කිව්වේ, "මල්ලියේ, මේකේ ප්‍රයෝජන ටික අහලා ඉගෙන ගනින්. ඉගෙන ගෙන මේකට උදවු කරපන්" කියලා. මට එහෙම කිව්වේ, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමායි. ඔන්න වරද! [බාධා කිරීම්] ඔන්න වරද! ඒ කාලයේ පුළුවන්, මේ කාලයේ බැහැ! ඒකයි වරද. [බාධා කිරීම්] එතුමා ඒ සමාගමේ අයටයි කිව්වේ, "මට වටිනවා දේශපාලනඥයා. මට තමුසෙලා බිස්නස්කාරයෝ. තමුසෙලා ගිහින් විජයමුණි සොයිසාට කතා කරනවා" කියලා. ඒ ආ අයට මා මොකක්ද දන්නවාද කිව්වේ? [බාධා කිරීම්] මම කියන්නම්. තවම ඉවර නැහැ. ඒ ආ අයට මා මොකක්ද දන්නවාද කිව්වේ? "උඹලා ආවාට මම පක්ෂ වන්නේ නැහැ. එහෙම නම්, මට මේ ගැන පැහැදිලි කරන්න වරෙල්ලා" කිව්වා. මමත් ගොවියෝ 2,000ක් ගෙන්නුවා. ගෙන්නලා බිබිල සම්මන්ත්‍රණශාලාවේ පැවැත්වූවා රැස්වීමක්. ඒ කතාව අහලා, ඒ සම්පූර්ණ විස්තරය අහලා එදා විරුද්ධ වුණේ කී දෙනාද? විරුද්ධ වුණේ 13දෙනායි. "14 වැනියා ලෙස මමත් විරුද්ධයි" කියලා මම අත ඉස්සුවා. මොකද, ඒ 13 දෙනාම මගේ ගෝලයෝ. මම විරුද්ධ නිසා උනුත් විරුද්ධයි. ඒක තමයි කතාව. මා විරුද්ධ නිසා ඒ අයත් විරුද්ධ වුණා. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. අපි කියන්නේ මෙයයි. [බාධා කිරීම්] කම්හල් භූමිය නොවෙයි, එක බිම් අඟලක් විදේශීය සමාගම්වලට දෙන්න ඉඩ දෙන්නේ නැහැ. ගොවි ජනතාවට අයිතිය දීලා කම්හල් භූමිය විතරක් අවුරුදු 33ක බද්දට දෙනවා. මේ උක් කම්හල ඇති කරන්න ඕනෑ. ගොවියාගේ ආර්ථිකය දියුණු කරන්න ඕනෑ. ගොවියාගේ සා පිපාසාව නිවන්න ඕනෑ. කුසගින්න නිවන්න ඕනෑ. හැබැයි මේක කළේ නැත්නම් දුප්පත්කම තිබෙනවා. එතකොට සමන්ත විද්‍යාරත්නට පාර්ලිමේන්තුවට එන්න පුළුවන්. ගරු පද්ම උදයශාන්ත මන්ත්‍රීතුමනි, එතකොට ඔබතුමාටත් පාර්ලිමේන්තුවට එන්න පුළුවන්. තේරුණාද?

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු අමාත්‍යතුමා, ඔබතුමා-

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ඔබතුමාට මම මොකවත් කියන්නේ නැහැ. වාඩි වෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කරුණාකර බාධා කරන්න එපා. ගරු අමාත්‍යතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මගේ මිත්‍රයා. අපි සෘජු රැකියා 10,000ක්, වක්‍ර රැකියා 100,000ක් බිහි කරන්න පුළුවන් දැවැන්ත ව්‍යාපෘතියක්- [බාධා කිරීම්]

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
අනේ මන්ත්‍රීතුමා, ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමාට වැව් හදන්න කතා කළාම, ආවේ නැහැ ඒ පැත්තේ. ඔබතුමා මහ හැරියා. ඔබතුමා බොරු කියන්නේ. වාඩි වෙන්න. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි, ගරු අමාත්‍යතුමා.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
මම මීට වඩා කතා කරන්න යන්නේ නැහැ. මා කියන්නේ මෙච්චරයි. මෙය ඉෂ්ට කළ යුතු යුතුකමක්. තමුන්නාන්සේලාගේ දේශපාලන පැවැත්මට ජනතාව දුප්පත්කමේ -දිළිඳුකමේ- පතුලට කිඳා බස්සන්න එපා කියමින් මම කතාව නවත්වනවා.

[අ.භා. 3.07]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපි කවුරුත් ආදරය කරන ඌව පළාතේ ඇමතිවරයකු වන අපේ වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ ඇමතිතුමාගේ කතාවෙන් පසුව මගේ කතාවට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. අපි දන්නවා මේ රටේ දේශපාලනය කරන සමහර කල්ලි කණ්ඩායම්වලට, පක්ෂවලට රටේ දුප්පත්කම ඉතාම වැදගත් දේශපාලන සාධකයක් කියලා. ඒ ජනතාව දුප්පතුන් විධියට සිටියොත් තමයි හැම දාම මෙතුමන්ලාගේ දේශපාලන වුවමනා ඉෂ්ට කරගන්න පුළුවන් වන්නේ. අද අපේ රටේ තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් අතිදුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හැටියට තමයි රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හඳුන්වන්න පුළුවන්.

මේ දුප්පත්කම අළෙවි කර ගෙන, දුප්පත්කම මතින් දේශපාලනය කරන දේශපාලනඥයන්ට රිදීමාලියැද්දේ දුප්පත් මිනිස්සුන්ගේ දුප්පත්කම තවදුරටත් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවක් තිබෙනවාය කියලා අපට පෙනෙනවා. මොකද, මීට කලින් මේ වාගේම සංවර්ධන ව්‍යාපෘති ගෙනෙන කොට මේ අය විරුද්ධ වුණේ කොහොමද කියන එක අපි දැක්කා. ඒ නිසා රිදීමාලියැද්ද ප්‍රදේශයට එන අලුත් ආර්ථික සංවර්ධන කලාපයට;

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

මේ ආයෝජනයට විරුද්ධ වෙනවාය කියන එක මහා පුදුමයක් නොවෙයි. විශේෂයෙන්ම අපේ ගරු විජිත් විජයමුණි සොයිසා ඇමතිතුමා කියපු විධියට මේ කර්මාන්තශාලාව බිහි වන ප්‍රදේශය විතරයි අවුරුදු 33කට බද්දට දෙන්නේ. අනෙක් ප්‍රදේශ ඒ ගොවි ජනතාවට ගෙවතු විධියට වගා කරන්න අවශ්‍ය සහාය, ශක්තිය, ආධාර, අනුබල මේ ආයෝජකයන් විසින් ලබා දෙනවා. ඒ නිසා මේ ආයෝජනය තුළින් අපට රිදීමාලියැද්ද බල ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරන්න පුළුවන්ය කියලා ලොකු විශ්වාසයක් මට තිබෙනවා. ඒ නිසා මේ ව්‍යාපාරයට යම් කිසි කෙනෙක් විරුද්ධ වෙනවා නම්, එසේ විරුද්ධ වන්නේ මේ ප්‍රදේශයේ ජනතාව තවදුරටත් දුප්පත්කමේම තියා ගන්න ඕනෑ අය කියන එකයි අපට කියන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපි දන්නවා, කොච්චර ඉඩම් තිබුණත් වගා කරන්න බැහැයි කියලා. වගා කරන්න නම් ඒ ඉඩම්වලට වාරි ජල පද්ධතියක් බිහි කරන්න අවශ්‍යයි. අපේ වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ ඇමතිතුමා මේ වාරි පද්ධතිය අලුතින් හදන්න අවශ්‍ය සැලසුම් සකස් කරමින් සිටිනවා. රඹකැන් ඔය ජලාශය, කුඹුක්කන් ඔය ජලාශය තුළින් මේ ප්‍රදේශයේ වාරි පද්ධතිය ඉදි වෙනවා. මම ඔය කෑගහන අයට කියනවා, ගිහිල්ලා රිදීමාලියැද්ද බල ප්‍රදේශයේ තිබෙන නාගදීප ජලාශය බලන්න කියලා. ඒ මිනිස්සු නාගදීප ජලාශයේ පහළ මිටියාවතේ කොච්චර සශ්‍රීකව භෝග වගා කරනවාද කියලා ගිහිල්ලා බලන්න. ඇත්තටම කියනවා නම් ඒ අයට හරිහැටි වතුර ටික දෙන්න පුළුවන් නම්, අනෙක් ආධාර සම්පත් ටික දෙන්න පුළුවන්නම් මේ ගොවීන් නඟාසිටුවන්න අපට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ගරු සභාව තුළ ඇති වෙලා තිබෙන්නේ බොහොම කනගාටුදායක තත්ත්වයක්. ඒ පිළිබඳව මා ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. සභාව කල් තැබීමේ යෝජනාව ගෙනාපු කවුරුවත් මේ ගරු සභාව තුළ නැහැ. විපක්ෂයේ කවුරුවත් නැහැ. තනිකර හිස් පුටු ගොඩක් තිබෙන්නේ. රුපියල් කෝටි ගණන් වියදම් කරලා පාර්ලිමේන්තුව රැස් වෙනවා. හැබැයි, විපක්ෂයේ හාදයින්ට මේ පාර්ලිමේන්තුවට එන්නවත්, අඩුම ගණනේ සභාව කල් තැබීමේ යෝජනාව ගෙනාපු මිනිස්සුන්ට පාර්ලිමේන්තුවේ ඉන්නවත් වුවමනාවක් නැහැ. අර මල් වට්ටි අර ගෙන පන්සල් ගානේ යන අයට අපි කියනවා, තැන් තැන්වල මයික් තියා ගෙන කෑගහන්නේ නැතිව පාර්ලිමේන්තුවට ඇවිල්ලා කෑ ගහන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ආණ්ඩුව ජනතාවාදී ආණ්ඩුවක් විධියට රටේ ඒ ඒ ප්‍රදේශවලට ගැළපෙන ව්‍යාපෘති ගෙනැල්ලා තිබෙනවා. අපි දන්නවා, ඌවට ගැළපෙන්නේ මොනවාද, ඒ ප්‍රදේශයට ගැළපෙන ව්‍යාපෘති තමයි ගෙනැල්ලා තිබෙන්නේ කියලා. පැල්වත්ත සීනි සමාගම ගැන අපි දන්නවා. අපේ ගරු ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමාත් ඉන්නවා. එතුමා වැල්ලවාය ආසනයේ සංවිධායකතුමා. පැල්වත්ත සීනි සමාගම තුළින් කොච්චර ආර්ථික ප්‍රතිලාභ ලැබෙනවාද කියන කාරණය එතුමා කියයි. මේ ප්‍රදේශයේ ජනතාවට තිබෙන දුෂ්කරතා එතුමන්ලා දන්නවා. ඒ දුෂ්කරතා අවබෝධ කර ගෙන ජනතාව නඟාසිටුවන්නට උත්සාහ කරද්දී තමන්ගේ දේශපාලන වුවමනාවන් වෙනුවෙන් ජනතාව යොදා ගන්නා කඩාකප්පල්කාරී, අසාර්ථක දේශපාලනඥයන් මේකට විරුද්ධ වෙනවා. ඒකයි ඇත්ත තත්ත්වය.

අද යහපාලන ආණ්ඩුව අපේ රටේ ආර්ථිකය කෙළින් කරලා ඉදිරි වසර තුන ඇතුළත අපේ රටේ ආර්ථිකයේ දැවැන්ත පිබිදීමකට අවශ්‍ය ශක්තිය ලබා දීමට ආරම්භය, අඩිතාලම දමලා ඉවරයි. හැම තැනම, හැම දිස්ත්‍රික්කයක්ම සංවර්ධන කලාප විධියට දියුණු වෙනවා. අපි දන්නවා, බිංගිරියේ අක්කර දහසකට වැඩි ප්‍රමාණයක දැවැන්ත ආයෝජන නගරයක් නිර්මාණය වෙමින් පවතින බව. මේ විධියට ආර්ථික කලාප, කෘෂිකාර්මික කලාප දියුණු වෙන කොට ඒවා ඉවසා දරාගන්න බැරි දේශපාලනඥයන් තමයි මේ විධියට මේවාට විරුද්ධ වන්නේ. මම ගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත් කියනවා, රජයක් හැටියට මේ ආරම්භ කරන එක ව්‍යාපාරයක්වත් ආපස්සට ගන්න එපා කියලා. කවුරුවත් විරුද්ධ වුණු පළියට, කවුරුවත් කෑගහපු පළියට දේශපාලනික වශයෙන් තමන්ගේ වාසියට කටයුතු කළ පළියට අපි සැලසුම් කළ ව්‍යාපාරයක්, පටන් ගත් ව්‍යාපාරයක් ආපස්සට ගන්න හොඳ නැහැ. ඒක තමයි ඇත්ත තත්ත්වය. මොකද, එහෙම කරලා තමයි ඉදිරි වසර පහ, හයක කාලය තුළ අපේ අපනයනයන් වර්ධනය කර ගන්න පුළුවන් වන්නේ.

අද අපේ අපනයන සඳහා යුරෝපා වෙළෙඳ පොළ ජය ගෙන තිබෙනවා. GSP Plus සහනය ලැබීම තුළින් භාණ්ඩ 6,600ක් විදේශ වෙළෙඳ පොළට යවන්න අවශ්‍ය වටපිටාව හදලා තිබෙනවා. අපේ ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමා ඉන්නවා. එතුමා අපේ හිටපු සීනි කර්මාන්ත සංවර්ධන ඇමතිතුමා. මේ ආයතන කොච්චර ලාභ ලබන ආයතන බවට පත් කරන්න පුළුවන්ද කියලා එතුමා දන්නවා. පක්ෂ භේදයකින් තොරව අපි කියන්නට ඕනෑ, එතුමාගේ කාලයේ සීනි කර්මාන්තය රටේ ආර්ථිකයට මොන තරම් හයියක්, ශක්තියක් ඇති වන තත්ත්වයට පත් කළාද කියලා.

මෙවැනි ආයෝජන රටට අවශ්‍යයි. නමුත් මේ ආයෝජන කරන කොට පරිසරය පැත්තෙනුත් බලන්න ඕනෑ දේවල් තිබෙනවා. මෙතුමන්ලා කියන විධියට මේ ආයෝජනය සඳහා නිල්ගල රක්ෂිතයවත්, වෙන රක්ෂිතයක්වත් අරගෙන නැහැ. අපි ගෘහ ඉඩම් ගන්න කොට වුණත් වටිනා ශාක තිබෙනවා නම්, විශාල ශාක තිබෙනවා නම්, දැවැන්ත ගස් තිබෙනවා නම් ඒවා රකිමින්, පරිසරය රකිමින් තමයි මේ උක් වගාව කරන්න ඕනෑ. අපට කථා බහ කරලා ඒකට අවශ්‍ය නීති නිර්ණායකයන් හදාගන්න පුළුවන්. මේ කඩාකප්පල්කාරීන් මොන යෝජනා ගෙනාවත් අපේ රටේ සංවර්ධනයට අවශ්‍ය ආයෝජනයක් විධියටයි අපි මේ ආයෝජන දකින්නේ. ඒ ආයෝජනය ඉස්සරහට අරගෙන යන්න අවශ්‍ය ශක්තිය අපි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විධියට ලබා දෙනවා කියන එක මතක් කරමින්, මගේ ඉතිරි කාලය ගරු ආනන්ද කුමාරසිරි මැතිතුමාට ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තූතියි. මීළඟට, ගරු සුමේධා ජී. ජයසේන නියෝජ්‍ය අමාත්‍යතුමිය.

[අ.භා. 3.13]

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் பிரதி அமைச்சர்)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Deputy Minister of Sustainable Development and Wildlife)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රිදීමාලියැද්ද ප්‍රදේශයේ සීනි සමාගමක් ආරම්භ කිරීම සඳහා කටයුතු කරන මේ අවස්ථාවේදී ඒකට විරුද්ධව මුලින්ම මේ ගරු සභාවට යෝජනාවක් ඉදිරිපත්

කරපු විපක්ෂයේ මන්ත්‍රීවරු පවා දැන් මේ ගරු සභාවේ නැති බව මම මුලින්ම මතක් කරන්න කැමැතියි. විපක්ෂයේ එක මන්ත්‍රීවරයෙක් දැන් ඇවිල්ලා ගරු සභාවේ වාඩි වුණා. නමුත්, අනෙක් මන්ත්‍රීවරු මේ වෙලාවේ සභාවේ නැහැ. ඒ මන්ත්‍රීවරු කවුරුත් මේ වෙලාවේ හිටියා නම් හොඳයි. නිවැරැදි අධීක්ෂණයක් කරලා අපේ ගහ කොළ, සතා සිවුපාවා ආරක්ෂා කරගෙන පරිසරය පිළිබඳව අවධානය යොමු කරමින් මෙවැනි ව්‍යාපෘති සඳහා කොම්පැනිවලට ඉඩ කඩ ලබා දිය යුතුයි කියන මතයේ අපි ඉන්නවා. පරිසරය ආරක්ෂා වන පරිදි එම බිම් ප්‍රමාණය වෙන් කරන්නට ගැසට් නිවේදන මඟින් දැනට කටයුතු කර තිබෙනවා. පරිසරයට හානියක් කරලා, ඇළ දොළ, ගංගා, වැව් අමුණුවලට හානියක් කරලා මෙවැනි ව්‍යාපෘතියක් කරන්න කිසිම අවස්ථාවක අතිගරු ජනාධිපතිතුමා ඉඩ දෙන්නේ නැති බව මම විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි. ඒ නිසා පරිසරය පිළිබඳව අධ්‍යයනය කරලා මේ පිළිබඳව නිවැරැදි තොරතුරු සොයා බලා ඒ කටයුතු කිරීම ඉතාම වැදගත්.

විපක්ෂයෙන් ඉදිරිපත් කරපු මේ යෝජනාව අනුව විශාල ඉඩම් ප්‍රමාණයක් මේ කොම්පැනිවලට ලබාදීමට කටයුතු කරලා නැහැ. කර්මාන්තශාලා ඉදිකිරීම සඳහා හෙක්ටයාර් 150ක පමණ බිම් කොටසක් පමණයි ලබා දෙන්න කටයුතු කරලා තිබෙන්නේ. අපේ සීනි කර්මාන්ත සංවර්ධන හිටපු අමාත්‍ය ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමා ප්‍රකාශ කළා, පසු ගිය කාලයේ අපේ එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය පවතින අවස්ථාවේත් මෙම ව්‍යාපෘතිය ගෙනෙන කොට එතුමා විරුද්ධ වුණා කියලා. ඇත්තටම ඒ වෙලාවේ විරුද්ධ වෙන්න හේතු තිබුණා. ඒ අවස්ථාවේ එතුමා ඇතුළු අපි කවුරුත් මේකට විරුද්ධ වුණේ වැඩි ඉඩම් ප්‍රමාණයක් මෙම ව්‍යාපෘතිය සඳහා ලබාදීමට කටයුතු කර තිබුණු නිසායි. නමුත්, මේ වන විට ඒවා සියල්ල මඟහරවා ගෙන ක්‍රමවත්ව, විධිමත් ආකාරයට කොම්පැනියට පමණක් ඉඩම් ලබාදීලා තමයි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ. මේ ව්‍යාපෘතිය තුළින් ගොවි පවුල් 7,500කට පමණ ඉඩම් ලබාදීලා, ඔවුන්ගේ උක් අස්වැන්න මෙම කර්මාන්තයට ලබා ගෙන ඒ ගොවි ජනතාවට හොඳ ආර්ථිකයක් ලබාදීමේ වැඩ පිළිවෙළකුත් මේ ව්‍යාපෘතිය හරහා සිද්ධ වෙනවා. එම නිසා, මෙවැනි කර්මාන්ත අපේ රටට ගෙන ඒම වැදගත් අවස්ථාවක් හැටියටයි මම දකින්නේ.

මට මතකයි, පැල්වත්ත සීනි සමාගම, සෙවනගල සීනි සමාගම වැනි සීනි සමාගම් මොනරාගල දිස්ත්‍රික්කයට ගෙනෙන අවස්ථාවලදී විපක්ෂයේ කණ්ඩායම් ඒවාට විරුද්ධ වූ ආකාරය. මම නම් ඒ අවස්ථාවේ පාර්ලිමේන්තුවේ සිටියේත් නැහැ. නමුත් එවැනි කටයුත්තක් සිදු වන අවස්ථාවක සාමාන්‍යයෙන් විරුද්ධ පක්ෂය විධියට කරන දෙයක් තමයි එයට විරුද්ධ වන එක කියලා අපි දන්නවා.

නමුත් අද අපි සන්තෝෂ වෙනවා, පැල්වත්ත සීනි සමාගම සහ සෙවනගල සීනි සමාගම කියන සීනි සමාගම් දෙක ඉතාම ලාභ ලබන ආයතන දෙකක් බවට පත් වෙමින් තිබෙන එක ගැන. එම ප්‍රදේශයේ ජීවත් වන ගොවි පවුල් 12,000ක් පමණ දැනට පැල්වත්ත සීනි සමාගම ඇතුළේ වගා කටයුතු කරන අතර, පිටස්තර ගොවීන් හැටියටත් 20,000කට පමණ ආසන්න ප්‍රමාණයක් වගා කටයුතු කරනවා. සෙවනගල සීනි සමාගමේත් එහෙමයි. සෙවනගල සීනි සමාගමේ වගා කටයුතු කිරීමෙන් 8,000ක් පමණ ගොවි පවුල් ජීවත් වන අතර, 30,000ක් පමණ වන අවට ගොවීන් එම සීනි සමාගමෙන් ලාභ ප්‍රයෝජන -භුක්ති විඳීම්- ලබනවා. එදා අපි මේවාට විරුද්ධ වුණත්, අද වෙනකොට මොණරාගල දිස්ත්‍රික්කයේ විශාල ජනතාවකට මෙමඟින් සහන සලස්වා තිබෙනවා. ඒ වාගේම ජනතාවගේ රැකියා ප්‍රශ්න විසඳා තිබෙනවා. විරැකියාවෙන් පෙළෙන ජනතාවගෙන් විශාල ප්‍රමාණයක් අද වනවිට මෙම සීනි කර්මාන්තශාලාවල සේවය කරනවා.

ඇත්තටම අද වනවිට ඔවුන්ගේ පවුල් දුෂ්කරතාවලින් මිදී, ඉතාම දිළිඳුබවින් මිදී යම් මට්ටමකින් ඉහළට ඇවිත් තිබෙනවාය කියන එකත් විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අපේ රටේ සිටින දිළිඳු ජනතාව නඟා සිටුවීම සඳහාත්, ඒ වාගේම අපේ ජනතාව ආර්ථික හැකියාවන්ගෙන් ඉදිරියට ගෙන ඒම සඳහාත් මෙවැනි කර්මාන්ත, ව්‍යාපෘති ඇති වෙන්නට ඕනෑ. ඒ වාගේම අපේ රටට ආයෝජකයින් එන්නට ඕනෑ. එම කර්මාන්ත, ව්‍යාපෘති අපේ රට තුළ ඇති කරන්නට ඕනෑ. ඒ තුළින් තමයි රටේ ජනතාවගේ ආර්ථිකය නඟා සිටුවීම සඳහා අවශ්‍ය වන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

දැන් ඔබතුමියගේ කථාව අවසන් කරන්න, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමිය.

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

විපක්ෂයේ ඉන්න කොට හොඳ දෙයක් ගෙනාවත්, වැරදි දෙයක් ගෙනාවත් විරුද්ධ වීම ස්වභාවික දෙයක්. කොහොම නමුත් අපි මොණරාගල දිස්ත්‍රික්කයේ ඉපදුණු අය හැටියට, මොණරාගල දිස්ත්‍රික්කයට උරුමකමක් තිබෙන අය හැටියට කිසිම අවස්ථාවක ජනතාවට හිරිහැර වෙන ආකාරයට නැත්නම් ජනතාවට හිංසා පීඩා ඇති වෙන ආකාරයට, එහි ජනතාව වගා කරගෙන ඉන්නා ගොවි බිම් අරගෙන, මෙවැනි කොම්පැනිවලට දෙනවා නම් අපි ඒකට හැම දාමත් විරුද්ධයි. එවැනි අවස්ථාවලදී අපි කවදත් ජනතාවගේ අයිතීන් වෙනුවෙන් -මොණරාගල දිස්ත්‍රික්කය, ඌව පළාත වෙනුවෙන්- කටයුතු කරලා තිබෙනවා. ඉදිරියටත් හැම අවස්ථාවකදීම අපි ඒ විධියටයි, කටයුතු කරන්නේ. මහජන නියෝජිතයින් හැටියට සිටින අපේ යුතුකමක් තමයි ජනතාවට අවශ්‍ය ආරක්ෂාව, රැකවරණය ලබා දීම. ඒ අනුව ඔවුන්ගේ ගොවිබිම් සහ ඔවුන්ගේ ගම් බිම් ආරක්ෂා කර දීලා ඔවුන්ගේ ආර්ථිකය නඟා සිටුවීමේ වැඩ පිළිවෙළට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුයි.

අද දින මෙම යෝජනාව ගෙන ආ ගරු මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කළේ, මෙම යෝජනාව වෙල්ලස්ස ආරක්ෂා කිරීම සඳහා ගෙන ආ යෝජනාවක් කියලායි. මම දකින විධියට වෙල්ලස්ස ඒ විධියට ආරක්ෂා වෙන්නේ නැහැ. මම මුලින් සඳහන් කළා වාගේ මහජන නියෝජිතයින් හැටියට අපි කවුරුත් හැම දාමත් වෙල්ලස්ස ආරක්ෂා කිරීමට, වෙල්ලස්සේ උපන් ජනතාව ආරක්ෂා කිරීමට කටයුතු කළාය කියන එක විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ. ඒ වාගේම මෙවැනි කර්මාන්ත, ව්‍යාපෘති ඇති කරන කොට, මහජන නියෝජිතයෝ එහෙම නැත්නම් දේශපාලනඥයෝ ඉස්සෙල්ලාම මුදල කොපමණ දෙනවාද කියලා අසා මුදල් ගන්නා කථාවක් ගැන ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. නමුත් මම දන්නා තරමින් මොණරාගල දිස්ත්‍රික්කයේ කිසිම මන්ත්‍රීවරයෙක් එවැනි කටයුතුවලට කිසිම අවස්ථාවක පෙලඹී නැහැ කියන එක පක්ෂ භේදයකින් තොරව මම විශේෂයෙන් මතක් කරන්න කැමැතියි. ජනතාවගේ පැත්තේ ඉඳගෙන කටයුතු කරන මන්ත්‍රීවරුන් හැටියට අපි එදා කටයුතු කළා වාගේම අදත්, හෙටත්, ඉදිරියටත් එසේ කටයුතු කිරීමට වග බලා ගන්නා බව මා මතක් කරනවා. ඒ වාගේම මේ ඇති කරන්න යන සීනි සමාගම තුළින් ඒ ප්‍රදේශයේ සිටින ඉතාම දුප්පත් ජනතාවට යහපතක් වන ආකාරයට කටයුතු කරනවා වාගේම, එම පරිසරය රැකගෙන, ආරක්ෂා කරගෙන කටයුතු කිරීමටත් අපේ රජය විශේෂයෙන් කටයුතු කරන බව සඳහන් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තූතියි. මීළඟට, කථා කිරීමේ අවස්ථාව තිබෙන්නේ ගරු දයා ගමගේ අමාත්‍යතුමාටයි. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 3.22]

ගරු දයා ගමගේ මහතා (ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு தயா கமகே - ஆரம்பக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Daya Gamage - Minister of Primary Industries)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සීනි කර්මාන්තය දියුණු කරන්නට ඉතාම මහන්සි වුණු කෙනෙක් විධියට මට අද දිනයේ සීනි කර්මාන්තය පිළිබඳව කථා කරන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා.

මට මතකයි, 2002 අවුරුද්දේදී සෙවනගල සීනි කර්මාන්තශාලාව රජයට කර ගන්න බැරුව, රුපියල් මිලියන 145ක් අවුරුද්දකට පාඩු වෙලා ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්න වෙලා තිබුණු අවස්ථාවේ, ඒ ටෙන්ඩර් එකෙන් දයා සමූහ ව්‍යාපාරය එම ආයතනයේ සියයට 90ක කොටස් මිලදී ගත්තා. මොකද, එදා ඒ දිස්ත්‍රික්කයට විශාල වශයෙන් දේශපාලන ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වෙලා වවලා තිබුණ උක් වගාව ගිනි තියන්න පටන් ගත්තා. උක් අක්කර සිය ගණන් ගිනි ගත්තා. මේ ආකාරයෙන් විශාල අලාභ හානි සිදු කරන අතරේ එදා ඒ කර්මාන්තශාලාව දියුණු කළා; එකේ නිෂ්පාදනය සියයට තුන්සීයකින් වැඩි කළා. එහෙම කරලා 2011 වසර වනවිට ඒ කර්මාන්තශාලාවෙන් මිලියන 450ක ලාභයක් ඉපැද්දුවා. අපේ රටේ සීනි කර්මාන්තය තුළින් නිෂ්පාදනය කරන්නේ සීනි සහ එතනෝල් පමණයි. නමුත්, ඉන්දියාව, බ්‍රසීලය වාගේ රටවල සීනි කර්මාන්තය ගත්තාම, එම රටවල ඒ bagasse පාවිච්චි කරලා විශාල ලෙස විදුලිය නිෂ්පාදනය කරනවා. අපේ රටේ විදුලිබලය නිෂ්පාදනය කරන්නේ කර්මාන්තශාලාව පවත්වාගෙන යන්න විතරයි. අපි bagasse ටොන් 13 1/2ක් පාවිච්චි කරලා විදුලිය මෙගවොට් එකක් නිෂ්පාදනය කරනකොට, අද අලුත් යන්ත්‍රෝපකරණ, අලුත් තාක්ෂණය පාවිච්චි කරලා විදුලිය මෙගවොට් එකක් නිෂ්පාදනය කරන්න අවශ්‍ය වන්නේ bagasse ටොන් 1.25ක් පමණයි. එතකොට අපට පුළුවන් වෙනවා අපේ විදුලිබල පද්ධතියට විශාල විදුලිය ප්‍රමාණයක් ලබා දෙන්න.

විදුලි බලය නිෂ්පාදනය කරන කොට, පොහොර නිෂ්පාදනය කරන කොට, biogas නිෂ්පාදනය කරන කොට, සීනි කියන්නේ ඒකේ අතුරු නිෂ්පාදනයක් බවට පත් වෙනවා. එතකොට, ලෝකයේ අනෙක් ඕනෑම රටක් එක්ක තරග කරන්න පුළුවන් තත්ත්වයකට අපි එනවා. නමුත් ඇත්තටම ලංකාව තරග කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද, එදා ඩී.එස්. සේනානායක අගමැතිතුමා ගල්ඔය සීනි කම්හල ආරම්භ කළා. ඊට පසුව 1950 ගණන්වල කන්තලේ සීනි කම්හල පටන් ගත්තා. ඊට පසුව 1984, 1985 වර්ෂවල සෙවනගල සහ පැල්වත්ත සීනි කර්මාන්තශාලා පටන් ගත්තා. මේ කර්මාන්තශාලා හතරෙන් මේ රටට අවශ්‍ය කරන සීනි ප්‍රමාණයෙන් සියයට 50ක් නිෂ්පාදනය කරන්න බලාපොරොත්තු වුණා. මම සෙවනගල සීනි කර්මාන්ත ආයතනය භාර ගත්තාට පසුව, ලෝකයේ හැම රටකටම ගිහින් අලුත් තාක්ෂණය ගෙනැත්, විදුලි බලය නිෂ්පාදනය කරලා, කර්මාන්තශාලාව විශාල කරලා, වගාව වැඩිදියුණු කරලා රට පුරා තවත් කර්මාන්තශාලා පටන් අර.ගෙන වසර 10ක් ඇතුළත අපේ රට සීනිවලින් ස්වයංපෝෂිත කරන්න උත්සාහ කළා. ඇත්තටම මේක කරන්න පුළුවන් වැඩක්. ඒ සඳහා එක කර්මාන්තශාලාවක් නොවෙයි, අපට අඩුම වශයෙන් සීනි කර්මාන්තශාලා 8ක් විතර අවශ්‍ය වෙනවා. අපේ රටේ සීනි කර්මාන්තශාලා 8ක් දමලා, මම මේ කියන ආකාරයට දැන් තිබෙන පරණ යන්ත්‍රෝපකරණ ඉවත් කරලා, අලුත් යන්ත්‍රෝපකරණ ඇතුළත් කරන්නට ඕනෑ. ඒ ආයෝජන තුළින් අනිවාර්යෙන්ම අපේ රටේ සීනි කර්මාන්තය දියුණු කරලා මේ කර්තව්‍ය කරන්න අපට පුළුවන් වෙනවා.

අද සිංගප්පූරු සමාගමක් බිබිලේ සීනි කර්මාන්ත ආයතනයට ආයෝජනය කරන්න ඉදිරිපත් වෙලා තිබෙනවා. මෙතැනදී, විශේෂයෙන්ම මම ප්‍රකාශ කරන්න ඕනෑ, ගණන් හිලව් හරියට බලන්න ඕනෑ කියලා. මොකද, මේකේ කියලා තිබෙනවා ආයෝජනය ඩොලර් මිලියන එකසිය පනස් ගණනක් වෙනවා කියලා. නමුත්, මෙවැනි සීනි කර්මාන්තශාලාවක් ඩොලර් මිලියන 35කින්, 40කින් පහසුවෙන් හදන්න අපට පුළුවන්. එතකොට මේ සල්ලි පිට රටින් අරන් එනවා කියලා මොකක් හරි -මේ වාගේ දේවල් අපේ රටට කරලා තිබෙනවා- ආයතනයක් ඇවිත් අපේ රටේ තිබෙන බැංකුවලින් ඒ සල්ලි අරගෙන මෙහාට යකඩ ගොඩක් ගෙනැත් දමලා, ලාභයකුත් අරගෙන යන්න පුළුවන්. අවසානයේ අපේ බැංකු බංකොලොත් වෙනවා. එතකොට, අපේ බැංකුවල පොලිය වැඩි කරන්න සිදු වෙනවා. මොකද, අවසානයේදී ගෙවන්න බැරි ණය මේ රටේ ඉන්න අපේ ව්‍යවසායකයන්ට, එහෙම නැත්නම් අපේ රටේ ණය ගන්න උදවියට තමයි දරන්න වෙන්නේ.

විශේෂයෙන්ම අපි ඒ පිළිබඳව කල්පනා කරන්න ඕනෑ. රිසාඩ් බදියුදීන් ඇමතිතුමාත්, කබීර් හාෂීම් ඇමතිතුමාත්, ඒ වාගේම මුදල් ඇමතිතුමාත් අපේ බැංකුවලින් කිසිම ආකාරයකින් මේ ආයතනවලට මුදල් නොදෙන්න මේ පිළිබඳව හරියට සොයා බලන්න ඕනෑ.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

විදේශීය ව්‍යාපාරවලට සියයට 60ක් ලංකා බැංකුවෙන් දෙන්න එකඟ වෙලා තිබෙනවා. එම නිසා ඒ කරුණ මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)

ඒක තමයි. අපි දේශීය ව්‍යාපාරිකයෝ දියුණු කරන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාත් මේ පාර්ලිමේන්තුවේ සිටියා. මගේ සීනි කර්මාන්තායතනය එදා ආණ්ඩුවට ගන්නකොට ඔබතුමන්ලාත් අත් උස්සා ඒකට එකඟ වුණා. එදා ඇත්තටම මහා විශාල අපරාධයක් තමයි කළේ. හිටපු සීනි කර්මාන්ත සංවර්ධන ඇමතිතුමාත් අද අපේ පැත්තේ ඉන්නවා. සීනි පිට රටින් ගේන්න ඩොලර් මිලියන 350ත් - 550ත් අතර මුදලක් විදේශ විනිමය හැටියට අපි අවුරුද්දකට වියදම් කරනවා. ඊට අමතරව එතනෝල් පිට රටින් ගේන්නත් ඒ වාගේම මුදලක් විදේශ විනිමය හැටියට අපි වියදම් කරනවා. මේ මුදල් ඔක්කෝම අපේ රටේ ඉතිරි කර ගන්න පුළුවන්. එදා අපේ ආර්ථිකයේ අපනයන ආදායම සියයට 37ක් තිබුණා. නමුත්, ඒක සියයට 14ක් වන තෙක් අඩු වුණා. එතකොට දේශීය නිෂ්පාදනයත් සම්පූර්ණයෙන්ම අඩු වුණා. එදා අපි වාගේ දේශීය ව්‍යාපාරිකයින්ව සම්පූර්ණයෙන්ම නැති කරලා දැම්මා. සෙවනගල සීනි කර්මාන්තායතනය ගත්තොත් ඒකේ තිබෙන යන්ත්‍රෝපකරණ, ඒ වාගේම වාහන ඔක්කෝම තවමත් අයිති වෙලා තිබෙන්නේ දයා සමූහ ව්‍යාපාරයට. පාර්ලිමේන්තුවට ගෙනා නීතියට අනුව රජයට අයිති වෙලා තිබෙන්නේ ඉඩමයි, ගොඩනැඟිල්ලයි පමණයි. යහ පාලන ආණ්ඩුවත් එක්ක අදත් මට පුළුවන්, සෙවනගල සීනි කර්මාන්තායතනයට ගිහිල්ලා ඒ දයා සමූහ ව්‍යාපාරයට අයිති යන්ත්‍රෝපකරණ, ඒ වාහන ඔක්කෝම අරගෙන එන්න. නමුත්, අද යහ පාලන ආණ්ඩුවේ සිටින ඇමතිවරයෙකු හැටියට මට ඒ දේ කරන්න පුළුවන්කමක් නැහැ. මට අයිති -දයා සමූහ ව්‍යාපාරයට අයිති- එම ආයතනය රජය තමයි අද කර ගෙන යන්නේ. ඒ තරම් අසාධාරණයක් ගිය ආණ්ඩුවෙන් මට සිද්ධ වුණා. අද මම රජයේ ඇමතිවරයෙකු හැටියට සිටියත්, ඒ සාධාරණය අපේ ආණ්ඩුවෙනුත් තවම මට

සිද්ධ වෙලා නැහැයි කියන එක කනගාටුවෙන් වුණත් මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරනවා.

මේ අවස්ථාවේදී ප්‍රාථමික කර්මාන්ත ඇමතිවරයා හැටියට මට විශේෂයෙන්ම කියන්න තිබෙන්නේ ඇත්ත වශයෙන්ම සීනි කර්මාන්තායතනය එන්න ඕනෑ, මගේ අමාත්‍යාංශයට කියලායි. මොකද, ඒක ප්‍රාථමික කර්මාන්තයක්. මේ අවස්ථාවේ විශාල වශයෙන් අපි සැලසුම් කරලා තිබෙනවා, අපේ රටේ නිෂ්පාදනය වැඩි කරන්න. විශේෂයෙන්ම කෘෂිකර්ම නිෂ්පාදනය.

රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට, ඒ වාගේම අපේ ජනාධිපතිතුමාට මේ අවස්ථාවේදී මගේ ගෞරවය මා පුද කරනවා. GSP Plus බදු සහනය අපේ රටට නැවත ලබා ගැනීම තුළ අපට භාණ්ඩ 7,500ක් පමණ පිට රට යවන්න පුළුවන්. අද අපි ඇඟලුම් කර්මාන්තය දියුණු කර ඒකෙන් අපනයන ආදායම වැඩි කරනවා. අපේ කෘෂි භෝගවලිනුත්, ඒ වාගේම අපේ අනෙකුත් value added නිෂ්පාදනවලිනුත් තමයි අපේ අපනයන ආර්ථිකයට සියයට 30ක් එකතු වන්නේ. අද අපේ වෙළෙඳ පරතරය ඩොලර් බිලියන 10ක්, 11ක් වාගේ ප්‍රමාණයක් තිබෙනවා.

අද අනිවාර්යයෙන්ම මේ වෙළෙඳ පරතරය අඩු කරන්න අපට අවශ්‍ය වෙලා තිබෙනවා. රටට සල්ලි නැති වෙලාවේ අප රට තුළ සීනි නිෂ්පාදනය කරන්න පිට රටවලින් ආයෝජන අපේ රටට එනවා නම් හොඳයි. මම කලින් කිව්වා වාගේ අපේ බැංකුවල සල්ලි ටික අරගෙන ඒ ව්‍යාපාර කළොත් එහෙම අපේ රටේ සිටින ව්‍යවසායකයින්ට මුදල් නැති වනවා. ඒ වාගේම අපේ ව්‍යවසායකයින්ට ඒවායේ වන්දි ගෙවන්න; පව් ගෙවන්න සිද්ධ වනවා. මේ ආණ්ඩුවේ සිටින ඇමතිවරයෙකු හැටියට ඒ පිළිබඳව ඉතාමත්ම සැලකිල්ලෙන් මා බලනවා, ඒ ආයෝජන හරියට එනවාද කියලා. මොකද, machinesවලට බොරු ගණන් දමා ගේන්න පුළුවන්. මාත් සීනි කර්මාන්තයේ නියැළී සිටි පුද්ගලයෙකු නිසා මේ සම්බන්ධයෙන් දන්නවා. මේ සඳහා බිලියන 150ක් නම් වැය වන්නේ නැහැ. බිලියන 37ක්, 40ක් වැය කරනකොට ඒ කර්මාන්තශාලාව ඔය කියනවාටත් වඩා හොඳට අපේ රටේ දමන්න පුළුවන් කියන එක මා විශේෂයෙන්ම ප්‍රකාශ කරනවා.

ඉදිරියේදී අපි තව එක දෙයක් සැලකිල්ලට ගන්න ඕනෑ. මොකද, බිබිලට ඉහළින් තිබෙන නිල්ගල, රතුගල ගත්තොත් මේ නිල්ගලට, රතුගලට වහින වැස්ස තමයි ඩී.එස්. සේනානායක සමුද්‍රයට එකතු වන්නේ. එම නිසා මොනරාගල දිස්ත්‍රික්කයේ සිටින මන්ත්‍රීතුමන්ලාට මම විශේෂයෙන් කරුණක් කියනවා. තමුන්නාන්සේලා ඒ පැත්ත බලාගන්න. මේ කර්මාන්තයට හරි වෙනත් මොනම හෝ කර්මාන්තයකට හරි මොන විධියකින් හරි කැලයේ තිබෙන ඉඩම් කොටස් ඉවත් කරලා ඉහිනියාගල ජලාශයට පිරෙන වතුර ටික අපට නැති වුණොත් එහෙම රටට බත සපයන ප්‍රමාණයෙන් සියයට 23ක් අපට නැති වෙලා යනවා.

අපට පළමුවෙනි වතාවට ඉහිනියාගලට වතුර මදි වුණා. ඒක නිසා අපි මේ හැම දෙයක්ම සැලකිල්ලට අරගෙනයි මේ වැඩ කටයුත්ත කරගෙන යන්නේ. ඒ හැම ඇමතිවරයෙක්ම ඒ වැඩ කටයුත්ත ඒ ආකාරයෙන්ම ඉෂ්ට කරයි කියලා මම බලාපොරොත්තු වනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.34]

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன) - விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - State Minister of Science, Technology and Research)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දයා ගමගේ අමාත්‍යතුමාගේ යෝජනාවක් තිබුණා විදේශීය ව්‍යාපාරිකයන්ට ලංකාවේ බැංකුවලින් ණය ගන්න ඉඩ දෙන්න එපාය කියා. ඒක නිවැරදියි. මෙතැන මම දැකපු වටිනාම දේ, මේ ආයතනයට ලංකාවේ බැංකුවකින්, ආයතනයකින් රුපියලක්වත් ගැනීම තහනම්ය කියලා අතිගරු ජනාධිපතිතුමාගේ අමාත්‍ය මණ්ඩල ප්‍රකාශනයේ - Cabinet Paper එකේ - පැහැදිලිව ප්‍රකාශ කර තිබීම. ඒක වටිනවා. ආයෝජකයන්ට එන්න පුළුවන්. නමුත්, ලංකාවේ බැංකුවකින් මුදල් ගැනීම තහනම් කියන එක හැම Cabinet Paper එකකම ඉස්සරහට එන්න ඕනෑ. Anyway, this is a Cabinet Paper presented by the President and that has been accepted by the Cabinet. It is very good. Hon. Keheliya Rambukwella, that is what should happen in future as well.

දෙහිගම, මහියංගනය මගේ පැරණි මැතිවරණ කොට්ඨාසයයි. ඔව්. නිල්ගල වැනි ප්‍රදේශ අපි රැක ගන්න ඕනෑ. අපි මේ පිළිබඳ හොඳ අධ්‍යයනයක් කළා. ඒ පැතිවලට හානියක් වෙන්නේ නැහැ. මේ අවස්ථාවේදී මෙම යෝජනාව ඉදිරිපත් කළ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක මන්ත්‍රීතුමා හිටියා නම් මම සන්තෝෂ වනවා. [බාධා කිරීමක්] හොඳයි, එහෙමනම් ඔබතුමාව තාවකාලිකව නායකයා කරන්නම් කෝ. ඇත්තටම පරණ පොරක් නේ. කමක් නැහැ. එතුමා ප්‍රකාශ ගණනාවක් කළා.

එතුමා ප්‍රකාශයක් කළා උක් කර්මාන්තයට 2006දී අපි බොහෝ දෙනෙක් විරුද්ධ වුණා කියලා. මමත් මහියංගනයේ ව්‍යාපෘතියට විරුද්ධ වුණා. එදා අක්කර 60,000ක් මේ කොම්පැනියට දෙන්නයි හැදුවේ. අද දෙන්න යන්නේ අක්කර 40,000යි. අද ඒ අක්කර 40,000ම දෙන්න යන්නේ ගොවියන්ට. සම්පූර්ණයෙන්ම outgrower system එක. රුපියල් කෝටි ගණනක ආයෝජනයක් නිසා උක් වගා කළ යුතුයි කියලා ඒකේ ගිවිසුමක් තිබෙනවා. ඇත්ත. උක් කර්මාන්තශාලාවක් පිහිටුවලා, ගොවියන්ට ඉඩම් දීලා උක් වගාව නොකර ඒ ඉඩම්වල පොල් හිටෙවුවොත් උක් කර්මාන්තශාලාවට වෙන්නේ මොකක්ද? අපි ඔක්කෝමලා වෙල්ලස්ස ගැන කථා කළා. වෙල් ලක්ෂය සුද්දෝ කැඩුවා. ඇත්ත. මේ රටේ අපේ පළාත් විනාශ කළා. හැබැයි, අපි දැන් වෙල් ලක්ෂය ගැන කථා කරලා රටට බත සපයනවාද? මොකක්ද ඒකට ජේ.ආර්. ජයවර්ධන මහත්තයා දුන්න පිළිතුර. එදා මහවැලිය පස්පොළකින් හරස් කරන්න කටයුතු කළා. මේ රටේ හෙක්ටෙයාර 280,000ක් වී නිෂ්පාදනය වුණා. අපි බතෙන් ස්වයංපෝෂිතයි. එදා මහවැලිය හදද්දි මුළු තෙල්දෙනියම විරුද්ධ වුණා. තෙල්දෙනිය නගරයම වැටුණා. අදත්-

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
හා, හොඳයි කියන්න කෝ.

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
ඔබතුමා කිව්වා, "කොම්පැනියට දෙනවාට තමයි විරුද්ධ. ගොවීන්ට දෙනවාට විරුද්ධ නැහැ." කියලා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඔව්.

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
නමුත්, එදා ඔබතුමා කියලා තිබෙනවා, "අපි උක් වගාවට නුසුදුසු ප්‍රදේශ දෙන්නේ." කියලා. මේක කිසිසේත්ම සුදුසු නැති ප්‍රදේශ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
හොඳයි මම මගේ කථාවෙන්ම ආපහු කියන්නම්.

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
ඉතින්, දැන් ඒ ප්‍රදේශයම නේ දෙන්නේ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඉන්න. ඉන්න. පොඩ්ඩක් ඉන්න. තවම මගේ කථාව අවසන් නැහැ. තව පොඩ්ඩක් ඉන්න කෝ. තව පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] මම ඒතැනට එනවා. මම විරුද්ධ වුණ හේතුව- [බාධා කිරීමක්] මේ ඔක්කෝම කරගෙන යද්දි 2010 වර්ෂයේදී මේ කර්මාන්තය මට භාර දුන්නා. මොකක්ද වුණේ? මම උක් පර්යේෂණ ආයතනයත් සමඟ සම්බන්ධ වෙලා මේ කර්මාන්තය පිළිබඳව හොඳට ඉගෙන ගත්තා. ලෝකයේ උක් නිෂ්පාදනය කරන රටවල් 120ක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, සම්මන්ත්‍රණ ගණනාවකට සහභාගි වෙලා මම උක් ගහ ගැන හොඳට ඉගෙන ගත්තා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඒ ඉගෙන ගත්ත එකේ 2006 කියපු ඒ දේ, 2010දී අපි එකඟ වුණු හේතු ගණනාවක් තිබෙනවා. එදා ඉඩම් ටික ගොවියාට දෙන්නේ නැතිව කොම්පැනියට තමයි දෙන්න ගියේ. එදා -2006- කර්මාන්තශාලා භූමිය ඇතුළේ ජල පෝෂක ප්‍රදේශයක් තිබුණා. අද ඒ භූමිය අයින් කරලා. සම්පූර්ණයෙන්ම අයින් කරලා. දැන් මේකේ පුරාවිද්‍යා තිබෙනවා ලු. එහෙනම් දැන් ගොවි මහත්තුරු 108 දෙනෙක් මේක ඇතුළේ ඉරිඟු වගා කරනවා නේ. එතකොට ඒ පුරාවිද්‍යාවට මොකද වෙලා තිබෙන්නේ? මගේ ළඟ පුරාවිද්‍යා වාර්තාව තිබෙනවා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] පොඩ්ඩක් අහගන්න කෝ. [බාධා කිරීමක්] ඒ එදා. 2006 දී මා කිව්වා. ඒක නේ මා කිව්වේ. 2016 දී මා මේ කර්මාන්තය භාර ගත්තා. මේ කර්මාන්තය භාරගෙන - [බාධා කිරීමක්] දැන් මා ප්‍රශ්නයක් අහන්නම්. එදා 1980 දී කර්මාන්තශාලා ගිනි තැබූ ජේවීපී එක අද කර්මාන්තශලා ගිනි තබනවාද? නැහැ නේ. එදා හැඳුනුම්පත් හොරකම් කරපු අය අද හැඳුනුම්පත් හොරකම් කරනවාද? නැහැ නේ. එදා ට්‍රාන්ස්ෆෝමර් ගිනි තැබූ අය අද ගිනි තබන්නේ නැහැ නේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. උක් පිළිබඳව මා ඉතාමත් හොඳට ඉගෙන ගත්තා.

මතක තබා ගන්න, මේ රටේ වියළි කලාපයට ගැළපෙන එකම භෝගය උක් ගහ කියලා. ඇයි? මෙය තණකොළ වර්ගයක්. මෙය C4 කියන තණකොළ වර්ගය. මේකේ තිබෙන්නේ තන්තු. මේකට වතුර ඕනෑ නැහැ. වී වගාවට අවශ්‍ය වතුර ප්‍රමාණයෙන් 1/6ක වතුර ප්‍රමාණයක් අවශ්‍ය භෝගයක් තමයි උක් ගහ කියන්නේ. මේ රටෙන් සියයට 70ක ප්‍රමාණයක තිබෙන්නේ වියළි කලාපයයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2010 සිට මා උක් ගහ ගැන ඉගෙන ගත්තා. වියළි කලාපයට ගැළපෙන සුදුසුම භෝගය උක් ගහයි. රටවල් 120ක උක් භෝගය වගා කරන්නේ ඒකයි. ඉන්දියාවේ කර්මාන්තශාලා 650ක් තිබෙනවා. එහෙම නම් ඉන්දියාව කාන්තාරයක් වෙලාද? [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාවේ මේ වාගේ භූමි නොවෙයි නේ තිබෙන්නේ. අක්කර ලක්ෂ ගණන් උක් වගා භූමි තිබෙන්නේ. [බාධා කිරීමක්] නැහැ, නැහැ. අහගෙන ඉන්න. රටක ආර්ථික ප්‍රතිපත්තියක් තිබෙනවා. රටක් වීවලින් ස්වයංපෝෂිත-

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියන්නේ, උක් වගාවට වතුර ඕනෑ නැහැ කියලාද?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ගරු මන්ත්‍රීතුමනි, මා කිව්වේ අඩු වතුර ප්‍රමාණයක් ඕනෑ කියලායි. වතුර ඕනෑ නැත්තේ ඇයි? වතුර ඕනෑ. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාව අවසන් වනවා. [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය අමාත්‍යතුමාට බාධා කරන්න එපා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය මොකක්ද? සහල්වලින් ස්වයංපෝෂිත වීම, සීනිවලින් ස්වයංපෝෂිත වීම, ධාන්‍යවලින් ස්වයංපෝෂිත වීම හා මාළුවලින් ස්වයංපෝෂිත වීමයි. ඕනෑම ආණ්ඩුවකට ප්‍රතිපත්ති මාලාවක් තිබෙනවා. මේ ආණ්ඩුවේත් ප්‍රතිපත්ති මාලාවක් තිබෙනවා. එතැනදී ප්‍රමුඛතාව දෙන්නේ මොනවාටද? දැන් අපට සහල් පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. ඊළඟට වැඩිම වියදමක් යන්නේ මොනවාටද, මන්ත්‍රීතුමනි? ඒ තමයි සීනි ආනයනය කරන්න. සීනි ආනයනය කරන්න රුපියල් මිලියන 400ක, රුපියල් මිලියන 500ක වියදමක් යනවා. [බාධා කිරීමක්] අර්තාපල් වැලිමඩ හදනවා නේ. ඒක මදියි. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, වැඩිම වියදමක් යන එකයි ඉස්සෙල්ලාම බලන්නේ. ගෙදර අප්පච්චි හැටියට තමුන්නාන්සේලා ඉස්සෙල්ලාම බලන්නේ වැඩිම වියදමක් යන ඒවා මොනවාද කියලා නේ. පවුලේ වැඩිම වියදම යන ඒවා අඩු කරගන්න නොවෙයිද බලන්නේ? එහෙම නැත්නම් ගොන්කමට, ඉස්සෙල්ලාම සෙරෙප්පු දෙකක් නොගෙන ඉන්න කෙනෙක් ඉන්නවාද? මෝඩ කථා කියන්න එපා. ඉස්සෙල්ලාම බැලුවේ මොකක්ද? [බාධා කිරීමක්] රටේ වැඩිම වියදමක් යන දෙයක්ද කියලායි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, බාධා කරන්න එපා. ඔබතුමාටත් වෙලාවක් වෙන්කර තිබෙනවා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඉරිඟු හොඳයි. මේ රටට ඉරිඟු අවශ්‍ය වන්නේ මෙට්‍රික් ටොන් ලක්ෂ හතරහමාරයි. සීනි සඳහා උක් මෙට්‍රික් ටොන් 6,50,000ක් ඕනෑ. මෙන්න වෙනස. ඉරිඟු පිට රටින් ගෙන්වුවත් අපට වියදම්

වන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 30යි. සීනි පිට රටින් ගෙනෙන්න ඇමෙරිකානු ඩොලර් මිලියන 400කට වැඩි ප්‍රමාණයක් වියදම් වනවා. මෙන්න වෙනස. රටේ ප්‍රතිපත්තියක් තිබෙනවා. ඉරිඟු වගා කරන එක හොඳයි. නමුත් ඉරිඟු ගෙන්වන්න යන වියදම කොපමණද? එය සුළු ප්‍රමාණයක්. සීනි ගෙන්වන්න යන වියදම කොපමණද? එහෙම නම් අපට ස්වයංපෝෂිත වන්න බැරි වුණත් අපි යම් තාක් දුරකට බලන්නේ මොකක්ද? යම් ප්‍රමාණයකට ඉදිරියට යන්නයි. එදා 2006 දී උක් වගාවට මා විරුද්ධ වුණා. ඒක ඇත්තයි. ඒ, කරුණු ගණනාවක් නිසායි. අද මා එයට එකඟ වන්නේ ඇයි? 2013 දී උක් කර්මාන්තය භාර -සීනි කර්මාන්ත සංවර්ධන- ඇමතිවරයා හැටියට මා උක් ගහේ තිබෙන වටිනාකම ඉගෙන ගත්තා. පැල්වත්තේ ගොවීන් 10දෙනකුගේ නාම ලේඛන ඉදිරිපත් කළා. මේ ගොවීන්ට පාඩුයි ලු. ගරු මන්ත්‍රීතුමනි, වැඩක් හරිහැටි කරන්නේ නැති ගොවි මහත්වරු ඕනෑම ව්‍යාපාරයක ඉන්නවා. එහෙම කට්ටියක් ඉන්නවා, නැත්තේ නැහැ.

මට කියන්න, පැල්වත්ත සෙවණගල ගොවීන් උක් වගාවෙන් කොයි තරම් ආදායමක් ගන්නවාද කියලා. බහුතරයක් ගොවීන් අවුරුදු 35ක් ජීවත් වන්නේ මේ කර්මාන්තයෙන් නොවෙයිද? ඒක මට කියන්න. ඒ කර්මාන්තයෙන් තමයි ජීවත් වන්නේ. එම නිසා මේක දේශපාලන මාර්ගයකට හරවා ගන්න එපා. යම් යම් දේවල්වලට මමත් විරුද්ධයි. නමුත් මේකෙන් හොඳ දේ ගනිමු. මෙය අපේ ඌව පළාතට ලැබෙන ආයෝජනයක්. මේ ආයෝජනය ලැබෙන්නේ අපේ ප්‍රදේශයටයි. රුපියල් කෝටි ගණනක ආයෝජනයක් තමයි මේ ප්‍රදේශයට එන්නේ.

දැන් සමහර කට්ටිය කියනවා, "දෙහිගම දෙහි ෆැක්ටරි එකක් හදමු" කියලා. මෝඩ කථා නේ. දෙහිගම කියලා නම තිබුණාට දෙහි factory එකක් එහේ ආරම්භ කරන්න පුළුවන්ද? අවුරුද්දට දවස් 365ක් තිබෙනවා. දවසකට දෙහි බෝතල් 100ක් හදන්න දෙහි ගෙඩි කොච්චර ඕනෑද? දවසකට දෙහි බෝතල් 100ක් හදන්න පුළුවන්ද? එපමණ දෙහි එහේ තිබෙනවාද? මෝඩ කථා නේ. රටට අවශ්‍ය දෙහි නොවෙයි. රටේ ආර්ථික ප්‍රතිපත්තිය සකස් කළ යුත්තේ රටක් ස්වයංපෝෂිත කරන්න පුළුවන් නිෂ්පාදනවලට යන්න. ඕනෑම ආණ්ඩුවක ප්‍රමුඛතාව එහෙමයි. හාල්, සීනි, තේ, පොල්, ධාන්‍ය - [බාධා කිරීම්] බැරිකම වෙනම කථාවක්. රටක ප්‍රතිපත්ති මාලාවක් තිබෙනවා.

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
හාල්වලින් රට ස්වයංපෝෂිත කරන්න ඕනෑ ක්‍රමවේදයක් ආණ්ඩුව අනුගමනය කරන්නේ නැහැ නේද?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ගරු මන්ත්‍රීතුමා, අපි හාල්වලින් ස්වයංපෝෂිතයි.

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
ස්වයංපෝෂිත නම්, ආනයනය කරන්නේ?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
අඩු පාඩු තිබෙනවා. යම් යම් අවුරුදුවල නිෂ්පාදනය අඩු වනවා. එතකොට ආනයනය කරනවා. එහෙම වනවා. නමුත්, අපි ස්වයංපෝෂිත වුණේ කොහොමද?

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
ඇත්ත කථා කරන්න. අසත්‍ය කියන්න එපා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
එදා අපි මහවැලි ව්‍යාපාරය ආරම්භ කරලා හෙක්ටෙයාර 280,000ක් වගා කළා. හෙක්ටෙයාර 280,000 වගා කිරීමේ ප්‍රතිඵලය තමයි, මේ රට සහලින් ස්වයංපෝෂිත වීම.

දැන් අපි කථා කරන්නේ, උක් කර්මාන්තය ගැන. ඒක මතක තබා ගන්න. අපේ පද්ම උදයශාන්ත මන්ත්‍රීතුමා කිව්වා, "උක් පර්යේෂණ ආයතනය බුදි" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Sugarcane Research Institute එකේ Director, Dr. A. P. Keerthipala මේ සම්බන්ධව එවා තිබෙන වාර්තාව මම **table*** කරනවා.

හෙක්ටෙයාර එකකට ටොන් 90ක් ලබා දෙන අලුත්ම උක් ප්‍රභේදයක් ගැන මෙහි සඳහන් කරනවා. උක් පර්යේෂණ ආයතනයෙන් අවුරුදු 4ක් පර්යේෂණ කරලා තමයි මේ ප්‍රභේදය එළියට දාන්නේ.

ඊළඟට කිව්වා, පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති දේවලට සිදු වන හානිය ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ දිනමිණ පත්‍රයේ පළ වී තිබෙන, "ඌව පළාත් සභාවේ පළාත් සභා මන්ත්‍රී ගරු සමන්ත විද්‍යාරත්න මහතා බිබිල සීනි කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳව නඟන චෝදනාවලට සීනි සමාගමේ පිළිතුරු" කියන මේ සම්පූර්ණ වාර්තාව හැන්සාඩ්ගත කරන්න කියලා මම ඉල්ලීමක් කරමින් එය **සභාගත*** කරනවා. ඒක කළ යුතුමයි.

ඊළඟට, නා නා මාදිළියේ ප්‍රශ්න ඇහුවා. විශේෂයෙන්ම කිව්වේ, අතළොස්සක් විරුද්ධ වීම ගැන. ඒ පළාතේ ඉන්නවා, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමෙක්. උන්නැහේ ඉන්නා ඒ දෙහිගම ප්‍රදේශයේ තිබෙනවා, පරණ ගල් ලෙනක්. ඒ කාලයේ උන්නැහේ හැංගිලා හිටියේ ඒකේ. ඒක අපිත් දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතැන ඉන්න පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මහාචාර්යතුමා දීලා තිබෙනවා, වාර්තාවක්. ඒ මහාචාර්ය රාජ් සෝමදේව. මහාචාර්ය රාජ් සෝමදේව මහතාගේ ලිපිය තමුන්නාන්සේලා කියවන්න. එතුමා කියන විධියට පුරාවිද්‍යා වටිනාකමක් තිබෙන කිසිම දෙයකට හානි වෙන්නේ නැහැ. ඒ භූමියේ ඉඳලා කිලෝ මීටර් 5ක් එහාට තමයි පුරා විද්‍යාවට අයිති දේවල් තිබෙන්නේ. කවුද ඒක කියන්නේ? රාජ් සෝමදේව. රාජ් සෝමදේව කියන්නේ කවුද? [බාධා කිරීම්] අවශ්‍ය නැහැ. [බාධා කිරීම්] ඕනෑ නැහැ. මේක අහගෙන ඉන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මෙතුමන්ලා මේ පෙන්නන්නේ නැඹිලියේ කිඹුල්ලු. ඇත්තටම යම් යම් දේවල් කරද්දි රටේ ජනතාව සමහර වෙලාවට විරුද්ධ වනවා. මම ඒක නේ කිව්වේ. මහවැලිය හදද්දී, තෙල්දෙණියේ ජනතාව විරුද්ධ වුණා; කොත්මලේ ජනතාව විරුද්ධ වුණා. නමුත්, හැදුවා. ඒකේ අතුරු ප්‍රතිඵලය අද බලන්න. එදා කණ්ඩලම හදද්දීත් විරුද්ධ

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා]

වුණා. හැම දේකටම මුලින් විරුද්ධ වනවා. කොත්මලේ විදුලි බලාගාරය හදද්දි ද්‍රවිඩ ජනතාව විරුද්ධ වුණා. මහින්ද රාජපක්ෂ මහත්තයා ඒක නතර කළාද? නැහැ. ඒවා මේ රටේ වෙන්න ඕනෑ දේවල්. සුළු පිරිසක් විරුද්ධ වුණත්, බහුතරයකගේ ශුභ සිද්ධිය වෙනුවෙන් කළ යුතු දේවල් තිබෙනවා. මෙම කර්මාන්තශාලාවට 150දෙනෙක් විරුද්ධයි. ඇත්ත, 150ක්-160ක් විරුද්ධයි. ඒ විරුද්ධ කට්ටියව මම මුණ ගැහුණා. ඒගොල්ලෝ කිව්වා, "අපි විරුද්ධයි" කියලා. ඒ මුළු ගමේම-

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
මුළු ගමම විරුද්ධයි.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
පොඩ්ඩක් ඉන්න කෝ, ගරු තේනුක මන්ත්‍රීතුමනි. ඒ ගමේම තිබෙන්නේ ඡන්ද 350 නේ. ගමේ ඡන්ද 350 විරුද්ධයි කියන්නේ මොකක්ද? ගමේ ඉන්නේ- [බාධා කිරීම්]

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
ඒ ගමේ -

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
නැහැ නේ. කවුද කියන්නේ? ඇකියන්කුඹුර ස්වාමීන් වහන්සේලා මම හම්බ වුණා. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා, මට ප්‍රශ්නයක් නැහැ. මේ අහන්න. [බාධා කිරීම්] එදා පැල්වත්ත, සෙවනගල සීනි කර්මාන්තශාලා හදද්දීත් විරුද්ධ වුණා. ඔබතුමන්ලා විරුද්ධ වුණා නේද?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියන්න කෘෂි කර්මාන්තය සම්බන්ධව ගම්වල-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 4යි තිබෙන්නේ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා රඹකැන්ඔය හදද්දී මහින්ද මහත්තයාට කිව්වා, අක්කර 9,000ක් යට වනවා කියලා. අක්කර 9,000ක් යට වනවා කියපු මන්ත්‍රීතුමා තමයි, මේ ඉන්නේ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා රඹකැන්ඔය හදද්දි, අක්කර 9,000ක් යට වුණාද? අමූලික අසත්‍ය.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
කවුද කිව්වේ?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේ පෙන්වන්න එපා, මේ පුංචි කොරහේ කිඹුල්ලු ඉන්නවා කියලා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, what is your point of Order?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මම කිසිම දවසක රඹකැන් ඔයට අක්කර නව දාහක් යට වෙනවාය කියා නැහැ. අසත්‍ය දේවල් කියන්න එපා ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය අමාත්‍යතුමනි.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උක් කර්මාන්තය ගැන කථා කිරීමේදී මම මුලදී කිව්වා වාගේ චෝදනා රාශියක් ආවා. මම වෙල්ලස්ස ගැන කථා කළා. ඊළඟට රටක ආර්ථික ප්‍රතිපත්ති ගැන අපි කථා කළා.

අද අලින්ගෙන් ජනතාවට හානියක් තිබෙනවා. ඇත්ත. අලින්ගෙන් හානිය රටේ හැම තැනම තිබෙනවා. පරිසර අමාත්‍යාංශය ඇතුළු සියලුම දෙනා සම්බන්ධ කරගෙන ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා මේ සඳහා ඉතා හොඳ ප්‍රතිපත්තියක් ගෙනැවිත් තිබෙනවා. ඒ සඳහා අපට විදේශ මුදල් ආධාරත් ලැබෙනවා. මේ අලින් වෙනුවෙන් අපි අලිවැටවල් ගහන්න ඕනෑ. නිකම් අලිවැටවල් නොවෙයි. අලින්ගෙන් අපේ අහිංසක ගොවීන්ට හානියක් නොවෙන විධියට, අලින්ට එන්නට බැරි විධියට අලිවැටවල් ගහන්න ඕනෑ. එය කළ යුතුයි. එය මේ රටේ ප්‍රශ්නයක්. අලියාගෙන් අදත් හානි තිබෙනවා. අලියා එනවා කියා විතරක් සීනි කර්මාන්තශාලාවක් හෝ වෙනත් ව්‍යාපෘතියක් නතර කරනවා නම් ඒක මහ මෝඩ වැඩක්. ඇත්තටම එහෙම නම්, පැල්වත්ත කර්මාන්තශාලාව අද හදා නැහැ; සෙවනගල කර්මාන්තශාලාව අද හදා නැහැ; හිඟුරාන කර්මාන්තශාලාව අද හදා නැහැ. අඩුපාඩුකම් තිබෙනවා.

හැම තැනම අඩු පාඩුකම් තිබෙනවා. නමුත් ඒ ප්‍රදේශයට, මේ රටේ සියයට 70ක් වන වියළි කලාපයට ගැළපෙන තණකොළ ගහ තමයි C4 තණකොළ ගහ. තණකොළ වර්ගය උක් ගහ. මෙහි නව ප්‍රභේදයන් තිබෙනවා. ඒ ප්‍රභේදයන් අපි රටට හඳුන්වා දෙන්නට ඕනෑ. එහෙම නැත්නම් ලෝකයේ රටවල් 120ක් මේවා වගා කරයිද? ලෝකයේ රටවල් 120ක් වගා කර මොනතරම් ආදායමක් ලබනවාද? මේවා කාන්තාර වෙනවා නම්, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, චීනය, තායිලන්තය, බ්‍රසීලය, කියුබාව, පිලිපීනය ආදී ලෝකයේ රටවල් 120ක් මේ බෝගය වගා කරයිද? ඇයි මේවා වගා කරන්නේ? මෙහි තිබෙන ආර්ථික ප්‍රතිලාභ වැඩියි. ආර්ථික ප්‍රතිලාභ ගණනාවක් මේ උක් ගසෙන් ලැබෙනවා. සීනි විතරක් නොවෙයි. අපි එතනෝල් ගැන කථා කළා. Molasses ගැන කියපු ගමන් ජේවීපී එකේ මන්ත්‍රීතුමන්ලා -සමන්ත

විද්‍යාරත්න කියන චරිතය- කිව්වා, "ඔන්න ඉස්කාගාරයක් එහේ හදන්න යනවා"කියා. ඉස්කාගරයක් හැදෙන්නේ නැහැ. මේ ආයතනයෙන් මම අහලා බැලුවා. මෙතුමන්ලා molassesවලින් කරන්නේ සත්ත්ව ආහාර නිෂ්පාදනය කරන එක. හොඳ දෙයක්. මොකද? [බාධා කිරීමක්]ඔව්. හොඳ දෙයට හොඳයි කියන්න ඕනෑ. එදා මම උක් කර්මාන්තය භාරව කටයුතු කරද්දී මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රතිපත්තිය තිබුණේ මොකක්ද? මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රතිපත්තියක් තිබුණා, මේ රට සීනිවලින් ස්වයංපෝෂිත කරන්නට ඕනෑය කියා. තමුන්නාන්සේලා එදා විරුද්ධ වුණේ නැහැනේ. තමුන්නාන්සේලා එදා විරුද්ධ වුණේ නැහැ. ඒ ප්‍රතිපත්තියමයි මේ ඉදිරියට අරගෙන යන්නේ. මේ අරගෙන යන්නේත් ඒකමයි. මතක තියා ගන්න. මේ රටේ අවශ්‍යතාවයක් මේක. රටට අවශ්‍ය දෙයක් මේ කරන්නේ. එම නිසා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටින්නේ, අපි මේ ගැන ඇණකොටා ගන්න, ගහ ගන්න ඕනෑ නැහැ. යහළු මිත්‍රයන් හැටියට මම ඉල්ලා සිටින්නේ, අපි සුහදව සාකච්ඡා කරලා, ගම්මුන්ගේ ප්‍රශ්නයක් තිබෙනවා නම්, ගරු තේනුක විදානගමගේ මන්ත්‍රීතුමනි, අපි ඒ සඳහා විසඳුමක් ලබා දෙමු.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා දැන් කථාව අවසන් කරන්න.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
අපි ගම්මුත් සමඟ සාකච්ඡා කරමු. මේකට විරුද්ධ කට්ටියක් ඉන්න බව මම දන්නවා. ඒ විරුද්ධ කට්ටියටත් ඒකට උත්තරයක් දෙමු. උත්තර දෙනවා. හැම දෙයටම උත්තර දෙනවා. නැත්තේ නැහැ. එහෙම නැත්නම් සමහර කට්ටිය කියනවා, "දෙහි factory එකක් දමමු. ඉරිඟු factory එකක් දමමු" කියා. ඒවා වෙන්නේ නැති වැඩනේ. ඒවා වෙලා වැඩකුත් නැති දේවල්නේ. ලංකාවට ඉරිඟු තව අවශ්‍ය වෙන්නේ මෙට්‍රික් ටොන් ටොන් ලක්ෂයයි. ඉරිඟුවලින් ස්වයංපෝෂිත වෙන්න අපට ඕනෑ ඉරිඟු මෙට්‍රික් ටොන් ලක්ෂ හතරහමාරයි. අපි මේ කන්නයේදී මෙට්‍රික් ටොන් ලක්ෂ තුනක් වගා කළා. මේ කන්නයේ ඉරිඟුවලට හානියක් වුණු නිසා ඉරිඟු කිලෝ එක රුපියල් පණහට ගියා. ලබන මහ කන්නයේ ඉරිඟු වගාව වැඩි වුණාම තමුන්නාන්සේලා හිතනවාද ඉරිඟු කිලෝ එක රුපියල් පණහට දෙන්න පුළුවන්ය කියා. නැහැ. ඉරිඟු මිල රුපියල් 35ට බහිනවා. හරිද? පොඩ්ඩක් කල්පනා කරන්න. උක් වගාව ගොවියෙකුට ස්ථිරව ලැබෙන ආදායම් මාර්ගයක්. උක් ගහ එක පාරක් වගා කළොත් අවුරුදු හයක් යනතුරු ආපසු වගා කරන්නට ඕනෑ නැහැ. කපන එක පමණයි තිබෙන්නේ. ඔබතුමා ඒක දන්නවා. ඒ අතරේ පළමුවෙනි මාස හයේ උක් ගස් අතරේ වෙනත් බෝග -කව්පි, මුං වාගේ දේවල්- වගා කරන්නට පුළුවන්. මේ ගැන තමුන්නාන්සේලාගේ විරුද්ධතාවක් තිබෙනවා නම් ඒක වෙනම කථාවක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථාව අවසාන කරන්න.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මේ ආයෝජනයට එදා මාත් විරුද්ධ වුණා. විරුද්ධ වුණු හේතු මම කිව්වා. හැබැයි, මම මේ විෂයය ගැන හොඳට ඉගෙන ගත්තාට පස්සේ මම දැන ගත්තා, මේ රටේ සියයට හැත්තෑවක් වන වියළි කලාපයට සුදුසු හොඳම බෝගය උක් ගසයි කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සහෝදර මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ, හැම දෙයකටම විරුද්ධ වෙන්නට එපා. තමුන්නාන්සේලා මේ මල් වට්ටියට අත ගහන්න, මේ රටේ දැවැන්ත ප්‍රශ්නයක් තිබෙන වෙලාවේ. [බාධා කිරීමක්] ඔව්. රටේ දැවැන්ත ප්‍රශ්නයක් තිබෙන වෙලාවේ මේ සඳහා සහයෝගයක් දෙන්න ඕනෑය කියන එකයි මම කියන්නේ. ඕකයි මම කිව්වේ.

මහවැලියටත් එදා මිනිස්සු විරුද්ධ වුණු බව මතක තියා ගන්න. එදා මහවැලියටත් මිනිස්සු විරුද්ධ වුණා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මිනී මල්, -

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මිනී මල් ගැන මොකක්ද කිව්වේ? තමුන්නාන්සේලාට ඕවා හොඳට පුරුදු බව මා දන්නවා. ජේවීපී එකට මිනී මල් හොඳට පුරුදුයි; ජේවීපී එකේ කට්ටියට මිනී මල් හොඳට පුරුදුයි. ඉතිහාසයේ තමුන්නාන්සේලාට, - [බාධා කිරීමක්] ඒ ගැන කථා කරන්න දෙයක් නැහැ, ගරු මන්ත්‍රීතුමා. ඒ නිසා අපි තමුන්නාන්සේලාගේ ජේවීපී එකේ ඉතිහාසය ගැන කථා නොකර සිටිමු. අපට ඒ ඉතිහාසය හොඳට මතකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රදේශයේ ජනතාව හැටියට අපි මේ කටයුත්ත සඳහා සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින් මා නවතිනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා සභාගත කරන ලද ලිපි ලේඛන සියල්ල ලබා දෙන්න.

ඊළඟට, ගරු තේනුක විදානගමගේ මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.54]

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබා දීම සම්බන්ධයෙන් පළමුවෙන්ම මා ඔබතුමාට ස්තූතිවන්ත වනවා. අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය ඇමතිතුමා කථා කළාට පස්සේ මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා සන්තෝෂ වනවා. අද උදේ වරුවේ හරින් ප්‍රනාන්දු ඇමතිතුමා කථා කරන අවස්ථාවේ චෝදනා කළා, "මගේ සහෝදරයාගේ ආසන සංවිධායක ධුරය ගැලවුණේ මම නිසා" කියලා. මම ඒ සම්බන්ධයෙන් පැහැදිලි උත්තරයක් එතුමාට ලබා දෙන්න ඕනෑ. එතුමාගේ හෘදය සාක්ෂිය දන්නවා, "ඒකට හේතුව මොකක්ද? මොකක්ද වුණේ?" කියලා.

මේ අවස්ථාවේදී ඒ කාරණය මම මතක් කරලා දෙන්න ඕනෑ. ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේම උක් කර්මාන්තශාලාවට මුල්ගල් තබන්න දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙන් යෝජනා වෙලා, 7,000ක ජනතාවක් සහභාගි කරලා, අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඒ උත්සවය

[ගරු තේනුක විදානගමගේ මහතා]

පවත්වන්න මේ වනකොට කටයුතු සැලසුම් කරලා තිබෙනවා. අපි මේ සංවර්ධනයට විරුද්ධ නැති බව කියන්න ඕනෑ. අපේ ගමට මේ සංවර්ධනය එනවාට අපි කිසිසේත් විරුද්ධ නැහැ. නමුත් උක් කර්මාන්තශාලාවක් ඒ ගමේ ඉදි වනවාට ගමේ ඉන්න ජනතාවගේ ලොකු විරෝධයක් තිබෙනවා. අපට ඡන්දය ලබා දුන් ජනතාව වෙනුවෙන් තමයි අද අපි කථා කරන්නේ. පක්ෂ පාට බේදයක් නැතිව, දේශපාලන වශයෙන් මේ කටයුත්තට අපේ විරුද්ධතාවක් නැහැ. මොකද, පසුගිය කාලය තුළදී -මහින්ද රාජපක්ෂ යුගය තුළදී - ලංකාවේ දෙවෙනියට තිබෙන දුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන මහියංගණය ආසනය අපි දැවැන්ත විධියට සංවර්ධනය කරලා පෙන්නුවා. ඉතිහාසයේ කවුරුවත් නොකරපු සංවර්ධනයක් පසුගිය අවුරුදු පහක කාලය තුළදී - මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලයේදී - අපි සංවර්ධනය කරලා තිබෙනවා. ඒ නිසා අපි මේ සංවර්ධනයට විරුද්ධ නැහැ.

එක්සත් ජාතික පක්ෂය කළත්, ජනතා විමුක්ති පෙරමුණ කළත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩු ගෙනැල්ලා මේ කටයුතු කළත් අපේ විරුද්ධතාවක් නැහැ. නමුත් මේ කටයුත්තට ගමේ අහිංසක මිනිසුන්ගේ විරෝධයක් තිබෙනවා. ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය ඇමතිතුමා එතුමාගේ කථාවේදී කිව්වා, මේ factory එක දමන තැන ඉඳලා කිලෝමීටර් පහක දුරකින් තමයි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයිති නටබුන් තිබෙන්නේ කියලා. පසු ගිය සතියේ ගම්මුත් එක්ක ගිහිල්ලා මා මේ භූමියේ ඇවිද්දා. ඒ භූමියේ ගත් ඡායාරූප මා ළඟ තිබෙනවා. මේ ප්‍රදේශයේ පුරාවිද්‍යා වටිනාකමින් යුක්ත නටබුන් තමයි තිබෙන්නේ. ඒ ඡායාරූප සියල්ල මා මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් වාර්තාව ඉල්ලන්න. "පුරාවිද්‍යා වටිනාකමින් යුක්ත නටබුන් ඒ ප්‍රදේශයේ නැහැ" කියලා ඔබතුමන්ලා කිව්වාට, "මෙන්න මේ නටබුන් ඒ ප්‍රදේශයේ තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න" කියලා අපි කියනවා. ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය ඇමතිතුමා අද කිව්වා, එතුමා 2007 ජූලි මාසයේදී කරපු කථාවට විරුද්ධ වුණා කියලා. හැබැයි, එතුමා 2013 ඇමතිවරයා බවට පත් වුණාට පස්සේ, මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කරලා, වැඩ පටන් ගත්තා කියලා කිව්වා. එතුමා හිටපු මන්ත්‍රීවරුන් සියලු දෙනාට ආරාධනා පත්‍ර බෙදුවා මට මතකයි. රුපියල් 5,000කට වැඩි වටිනාකමකින් යුක්ත ආරාධනා පත්‍රයක් හදලා, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා එක්ක ගිහිල්ලා -ඒ ආරාධනා පත්‍රය අද මට ගෙනෙන්න බැරි වුණා, ගරු රාජ්‍ය ඇමතිතුමා. මම ළඟ ඒ ආරාධනා පත්‍රය තිබෙනවා.- ඔබතුමා කන්තලේ සීනි කර්මාන්තශාලාවට මුල්ගල් තැබුවා. අද කන්තලේ සීනි කර්මාන්තශාලාවට මොකද වෙලා තිබෙන්නේ?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ආණ්ඩුවෙන් මුදල් වෙන් කළා, කන්තලේ සීනි කර්මාන්තශාලාව අපට හදන්න කියලා. හැබැයි, ආණ්ඩුව වෙනස් වුණා. කන්තලේ සීනි කර්මාන්තශාලාව හදන්න බැරි වුණා.

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)

ගරු රාජ්‍ය ඇමතිතුමා, ඔබතුමන්ලාගේ ආණ්ඩුව තිබෙන කාලයේ නේ ඒ කටයුත්ත පටන් ගත්තේ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

කන්තලේ සීනි කර්මාන්තශාලාව සකස් කරන්න අවුරුදු දෙකක් තිස්සේ ගෙනාපු යෝජනා ඉවත් කරපු ආකාරය පිළිබඳ විස්තර අපි ළඟ ඕනෑ තරම් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. අවුරුදු දෙකක් තිස්සේ ගෙනාපු යෝජනා ඉවත් කළා. අවසාන යෝජනාවට මොකක්ද කිව්වේ? "කන්තලේ සීනි කර්මාන්තශාලාව පටන් ගන්න ආණ්ඩුවෙන් සල්ලි දෙන්නම්" කිව්වා. හැබැයි, අපි මුල්ගල තැබුවා. නමුත් අපට කන්තලේ සීනි කර්මාන්තශාලාව පටන් ගන්න බැරි වුණා. ඒ මොකද?

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)

මුල්ගල තැබුවා නම් කරගෙන යන්න තිබුණා නේ, මේ ආණ්ඩුවත් එක්ක එකතු වෙලා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

මොකද, මුල්ගල තිබ්බේ මැතිවරණයට මාසයකට ඉස්සෙල්ලා.

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)p

ඔබතුමන්ලාගේ මේ ආණ්ඩුව තුළ ඉඳගෙන ඔබතුමාට ඒක කරගෙන යන්න තිබුණා නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ඇමතිතුමනි, ඔබතුමාත් ඉන්න ආණ්ඩුවෙන් ඒක කරන්න පුළුවන් නේ. එහෙම බැරි නම් ඔබතුමා ඔතැන ඉඳලා වැඩක් නැහැ නේ.

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ කාලයේ ඒක හොඳ නැහැ කිව්වා. ඔබතුමා සීනි කර්මාන්ත ඇමතිවරයා විධියට, පස්සේ ඒක හොඳයි කිව්වා. මහියංගණය ආසනයේ රිදීමාලියද්ද, ඒවාගේම, බදුල්ල දිස්ත්‍රික්කයේ උඟව-පරණගම ආසනයේ, ඔබතුමාගේ වියලුව ආසනයේ, වැලිමඩ ආසනයේ සීනි කර්මාන්තය නඟා සිටුවන්න විශාල මුදලක් වැය කළා කියලා ඔබතුමාට මතකද කියලා මම දන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ගරු මන්ත්‍රීතුමනි, හකුරුවලට ලොකු ඉල්ලුමක් තිබෙන හින්දා හකුරු නිෂ්පාදනය කළා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
ගරු ඇමතිතුමනි, ඔබතුමා සීනි කර්මාන්තය නඟා සිටුවන්න මහියංගණය ආසනයේ රිදීමාලියද්ද -

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
උක් හකුරුවලට යාපනයේ ලොකු ඉල්ලුමක් තිබෙන හන්දා අපි පොඩි ව්‍යාපෘතියක් පටන් ගත්තා, ගම්වල උක් ගස් හිටවලා ඒ තුළින් හකුරු නිෂ්පාදනය කරලා යාපනයට යවන්න. ඒ පටන් ගත්තු දේ අදත් පස්සර ප්‍රදේශයේ කරනවා.

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
ගරු ඇමතිතුමනි, ඔබතුමා නිලධාරින් ගෙනැල්ලා ලොකු හෝටල්වල සම්මන්ත්‍රණ තියලා ඒ ඔක්කෝම කළා. අද වෙන කොට ඒ මිනිස්සු නැත්තට නැති වෙලා ඉවරයි. ඔබතුමා ඒක නැහැ කියන්න එපා. ඒක ඔබතුමාගේ හදවත දන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි.

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
මට තව විනාඩියක කාලයක් දෙන්න. ගරු ඇමතිතුමා මගේ කාලය අරගෙන කථා කරන්න ගත්තා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා විනාඩියක කාලයක් අරගෙන කථාව නතර කරන්න.

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
මම මගේ කථාවේ ඉතුරු කොටසත්, මේ කරුණු වාර්තා සියල්ල මේ සභාවට ඉදිරිපත් කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා තමයි මේ ව්‍යාපෘතියට මැදිහත් වෙන්නේ. ඔබතුමා පසු ගිය කාලයේ ගිහිල්ලා ඒ ගැන රැස්වීම් තිබ්බා. ඒ රැස්වීම්වලදී ජනතාව ඔබතුමාට විරෝධය පළ කළා. ඒ සීනි කර්මාන්තය නියෝජනය කරන පිරිසක් අද මේ ගැලරියට ඇවිල්ලා ඉන්නවා. අපි ඒ ගොල්ලන්ටත් ඇහෙන්නයි කියන්නේ.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
කොහේද ඉන්නේ?

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
අද ඇවිල්ලා ඉන්නවා. අද දවල් මට හම්බ වුණා; මාත් එක්ක කථා කළා. ඒ නිසා මම ඔබතුමාට පැහැදිලිව කියනවා, අද කන්තලේට වෙලා තිබෙන දේ, අද ඌව-පරණගමට වෙලා තිබෙන දේ-

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඒ ඉන්නවාය කියපු අය කෝ? නැහැ නේ.

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
අද එතුමන්ලා මට හම්බ වුණා; මා සමඟ කථා කළා. ඒ ගොල්ලන් දවල් කෑම වෙලාවේදී මාත් එක්ක කථා කළා. ඒ හින්දායි මම කියන්නේ. මම ඔබතුමාට කියනවා, කන්තලේට සිදුවෙච්ච දේ පැල්වත්තේ ජනතාවට, වේලක් ඇර වේලක් කන රිදීමාලියද්දේ අහිංසක ජනතාවට සිදු වෙන්න ඉඩ දෙන්න එපා කියලා. එහෙම කළොත් ඒ මිනිස්සු සදාකල් නැති වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න.

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
මට නියමිත කාලය අවසානයි කියලා කියන නිසා මගේ කථාවේ ඉතුරු කොටස **සභාගත*** කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 4.02]

ගරු අනුරාධ ජයරත්න මහතා (මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுராத ஜயரத்ன - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne- Deputy Minister of Mahaweli Development and Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. විශේෂයෙන්ම අද මේ විවාදයේදී මට මේ කාරණය මූලිකව කියන්න තිබෙනවා. ලංකාවට ආයෝජනයක් පැමිණි වෙලාවක, ඒ ආයෝජනය කරන මුදල් ප්‍රමාණය රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ආයෝජනය කරන කොට මොන විධියටද අපි ඉදිරි කටයුතු කළ යුත්තේ කියන එක පිළිබඳව අපේ මන්ත්‍රීවරුන් විවිධ අදහස් හා යෝජනා ඉදිරිපත් කළා. හැබැයි අපි සියලුදෙනා බොහොම පැහැදිලිව තේරුම් ගත යුතු එක කාරණාවක් තිබෙනවා. ඒ මෙකයි. අද අපි හැමෝම දේශපාලන පක්ෂ, පාට සියල්ලක්ම අමතක කරලා තර්ක-විතර්ක කරන්නේ මේ රටට අවශ්‍ය කරන ආයෝජන අරගෙන එන්නයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට අපි වෙන්න පුළුවන්, විවිධ පක්ෂ නියෝජනය කරන අනෙකුත් මන්ත්‍රීවරුන් වෙන්න පුළුවන් අපි සියලුදෙනාට අවශ්‍ය කරලා තිබෙන්නේ ඒකයි. රට හරි තැනකට ගෙන යන්න පුළුවන් නම්, රටට අවශ්‍ය කරන ආයෝජන රට තුළට අරගෙන එන්න පුළුවන් නම් ඒ කාරණය තමයි අපි හැමෝම බලාපොරොත්තු වෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විශ්වාස කරනවා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මේ ඉන්න 225දෙනාටත් අවශ්‍ය කරලා තිබෙන්නේ ඒ කාරණාවයි කියලා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අනුරාධ ජයරත්න මහතා]

මේ ආයෝජන සියල්ලක්ම එනකොට අප බොහෝ විට විවිධ තර්ක-විතර්ක කරනවා. මේක මේ විධියට කළොත් හොඳයි කියනවා. එහෙමත් නැත්නම් ඒ ස්ථානයේ ඒක කරනවාට වැඩිය වෙනත් ස්ථානයකට අරගෙන යන එක සුදුසුයි කියනවා. අවසානයේ හැරිලා බැලුවාම සියලු ආයෝජන අපෙන් අත් හැරිලා -ගිලිහිලා- ගිහිල්ලා මේ රට පරණ තිබුණු තත්ත්වයට පත් වෙන්න අවශ්‍ය සියලු කටයුතු යෙදෙනවා. දේශපාලන අධිකාරිය හැටියට, මහජන නියෝජිතයන් හැටියට අපි මේ රට අරගෙන යා යුත්තේ එතැනට නොවෙයි කියලා විශේෂයෙන්ම මෙතැනදී සිහිපත් කරනවා.

මේ විවාදයේදී අද අපේ මන්ත්‍රීතුමන්ලා විවිධ අදහස් යෝජනා ඉදිරිපත් කරනවා මම දැක්කා. අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, හෙක්ටයාර 300ක භූමි ප්‍රමාණයක් මේ කර්මාන්තශාලාවලට වෙන් කළාය කියලා. හෙක්ටයාර 300කට වෙනමම පරීක්ෂණයක් පැවැත්වූවාය කියලා මන්ත්‍රීතුමා විවිධ කාරණා ඉදිරිපත් කළා. තවත් මන්ත්‍රීවරුන් කිව්වා, බොහොම ක්ෂණිකව වන සංරක්ෂණයට අයිති ඉඩම් නිදහස් කරගෙන තිබෙනවාය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මේ ඉඩම් නිදහස් කරන්න 2011.05.16 වෙනි දා ඉදිරිපත් කරපු ලේඛනය මා සතුව තිබෙනවා. එහෙම නම්, රජයන් හැටියට අපි සියලුදෙනා දායක වෙලා, ඉදිරියට අරගෙන ආපු කාරණාවක් මේක. පසුගිය රජය වෙන්න පුළුවන්, විවිධ දේශපාලන නියෝජිතයන් වෙන්න පුළුවන්, මේ කාර්යයට දායකවෙලා තිබෙනවා. ඒ සියලුදෙනා මේ ව්‍යාපෘතියට සහයෝගය දීලා, අද මේ වෙන කොට මේ සමාගමට මේ ව්‍යාපෘතිය පවරන්න පුළුවන් තත්ත්වයට, ඒ සමාගමට ක්‍රියාත්මක වෙන්න පුළුවන් තැනකට අරගෙන ඇවිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණාව ඉදිරිපත් කරන්න මා ඔබතුමාගේ අවසරය ඉල්ලනවා. මේ ලිපිය ඉදිරිපත් කරලා තිබෙන්නේ සේනාරත්න, දිසා වන නිලධාරි. මෙය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂකට ඉදිරිපත් කළ ලිපියක්. 2011.05.16 වෙනි දායි මේ ලිපිය ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ ලිපියේ මේ විධියට කියලා තිබෙනවා.

"මෙම කර්මාන්තශාලා සංකීර්ණය හා අදාළ ව්‍යාපෘතිය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් නිදහස් කිරීම. මෙම කරුණ මූලිකව නිර්දේශ නොකළ අතර, පසුව කර්මාන්තශාලා සංකීර්ණය සඳහා පමණක් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පූර්ව ශක්‍යතා අධ්‍යයනයෙන් පසුව හෙක්ටයාර 200ක බිම් ප්‍රමාණයක් නිදහස් කිරීමට අප දෙපාර්තමේන්තුව එකඟතාව පළකර ඇත."

මෙහෙම කියන්නේ 2011දී,- [බාධා කිරීමක්]

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, what is your point of Order?

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
මම ඔබතුමාට බාධා කිරීමක් නොවෙයි කරන්නේ. ඔබතුමාට වාර්තා සියල්ලම ලැබිලා තිබෙනවා. නමුත්, අපි ඔබතුමාට යෝජනා කරනවා, ගමට ගිහිල්ලා මේ පරිසරය නිරීක්ෂණය කරමු කියලා. මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට ඔබතුමා ඒ නිරීක්ෂණය කරන්න යන්න එන්න. එතකොට ඔබතුමාට වැටහෙයි අපි මේ කියන දේ, ගමේ මිනිස්සු කියන දේ මොකක්ද කියන එක.-[බාධා කිරීමක්]

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
ඔබතුමා කියන කාරණාව හරි. නමුත් ආයෝජනයක් රට තුළට එනකොට, ඩොලර් මිලියන 152ක් මේ රට තුළට එන කොට, මේ කර්මාන්තශාලා ටික හදන්න යනකොට, එතැන තිබෙන ඉඩම් හෙක්ටයාර දෙක ගණනේ අපේ ගොවි මහත්වරුන්ට දෙනකොට, -අක්කරවලින් ගත්තොත් 4.9ක්- තමයි මේ ප්‍රශ්න ඇති කරන්නේ. මේ අක්කර 4.9න් අක්කර හතරක උක් වගා කළ යුතුයි කියලා විතරයි අපි කොන්දේසි දමන්නේ. ඉතිරි අක්කර 0.9, ඒ කියන්නේ පර්චස් 150කට ආසන්න භූමි ප්‍රමාණයකින් පර්චස් දහයක් දෙනවා ගේ හදා ගන්න. ඉතිරි පර්චස් ප්‍රමාණයේ ඒ ගොල්ලන්ට අවශ්‍ය වෙනත් වන වගාවක් කර ගැනීමේ හැකියාව තිබෙනවා; වෙනත් අතුරු භෝග නිෂ්පාදනය කිරීමේ හැකියාව තිබෙනවා; වෙනත් අමතර ආදායම් ඇති කර ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ නිසා අපි මේ කථා කරන්නේ ඒ ජනතාවට අමතර රුපියල් 40,000ක විතර ආදායමක් ලබන්න පුළුවන් ක්‍රමවේදයක් පිළිබඳවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන අපි තර්ක-විතර්ක කළ යුතුයි. ඒ පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මේ සියලු දේවල් නොවෙන තැනට අපි කටයුතු කරනවා නම්, ඇමෙරිකානු ඩොලර් මිලියන 152ක් එන කොට ඒකට පයින් ගහලා එළියට දානවා නම් මොකක්ද අපි කරන්නේ? අපි කථා කරනවා අපි කරපු දේවල්වලින් වැහුණු ඒවා ගැන. අපි කථා කරනවා, අපි කරපු ඒවායින් ලාභ ලබන තත්ත්වය පිළිබඳව. හැබැයි, මේ විදේශ ආයෝජන සියල්ල එන්නේ අවශ්‍ය වාර්තා කැඳවලා, අවශ්‍ය ශක්‍යතා අධ්‍යයන කරලායි.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව තිබෙන ඉඩම් පිළිබඳ ලේඛනය මම **සභාගත*** කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

2011 සිට සියලු දෙනාම මේ ව්‍යාපෘතියට එකඟතාව පළ කරලායි අද වෙන කොට මේ තත්ත්වයටඅරගෙන ඇවිල්ලා තිබෙන්නේ.

පාරිසරික ඇගැයීම් පිළිබඳ වාර්තාව පිළිබඳව අපේ මන්ත්‍රීතුමන්ලා අදහස් ඉදිරිපත් කළා. පාරිසරික බලපෑම් පිළිබඳ ඇගැයීම් වාර්තාවක් කැඳවලා, ඒ කමිටු පත් කරලා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමේ වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙන්නේ 2008 වර්ෂයේදියි. එහෙමනම්, දීර්ඝ කාලයක් තිස්සේ සියලුදෙනා මේ ව්‍යාපෘතිය වෙනුවෙන් එකඟතාව පළ කරලා තමයි ඉදිරියට අරගෙන ඇවිල්ලා තිබෙන්නේ. මේ වෙනකොට ඩොලර් මිලියන 250ට වැඩි ප්‍රමාණයක් අපේ රටින් පිටතට යනවා. පසුගිය 2016 අවුරුද්ද ගත්තොත් ඇමෙරිකන් ඩොලර් මිලියන 340ක මුදලක් පිටරටවලට ගිහිල්ලා තිබෙනවා, සීනි ආනයනය කිරීම සඳහා. ඇයි අපි විදේශීය සමාගම් ටික පොහොසත් කරන්න කටයුතු කරන්නේ? ඇයි අපි මේ සීනි ආනයනය කිරීම වැනි කාරණාවකට අපේ රටේ තිබෙන සල්ලි තවත් පිටරටට යවන්නේ? මේ කර්මාන්තශාලාවෙන් සීනි නිෂ්පාදනය කරන කොට අපේ රටට

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

අවශ්‍ය ප්‍රමාණයෙන් සියයට 14ක අවශ්‍යතාව සම්පූර්ණ කර ගන්න අපට පුළුවන්කම ලැබෙනවා. අපි මේ කීයක් ගැනද කථා කරන්නේ? මේ හරහා ඇමෙරිකන් ඩොලර් මිලියන 21ක් රට තුළ ඉතිරි කර ගන්න අපට පුළුවන්කම ලැබෙනවා. [බාධා කිරීමක්]

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

නැණී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
ගරු මන්ත්‍රීතුමනි, මට බොහොම සීමිත කාලයක් තිබෙන්නේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඔබතුමා කියන කාරණාව හරි. සීනිවලට ඇමෙරිකන් ඩොලර් මිලියන 300ත් - 400ත් අතර මුදලක් වැය වෙනවා. ඒක හොයන්න පුළුවන්. දැනට තිබෙන factories හතරට අක්කර 25,000 ගණනේ අක්කර ලක්ෂයක් තිබෙනවා. ඒවා සඳහා උක් ප්‍රභේද ගෙනෙන්න; පර්යේෂණ කරන්න. අක්කරයකින් නිෂ්පාදනය කරන උක් ප්‍රමාණය මෙට්‍රික් ටොන් සියයට ගෙනාවොත්, රටට අවශ්‍ය සමස්ත සීනි ප්‍රමාණය නිෂ්පාදනය ඒ factories හතරෙන් නිෂ්පාදනය කරන්න පුළුවන්.

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
ගරු මන්ත්‍රීතුමා, බොහොම හොඳයි. කථා කරන කොට අදහස්, යෝජනා නම් බහුතරයක් තිබෙනවා. ඒ යෝජනා ඔය විධියට ඉදිරිපත් කරන්නත් පහසුයි. හැබැයි, ඒ යෝජනා පොළොවේ ක්‍රියාත්මකවීම, යථාර්ථයක් කර ගැනීම පිළිබඳව තමයි අපට ප්‍රශ්නය තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ජලය පිළිබඳ ප්‍රශ්නය බරපතළ ප්‍රශ්නයක් කියලා දැන් කථා කළා. හැබැයි වී වගාවත් එක්ක සංසන්දනය කළාම හයෙන් එකක වතුර ප්‍රමාණයක් තමයි උක් වගාවට අවශ්‍ය කරන්නේ. අද අපි කරලා තිබෙන්නේ අපේ ගොවි ජනතාව අසරණ කරන එක. දිනෙන් දින ඔවුන් අසරණ කිරීමයි අපි කරලා තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා 2015 වසරේ සංඛ්‍යා ලේඛන අරගෙන බලන්න. මේ රටේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 4.3යි. හැබැයි රටේ අවශ්‍යතාව කොපමණද? මෙට්‍රික් ටොන් මිලියන 3.5යි. ඇයි, අපි මේ අමතර ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්නේ? වී ටික විකුණා ගන්න බැරුව වී ගොවීන් හන්දි ගානේ බැහැලා උපවාස කරනවා. පාරවල් ගානේ බැහැලා යනවා, වී ටික විකුණා ගන්න බැරුව. හැබැයි අපි ගිහිල්ලා කියනවා, වී වගා කරන්න, ඒ සඳහා අවශ්‍ය බීජ ටික දෙන්න, ඒ සඳහා අවශ්‍ය පොහොර ටික දෙන්න කියලා. වී ගොවීන් ශක්තිමත් කරන්න කියලා අපි -දේශපාලන නියෝජිතයින්- ගිහිල්ලා කථා කරනවා. ඒ කථා කිරීම තුළින් මොකක්ද කරන්නේ? ඒක තමුන්ගේ දේශපාලනයට හොඳයි. හැබැයි අර අහිංසක, අසරණ ගොවීන් අන්ත අසරණ කරලා විනාශ කරන එක නොවෙයිද, ඒ මඟින් අපි කරන්නේ? හැබැයි අද මේ උක් ශාකය වගා කිරීම තුළ ඔවුන්ට ආදායම් ලබා ගන්න පුළුවන් ක්‍රමවේදයක් නිර්මාණය කරලා තිබෙනවා. අද අපේ ගම්පොළ ප්‍රදේශයට යන්න. ගම්පොළ ප්‍රදේශයේ දොරගල වසමට යන්න. ගෝවා වගා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෝවා වගා කරන කාලයට ගෝවා කිලෝව රුපියල් හතට විකුණා ගන්න බැරුව ඔවුන් අන්ත අසරණ වෙනවා. දඹුල්ලට අරගෙන ගිහිල්ලා විකුණා ගන්න බැරුව පාරේ හලලා එන අවස්ථා අනන්තයි, අප්‍රමාණයි. වැලිමඩ පැත්තට යන්න. වැලිමඩ ප්‍රදේශයට ගිහිල්ලා බලන්න. අල වගා කරන කාලයට මොකක්ද කරන්නේ? යායට අල වගා කරනවා. මට හොඳට මතකයි, 2014 පළාත් සභා මැතිවරණය එන කොට අපි වැලිමඩ ආසනය භාරව කටයුතු කළා. එදා අපි මොකක්ද කළේ? ඒ මුළු අල තොගයම සතොස හරහා මිලදී ගන්න කටයුතු කළා. හැබැයි අවසානයේදී අල ටිකට මොකක්ද වුණේ? රජයන් හැටියට අපට තාවකාලික පැලැස්තර යොදන්න පුළුවන්. හැබැයි අපි ඊට වඩා දීර්ඝ කාලීන විසඳුමකටයි යා යුතුව තිබෙන්නේ.

අද අපේ ගොවියෙකුට හෙක්ටයාර දෙකක් -අක්කර 4.9ක්- දෙන කොට විරුද්ධ වෙන්න පුළුවන් කාටද? අපේ කෙනෙක් අපේ ඉඩම් කොටසක් අරගෙන, ඒ ඉඩම සංවර්ධනය කරගෙන, තමුන්ට අවශ්‍ය කරන පරිසරය ගොඩ නඟා ගෙන දියුණු වෙන කොට, ඒකට විරුද්ධව අපි කථා කිරීම කිසිම ඵලක් නැහැ කියන එක මම මෙතැනදී විශේෂයෙන්ම සිහිපත් කරනවා. අපේ සුමේධා ජී. ජයසේන නියෝජ්‍ය ඇමතිතුමිය ටිකකට කලින් මේ සභාවේ හිටියා. එතුමිය මා එක්ක කිව්වා, එදා පැල්වත්ත සීනි කර්මාන්තශාලාව ආරම්භ කරන කොට එතුමියත් ගිහිල්ලා උද්ඝෝෂණය කළා කියලා. ඒ ව්‍යාපෘතිය නතර කරන්න කියලා උද්ඝෝෂණය කළා කියලා කිව්වා. හැබැයි අවුරුදු දෙක-තුනක් ගියාට පස්සේ තමයි ඒකේ වාසිය තේරුණේ කියලා කිව්වා. ඒ ජනතාව ඒකෙන් ජීවත් වෙන කොට, ඒකෙන් ආදයම් ලබන කොට තමයි ඒ සියලු කාරණා පිළිබඳව දැන ගත්තේ කියලා එතුමිය මා එක්ක කිව්වා. ඒක තමයි යථාර්ථය.

රිදීමාලියද්ද කියන්නේ අද මේ රටේ තිබෙන අති දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්. ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය දියුණු කරන්න අපි කටයුතු කළ යුතුව තිබෙනවා. බොහෝ විට අද දේශපාලන අධිකාරියේ ඉන්න සියලු දෙනාම විවිධ තර්ක විතර්ක ඉදිරිපත් කරනවා. උමා ඔය ව්‍යාපෘතිය පිළිබඳව ප්‍රශ්න ඇති කරනවා. ඒක ඇත්ත. හැබැයි ඒක රුපියල් බිලියන 57කට වඩා වියදම් කරපු ව්‍යාපෘතියක්. අපට ආපස්සට යන්න පුළුවන්කමක් නැහැ. මේ රටේ අහිංසක මිනිසුන්ගේ රුපියල් බිලියන 57ක් අපි ඒ ව්‍යාපෘතිය වෙනුවෙන් ආයෝජනය කරලා තිබෙනවා. ඒ මුදලට ඉතුරු ටිකත් දාලා ඒ ව්‍යාපෘතිය අවසන් කරනවා වෙනුවට අපට ආපස්සට හැරිලා යන්න පුළුවන්කමක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම ව්‍යාපෘතිය අවසන් වෙන කොට, අලිකොටආර ජලාශයට වතුර ටික ගිහිල්ලා වැටෙන කොට, මොණරාගල වගා කරන්න බැරි විශාල අක්කර ප්‍රමාණයක් වගා කරන්න පටන් ගන්න කොට, හඳපානාගල ජලාශයට වතුර ටික ගිහිල්ලා වැටෙන කොට, හඳපානාගල ජලාශය පිරිලා වගා කරන්න පටන් ගන්න කොට, ඒකේ ප්‍රයෝජනය ගන්න කොට තමයි ඒ තීන්දු තීරණ ගත්ත දේශපාලන නායකයින් ඇතුළු සියලු දෙනාට පින් දෙන්න කටයුතු කරන්නේ.

එදා පොල්ගොල්ල ව්‍යාපෘතිය කරද්දී මොකක්ද වුණේ? පොල්ගොල්ල ව්‍යාපෘතිය කරන කොට, පොල්ගොල්ලේ tunnel එක හදන කොට, වතුර නැති වෙනවාය කියලා මිනිසේ ගොවීන් උපවාස කළා; උද්ඝෝෂණ කළා. පොල්ගොල්ල වේල්ල පුපුරවනවා කියලා දේශපාලන අධිකාරියේ ඇතැම් නායකයින් එදා කිව්වා. හැබැයි මිනිසෙට වතුර නැති වුණාද? එහෙම වතුර නැති වෙලා නැහැ. අද මිනිසේ anicut එක මීටර 3.5ක් උස්සනවා. අද

[ගරු අනුරාධ ජයරත්න මහතා]

මොකක්ද, ත්‍රිකුණාමලයෙන් කියන්නේ? ත්‍රිකුණාමලයෙන් තර්ක කරනවා, ඒ anicut එක ඉස්සීම තුළ ත්‍රිකුණාමලයේ වගා බිම් ටික සම්පූර්ණයෙන්ම අසාර්ථක වෙනවාය කියලා. හැබැයි අපි බොහොම පැහැදිලිව කියනවා, එහෙම වුණොත් මිනිසේ anicut එක පුපුරවන්න සිය දහස් ගණනක් එතැන ඉන්නවා, බය වෙන්න දෙයක් නැහැ කියලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

සියලු ව්‍යාපෘති ආරම්භ කරන කොට, මේ සියලු ව්‍යාපෘති කරගෙන ඉදිරියට යන්න හදන කොට, ඒකට චෝදනා කරලා, ඒවා විනාශ කරලා, ඒවා නැති කරන එක නොවෙයි අපි කළ යුතුව තිබෙන්නේ. අපේ තර්කය විය යුත්තේ ඒක වඩාත් හොඳ විධියට හසුරුවා ගත යුත්තේ කොහොමද කියන කාරණාව පිළිබඳව විතරයි. අපට මේ ආයෝජන නැති කර ගන්න බැහැ. අපි එහෙම කරපු කාලයක් තිබුණා. අපි සියලු දෙනා එහෙම කරලා මේ රට අගාධයට අරගෙන ගිහිල්ලා තිබෙනවා. හැබැයි මේ ආයෝජන නැති කරගෙන මේ රට ඉදිරියට අරගෙන යන්න පුළුවන්කමක් නැහැ. රට තුළ මේ කර්මාන්තශාලාව ඇති වීමත් එක්ක ඒ ප්‍රදේශය තුළ දහසකට එහා ගිය සෘජු රැකියා අවස්ථා සංඛ්‍යාවක් ඇති වෙයි කියලා අපි විශ්වාස කරනවා. වක්‍ර රැකියා අවස්ථාත් අති බහුතරයක් ඇති වෙනවා. ඒ වාගේම රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගත්තාම, අද වන සංරක්ෂිත ප්‍රදේශවල හේන් ගොවිතැන් කරන ගොවීන් විශාල ප්‍රමාණයක් සිටිනවා. හැබැයි, ඔවුන් ගිහිල්ලා කැලෑවට කරන හානි පිළිබඳව සමහර වෙලාවට කථා කරන්නේ නැහැ. ඔවුන් ගිහිල්ලා ඒ ප්‍රදේශවල කරන හානියෙන් වෙන්නේ මොකක්ද කියන එක පිළිබඳව කවුරුවත් කථා කරන්නේ නැහැ. හැබැයි, මෙවැනි ව්‍යාපෘතියක් කරලා යම් කිසි ප්‍රතිලාභයක් දෙන්න හදන කොට තමයි සියලු දෙනා මේ පිළිබඳව කථා කරන්නේ. එහි අනවසරයෙන් වගා කරන කණ්ඩායම් නියමානුකූල කරන්නත් මේ කටයුත්ත තුළ අපට පුළුවන්කම ලැබෙනවා. එම ඉදිරිපත් කරපු කැබිනට් පත්‍රිකාවේ පළමුවැනි කාරණාව හැටියට අතිගරු ජනාධිපතිතුමා බොහොම පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, දැනට වගා කරන කණ්ඩායම්වලට ප්‍රමුඛතාව ලබා දීලා මේ උක් වගාව සඳහා හෙක්ටෙයාර් දෙකක ඉඩම් ප්‍රමාණයක් ලබා දෙන්න කියලා. ඒ අනුව ගත්තාම එම ප්‍රදේශයේ ජීවත් වන අතිබහුතර ප්‍රමාණයකට වාසි රැසක් අත්වෙන ක්‍රමවේදයක් බවට මෙය පත් වෙනවායි කියන එක විශේෂයෙන්ම මතක් කළ යුතු වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් අවසන් කරන්න.

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමත් එක්ක අපට ඒ ප්‍රදේශ නහා සිටුවන්න හැකියාව ලැබෙනවා. විශේෂයෙන්ම උමා ඔය ව්‍යාපෘති, මහවැලි අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වන දැවැන්ත ව්‍යාපෘති සියල්ල හරහා ජනතාවට වැඩි සහන ප්‍රමාණයක් සලසන්න අපි බලාපොරොත්තු වෙනවා. කඩිනම් මහවැලි ව්‍යාපාරයට පස්සේ මේ කාලයේ තමයි මහවැලිය හරහා වැඩිම ව්‍යාපෘති ප්‍රමාණයක් ක්‍රියාත්මක වෙන්නේ. එම ව්‍යාපෘති ප්‍රමාණය අවසන් වන කොට මේ වගාවන් එක්ක ජීවත් වන ගොවි ජනතාවට තව තවත් වැඩි සහන සලසන්න බොහොම පැහැදිලිව අපට පුළුවන්කම ලැබෙනවාය කියන කාරණයත් මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තූතියි.

මීළඟට, ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.15]

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික සමාගමකට මොනරාගල හා බිබිල ප්‍රදේශවල ඉඩම් ලබා දීම පිළිබඳව සභාව කල් තබන අවස්ථාවේ ගෙනාපු යෝජනාව පිළිබඳව කරුණු කාරණා බොහොමයක් ඉදිරිපත් වුණා. කොහොම වුණත් මමත් මේ පිළිබඳව කාරණා කිහිපයක් මතු කරන්න බලාපොරොත්තු වනවා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය ඇමතිතුමා 2007දී මේකට විරුද්ධ වුණා. එතුමා ඒ කාලයේ මේ සභාවේ කියාපු කාරණාවක් මතක් කරමින් මා කථාව පටන් ගන්නම්. එතුමා ඒ සම්බන්ධයෙන් මේ සභාවේදී කළ කථාව 2007 ජූලි 17වැනිදා හැන්සාඩ් වාර්තාවේ 95 වැනි තීරුවේ මෙසේ සඳහන් වෙනවා:

"... ප්‍රදේශයේ මහජනතාවට හානියක් වුණා. අද උක් වගාව නැහැ. නැවත වතාවක් උක් වගාව පටන් ගත්තොත් මේ ප්‍රදේශයට අලින්ගෙන් සිදු වන හානිය කිසිම කෙනකුට නවත්වන්න බැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කිසිම කෙනකුට නවත්වන්න බැහැ."

එතුමා එදා කරපු කථාවේ කොටසකුයි මා මේ සඳහන් කළේ. ඊළඟට එතුමා කියා තිබෙනවා, "...අපි උක් වගාවට නුසුදුසු ප්‍රදේශයක් දෙන්නේ. ඊට කිසි සේත්ම සුදුසු නැති ප්‍රදේශයකුයි දෙන්න යන්නේ" කියලා. එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා :

"...මා විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, මේ ප්‍රදේශය මහා පරිමාණ විශාල ඖෂධ වනයක් තිබෙන ප්‍රදේශයක්. මේ ඖෂධ වනය නාමල්ඔය, නිල්ගල පැත්තට මෙන්ම ඇකිරියන්කුඹුර පැත්ත, දෙහිගම, බුලුගහළිඳ යනාදි ප්‍රදේශවලට ව්‍යාප්ත වෙලා තිබෙනවා. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙනුත් -කැලෑ දෙපාර්තමේන්තුවෙනුත්- මේ ප්‍රදේශයට අත තියන්න එපාය කියා නියෝග දීලා තිබෙනවා."

ඊළඟට, එම හැන්සාඩ් වාර්තාවේම 96 වැනි තීරුවේ එතුමාගේ කථාවේ තවදුරටත් මෙසේ සඳහන් වී තිබෙනවා:

"මම දවස් කිහිපයකට ඉස්සෙල්ලා සිටියේ මහියංගනය ප්‍රදේශයේ. මහජනතාව සෑහෙන වශයෙන් මේකට විරුද්ධයි. මොකද, අත්දැකීමක් ලබා තිබෙන නිසා. මේ උදවිය අත්දැකීමක් ලබා තිබෙනවා,..."

ඉතින් ඒ විධියට ජනතාව පැත්තේ ඉඳගෙන කථා කරපු ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමා අවුරුදු 10කට විතර පස්සේ අද කියනවා, එතුමා ඒ සම්බන්ධයෙන් අධ්‍යයනයක් කළාය, එදා තමන් දරපු මතය වැරැදියි කියලා. හැබැයි, තව අවුරුදු පහකින් මේ ව්‍යාපෘතිය අසාර්ථක වුණොත්, එතුමා එදාට කියන්න පුළුවන්, "මා දැන් අධ්‍යයනය කර තිබෙන ආකාරයට මා එදා ගත් තීන්දුවත්, එදා ආපු නිගමනයත් වැරැදියි කියලා මට දැන් තේරෙනවා" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා අලිමංකඩ ගැනත් කථා කළා. ගරු තේනුක විදානගමගේ මන්ත්‍රීතුමා ඒ සම්බන්ධ ඡායා

රූපයකුත් අද සභාගත කළා. ගරු ලක්ෂමන් සෙනෙවිරත්න රාජ්‍ය අමාත්‍යතුමාත් එදා අලි ගැනයි කියලා තිබෙන්නේ. "උක් කන්න අලි එනවා. ඒකෙන් විශාල වශයෙන් ප්‍රදේශයේ මහජනතාවට හානියක් වුණා. අද උක් වගාව නැහැ" කියලයි එතුමා එදා කියලා තිබෙන්නේ. ඉතින් මේ විධියට එතුමා මේ ගරු සභාවට ඉදිරිපත් කරපු කරුණු කාරණා අවුරුදු කිහිපයකින් එතුමාටම අමතක වෙනවා. ඒ නිසා අපට මේ ව්‍යාපෘතිය ගැන ඇත්තටම සැකයක් තිබෙනවා.

අතිගරු ජනාධිපතිතුමා හුඟක් වෙලාවට ජනතාවගේ හඬට කන් දීපු අවස්ථා තිබෙනවා. ඉන් එක් කාරණයක් මා මතක් කරන්නම්. මහබැංකු බැඳුම්කර වංචාවෙන් පසුව හිටපු මහබැංකු අධිපතිතුමාවම නැවත පත් කරන්නට ගරු අග්‍රාමාත්‍යතුමා ලොකු අරගළයක් ගෙන ගියා. හැබැයි, ඔහුගේ කීමට ඇහුම්කන් දෙන්නේ නැතිව එතුමා අර්ජුන මහේන්ද්‍රන් මහබැංකු අධිපතිතුමාව ඉවත් කළා. ඒ වාගේම වංචා, දූෂණ චෝදනා එල්ලවීම නිසා ඇමති මණ්ඩලය වෙනස් කළා. විශේෂයෙන්ම දූෂණ සහ වංචා පිළිබඳ චෝදනා එල්ලවීම නිසා ගරු මුදල් අමාත්‍යතුමාගෙන් එම අමාත්‍යධුරය වෙනස් කළා.

මට මතකයි, ලොතරැයි පතක මිල වැඩි කළාට පස්සේ ලොතරැයි මණ්ඩලයට සහ රජයට ලැබෙන ආදායම ගැන නොසිතා එතුමා ඒ තීරණයත් වෙනස් කළා. එම නිසා රිදීමාලියැද්ද ප්‍රදේශයේ සීනි කර්මාන්තශාලාවක් ඉදිකිරීමට ගෙන ඇති තීන්දුව වෙනස් කරගන්න පුළුවන්කම ලැබෙයි කියලා හිතන්නටත් පුළුවන්කම තිබෙනවා. විශේෂයෙන්ම වර්තමානයේ පැල්වත්ත සහ සෙවණගල ප්‍රදේශ ගැන අපට අත් දැකීම් තිබෙනවා. පැල්වත්ත ප්‍රදේශයේ තිබෙන ජනාවාස ඇතුළට ගියාම - ඒ ගම්මාන ඇතුළට ගියාම - උක් වගාවට යොමුවෙලා සිටින මිනිසුන් විඳින දුක අපට පැහැදිලිව පෙනෙනවා. ඒ අයට ජලය නැහැ, කන්න නැහැ, එදිනෙදා අවශ්‍යතාවන් සඳහා අවශ්‍ය ආදායම නැහැ, දරුවන් පාසල්වලට යවන්න විධියක් නැහැ, බෙහෙත්-හේත් ගන්න මුදල් නැහැ, අනෙක් පැත්තෙන් වකුගඩු රෝගවලට ගොදුරු වෙලා. ඒ වාගේම වල්අලි තර්ජනවලටත් මුහුණ දෙනවා. අපි මාස තුන හතරකට සැරයක්වත් අලියෙක් ගහලා මරණයට පත්වුණු කෙනෙකුගේ ගෙදරට යනවා, ඒ සිද්ධිය බලන්න. එහෙම බැලුවාම මෙහි සැබෑ තත්ත්වය අපට පෙනෙනවා. හරියට උක් කර්මාන්තශාලාවට උක් දණ්ඩක් දැම්මාම අවසානයේ එන රොඩ්ඩ වගේ තමයි ඒ උක් වගාවේ යෙදී සිටින මිනිසුන්ගේ ජීවන තත්ත්වය. සෙවණගලත් එහෙමයි. සෙවණගල එක්තරා ග්‍රාම නිලධාරි වසමක් තිබෙනවා, මුතුමිණිගම කියලා. එම වසමේ බරපතළ විධියට වකුගඩු රෝගීන් ඉන්නවා. එහෙම බැලුවාම ඌව පළාතේ අලි ප්‍රශ්න, දරිද්‍රතාව, ඒ වාගේම විවිධ වූ සමාජ ආර්ථික ගැටලු උක් වගාව වැඩි වශයෙන් ඇති පැල්වත්ත සහ සෙවණගල ආශ්‍රිත ප්‍රදේශවල අපි දකිනවා. අපට ඒකේ අත් දැකීම තිබෙන නිසා,- අපට අල්ලපු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තමයි රිදීමාලියැද්ද කියන්නේ. රිදීමාලියැද්ද කියන්නේ ඇත්තටම දරිද්‍රතාව පැත්තෙන් ලංකාවේ දෙවැනි තැනට ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය. උක් වගාව කියන්නේ මොකක්ද කියලා ඒ ප්‍රදේශයේ ජනතාව අත් දැකීමෙන් දන්නවා. ඒ නිසා තමයි ඒ අය නිතරම කියන්නේ, උක් වගාව නැතුව අපට බඩ ඉරිඟු වගාව දෙන්න, නැත්නම් මුං ඇට වගාව, කුරක්කන් වගාව, රඹුටන් වගාව, ඒ වාගේම ගම්මිරිස්, කුරුඳු, රබර් වැනි වගාවන් දෙන්න කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
මේ ආණ්ඩුව විනිමය අර්බුදයකට මුහුණ දීලා තිබෙනකොට, වැඩිපුර විනිමය ගන්න නම් මේ ප්‍රදේශයට හිතකර, පරිසරයට හිතකර, දේශගුණයට හිතකර, වැඩි ආදායමක් ගන්න පුළුවන් වගාවන්වලට ජනතාව යොමු කරලා මේ ව්‍යසනයෙන් රිදීමාලියැද්ද ප්‍රදේශය ඇතුළු ඌව පළාතේ ජනතාව බේරාගන්න ඕනෑ. මේක රිදීමාලියැද්දට විතරක් සීමාවුණු එකක් නොවෙයි. මහඔය, පදියතලාව, බිබිල, මැදගම, ඒ වාගේම මීගහකිවුල, ඒ හැම ප්‍රදේශයකටම ව්‍යාප්තවෙලා යන ප්‍රශ්නයක්. ඒ වාගේම ඌව වෙල්ලස්ස බිම්තැන්නත් එහෙමයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව පුංචි කාරණා කිහිපයක් ඉදිරිපත් කරන්න තිබෙනවා. අනිත් එක, මේ සඳහා රජයේම ප්‍රතිපත්තියක් තිබෙනවා. මීට කලින් මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා කථා කළා. මොකද, මේ රජයේ වැඩ පිළිවෙළක් තිබෙනවා, 2022 වෙනකොට වන ආවරණය සියයට 32 දක්වා වැඩිකර ගැනීමට. දැන් වෙනකොට වන ආවරණය තිබෙන්නේ සියයට 29යි දශම ගණනයි. පරිසරය හානි කරන, ආදායමක් නොලැබෙන, ජනතාව දුප්පත් බවට ඇදදමන මේ උක් වගාව සඳහා මේ රක්ෂිත ප්‍රදේශය, ජල මූලාශ්‍ර ප්‍රදේශය නිදහස් කළාම, රජයේ අරමුණක් බවට පත්වී ඇති වන වගාව වැඩි කිරීමේ අරමුණට කොහොමද ළං වෙන්නේ?

වාර්ෂිකව අක්කර හෙක්ටෙයාර් 8,000ක් විනාශ වෙනවා. ඊට අමතරව මෙම ව්‍යාපෘතියත් අසාර්ථක වුණොත්, සංවර්ධන ව්‍යාපෘතිවලට වනාන්තර වෙන්කිරීම නිසා රජයේ අනිත් අරමුණට ළඟාවෙන්න පුළුවන් වෙන්නේ නැහැ. මොකද, මේ ආණ්ඩුව හරියට යන්නේ කොහේද කියලා දන්නේ නැතුව පාරට බැස්සා වාගෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
එම නිසා මේ වගේ අසාර්ථක ව්‍යාපෘතිවලින් ඌව පළාතේ ජනතාව බේරාගන්න, ඒ වාගේම ජනතාවගේ හඬට කන්දෙන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 4.24]

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவூப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තැබීමේ විවාදයේදී මේ රටේ සීනි කර්මාන්තය පිළිබඳව වාගේම උක් වගාව

[ගරු රවුෆ් හකීම් මහතා]

පිළිබඳවත් සාකච්ඡා කරනවා. විශේෂයෙන්ම මොනරාගල දිස්ත්‍රික්කය පදනම් කරගෙන ඇති වී තිබෙන මේ ගැටලුව ගැන සාකච්ඡා වෙනවා. මේ රටට ආයෝජනය ගලා යෑම සඳහා අපි කළ යුතු උපරිමය කළ යුතුයි කියන එක කවුරුත් පිළිගන්නවා. නමුත් අපි මීට කලින් කොම්පැනි හරහා ඇති කරන්න ගිය ව්‍යාපාරවලට ඇති වෙලා තිබෙන හානිය, කඩා වැටීම් පිළිබඳව පැහැදිලිව තේරුම් අරගෙන උක් වගාවට අවතීර්ණ විය යුතුයි කියන එකයි මා කියා සිටින්නේ. මොනරාගල දිස්ත්‍රික්කය හැරුණාම මහ ඔය, දෙහිඅත්තකණ්ඩිය කියන ප්‍රදේශවලටත් මේ අදාළ කොම්පැනියේ ඒ භූමි භාගය ව්‍යාප්ත වෙනවා කියන එක කල් තැබීමේ විවාදයේ ඉදිරිපත් වුණු එක් තර්කයක් ලෙස මා දකිනවා.

විමලවීර දිසානායක මැතිතුමා සභාවේ සිටින බැවින් එතුමා දන්නවා දීසවාපී ප්‍රදේශයේ, එරගම ප්‍රදේශයේ, නොරොච්චෝලේ ප්‍රදේශයේ ගොවීන් දැන් විඳින දුක. එයට මූලික කාරණය වශයෙන් අපි හිතට ගන්න ඕනෑ කාරණය තමයි හිඟුරාන සීනි කර්මාන්තශාලාව එක කොම්පැනියක්; ඒ කියන්නේ, Hingurana Sugar Industries Limited. ඊටපස්සේ Gal-Oya Plantations (Private) Limited කියලා කොම්පැනියක් හදලා, හිඟුරාන සීනි කර්මාන්තශාලාව අයත් කොම්පැනියේ වත්කම් පාලනය කරන්න Gal-Oya Plantations (Private) Limited එකට පැවරුවා. මිලියන 500කට විතර තක්සේරු කරලා පැවරුවාට එහි පාලනය පිළිබඳව විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, මේ කොම්පැනියේ කොටස්වලින් සියයට 51ක් භාණ්ඩාගාරයට අයිතියි. මෙහිදී ලබා දීලා තිබෙන business plan එක අනුව මේ කොම්පැනිය ක්‍රියාකර තිබෙනවාද කියන ප්‍රශ්නයක් තිබෙනවා. මේ ඔක්කෝම ප්‍රශ්න පැන නැගුනේ ගොවීන්ට ලබා දෙන මිල ප්‍රශ්නය පිළිබඳව අපි කථා කරන්න ගියාමයි. එතකොට තමයි අපට මේවා ගැන සොයා බලන්න සිදු වුණේ. අඩුම තරමින් මේ කොම්පැනිකාරයෝ -මේ මිලට ගත්ත අය- ගොවීන්ට නිශ්චිත මිලක් ලැබීම පිළිබඳව තිබෙන වගකීම ගැන වගබලා ගන්න ඕනෑ.

උක් වගා කිරීමේ අලුත් ව්‍යාපාරයක් පටන්ගන්නකොට හිතට ගන්න ඕනෑ එක දෙයක් තමයි, තරගකාරී මිලක් ලබා දෙන්න ඕනෑ කියන කාරණය. තරගකාරිත්වය තියෙන්න ඕනෑ ඒකට සමානව ඒ භූමි භාගයේ වගා කිරීමට පුළුවන්කමක් ඇති අනෙකුත් බෝග වගාවන් අතරේයි. විශේෂයෙන්ම උක් වගාවත් එක්ක වී ගොවීන් ඉන්නවා; බඩඉරිඟු වගා කරන ගොවීන් ඉන්නවා; කෙසෙල් ඒ වාගේම අනෙකුත් පලතුරු වර්ග වගා කරන්න පුළුවන් ගොවීන් ඉන්නවා. ඉතින් මේ අනෙකුත් බෝග අතරේ තරගාකාරි මිලක් උක් වගාවට ලබා දෙන්න අපට පුළුවන්ද කියන ප්‍රශ්නයක් තියෙනවා. අඩුම වශයෙන් රුපියල් 50ක් වී කිලෝ එකකට ලැබෙනවා නම්, එක් කන්නයකදී උක් ටොන් එකකට රුපියල් 4,500ක් ලබා දෙනවා කියන එක සොච්චමක්. ඒ තුළින් තමන්ගේ ජීවන රටාව නඩත්තු කරගෙන යාමේදී ගොවියාට විශාල අර්බුදයකට මුහුණපාන්න සිදුවෙලා තිබෙනවා.

විශේෂයෙන්ම දීසවාපී, එරගම, නොරොච්චෝල ප්‍රදේශවල ගම්වාසීන්ට ඇතිවී තිබෙන මේ ප්‍රශ්නය පිළිබඳව මේ Gal-Oya Plantations (Private) Limited එකේ හාම්පුතුන් කිසිම පැහැදිලි තීරණයක් තවම ලබාදී නැහැ. මොන වාගේ ලාභදායී ක්‍රමයක් තුළදී මේක කරගෙන යනවාද කියන එක පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ. ඒ විතරක් නොවෙයි, ගොවීන්ට ණය ලබා දෙනවා. ගොවීන්ට ණය ලබා දීමේදීත් විශාල ලෙස පොලී අය කරනවා. මේ පොලිය පිළිබඳවත් විශාල ප්‍රශ්න මතු වෙලා තිබෙනවා.

විමලවීර දිසානායක මැතිතුමා මේ ගැන ඉතාම පැහැදිලිව දන්නවා. මොකද, එතුමාගේ ඡන්ද දායකයන් සිටින ප්‍රදේශයක්. එතුමා මේ පිළිබඳව මැදිහත් වෙලා ඇති. මම හිතනවා, මේ විවාදයේදී එතුමා කථා කරයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උක් වගා කිරීමට මහා කොම්පැනිකාරයන්ට විශාල භූමි භාගයක් ලබා දීමට කලින් අපි මේ ගොවීන්ගේ ප්‍රශ්න පිළිබඳව එනම් ගොවීන්ට ලැබෙන ආදායම පිළිබඳව, උක් වගාවත් එක්ක සමානව ගොවිතැන් කළ හැකි අනෙකුත් බෝගයන් පිළිබඳව අවධානය යොමු කළ යුතුයි. විශේෂයෙන්ම වී ගොවීන්, බඩ ඉරිඟු ගොවීන්, කෙසෙල් ගොවීන් සහ අනෙකුත් පලතුරු වගා කරන අය අතරේ තරගකාරී මිලක් පිළිබඳව නිශ්චිත තීරණයකට එන්න ඕනෑ. ටොන් එකකට රුපියල් 4,500ක් ලබා දෙනවා කියලා වාගේ.

අනෙක් කාරණය තමයි අස්වැන්න. අස්වැන්න පිළිබඳවත් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. අස්වැන්න නෙළන්න ගියාම කලට වේලාවට ඒ මැෂින් එක එන්නේ නැහැ; ඒ යන්ත්‍රය එන්නේ නැහැ. කලට වේලාවට අස්වැන්න නෙළා නොගත්තාම ඇති වෙන විපාක තිබෙනවා. උදාහරණයක් විධියට ඒවායේ බර අඩු වෙනවා. ඒ වාගේම ප්‍රවාහනය සම්බන්ධයෙනුත් ප්‍රශ්න තිබෙනවා. ප්‍රවාහනය සඳහා දවස් දෙක තුනක් ගත වුණාම අස්වැන්න වේලී යාම නිසා බර අඩු වෙලා ගොවියාට පාඩු විඳින්නට වෙනවා. ඒ අතරේ කිසි විටෙක පොලිය අඩු කරන්නෙත් නැහැ. පොලියට ණය දෙන සමාගම් මේ කොම්පැනිය තමන්ගේ අතට අරගෙන තමන්ගේම පොලී දෙන සමාගම් හරහා අහිංසක ගොවියාට පොලියට ණය දෙනවා. ගොවියාට තමන්ගේ අස්වැන්න විකුණා ගන්න තිබෙන අවස්ථාවත් මහ හරවන නිසා ඒ අයට විශාල ලෙස පාඩු විඳීමට සිදු වෙනවා. අපි මේ පිළිබඳව විටින් විට විශේෂයෙන්ම අම්පාර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා ඉදිරියේ කථා කළා. දිසාපතිතුමාටත් අධීක්ෂකවරයෙක් හැටියට මේ කොම්පැනියේ කටයුතු නිරීක්ෂණය කරන්නට භාර වෙලා තිබෙනවා. ඒ වාගේම භාණ්ඩාගාරයේ නිලධාරින් ඉන්නවා.

මම දන්නේ නැහැ භාණ්ඩාගාරයේ නිලධාරින් මොනවාද කරන්නේ කියලා. මේ කොම්පැනි, විශේෂයෙන් Gal-Oya Plantations (Pvt.) Limited එකේ ආදායම, තවමත් ඒක ඒ business plan එකට අනුකූලව යනවාද, රජයට ලැබෙන පාඩුව පිළිබඳව වගකීම් දරන්නේ කවුද කියන කාරණා සම්බන්ධව වගකීමකින් තොරව කටයුතු කිරීම පිළිබඳව අපේ විශාල පිළිකුලක් සහ කනගාටුවක් තිබෙනවා. ඒ අතරේ ගොවීන්ගේ ප්‍රශ්නයට නිශ්චිත විසඳුමක් ලබා දිය යුතුයි කියන එක මම පැහැදිලිව නැවත වාරයක් කියා සිටිනවා.

විශේෂයෙන්ම උක් ටොන් එකකට තරගකාරී මිලක් ලබාදීමේ ක්‍රියාදාමය පිළිබඳව හරි නිගමනයක් තවමත් කරලා නැහැ. අඩුම වශයෙන් රුපියල් 5,500ක්වත් කලින් ලබා දුන්නා නම් හොඳයි කියලා මම මීට අවුරුදු දෙකකට උඩදී ගොවි සංවිධාන සහ කොම්පැනිකාරයින් හමු වූ අවස්ථාවේ කියා සිටියා. ඒකත් පිළිගත්තේ නැහැ. නමුත් දැන් ඊට වඩා මුදලක් දිය යුතුයි කියන එකයි මගේ හැඟීම වන්නේ.

ඒ විතරක් නොවෙයි. මේක වාරි භෝගයක් හැටියට කරගෙන යන්නට අදහස් කරලා තිබෙනවා. විශාල වාරි යෝජනා ක්‍රම ලෙස දැන් කුඹුක්කන් ඔය සහ හැඩ ඔය ජලාශ යෝජනා ක්‍රම පටන් ගන්නට නියමිතයි කියලා වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ ඇමතිවරයා පොරොන්දුවක් දුන්නා. මේ ව්‍යාපාරය හරහා සියඹලාණ්ඩුවේ ගොවියාට විතරක් නොව පොතුවිල්, පානම වාගේ ප්‍රදේශවල ජනතාවටත් විශාල වාසියක් ලැබෙන පානීය ජල යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන්නට අපට පුළුවන්

වෙනවා. ගොවීන්ගේ වගා කටයුතුවලට සහ වී ගොවිතැන්වලට රුකුලක් විධියටයි මේ ජලාශ යෝජනා ක්‍රම සිදු වෙන්නේ. මඩකළපු දිස්ත්‍රික්කයේ රූගම් සහ කිතුල් කියන වැව් දෙක එකතු කරමින් විශාල වාරිමාර්ග ක්‍රමයක් ඇති කරන්නටත් අපේ ගරු ඇමතිතුමා අදහස් කරනවා කියන එක ප්‍රකාශ කළා. මේ සියල්ලම හොඳ දේවල්. නමුත් නියමිත වේලාවට වගාව කිරීමට තිබෙන අවස්ථාව ගිලිහී ගියාම ගොවියාට ඉන් පසුව කිසිම සරණක් නැහැ. මේක වැසි ජලය බලාපොරොත්තුවෙන් කළ හැකි වගාවක් නොවෙයි. විශේෂයෙන්ම අම්පාර දිස්ත්‍රික්කයේ විශාල ප්‍රශ්න රාශියක් තිබෙනවා. මේ පිළිබඳව නිශ්චිත තීරණයකට ආ යුතුයි. මම හිතනවා මේ වාගේ අලුත් කොම්පැනිවලට විශාල භූමි භාගයන් ලබාදීමට පෙර පවතින කර්මාන්තශාලාවල තත්ත්වය ගැන සොයා බැලිය යුතුයි කියලා.

දැන් කන්තලේ කර්මාන්තශාලාව ඉන්දියානු කොම්පැනියකට ලබාදී තිබෙනවා. එම කර්මාන්තශාලාවේ යන්ත්‍රෝපකරණ - machinery- පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා. ඒවා හරියට තක්සේරු කළාද කියන එක ගැන, ඒ මිල ගණන් පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා. ඒ පිළිබඳව අමාත්‍ය මණ්ඩලයේ කථා වෙද්දි මමත් මැදිහත් වෙලා කරුණු කීපයක් කිව්වා. විශේෂයෙන්ම අවුරුදු ගණනක් තිස්සේ අකර්මණ්‍ය වෙලා තිබුණු කර්මාන්තශාලා නැවත පණ ගැන්වීම සඳහා ගන්නා මේ ව්‍යාපාරය කොයි තරම් දුරට සාර්ථක වෙයිද කියා කාටවත් කියන්න බැහැ. මොකද, මේකට වෙන් කර තිබුණු භූමි භාගයේ අනිකුත් භෝගවලට දැන් ගොවීන් යොමු වෙලා ඉවරයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හිඟුරානේ එහෙම වුණා, ගරු ඇමතිතුමනි.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவூப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
හිඟුරානේ එහෙම වෙලා ඒ පිළිබඳව විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. හිඟුරානේ ප්‍රශ්නය ගැන තමයි මම දැන් විමලවීර දිසානායක මන්ත්‍රීතුමාටත් කිව්වේ. මා හිතන විධියට එතුමාගේ කථාවේදී ඒ ගැන පැහැදිලි කරයි. හිඟුරානේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. එය අප කාටත් ප්‍රශ්නයක්. මොකද, ඒ ප්‍රදේශයේ වගා කරන මුස්ලිම් ජනතාව ඉන්නවා. සිංහල ජනතාව ඉන්නවා. මේ දෙගොල්ලන්ටම අද විශාල ප්‍රශ්නයකට මුහුණ පාන්න සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ගොවීන්ට ලැබෙන නිශ්චිත මිල පිළිබඳව යම් ගැටලුවක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவூப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
අලුත් කොම්පැනිවලට මේ විධියේ විශාල භූමි භාගයක් ලබාදීමට පෙර දැන් පවතින කොම්පැනිවල ක්‍රියා කලාපය පිළිබඳවත්, මේ ප්‍රශ්න නිසා ගොවීන් විඳින දුක පිළිබඳවත් අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තූතියි.

[අ.භා. 4.35]

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප අද දින කථා කරන යෝජනාව පිළිබඳව අපේ ගරු මැති ඇමතිතුමන්ලාගෙන් අදහස් ගණනාවක් ඉදිරිපත් වුණා. විශේෂයෙන්ම මේ අලුත් සමාගම් ආරම්භ කරන කොට, පැල්වත්ත, සෙවනගල, හිඟුරාන සහ කන්තලේ කර්මාන්තශාලාවලින් ලබාගත් අත්දැකීම් එක්ක අප මේ කටයුත්ත ඉස්සරහට කළ යුතුය කියා මා විශ්වාස කරනවා.

අපේ රටේ සීනි නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කළේ එක්දහස්නවසිය හැට ගණන්වලදී කන්තලේ සහ හිඟුරාන කර්මාන්තශාලා දෙකත් එක්කයි. කන්තලේ සීනි සමාගම අසාර්ථක වුණේ කන්තලේ වැව කැඩී යාමත් සමඟ වී ගොවිතැනේ යෙදෙන ගොවි මහත්වරු ජලය ලබාගැනීමට කන්තලේ ව්‍යාපාරයට විරෝධය පළ කිරීම නිසායි. ඒ නිසා තමයි එතැනින් එහාට ඒ වැඩකටයුත්ත දිගටම කරගෙන යන්න බැරි වුණේ. ඉන් පසුව ඇති වුණු ජාතිවාදී කෝලාහල සමඟ මේ ප්‍රශ්නය එතැනින් එහාට ගිහින්, එම කර්මාන්තශාලාව සම්පූර්ණයෙන්ම අඩපණ වෙලා, අද අපේ රවුෆ් හකීම් ඇමතිතුමා කියූ තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

අපි පැල්වත්ත සහ සෙවනගල සීනි කර්මාන්තශාලා දෙක ආරම්භ කරන්න ප්‍රධාන වශයෙන් හේතු වුණේ මෙන්න මේ කාරණයයි. 1970-77 කාලයේ පැවති සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය කාලයේ සීනි ආනයනය සඳහා යම්කිසි මුදලක් අපේ රටින් පිට රටවලට ගියා. විශේෂයෙන්ම විදේශ විනිමය පිළිබඳ ගැටලුවක් ඒ අවස්ථාවේ තිබුණු නිසාත්, රටේ දේශීය නිෂ්පාදනය ගොඩනඟන්න ඕනෑය කියන පදනම මතත් සීනි ආනයනය කිරීම අඩු වුණා. ඊට පසුව ගම් මට්ටමේ සිටින ගොවි මහත්වරු උක් වගාව ආරම්භ කරලා, ඒකෙන් හකුරු නිෂ්පාදනය කරලා, ඒවා තමයි සීනි හැටියට පාවිච්චි කළේ.

1977දී ආර්ථිකය විවෘත වීමත් සමඟ සීනි ඇතුළු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය යළිත් රටට ආනයනය කරන්න පටන් ගත්තා. මේ හේතුව නිසා හපුතලේ, හල්දුම්මුල්ල සහ මොනරාගල දිස්ත්‍රික්කයේ ගම්මානවල දැවැන්ත කර්මාන්තයක් වෙලා තිබුණු හකුරු නිෂ්පාදනය කඩා වැටෙයි කියන ප්‍රශ්නය මත ඒ ප්‍රදේශය නියෝජනය කළ ගරු මන්ත්‍රීතුමන්ලා කළ ඉල්ලීමක් මත තමයි මේ ක්ෂේත්‍රයට යම්කිසි ස්ථිරසාර වැඩ පිළිවෙළක් නිර්මාණය කරන්න එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා මේ කටයුත්ත කළේ.

එහි වගකීම භාර දුන්නේ රන්ජන් විජේරත්න මැතිතුමාටයි. එතුමා තමයි පැල්වත්ත සීනි සමාගමේ සභාපතිවරයා හැටියට මේ කටයුත්ත භාරගෙන මේ වැඩ පිළිවෙළ ආරම්භ කළේ. හිඟුරාන සහ කන්තලේ කර්මාන්තශාලා මඟින් අප ලැබූ අත්දැකීම් නිසා මේ වැඩ පිළිවෙළ ආරම්භ කරනකොට අවුරුදු 10ක් තුළදී මේ කටයුත්ත කළමනාකරණය කරන්න -එම කර්මාන්තශාලාව හැදීම, වගා බිම් නිර්මාණය කිරීම කියන සම්පූර්ණ කටයුතු- භාර දුන්නේ Booker Tate කියන සමාගමටයි. එය ලෝකයේ සීනි නිෂ්පාදන ක්‍රියාවලියේ ඉහළින්ම සිටි සමාගමක්. සාමාන්‍යයෙන් මේ රටේ යම් වැඩක් කරනකොට විරෝධතා එනවා නේ. එදාත් මේ කටයුත්ත ආරම්භ කරනකොට කිව්වේ මොකක්ද? සුද්දන්ට ඉඩම් දෙන්න පටන් ගත්තාය කිව්වා. වෙල්ලස්සේ මිනිසුන්ට දැනට අවුරුදු 200කට පමණ පෙර වුණු හානියත් එක්ක, කවුරු හෝ විදේශිකයෙක් එම ප්‍රදේශයේ මොකක් හෝ දෙයක් කරන්න පටන් ගත්තොත්, සුද්දන්ට ඉඩම් දෙනවා කිව්වොත්, ඒක තමයි

[ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා]

ඔවුන්ගේ ඉතාම සංවේදී මාතෘකාව බවට පත් වන්නේ. ඒ සංවේදී මාතෘකාවත් එක්ක, සුද්දන්ට ඉඩම් දෙනවාය කියා ඒකට විරෝධතාවක් ආවා. දැන් ටිකකට කලින් මේ ගරු සභාවේ කථා කළ ගරු සුමේධා ජී. ජයසේන මැතිනියත් දැනට අවුරුදු 32කට ඉස්සර වෙලා ඒ විරෝධතාවලට සම්බන්ධ වුණාය කියා පිළිගත්තා.

ඒ විතරක් නොවෙයි. මේ රටේ හිටපු නායක නායිකාවෝ කීපදෙනෙකුත් ආවා. මා ඒ අයගේ නම් කියන්න කැමැති නැහැ. ඒ හැම කෙනාම ගිහිල්ලා මොනරාගල කච්චේරිය ඉස්සරහා උපවාසයක් කරලා, "සුද්දන්ට ඉඩම් දෙන්න එපා" කියලා තමයි එදා ඒ වැඩ පිළිවෙළට බාධා කරන්න, එය නවත්වන්න මූලික කටයුතු කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ යමක් කරන්න උත්සාහ කරන කොට එයට හැම දාම නොයෙකුත් බාධා එනවා. නමුත් ගරු සුමේධා ජී. ජයසේන නියෝජ්‍ය අමාත්‍යතුමිය කියූ පරිදිම දැන් එතුමියට තේරුම් ගිහින් තිබෙනවා, මෙමඟින් යම්කිසි විධියක ආදායමක් රටේ ජනතාවට -විශේෂයෙන් මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාවට- අද ලැබෙනවා කියා. ඒ නිසා තමයි එතුමිය ඒ විධියට කිව්වේ. එතුමිය එදා ඒ කියපු කාරණයේ වැරැද්ද තේරුම් ගෙන අද එතුමිය සන්තෝෂ වනවා, සීනි කර්මාන්තශාලා දෙකක් ආරම්භ කිරීම ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කර්මාන්තශාලාව ආරම්භ කළ පමණින් සියල්ල සියයට සියයක් සම්පූර්ණ වන්නේ නැහැ; හැම කෙනාම සන්තෝෂ කරන්න පුළුවන්කමක් නැහැ. ගොවිතැන් කටයුතු කරන ගොවි මහත්වරුන් 3,000ක්දෙනා සිටින විට ඒ අතරින් කීපදෙනෙකුට පාඩු වෙන්න පුළුවන්, එක්කෝ මහ පොළොවේ තිබන ප්‍රශ්නය නිසා, එහෙම නැත්නම් තමන්ගේ තිබෙන අදක්ෂතාව නිසා. ඒ ක්ෂේත්‍රයේම වැඩිම ආදායම ලැබූ කෙනා කොච්චර මුදලක් ගෙන තිබෙනවාද කියන එක ගෙන ඒ දෙක අතර සංසන්දනය කර සහ මැද පිළිවෙත මොකක්ද කියන එකත් බලා තමයි අප තීරණය කරන්න ඕනෑ, එය සාර්ථකද, අසාර්ථකද කියා. දැනට අවුරුදු 31ක 32ක සිට අපි පැලවත්ත සීනි සමාගම කරගෙන එනවා; දිස්ත්‍රික්කය තුළ ආදායමක් ලබනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ලබන ආදායම ගෙන බැලුවාම, මා ඔබතුමාට සන්තෝෂයෙන් කියන්න කැමැතියි, 2016 වර්ෂයේ විතරක් රුපියල් කෝටි තුනකට ආසන්න මුදලක් ගමේ සංසරණය වී ඇති බව. ඒ වාගේම 2015 වර්ෂයේ කෝටි දෙකහමාරකට ආසන්න මුදලක් ගමේ සංසරණය වෙලා, උක් නිෂ්පාදනය කරපු ගොවි මහත්වරුන්ගේ අතට ලැබී තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ කර්මාන්තශාලා දෙක සංසන්දනය කර බැලුවාම පෙනෙනවා, අවශ්‍ය අනෙක් පහසුකම් ලබා දීම - ට්‍රැක්ටරය තිබෙන පුද්ගලයා තමන්ගේ ට්‍රැක්ටරය ලබා දීම, එම නිෂ්පාදන ක්‍රියාවලියට දායකත්වය ලබා දීම- නිසා කෝටි එකහමාරකට ආසන්න මුදලක් ඒ ගමේ එකී යන්ත්‍ර සූත්‍ර පාවිච්චියට යොදවපු, භාවිතට යොදවපු ඒවායේ අයිතිකාරයන්ට ලැබී තිබෙන බව. ඒ නිසා කොයි තරම් ප්‍රශ්න තිබුණත් මම විශ්වාස කරනවා, මොනරාගල දිස්ත්‍රික්කයේ ඒ කර්මාන්තශාලා දෙක තුළින් අතිවිශාල ආදායමක් රටේ ජනතාවට -විශේෂයෙන් ඒ දිස්ත්‍රික්කයේ ජනතාවට- එනවා කියා. ඒ නිසා, "මේක අපට වැඩක් නැහැ" කියා නිකම්ම කියන්න පුළුවන් තත්ත්වයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මොනරාගල දිස්ත්‍රික්කයේ දරිද්‍රතාව ගැන කල්පනා කර බලද්දී, අප මෙන්න මේ කාරණය ගැන කල්පනා කර බලන්න ඕනෑ. අවුරුදු 20ක් ආණ්ඩු කරපු අය මීට කලින් කතා කරන කොට විවිධ දේවල් කිව්වා. මා මේ කාරණය මතක් කරන්නේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ 2016 වාර්ෂික වාර්තාව අනුවයි. එහි 124 පිටුවේ ශ්‍රී ලංකාවේ ජනගහන දරිද්‍රතා දර්ශකය ගැන මෙසේ සඳහන් වනවා:

> "පළාත් මට්ටමින් සැලකීමේදී ජනගහන දරිද්‍රතා දර්ශකයේ අවම අගය වූ සියයට 2.0 බස්නාහිර පළාතෙන් වාර්තා වන අතර ඉහළම අගය වූ සියයට 15.4 ඌව පළාතෙන් වාර්තා විය"

ඒ කියන්නේ, ඌව පළාත දුප්පත්කමේ අන්ත පහළ මට්ටමේයි තිබෙන්නේ කියන එකයි. එතැනින් එහාට ගිහින්, මේ වාර්තාවේ එම පිටුවේ එම ඡේදය යටතේම තවදුරටත් මෙසේ කියනවා:

> "දරිද්‍රතාවයේ ප්‍රාදේශීය ව්‍යාප්තිය දෙස බලන විට ඇතැම් දිස්ත්‍රික්කවල තවමත් අන්ත දරිද්‍රතාවෙයෙන් යුතු ප්‍රදේශ පවතින බව පෙන්නුම් කරයි. මූලතිව දිස්ත්‍රික්කයට අමතරව මොනරාගල, මඩකලපුව, මන්නාරම, බදුල්ල සහ කිලිනොච්චිය යන දිස්ත්‍රික්ක...."

මා ඉහත කී පරිදි අවුරුදු 20ක් තුළ පැවැති පසුගිය ආණ්ඩුවලින් ඔය කියපු ආර්ථික සංවර්ධනය ඇති කළා නම්, රිදීමාලියද්ද ප්‍රදේශයේ ඔය කියපු විධියට ආර්ථික ශක්තිය ඇති කළා නම් මහ බැංකු වාර්තාවේ ඒ ආකාරයට කියැවෙන්න විධියක් නැහැ. අප තවමත් දුප්පත්. ඒ දුප්පත්කම නැති කරන්න අප වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි. එහි අඩු පාඩු තිබෙන්න පුළුවන්. මා පැහැදිලිවම මෙහිදී කියන්න ඕනෑ, මා මේ කතා කරන්නේ මගේ දිස්ත්‍රික්කය තුළ තිබෙන කර්මාන්තශාලා දෙක ක්‍රියාත්මක කිරීම තුළින් මහ ජනතාවට -විශේෂයෙන්ම ඒ ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට- ආදායමක් ලැබෙන කාරණය ගැන පමණක් බව. එතැනින් එහාට -මේ කර්මාන්තශාලාව හදන්නේ කවුද කියා- මම දන්නේ නැහැ. ඒ මිනිසුන් සුදු ද කළු ද කියා මම දන්නේ නැහැ. නමුත් මේ ක්ෂේත්‍රය තුළ ආදායමක් ගන්න පුළුවන් අවස්ථාව තිබෙනවා කියන කාරණය තමයි මට විශේෂයෙන් ඔබතුමාට කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අනෙක් කාරණය මොකක්ද? ගොවිතැනේ තිබෙන ප්‍රධානම ප්‍රශ්නය ගැන මා කියන්නම්. නිෂ්පාදනය කරන දේ වෙළඳ පොළට එන කොට එයට මිලක් අවශ්‍යයි. ඒ මිල නැති නිසා තමයි අපි හැම දාම දුප්පත් වෙලා තිබෙන්නේ. අප විවිධ අවස්ථාවලදී විවිධ දේවල්, විවිධ බෝග වගා කරනවා. රට කජුවලට ඉහළ මිලක් ලැබෙන කොට, වැඩි දෙනෙක් රට කජු වගා කරනවා. රට කජු වැඩියෙන් වෙළෙඳපොළට එන කොට ඒවාට ස්ථිර මිලක් නැහැ. සෝයා බෝංචි, එළවලු වර්ග, ඉරිඟු ආදි සෑම දෙයක්ම වගා කළාට ස්ථිරසාර මිලක් කොතැනකවත් අපට නැහැ.

මෙහිදී ගරු රවුෆ් හකීම් අමාත්‍යතුමා කථා කරන කොට කිව්වා, උක් දඬු මෙට්‍රික් ටොන් එකක් සඳහා රුපියල් 4,500ක මිලක් හම්බ වෙනවා කියා. මා දන්නේ නැහැ එතුමා නොදැනුවත්වද එසේ කිව්වේ කියා. මුදල් අමාත්‍ය ලෙස එවකට හිටපු රවි කරුණානායක අමාත්‍යතුමා පසු ගිය අය වැය විවාදයේදී මේ ගරු සභාවේ කිව්වා, මීට පසුව උක් දඬු මෙට්‍රික් ටොන් එකක් ගන්නේ රුපියල් 5,000ක ස්ථිර මිලකටයි -අවම මිලකටයි- කියා. ඕනෑම ගොවි මහත්මයෙකුට අද බයක් නැතිව උක් නිෂ්පාදනය කරගෙන යන්න පුළුවන්. මොකද, ඒ අයට ආණ්ඩුව පැහැදිලිව කියා තිබෙනවා, අපි මේ ස්ථිර මිල දෙනවා කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හැම දෙයක්ම බල පවත්වන්නේ නිෂ්පාදනය මත පමණක් නොවෙයි. නිෂ්පාදනයෙන් එහාට යන්න ඕනෑ. ඒ වාගේම නිෂ්පාදනය කරන්න අවශ්‍ය පිරිසිදු උක් දඬු කර්මාන්තශාලාවට එන්න ඕනෑ. ඒ වාගේම උකහා ගැනීමේ ශක්තිය වැඩි වෙන්න ඕනෑ. අද එම අගය තිබෙන්නේ සියයට දශම 7ක් ලෙසයි. සාමාන්‍ය උකහා ගැනීමේ අවශ්‍යතාව, එහෙම නැත්නම් සීනි නිෂ්පාදන ක්‍රියාවලියේදී කර්මාන්තශාලාවක් උක් ටොන් එකක් ඇඹරුවාට පසුව නිෂ්පාදනය කොච්චරද කියා

බැලුවාම සියයට 8.5ක් එනවා නම් කර්මාන්තශාලාවට කිසිම ප්‍රශ්නයක් නැතිව ලාභයක් ගන්න පුළුවන්. එසේ සියයට 8.5 දක්වා වූ සීනි ප්‍රතිශතයක් ලබා ගැනීමේ තත්ත්වය ඇති කරන්න අපට පුළුවන් නම් කර්මාන්තශාලාවටත් ලාභයක් එනවා.

ඒ විතරක් නොවෙයි. ගොවි මහත්වරුන්ටත් ඒ ලාභය බෙදන්න පුළුවන්. ඒ නිසා තමයි අපි සෙවණගල සහ පැල්වත්ත කියන සීනි කර්මාන්තශාලා දෙකේම සභාපතිතුමාට කතා කරලා, උකහාගැනීම 8.5ට වඩා එන සෑම දශම 1ක ප්‍රතිශතයකටම සමාගම අනිවාර්යයෙන් කීයක් හෝ ගෙවන්න ඕනෑ කියා වැඩ පිළිවෙළක් හදා තිබෙන්නේ. එතකොට අපට මේක එතැනින් එහාට ගෙන යන්න පුළුවන්. ඒ නිසා මෙපමණ කාලයක්, අවුරුදු 32ක කාලයක් මේ කර්මාන්තය පවත්වා ගෙන ගිය දිස්ත්‍රික්කයක මන්ත්‍රීවරයෙක් හැටියට මම විශ්වාස කරනවා, ගොවි මහත්වරු හරියට දැනුවත් කරලා, කර්මාන්තශාලා හරියට කළමනාකරණය කරලා, නිෂ්පාදනය කරන කාලයට, නියමිත වෙලාවට උක් ගස් ටික ගෙනැල්ලා හරියට ඇඹරුවොත් ගොවි මහත්වරුන්ට පාඩුවක් නැතිව මේ කර්මාන්තය තුළින් ලාභයක් ගන්න පුළුවන්කම තිබෙනවාය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කලින් කිව්වා වාගේ මේක නිකම්ම පාඩුවටම ලඝු කරලා අපි මොනවාටද යන්නේ? අපට දැන් වී ටික විකුණා ගන්න බැහැ. වී නිෂ්පාදනය කරන ගොවි මහත්වරු කන්නයට තමන්ගේ නිෂ්පාදන විකුණා ගන්න බැරිව වාහනවල පටවා ගෙන ඇවිල්ලා පෝලිම්වල රස්තියාදු වෙනවා. අපට ඒ තත්ත්වය ඇති කරන්නද අවශ්‍ය? ඒකද, අපට තිබෙන අවශ්‍යතාව? එහෙම නැත්නම් මේ තිබෙන අක්කර 20,000ක, 30,000ක රටකජු වගා කරලා විකුණන්නේ කාටද? අපට කථා කරන්න පුළුවන්, විවිධ දේවල් කියන්න පුළුවන්. මේ මේ විධියට කරන්න පුළුවන් කියලා විවිධ යෝජනා කරන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කථා කරන කොට දෙහි පිළිබඳව කිව්වා. දෙහි පිළිබඳ දැවැන්ත ප්‍රශ්නයක් තිබෙනවා. මම ඒක පිළිගන්නවා. හැබැයි, ඒ ගැන මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. ඒ කාලයේ රන්ජන් විජේරත්න මැතිතුමා යටතේ කෘෂි සංවර්ධන අධිකාරිය කියලා ආයතනයක් තිබුණා. එතුමා තුළ කෘෂිකර්මාන්තය කියන විෂය පිළිබඳව පැහැදිලි අවබෝධයක් තිබුණු නිසා මොණරාගල දිස්ත්‍රික්කයේ හැදෙන දෙහි ටික පිට රට යවන්නේ කොහොමද කියන කාරණයට මුලින්ම අතගැහුවා. හරියටම ඒ ස්ථානය මම කියන්නම්.

තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෝධගම කියන ගමේ නිෂ්පාදනය කරන දෙහි ටික වේලලා මැද පෙරදිග වෙළෙඳ පොළට යවන්න අවශ්‍ය වැඩ පිළිවෙළ එතුමා හැදුවා. 1988 -89 කාලයේ භීෂණයෙන් ඒ කර්මාන්තශාලාව සම්පූර්ණයෙන්ම ඉවර කළා. එතැනින් එහාට ඒ ගැන කථා කරන්න කවුරුවත් හිටියේ නැහැ. ඒ ආයෝජකයාත් මේ රට අතහැරලා ගියා. ඒ වැඩේ එතැනින්ම කඩා ගෙන වැටුණා. අද ඒ ප්‍රදේශයේ දෙහිවලට මුලින් තිබුණු තත්ත්වමයි තිබෙන්නේ. තමුන්නාන්සේලා මේ ගැන කල්පනා කර බලන්න. අද අපි කථා කරන්නේ ළඟදී ආරම්භ කරන ව්‍යාපෘතියක් ගැනයි. 2007 විතර කථා කළ ව්‍යාපෘතියක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1988 - 89 කාලයේ ඉන්දියානු සමාගමක් ආවා, පැල්වත්ත, සෙවනගල සීනි කර්මාන්තශාලා දෙකට අමතරව, හිඟුරානත් මොණරාගලත් අතර ප්‍රදේශයේ උක් වගා කරන්න. ඉන්දියානු සමාගමේ ඉන්දියන් කළමනාකරුවෝ සියලු දෙනාම මරා දැම්මා. ඉතිරි සියලු දෙනාම රට අතහැරලා ගියා. එතකොට අපි මේ ඌව - වෙල්ලස්සට මොකක්ද කරලා තිබෙන්නේ? ඇත්තටම මහපොළොවේ කරන්න බැරි දේවල් මෙතැන කථා කරනවාට වඩා හොඳයි, කරන්න පුළුවන් අවස්ථාව තිබෙන කොට මේ වෙල්ලස්සේ අහිංසක මිනිසුන්ට; ඒ ගොවි ජනතාවට ශක්තියක් දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන එක. අපි අවුරුදු 200ක් මේ දුක වින්දා.

1818 සිට ලබන 2018 අවුරුද්ද වෙන කොට මේ පරිත්‍යාගය කරලා අවුරුදු 200ක් වෙනවා. මම හිතන විධියට වෙල්ලස්සේ මිනිසුන් තරම්, මේ රටේ ජනතාව වෙනුවෙන්, ජනතාවගේ ඉල්ලීම් වෙනුවෙන්, තමන්ගේ අයිතිය වෙනුවෙන් සටන් කරලා පරාජය වුණු මිනිසුන් වෙන කොහේවත් නැහැ. නමුත් අපි වෙල්ලස්සට කර තිබෙන්නේ මොනවාද? ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ඒ අවුරුදු නවය, දහය කාලය තුළ අඩු ගණනේ මේ කර්මාන්තශාලා දෙකවත් හදලා මහ ජනතාවට ජීවත් වෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් කිරීම ගැන මම සන්තෝෂ වෙනවා. ඒ නිසා අපි මෙතැනින් එහාට කල්පනා කරන්න ඕනෑ. එහෙම නැතිව, මේ හැම දෙයක්ම එපා කියනවාට වඩා, නැවත මේවා නිර්මාණය කරලා, එදා තිබුණු ශ්‍රී විභූතිය නැවත ඇති කරන්නේ කොහොමද කියන කාරණය අපි කල්පනා කරන්න අවශ්‍යයි; කථා කරන්න අවශ්‍යයි. හැබැයි, ඒක වී ගොවිතැනින් විතරක් කරන්න පුළුවන්ය කියලා මම නම් විශ්වාස කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැල්වත්ත සීනි කර්මාන්ත ශාලාව ආරම්භ කරන කොට දැවැන්ත උද්ඝෝෂණ තිබුණා. ඒකට සින්දු හැදුවා; නාට්‍ය හැදුවා; සුද්දන්ට ඉඩම් දෙනවා කිව්වා. නමුත් අපි ඒ වැඩේ කර ගෙන ගියා. බැරි වෙලාවත් අද වාගේ දවසක පැල්වත්ත වාගේ කර්මාන්තශාලාවක් හදන්න ගියා නම් මේ සම්මජාතියේවත් අපට ඒක කරන්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා තමන් හරියට කාරණා නොදැන කරන මේ විරෝධතා තුළින්, මේ කරන වැඩ පිළිවෙළ තුළින් මහ ජනතාව අමාරුවේ වැටෙනවා හැර අනෙක් කාටවත් ඒකෙන් හානියක් වන්නේ නැහැ. අද විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා කථා කරමින් කිව්වා, එතුමා පැල්වත්ත සීනි සමාගම තිබෙන ප්‍රදේශයේ ගම්මානයකට ගියාම පෙනෙන්නට තිබෙන ප්‍රශ්න ගැන. ඒක මම දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එතුමාට මතක් කරන්නේ එහෙම ප්‍රශ්න තිබෙන කොට, ඒ ප්‍රශ්න දිහා බලලා, එහෙම ප්‍රශ්න තිබෙනවා කියලා වැඩක් නැහැ. ඒ සම්බන්ධයෙන් අපට කරන්න පුළුවන් මොකක්ද කියන කාරණය බලන්න ඕනෑ. මම ඒ ආයතනවල සභාපතිවරයා සහ ගොවි මහත්වරු සියලු දෙනාම මාසිකව ගෙන්වලා පැල්වත්ත සීනි කර්මාන්තශාලාවේ සහ සෙවනගල සීනි කර්මාන්තශාලවේ මාසික රැස්වීම් පවත්වලා ඒගොල්ලන්ගේ ප්‍රශ්න හඳුනා ගත්තා. දැන් අවුරුදු 32ක් වෙනවා. අවුරුදු 20ක් ඔබතුමන්ලාගේ ආණ්ඩු තිබුණා. මෙච්චර කාලයක් ගියත්, අඩු ගණනේ මේ ගම්මානවලට යන පාරවල් ටිකවත් හදන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. අහිංසක දරුවෝ උදේ පාන්දර ඒ පාරවලින් ඉස්කෝලේ ගිහිල්ලා ආපසු එන කොට තනිකරම දුඹුරු පාට වෙලායි එන්නේ. ඒවා තනිකර දූවිලි සහිත පාරවල්. මම ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාට කථා කරලා අද කිලෝමීටර් 23ක් පාර අලුතින් කාපට් කරලා හදනවා. ඒකෙන් අඩු ගණනේ ඒ දරුවන්ටවත් යමක් කරන්න පුළුවන් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වකුගඩු රෝගය ගැන කථා කරනවා. වකුගඩු රෝගය කියන ප්‍රශ්නය මෙච්චර කාලයක් තිබුණා. ඇත්තටම අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කළ නිසා තමයි දැන්වත් මෙවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන්නේ. අපි කරන්න ඕනෑ වැඩ පිළිවෙළ මොකක්ද? මේ ප්‍රදේශවල ජලය බීමට සුදුසු නැත්නම් ඒකට සුදුසු පරිසරය හදන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ රජය යටතේ සියලු ගම්මාන ආවරණය වන විධියට දැවැන්ත ජල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනවා.

[ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා]

ඔබතුමන්ලා ඒවා ගැන දන්නවා ඇති කියලා මම විශ්වාස කරනවා. මොකද, දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීම්වලදී අපි මේ සම්බන්ධයෙන් කථා කරලා තිබෙනවා. ඒ නිසා මේවා ගැන කථා කරලා වැඩක් නැහැ. මේවා ගැන නිකම් මෙතැන ඇවිල්ලා කථා කරලා වැඩක් නැහැ. ඒ ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළට ඔබතුමන්ලා සම්බන්ධ වෙන්න.

පසුගිය අවුරුදු 20ක කාලය තුළ මේවා කරන්න බැරි වුණා නම් දැන්වත් ඒවාට එකතු වෙන්න. අපේ පද්ම උදයශාන්ත ගුණසේකර මැතිතුමායි, විජිත බේරුගොඩ මැතිතුමායි ආචාර්ය එන් එම්. පෙරේරා කේන්ද්‍රයේදී ඊයේ සාකච්ඡාවක් තියලා තිබුණා. එතැනදී ඔබතුමන්ලා මතු කරලා තිබෙන සමහර කාරණා ගැන මම කියන්නම්. ඔබතුමන්ලා කියලා තිබෙනවා, "මහින්ද රාජපක්ෂ මහතාගේ පාලන කාලයේදීත් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට උත්සාහ ගත්තා. නමුත්, මහජන විරෝධය හමුවේ එම ව්‍යාපෘතිය අත්හැර දැම්මා. ඌව-වෙල්ලස්ස කියන්නේ ලංකාවේ දිළිඳු ප්‍රදේශයක්." කියලා. ඔබතුමන්ලා එතැනදී කියනවා, ඌව-වෙල්ලස්ස දිළිඳු ප්‍රදේශයක් කියලා. මොකක්ද එතකොට ඔබතුමන්ලා පසු ගිය අවුරුදු 20ක් කළේ? මේ දිළිඳුකම නැති කරන්න ඔබතුමන්ලා මොකක්ද ගත්ත පියවර?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Padma Udhayashantha Gunasekera, what is your point of Order?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මෙතුමා මගේ නම කියපු නිසායි මම එතුමාට උත්තර දෙන්නේ. දිළිඳුම පළාතක් ලෙස තිබුණු ඌව පළාතේ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රිදීමාලියැද්ද දුප්පත්කමේ සිට ඉතා ඉහළම තැනකට ගේන්න මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ කටයුතු කළා කියන එක තමයි අද පාර්ලිමේන්තුවේදීත් මා කිව්වේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ගරු ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)
මම දන්නේ නැහැ, ඔබතුමා කොහොමද ඔය කාරණා කියන්නේ කියලා. මම මේ කියන්නේ ඔබතුමා කියාපු කාරණායි. මේ පුවත් පත් වාර්තාවේ තිබෙනවා, "ඌව-වෙල්ලස්ස කියන්නේ ලංකාවේ දිළිඳුම ප්‍රදේශයක්." කියලා. එහෙම නම්, ඒක වෙනස් කරන්න පසු ගිය දවස්වල ඔබතුමන්ලා මොකක්ද කළේ? ඔබතුමන්ලා එක දෙයක් කළා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
Factories ගිනි තිබ්බා.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)
ඔබතුමන්ලා කියනවා, මේ ඉඩම් ටික පාවිච්චි කරලා මේ පළාතට ගැළපෙන, මේ පරිසරයට ගැළපෙන යමක් නිර්මාණය කරන්න කියලා. මොකක් හරි නිර්මාණය කරන කොට ඒක හොඳ නැහැ කියලා කියනවා. එතකොට විකල්පය මොකක්ද? ඔබතුමන්ලාට විකල්පයක් නැහැ. එහෙම නම්, පසුගිය අවුරුදු 20 තුළ ඒවා ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලාට ඕනෑ තරම් අවස්ථාව තිබුණා නේ.

මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ රජයෙන් මේ ඌව-වෙල්ලස්සට යමක් කළා කියලා තමුන්නාන්සේලා කියනවා. වෙල්ලස්ස ගොඩගන්න තිබුණු හොඳම අවස්ථාව විධියට තමයි අපේ ගරු අගමැතිතුමා 2001 ආණ්ඩුවේදී මේ ප්‍රදේශය සංවර්ධනය කරන්න අවශ්‍ය ප්‍රධානම ව්‍යාපෘතිය ගෙනාවේ. ඒ ප්‍රදේශයේ ගුවන් තොටුපොළක් නිර්මාණය කරලා ඒ තුළින් මේ කර්මාන්තශාලා ඇති කරන්නයි සැලසුම තිබුණේ. ඒක තමයි අපට තිබුණු ලොකුම ව්‍යාපෘතිය. නමුත්, ඒකට මොකද වුණේ? මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉස්සෙල්ලාම කළේ මොකක්ද? මත්තල ගුවන් තොටුපොළක් හැදුවා. අද ඒක ක්‍රියාත්මක නොවෙන ගුවන් තොටුපොළක් බවට පත් වෙලා තිබෙනවා. අපේ ආණ්ඩුව කඩා වට්ටන්න ඔබතුමන්ලා උදවු කළා කියලා මතක තියාගන්න. මෙතැනදී ඔබතුමන්ලා කියනවා, -[බාධා කිරීමක්] ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා එක වතාවක් කථා කළා නේ. කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න. මට තිබෙන කාලය තුළ මට කථා කරන්න අවස්ථාව දෙන්න. ඔබතුමා දැන් කථා කරලා ඉවරයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමාට නියමිත කාලයත් අවසන් වේගෙනයි එන්නේ. ඒ නිසා ඔබතුමාම කථා කරන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමන්ලා වාඩි වෙලා අහගෙන ඉන්න.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)
පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා මේ පුවත් පත් සාකච්ඡාවේදී කියලා තිබෙනවා, උක් වගාවට නෑඹුල් භූමියක් ඕනෑ කියලා. මම කියන්නේ 2017.05.25වන දින "ලංකාදීප" පුවත් පතට ඔබතුමා කියාපු කාරණයක්. ඒ කාරණයේදී ඔබතුමා කියනවා, උක් වගාවට නෑඹුල් භූමියක් අවශ්‍යයි කියලා. හැබැයි, මතක තියාගන්න, අවුරුදු 32ක් තිස්සේ පැල්වත්ත සීනි සමාගමේ ඉඩම්වල උක් වගා කරන බව. ඒවා නෑඹුල් භූමි නොවෙයි. [බාධා කිරීමක්] පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙයක් කියනවා නම් තේරුම් අරගෙන කථා කරන්න. මේ වැඩ කඩාකප්පල් කරන්න නිකම් කථා කරන්න එපා. පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා මා සමඟ බොහොම හිතවත් කෙනෙක්. නමුත්, ඔබතුමා කියපු දේවල්වලටයි මම මේ උත්තර දෙන්නේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා මොකක්ද point of Order එක?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා ඒ සාකච්ඡාව සම්පූර්ණයෙන්ම බලලා නැහැ. ඒ ප්‍රවෘත්තිය සම්පූර්ණයෙන්ම බලලා නැහැ. පත්තරේ බාගයක් විතරයි බලලා තිබෙන්නේ. ඒකේදී මම කිව්වේ, ලෝකයේ උක් කර්මාන්තය සම්බන්ධයෙන් තිබෙන සියලු සමාගම් හැම මොහොතේම නැඹුල් බිමක් හොයනවා කියන එකයි.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)
ඔබතුමාට මම මේ පත්තරේ දෙන්නම්. ඔබතුමා කියපු දේ වාර්තාකරුගේ නමත් සමඟ තිබෙනවා. පත්තරේ ලියපු එක මම ඔබතුමාට දෙන්නම්. කියවලා බලන්න ඔබතුමා මොකක්ද කිව්වේ කියලා. මම ඒ සාකච්ඡාවේ හිටියේ නැහැ. ඔබතුමා කියපු දේ පත්තර වාර්තාවෙන් උපුටාගෙන තමයි මම මේවාට උත්තර දෙන්නේ. විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා අපේ දිස්ත්‍රික්කය තුළ ඉතාම හිතවත්ව වැඩ කරන අය. නමුත් මෙතැනදී කියන සමහර දේවල් නිවැරැදි කළේ නැත්නම් එයින් රටට යන්නේ වැරැදි පණිවිඩයක්. ඒ නිසා ඒක නිවැරැදි කරන්න අවශ්‍යයි. ඔබතුමා කියලා තිබෙනවා, පසුගිය රජය යටතේ ලාභ ලැබූ පැල්වත්ත සෙවනගල සීනි කර්මාන්තශාලාව ගැන. මට පොඩ්ඩක් කියන්න මොන සංඛ්‍යා ලේඛන පාවිච්චි කරලා ද කියලා මේ කාරණා කියන්නේ කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න. මගේ ළඟ සංඛ්‍යා ලේඛන තිබෙනවා. මම ඒ සංඛ්‍යා ලේඛනවලින් කියන්නේ. 2013 අවුරුද්දේ පැල්වත්ත සීනි සමාගමේ ලාභය රුපියල් මිලියන 1,345යි. 2014 පාඩුව රුපියල් මිලියන 211,213යි. 2015 පාඩුව රුපියල් මිලියන 1,052යි. 2016 ලාභය රුපියල් මිලියන 1,103යි. ඒක තමයි නිවැරදි සංඛ්‍යා ලේඛනය. ඕනෑ නම් ඔබතුමා පැල්වත්ත සීනි සමාගමේ කළමනාකාරිත්වයෙන් මේ ගැන විස්තර අරගෙන කථා කරන්න. මේවා ගැන මේ අය කරන්නේ අසත්‍ය ප්‍රකාශ. සිදු නොවුණු දේවල් ගැන කථා කරන්න එපා. අපේ හිටපු සීනි කර්මාන්ත සංවර්ධන ඇමතිතුමා මෙතැන ඉන්නවාද මම දන්නේ නැහැ. මට පෙනෙන්නේ නැහැ. නමුත් මම ඔබතුමාට කියනවා, මේ කියන කාරණයේදී පසුගිය කාලයේ සමහර සිද්ධි වුණු බව. පැල්වත්ත සහ සෙවනගල කඩා වැටෙන තත්ත්වයට පත් වුණා. ඒවා වෙනස් කළේ, අද ඉන්නා -වර්තමාන- සභාපතිවරයා ඇතුළු ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමාගේ අමාත්‍යාංශයයි. මම දන්නේ නැහැ, මෙතැන රිසාඩ් බදියුදීන් ඇමතිතුමා ඉන්නවාද කියලා. එතුමාගේ අමාත්‍යාංශය යටතේ තමයි මේවාක්‍රියාත්මක වෙන්නේ. අද මම ඒ ගැන සන්තෝෂ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෙවනගල කර්මාන්ත ශාලාවේ තිබෙන උක් ගස් ටික එම මැෂින්වලින් යවා season එක ඉවර වෙන්න ඉස්සෙල්ලා අඹරන්න පුළුවන්කමක් නැහැ. මොකද, එම නිෂ්පාදනය ඇති කරන්න අවශ්‍ය වෙනස්කම් පසුගිය අවුරුදු විස්සේම කළේ නැහැ. අද ලොකු වියදමක් නොකර, එක දවසකට ටොන් 1,500ක් අඹරන්න පුළුවන්කම තිබෙන බව මම කියනවා. අපි ඒක ටොන් 2,000 දක්වා ගෙනයනවා. අද අවශ්‍ය උක් ගස් ප්‍රමාණය සෙවනගල නැති තත්ත්වයකට පත් වී තිබෙනවා. මේවා වෙනස් කරන්න අවශ්‍යයි. මොකද, අපි මේ කථා කරන්නේ අපේ දිස්ත්‍රික්කය ගැනයි.

අපේ අනුර දිසානායක මැතිතුමා ඉදිරිපත් කර තිබෙන කල් තැබීමේ යෝජනාවට සම්බන්ධ මෙම කර්මාන්තශාලාවලින් මේ හැම දේකින්ම පාඩමක් ඉගෙන ගෙන වෙල්ලස්සේ මේ තිබෙන ප්‍රශ්නය විසඳා ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරාවිය කියලා මම විශ්වාස කරනවා. වේදිකාවල කථා කරද්දී, "අපි තවම දුප්පත්" කියලා අපි කියනවා. අපි වේදිකාවල නැගලා කියනවා, "අපි තමයි දුප්පත්ම දිස්ත්‍රික්කය" කියලා. එම කරුණ නිකම් ආභරණයක් විධියටයි අපි පාවිච්චි කරන්නේ. අපි මන්ත්‍රීවරුන් හැටියට ලජ්ජා වෙන්න ඕනෑ. අවුරුදු විස්සක්, විසිපහක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන වෙල්ලස්සේ මිනිස්සු හැටියට අපි මොනවාද කළේ මේ දිස්ත්‍රික්කයට? මොකුත් කරලා නැහැ. ඒක වෙනස් කරන්නයි අපි දැන් ක්‍රියා කරන්නේ. ඒක වෙනස් කරන්න ආදායම වැඩි කරන්න ඕනෑ; මහජනතාවට ජීවත් වෙන්න පුළුවන් වටපිටාවක් හදන්න ඕනෑ; ඉදිරි පරම්පරාවට අලුත් අනාගතයක් නිර්මාණය කරලා දෙන්න ඕනෑ. අපි මේ ඔක්කෝම කරන්න අවශ්‍යයි. මන්ත්‍රීවරුන් හැටියට අපෙන් කෙරෙන්න ඕනෑ කාරණය ඒකයි කියන එකත් මතක් කරමින්, මේ යෝජනාවට අදාළව කථා කිරීමට මා හට අතිරේක වේලාවක් ලබා දීම සම්බන්ධව විශේෂයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි පහක කාලයක් තමයි තිබෙන්නේ.

[අ.භා. 4.57]

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි 08වැනි දායින් පසුව මේ පාර්ලිමේන්තුව තුළ අපි සිහින ගැන කථා, සබන් බෝල කථා හුඟාක් අහලා තිබෙනවා. දැන් තවත් එක සිහින ලෝකයක් මවන්න, ඌව-වෙල්ලස්සේ බිම්තැන්න පත්තුවේ අහිංසක ජනතාවගේ ඉඩම් ටික කොල්ල කන්න මේ සභාව තුළ දැලක් එළමින් තිබෙනවා. උක් ගසේ බූව ගැන, උක් ගහ ගැන දන්නා,

[ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා]

උක් ගහට කැපී ලේ හැලුණු ඇඟක් -සිරුරක්- තිබෙන උක් ගොවියෙක් විධියටයි මම මේ ගරු සභාවේ කථා කරන්නේ. මේ සිටින සියලු දෙනාට වඩා උක් ගහ ගැන, උක් වගාව ගැන මට හොඳ අවබෝධයක් තිබෙනවා. ඒ නිසා මම මෙතැනදී ඒ ගැන කියන්න කැමැතියි.

ලක්ෂ ගණන් ලාභ ලබන හැටි මෙතුමන්ලා කියනවා. මම අවුරුදු තිස්පහක් තිස්සේ උක් ගොවියෙක් විධියට කටයුතු කර තිබෙනවා. ගිය අවුරුද්දේ මගේ අක්කර දෙකහමාරෙන් ලබා ගත්ත ලාභය වූයේ, රුපියල් තිස්පන්දහසයි. මේ සභාවේ එක උක් ගොවියෙක්වත් නැහැ නේද? මමනේ, මේ ගරු සභාවේ ඉන්නේ උක් ගොවියෙක් විධියට. මම ලබා ගත්තේ රුපියල් තිස්පන්දහසයි. මේ වාගේ සිහින කථා අහලා අද මුළු ලංකාවේම උක් ගොවීන් එකම දුකකින් ඉන්නේ. ඒක වසන් කරලා 1818 කැරැල්ල, 1848 කැරැල්ල වැනි කැරැලි මර්දනය කරපු මිලේච්ඡත්වයෙන්ම අද රිදීමාලියද්දේ, මහඔය, පදියතලාවේ, බිම්තැන්න පත්තුවේ, මැදගම මිනිස්සු මර්දනය කරන්න මේ ආණ්ඩුව කටයුතු කරන කොට, මට තිබෙන දුක එදා ඒ සියල්ලට විරුද්ධ වුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇමතිවරයෙක් මේකට මූලිකත්වය ගත්ත එක ගැනයි. "ලක්ෂ්මන්ට එරෙහි ලක්ෂ්මන්". එතුමා මීට කලින් පාර්ලිමේන්තුවේදී මෙන්න මෙහෙම කිව්වා. "1989 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තිබුණු කාලයේ එදා හිටපු වන සංරක්ෂණ අධ්‍යක්ෂ සරත් කොටගම මහතාත්, මාත්, තවත් නිලධාරින් ගණනාවකුත් එකතු වෙලා කිහිප වතාවක්ම මේ ප්‍රදේශයට ගිහිල්ලා අලිමංකඩ වෙනස් කරන්න උත්සාහ දැරුවා. හැබැයි, ඒක කරන්න විධියක් නැහැ. මොකක්ද වුණේ? උක් කන්න අලි එනවා. ඒකෙන් විශාල වශයෙන් ප්‍රදේශයේ මහජනතාවට හානියක් වෙනවා.". "ලක්ෂ්මන්ට එරෙහි ලක්ෂ්මන්". එදා ලක්ෂ්මන් මහත්මයා කියපු දේ අද මේ සභාවේදී වෙනස් විධියට කියනවා. මට පෙනෙනවා, මේ සමාගම ඩොලර්, පවුම් හුහක් වියදම් කරලා තිබෙන බව. සමහර තැන්වලදී මට තේරෙන්නේ, ඩොලර් කථා කරනවා කියලායි. ඩොලර් කථා කරනවා වාගේ තමයි මට ඇහෙන්නේ. අපේ ශ්‍රී ලංකාවේ මහා ජලාශය වන්නේ සේනානායක සමුද්‍රයයි.

ඒකේ වතුරෙන් ජීවත් වෙන මිනිහෙක් මම. මේ මොහොතේ අම්පාර දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවගෙන් සියයට 50කට ජලය නැහැ; වී වගා කරන්න ජලය නැහැ. මේ ජල පෝෂක ප්‍රදේශවලින් -නිල්ගල ආදී ප්‍රදේශවලින්- දැනුත් ජලය ගලාගෙන එන්නේ නැත්නම්, මේ උක් වගාවටත් වනය එළි කළොත් මොකක්ද අපට සිද්ධ වෙන්නේ? එහෙම කළොත් අක්කර 120,000ක කුඹුරුවලට ජලය දෙන, එක්සත් ජාතික පක්ෂයේ නිර්මාතෘ මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා හදපු සේනානායක සමුද්‍රය හිඳෙයි. ඒ වාගේම, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා හදපු රඹකැන් ඔය ජලාශයෙන් ජලය සපයන අක්කර 6,000කට ජලය නැති වෙයි. ඒ වාගේම ඩී.එස්. සේනානායක මහත්මයා හදපු නාගදීපය ව්‍යාපාරයට වතුර නැති වෙයි.

සුද්දෝ සන්තෝෂ කරන්නයි තමුන්නාන්සේලා මේ හදන්නේ. මුංඇට වවපු, කව්පි වවපු, කුරහන් වවපු, බඩ ඉරිඟු වවපු, ඒ මාර්ගයෙන් ගෙයක් හදා ගත්ත, දරුවෝ ඉස්කෝලේ යවපු, ට්‍රැක්ටරයක් ගත්ත, ත්‍රී වීලර් එකක් ගත්ත, මෝටර් සයිකලයක් ගත්ත, ආර්ථිකය හදා ගත්ත අහිංසක ගොවියෝ, රාජාධිරාජසිංහ රජ සමයේ සිට පැවැත එන නිදහස් ගොවියෝ අද ඇමෙරිකන් කොම්පැනියක වහල්ලු කරන්නයි මේ ආණ්ඩුව හදන්නේ. 1977න් පස්සේ එක්සත් ජාතික පක්ෂයේ තේමාවයි, ප්‍රතිපත්තියයි වුණේ විකුණාගෙන කෑමයි. එදා වෙල්ලස්සේ බූටෑවේ රාළලා, උඩරට අපේ වීර කැප්පෙටිපොළලා, දිවි පුදලා, පණ දීලා රැක ගත්ත - සුද්දන්ගෙන් බේරා ගත්ත- මේ භූමිය එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මේ නිමේෂයේ -මේ අඳුරු මොහොතේ- ආපහු සුද්දන්ට දෙන්නයි හදන්නේ. ඒකට විරුද්ධ වුණේ අපි නොවෙයි, මහත්වරුනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
රිදීමාලියද්දට ගිහිල්ලා අහන්න, ඇකිරියන්කුඹුරට ගිහිල්ලා අහන්න, දෙහිගමට ගිහිල්ලා අහන්න. අතේ කරගැට තිබෙන ඒ ගොවි ජනතාව තමයි මේ ව්‍යාපෘතියට විරුද්ධව නැඟී සිටියේ. අපි කරන්නේ ඒ අයගේ සටනට සහාය දෙන එක විතරයි. මේ සටන ඔවුන්ගේ. මෙතැන දේශපාලන කුමන්ත්‍රණයක් නැහැ. 'හරි' ලකුණ දමාගෙන ඡන්දය ඉල්ලපු හරින් ප්‍රනාන්දු මහත්මයා කියනවා, "මම මේ අවුරුදු දෙකට දුන්නේ එක රස්සාවයි" කියලා. මේ ආණ්ඩුවේ ඉන්න බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා කියනවා, "මේ ආණ්ඩුවෙන් අපට වුණු සෙතක් නැහැ" කියලා. පාලිත තෙවරප්පෙරුම ඇමතිතුමා මේ සභාවේ හිටියා. එතුමා මට කිව්වා, "මට වයඹ සංවර්ධන නියෝජ්‍ය ඇමැතිකම දුන්නාට, මම ඉන්නේ බස්නාහිර" කියලා. පාඨලී චම්පික රණවක ඇමතිතුමා ඊයේ උදේ පත්තරේකට කියලා තිබුණා, "මේ ආණ්ඩුව යන්නේ පරණ ආණ්ඩුව ගිය පාරේමයි. මේ ආණ්ඩුව ජනතාවට සේවයක් කරන්නේ නැහැ" කියලා. මේක තමයි ආණ්ඩුවට තිබෙන සහතිකය.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
බිංතැන්න පත්තුවේ, මේ මහා කොල්ලයට අහුවෙන ප්‍රදේශයේ ඉන්න ආදිවාසි නායකයා ගෝඹිල ඇත්තෝ කථාවක් කියනවා. "අනේ මහත්තයෝ අපේ එවුන්ට උරුසුමේ නැහැ" කියනවා. උරුසුමේ නැහැ කියන්නේ ගඳ සුවඳ තේරෙන්නේ නැහැ කියන එකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවටත් උරුසුමේ නැහැ කියලායි!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 5ක් තිබෙනවා.

[අ.භා. 5.03]

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉහළ ඌව නියෝජනය කරන ජනතා නියෝජිතයකු හැටියට අද දින පැවැත්වෙන මේ විවාදයට එක් වීමට ලැබීම පිළිබඳව මා ඉතාම සතුටු වෙනවා.

අද පාර්ලිමේන්තුව ආරම්භයේ සිට මේ දක්වා මේ විවාදය තුළ විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මැති ඇමැතිතුමන්ලා මේ ව්‍යාපෘතියේ ප්‍රතිලාභ සහ ගුණාගුණ පිළිබඳව කථා කළා. ඒ වාගේම විපක්ෂයේ සහ ඒකාබද්ධ විපක්ෂයේ බොහෝ දෙනා මේ ව්‍යාපෘතියේ අගුණ පිළබඳව කථා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඒකාබද්ධ විපක්ෂය නියෝජය කරන ගරු මන්ත්‍රීතුමන්ලාට මේ පිළිබඳව කථා කරන්න සදාචාරාත්මක අයිතියක් නැහැ කියලා මම කියන්න ඕනෑ. පසුගිය ආණ්ඩුව කාලයේ කරපු ආයෝජන දිහා බැලුවාම, ඒවා සඳහා වියදම් කරලා මේ රටේ බොහෝ දෙනා ලබා තිබෙන ප්‍රතිලාභ පිළිබඳව මා අමුතුවෙන් කියන්න යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය ආණ්ඩුවෙන් පටන් ගත් උමා ඔය ව්‍යාපෘතිය පිළිබඳවත් ඉහළ ඌවේ ජීවත්වන පුද්ගලයකු හැටියට මා කියන්න ඕනෑ. අද ඒ ව්‍යාපෘතිය තුළින් විශාල පාරිසරික හානියක් සිද්ධ වෙනවා.

ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මේ ක්‍රියාත්මක කරන්න යන නව ව්‍යාපෘතිය හොඳයි කියනවා වාගේම, උමා ඔය ව්‍යාපෘතියෙන් අද සිද්ධවන ඒ පාරිසරික හානිය වාගේ දේවල් මේ ව්‍යාපෘතියෙනුත් සිද්ධවෙනවා නම්, ඒවා වළක්වා ගැනීමට කටයුතු කරන ලෙසත් මා යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වේ, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය තමයි විදේශ ගැත්තන් වෙලා විදේශිකයන්ට මේ රට විකුණන එක කියලායි. ඒ දේවල් කියනවා වාගේම එතුමන්ලාගේ ජීවිතය පිළිබඳවත් අදෝනා නැඟුවා. ඒ කථා කළ එක් මන්ත්‍රීවරයෙකුට කොන්දක් තිබුණේ නැහැ, එතුමා තවමත් රජයට අයිති, හිඟුරාන සීනි කර්මාන්තශාලාවට අයිති නිල නිවාසයක පදිංචි වෙලා ඉන්නවාය කියන්න. "එළවා ගන්න බැරිව මාත් තවම ඒ නිවාසයේ ඉන්නවා" කියන කාරණය ඒ මන්ත්‍රීතුමා කිව්වේ නැහැ. එතුමන්ලාට නොලැබුණු දේවල් ගැන තමයි එතුමන්ලා කථා කළේ. ඒ කථා කරපු මන්ත්‍රීවරයකු තවම හිඟුරාන සීනි කර්මාන්තශාලාවට අයිති නිල නිවාසයක පදිංචිව ඉන්නවා කියලා අපි දන්නවා. නමුත් එතුමා ඒ ගැන කථා කළේ නැහැ. එක්සත් ජාතික පක්ෂය විකුණන්න යන දේවල් ගැන තමයි එතුමාත් කථා කළේ. නමුත් එතුමාට නිවහනක් හැටියට එතුමා ගත කරන තැන ලබා දෙන්න අපි කටයුතු කරනවා. මා එතුමාගේ නම කියන්න කැමැති නැහැ. මම එතුමාගේ කථාව අහගෙන සිටියා. ඒ කථාව අහගෙන හිටපු මට හිනා ගියා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ රටවලින් ආපු තර්ජනවලින් මේ රට බේරා ගන්න 1818 වර්ෂයේදී ඉහළ ඌවේත්, පහළ ඌවේත් ජනතාව විශාල වශයෙන් කැප කිරීම් කළා. අදටත් ඒ ජනතාව දුගීභාවයෙන් පෙළෙනවා. අදටත් ඒ ප්‍රදේශවල ගැල් ක්‍රමයත් එක්ක ජීවත් වන පිරිස් ඉන්නවා. විශේෂයෙන්ම මා නියෝජනය කරන බණ්ඩාරවෙල ආ සනයේ ඇල්ල කොට්ඨාසයේ ඉලුක්පැලැස්ස, දොඩම්ගොල්ල කියන ගම්මානවල ජනතාව අදටත් ගැල්වලින් තමයි ඔවුන්ගේ ප්‍රවාහන කටයුතු කරගන්නේ. අපි ඔවුනට සාධාරණයක් ඉෂ්ට කරලා නැහැ. ඔවුන්ට එසේ සාධාරණයක් ඉෂ්ට කරන්න අපට බැරි වුණේ මොකද? අපි ජාතිවාදී ප්‍රශ්න සහ ආර්ථික ප්‍රශ්න හඳුනා ගත්තේ නැහැ. අපේ ආර්ථිකය ගොඩ නඟා ගන්න වැඩ පිළිවෙළක් හදා ගැනීමේදී ශ්‍රමය සහ භූමිය හැර වෙන විකල්ප විසඳුම් අපට නැහැ. ඒ වාගේම ප්‍රාග්ධන හිඟකම පිළිබඳවත් අපට ප්‍රශ්න තිබෙනවා. ප්‍රාග්ධනය නොමැතිකම නිසා අපි ආයෝජකයෝ මේ රටට ගෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක කන්නයක් වගා කරලා ඒ ලැබෙන ආදායමින් ජීවත්වන ජනතාවක් තමයි ඒ කෘෂි කාර්මික ප්‍රදේශවල ඉන්නේ. ඒ කන්නයේදී හදිසියේවත් වර්ෂාවක් ආවොත්, එහෙම නැත්නම් නියං කාලයක් ආවොත් එයිනුත් පීඩාවට ලක් වෙලා ඒ ජනතාවගේ ආර්ථිකය වැටෙනවා. ඒ නිසා මාස්පතා ආදායමක් ලබා ගන්න පුළුවන් විධියට, මාස්පතා වැටුපක් ලබා ගන්න පුළුවන් විධියට ඔවුන්ගේ ජන ජීවිතය ගොඩ ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් අපි හදන කොට "බොන කෝප්පයේත් කිඹුල්ලු දකින" එක එදා වාගේම අදත් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එදා එතුමන්ලා කළා වාගේ මහා පරිමාණ ව්‍යාපෘති, පරිසරය හානි වන ව්‍යාපෘති, ජන ජීවිතයට හානිවන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න ඒ ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරු විධියට අපි ඉඩ තියන්නේ නැහැයි කියන එක ඒ මන්ත්‍රීවරුන්ට අපි කියනවා. ඒ නිසා මේ නව ව්‍යාපෘතිය ආරම්භ කරන ක්‍රමවේදය පිළිබඳවත්, පාරිසරික ගැටලු අවම කිරීම පිළිබඳවත් මේ සභාවට වාගේම මාධ්‍යටත් ඉතා විවෘතව පැහැදිලි කරන්න කියලා ඒ අදාළ මැති ඇමතිවරුන්ගෙන් අපි විශේෂයෙන්ම ඉල්ලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උමා ඔය ව්‍යාපෘතිය පිළිබඳව මා කලිනුත් සඳහන් කළා. පරිසර ඇගැයීම් වාර්තා නොගෙන ඒ ව්‍යාපෘතියේ වැඩ කටයුතු කළ නිසා අද ඒ ප්‍රදේශයේ ජනතාවට ජීවත්වීමට තිබෙන නිවාස පවා අහිමි වෙලා තිබෙනවා. මේ නව ව්‍යාපෘතියත් එවන් ව්‍යාපෘතියක් විය යුතු නැහැ. එවන් ව්‍යාපෘතියක් හා සමානව මේ ව්‍යාපෘතියේත් කටයුතු කෙරෙනවා නම්, ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මටත් දෙවරක් මේ පිළිබඳව හිතන්න වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පහළ ඌවේ සිටින ජනතාවගේ කෘෂි භෝග අළෙවි කිරීමට තේතැන්නක් වුණේ බණ්ඩාරවෙල ප්‍රදේශයේ පවතින්නා වූ පොළයි. අද ඒ පොළට පහළ ඌවෙන් එන එළවලු ප්‍රමාණය කෙමෙන් කෙමෙන් අඩු වෙලා තිබෙනවා. ඒ ඇයි කියලා නිරීක්ෂණය කරලා බැලුවාම අපට පෙනෙනවා, තාත්තා ගොවිතැන කළාට පුතා ගොවිතැන කරන්න පෙලඹෙන්නේ නැහැයි කියලා. ඔවුන් අද නවීන ලෝකයත් එක්ක යන නිසා අමුඩය ගහගෙන කුඹුර කොටන්න යන වැඩ පිළිවෙළ තුළ නැහැ. ඔවුන්ට අධ්‍යාපනය තිබෙනවා. ඔවුන් ඉහළ අධ්‍යාපනයක් ලබා තිබෙන නිසා එවන් වැඩ පිළිවෙළකට යන්නේ නැහැ. මේ නිසා අපේ දේශීය කර්මාන්ත සියල්ල මේ රටින් ඉවත් කරන්න ඕනෑය කියලා අපි කියන්නේ නැහැ. ඒවා ආරක්ෂා කර ගන්නවා වාගේම, මේ රට ආර්ථික උත්පාදන වැඩ පිළිවෙළකට ගෙන යන්නේ කොහොමද කියන එකත් අපි හිතන්න ඕනෑ.

විශේෂයෙන් මේ කර්මාන්තශාලාව තුළින් වෙනත් අතුරු නිෂ්පාදන සඳහා යන වැඩ පිළිවෙළක් එනවා. ඒ තුළිනුත් විශාල වශයෙන් රැකී රක්ෂා ලැබෙන්න කියලා ප්‍රාර්ථනය කරමින්, මේ කර්මාන්තශාලාව ඉදිවනකොට ඉහළ ඌවේ සහ පහළ ඌවේ ජීවත්වන සියලු ජනතාවට වැඩි ප්‍රතිලාභ ගෙන එන වැඩ පිළිවෙළක් ගෙනෙන්නට අපි කටයුතු කරනවාය කියන කාරණාවත් මතක් කරමින්, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා.

[பி.ப.5.10]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மிக முக்கியமான விவாதப் பொருளொன்று சபை ஒத்திவைப்பு வேளைப் பிரேரணையாக முன்வைக்கப்பட்டிருக்கும் இந்தத் தருணத்தில், இந்த விவாதத்தில் கலந்துகொண்டு உரையாற்று வதற்கு எனக்கும் வாய்ப்பளித்தமைக்கு உங்களுக்கு நன்றி தெரிவித்துக் கொள்கின்றேன்.

இது மிக முக்கியமான ஒரு காலகட்டம். இலங்கையின் பொருளாதார நிலைமைகளை அல்லது அபிவிருத்தி நிலைமைகளைப் பார்க்கின்றபொழுது மிக அண்மையிலேதான் தற்போதைய நல்லாட்சி அரசாங்கம் GSP Plus எனப்படுகின்ற வரிச் சலுகையை வென்றெடுத்து இந்த நாட்டை நோக்கி முதலீடுகளைக் கொண்டுவரச் செய்கின்ற ஏற்பாடுகளைச் செய்திருக்கிறது. அதே தருணத்தில், 2030ஆம் ஆண்டளவில் நாங்கள் நிலைபேறான அபிவிருத்தியை அடைய வேண்டும் என்ற ஐக்கிய நாடுகள் அபிவிருத்திச் சபையின் திட்டத்தை முன்னெடுக்க வேண்டியவர்களாக இருக்கின்றோம். ஐக்கிய நாடுகள் அபிவிருத்தி சம்பந்தமாக முன்வைக்கப்பட்டிருக்கும் "Left no one behind - யாரையும் பின்நோக்கி விட்டு வைக்காது எல்லோரையும் அபிவிருத்தியில் ஒன்றுசேர்த்துச் செல்ல வேண்டும்" என்ற நோக்கோடு 17 இலக்குகளை அடையும் கோட்பாடுகள் முன்வைக்கப்பட்டிருக்கின்றன. அவற்றில் மிக முக்கியமானதாக சுற்றாடல் சம்பந்தப்பட்ட விடயங்கள், வறுமை ஒழிப்புச் சம்பந்தப்பட்ட விடயங்கள் என்பவற்றைக் குறிப்பிடலாம்.

மொனராகல மாவட்டத்தில் அமைக்கப்படவிருக்கின்ற சீனி உற்பத்தித் தொழிற்சாலையுடன்கூடிய கரும்பு உற்பத்திக்காக நிலங்களை குறிப்பாக வெளிநாட்டு நிறுவனங்களுக்கு ஒதுக்குவது சம்பந்தமாகப் பார்க்கவேண்டும். கடந்த காலங்களில் இதுபோன்ற அபிவிருத்தித் திட்டங்களை முன்வைத்தபோது எவ்வாறான விடயங்கள் பின்பற்றப் பட்டிருக்கின்றன? அவை எவ்வாறான நிலைமைகளுக்கு இட்டுச்சென்றிருக்கின்றன? என்பது தொடர்பிலும் கவனத்தைச் செலுத்திக்கொண்டு இத்தகைய அபிவிருத்தித் திட்டங்களை முன்வைப்பது பொருத்தமானதென நான் நினைக்கின்றேன். எதிர்வரும் 2030ஆம் ஆண்டளவில் அடையவிருக்கின்ற நிலைபேறான அபிவிருத்தி எவ்வாறா னதாக இருக்க வேண்டும்? என்பது தொடர்பில் முன்வைக்கப் படுகின்ற இதுபோன்ற திட்டங்களைப் பின்னோக்கிப் பார்ப்பதற்கு மிக முக்கியமான உதாரணத்தை எடுத்துக் கொள்ளலாம்.

இலங்கையில் இன்று சீனி உற்பத்தி தொடர்பாக எவ்வாறு அக்கறையுடன் பேசப்படுகின்றதோ, அதுபோலவே ஏற்றுமதிப் பொருளாதாரத்தில் முதன்மையிடத்தில் இருந்த தேயிலைக்கு என்ன நடந்துள்ளது என்பது பற்றிப் பேசப்படுகிறது. இன்று இலங்கையின் ஏற்றுமதியில் தேயிலை நான்காவது இடத்திற்குச் சென்றிருக்கின்றது. இலங்கையின் முதன்மை ஏற்றுமதியாக இருந்த தேயிலை, Ceylon Tea என உலக மட்டத்திலே பெயரெடுத்திருந்த நிலையில் அதன் ஏற்றுமதி இன்று பின்னோக்கிச் செல்வதற்கான காரணம் என்ன? 1992ஆம் ஆண்டு தனியார்மயம் என்ற வகையிலே தேயிலைத் தொழிற்றுறை முறையான நிருவாகத்திற்கு உட்படுத்தப் படாமல் 22 பிராந்தியக் கம்பனிகளுக்குப் பிரித்துக் கொடுக்கப்பட்டது. அந்தத் தேயிலையை வளர்க்கக்கூடிய நிலம் Golden Shareholder என்ற அடிப்படையில் அரசுக்குச் சொந்தமானதாக இருந்தபோதிலும்கூட அதில் பயிரிடுவதற் கான முகாமைத்துவ முறைமைகள் அனைத்தும் முற்று முழுதாகத் தனியாரிடம் ஒப்படைக்கப்பட்டன.

அவ்வாறு ஒப்படைக்கப்பட்டு இன்று 25 வருடங்கள் கழிந்த நிலையில், அந்தத் தேயிலை உற்பத்தி நிறுவனங்கள் வழங்குகின்ற அறிக்கைகள் எப்படி இருக்கின்றன? "நாங்கள் இப்போது நட்டத்தில் இயங்குகின்றோம்; இந்தத் தோட்டத்தைக் கைவிடப்போகின்றோம்; இந்தத் தொழில் துறையைத் தொடர்ச்சியாகச் செய்ய முடியாது" என்று கூறுகின்றன. இந்த நிலையிலேயே இந்தத் தேயிலை ஏற்றுமதி என்பது நான்காம் இடத்திற்கு வந்திருக்கின்றது. 92ஆம் ஆண்டு இந்தத் தோட்டங்களைப் பொறுப்பேற்கும்போது 5 இலட்சமாக இருந்த தொழிலாளர்கள் இன்று ஓரிலட்சமாகக் குறைக்கப்பட்டிருக்கின்றார்கள். அதாவது, 4 இலட்சம் பேர் அந்தத் தொழிற்துறையிலிருந்து நீக்கப்பட்டிருக்கின்றார்கள். எனவே, தொழிலாளர்களுக்காகவும் விவசாயிகளுக்காகவும் தான் இந்தத் திட்டங்கள் முன்வைக்கப்படுகின்றன எனச் சொல்கின்ற அதேவேளை, இவ்வாறான பின்னோக்கிச் சென்ற அல்லது வீழ்ச்சிப் போக்கைக் கண்ட அனுபவங்களைப் பகிர்ந்துகொண்டுதான் நாங்கள் இத்தகைய புதிய திட்டங்களை இங்கே கையாள வேண்டியிருக்கின்றது. அந்தவகையில், இன்றைய திகதியில் இங்கு பேசப்படுகின்ற விடயத்தில், மொனராகலை மாவட்டத்தில் அமைந்திருந்த தேயிலைத் தோட்டங்களுக்கு என்ன நடந்தது? அங்கே யிருக்கின்ற தொழிலாளர்களின் நிலைமை எவ்வாறுள்ளது? போன்ற நிலைமைகளை நாம் ஆராய வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் நுவரெலியா மாவட்டப் பாராளுமன்ற உறுப்பினராக இருந்தாலும் ஒரு தொழிற்சங்கத்தின் உறுப்பினர் என்ற வகையிலே, எங்களது தொழிற்சங்கத்தில் உறுப்பினர்களாக இருக்கின்ற மொனராகலை மாவட்டத்திலுள்ள தேயிலைத் தோட்டத் தொழிலாளர்கள் அன்றாடம் எதிர்நோக்கும் பிரச்சினைகளை இந்தச் சபையிலே முன்வைக்க வேண்டிய கடப்பாடு எனக்கிருக்கின்றது என நினைக்கின்றேன். மொனராகலை மாவட்டத்தின் மொனராகலைப் பிரதேச செயலகப் பிரிவில் குமாரதொல, மடகல, factory division, வெலிஆய, ஊவத்தன்ன, நக்கல, முப்பனவெளி, கும்புக்கண, பாராவில, மொனரகெல, அலியாவத்தை எனத் தோட்டங்கள் இருக்கின்றன. இவை JEDB எனப்படுகின்ற மக்கள் பெருந்தோட்ட அபிவிருத்திச் சபையின் நிர்வாகத்தின்கீழ் இயங்கிய தோட்டங்கள். இந்தத் தோட்டங்களுக்குக் கீழ் 1834 குடும்பங்கள் வசிக்கின்றன. அதேபோல், படல்கும்புர பிரதேச செயலகப் பிரிவின் கீழ் கிட்டத்தட்ட 10 - 12 தோட்டங்கள் இருக்கின்றன. இவை முற்றுமுழுதாகத் தனியார் கம்பனிகளின் கீழும் பிராந்தியக் கம்பனிகளின் கீழும் இயங்குகின்றன. அங்கே ஏறக்குறைய 1887 குடும்பங்கள் வசிக்கின்றன. அதேபோல், பிபில பிரதேச செயலகப் பிரிவுக்குட்பட்ட பிரதேசத்திலும் 215 குடும்பங்கள் இந்தத் தேயிலைத் தோட்டங்களை நம்பி வாழ்ந்துகொண்டிருக்கின்றன.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இதில் குறிப்பாக நான் மொனரகெல, அலியாவத்தை ஆகிய இரு தோட்டங்கள் தொடர்பாகக் கூறலாமென நினைக்கின்றேன். இங்கே 450 தொழிலாளர் குடும்பங்களைச் சேர்ந்தவர்கள் வசிக்கிறார்கள். நாங்கள் அறியக்கூடிய வகையிலே JEDB - மக்கள் பெருந்தோட்ட அபிவிருத்திச் சபை இந்த இரண்டு தோட்டங்களையும் நிர்வகிப்பதை முற்றுமுழுதாகக் கைவிட்டிருக்கின்றது. அங்கே முன்பு இறப்பர் பயிர்

செய்யப்பட்டிருக்கின்றது. பின்னர் கரும்பும் பயிர் செய்யப் பட்டிருக்கின்றது. இன்று கரும்புப் பயிர்ச்செய்கை சம்பந்த மாகவே நாங்கள் அதிகமாகப் பேசிக் கொண்டிருக்கின்றோம். ஏற்கெனவே இந்த மாவட்டத்தில் அரச உரிமையின் கீழ்-அரச நிர்வாகத்தின் கீழ் இயங்கிய அதாவது மக்கள் பெருந்தோட்ட அபிவிருத்திச்சபை என்ற அந்த நிர்வாகத்தின் கீழ் இயங்கிய தோட்டங்கள் கைவிடப்பட்ட நிலையிலே, அங்கே 450 குடும்பங்கள் எவ்வித வாழ்வாதார நிலைமைகளும் இல்லாது வாழ்ந்து கொண்டிருக்கின்றன. இந்தத் தருணத்தில்தான் நாங்கள் வெளிநாட்டு முதலீடுகளோடு அங்கே கரும்பு உற்பத்திக்காகப் புதிய முதலீட்டு முயற்சிகளைச் செய்வதற்கு முயற்சிக் கின்றோம். மொனரகெல மற்றும் அலியாவத்தை ஆகிய இரண்டு தோட்டங்களும் கைவிடப்பட்ட நிலையில், அந்த இரண்டு தோட்டங்களிலும் வசிக்கும் தொழிலாளர்களுக்கு 2 ஏக்கரைப் பகிர்ந்து கொடுப்பதன் மூலமாக அவர்கள் தங்களது வாழ்வாதார நிலைமைகளைத் தாங்களே பார்த்துக் கொள்வார்கள் என்ற நிலைமை உருவாக்கப்பட்டது. இருந்தாலும், LRC என்று சொல்லப்படுகின்ற காணி சீர்திருத்த ஆணைக்குழு அவர்களுக்கு அந்தக் காணிகளைப் பகிர்ந்து கொடுப்பதற்கு அளவீடுகளைச் செய்தது. எனினும், இன்றைய திகதி வரை தொழிலாளர் பற்றிப் பேசுவோர், விவசாயிகளைப் பற்றிப் பேசுவோர் அவர்களுக்கு அதனைப் பகிர்ந்தளிக் காமையால், அந்த 2 ஏக்கர் காணிகளை வழங்குவதற்காகக் காணி சீர் திருத்த ஆணைக்குழு அந்த மக்களிடம் 45,000 - 50,000 ரூபாய் பணம் செலுத்துமாறு கோரிக்கை விடுத்து, அதற்குரிய ஆவணங்களைச் சமர்ப்பித்திருக்கின்றது.

எனவே, மக்கள் விடுதலை முன்னணியின் தலைவர் இந்தப் பிரேரணையை முன்வைக்கும்போது குறிப்பிட்ட பிரதான விடயங்களில் ஒன்று, நாங்கள் குறிப்பிட்ட மாவட்டத்தில் வசிக்கின்ற தொழிலாளர்களுக்கும் மக்களுக்கும் எந்தவிதமான ஏற்பாடுகளையும் செய்யாது வெளிநாட்டு முதலீடுகளைக் கொண்டுவருவதன் மூலம் எவ்வித பயனையும் அடைய முடியாது என்பதாகும். எனவே, அங்கே கைவிடப்பட்ட மக்களை நாங்கள் கவனத்திற்கொள்ள வேண்டும். நான் ஏற்கெனவே குறிப்பிட்டதுபோல், 2030ஆம் ஆண்டு நாங்கள் அடையவேண்டிய இலக்கு left no one behind என்பதற்கமைய இருக்கவேண்டும். யாரையும் நாங்கள் அபிவிருத்தியில் பின்னடையச் செய்யாது எல்லோரையும் ஒன்று சேர்த்துக்கொண்டுதான் எங்கள் அபிவிருத்தியை முன்னெடுத்துக்கொண்டு செல்லவேண்டும். மொனராகலை மாவட்டத்தில் வசிக்கும் 15,000 பெருந்தோட்டத் தொழிலாளர்கள் அதாவது கிட்டத்தட்ட 4000 குடும்பங்கள் அங்கே நிர்க்கதியாக்கப்பட்டுள்ளன. அவர்கள் தங்கிவாழ்கின்ற அந்தப் பெருந்தோட்டங்கள் எவ்வித பராமரிப்புமின்றித் தனியார் சிலருக்கு ஒப்படைக்கப்பட்ட நிலையிலும் அரச பொறுப்பிலுள்ள JEDB இன் கீழுள்ள சில நிறுவனங்களினால் முழுமையாக நிர்வகிக்கப்படாத நிலையிலுமே இந்தத் திட்டங்கள் முன்வைக்கப்படுகின்றன. எனவே, இவ்வாறான அபிவிருத்தித் திட்டங்கள் முன்வைக்கப் படுகின்றபோது ஏற்கெனவே அங்கே தொழிலாளர்களாக, விவசாயிகளாக இருந்தவர்கள் தொடர்பிலும் அவர்களுக்கு வழங்குவதாக உறுதியளிக்கப்பட்ட காணி தொடர்பிலும் எவ்வாறான நடவடிக்கைகள் முன்னெடுக்கப்பட இருக் கின்றன? அவை எவ்வாறு நடைமுறைப்படுத்தப்பட இருக்கின்றன? என்பன தொடர்பான உறுதிப்பாட்டை எடுக்கவேண்டிய கடப்பாடு அரசாங்கத்துக்கு இருக்கின்றது.

குறிப்பிட்ட மாவட்டத்தின் பாராளுமன்ற உறுப்பினராக நான் இல்லாதபோதும்கூட, அந்த மாவட்டத்தில் தமிழ் பேசக்கூடிய தோட்டத் தொழிலாளர்கள் கவனிப்பாரற்று இருப்பதை அறிவேன். நான் அங்கு நேரடியாகச் சென்று செய்த ஆய்வுகள் இருக்கின்றன. *ஹன்சாட் அறிக்கைக்காக அதனைச் சமர்ப்பிக்கின்றேன். மொனராகலை நகரத்திலிருந்து பார்த்தால் 7 கிலோ மீற்றர் தூரத்திலே கண்பார்வைக்கு எட்டக்கூடிய வகையில் தெரியக்கூடிய இரண்டு உயர்ந்த மலைகளுக்கிடையிலான பாதை இன்னமும் புனரமைக்கப் படவில்லை. மேலும், 200 வருடங்களுக்கு முன்னர் இங்கு வந்த அந்த மக்கள் எவ்வாறு வாழ்ந்தார்களோ, அந்த நிலையிலேதான் இன்றும் இந்த மக்கள் வாழ்கின்றார்கள். மண்ணினால் அமைக்கப்பட்ட, கட்டையினால் அமைக்கப் பட்ட சிறுசிறு குடிசைகளிலே வாழ்ந்துகொண்டு சேனைப் பயிர்ச்செய்கை மேற்கொள்கின்ற நிலைமை இன்றும் அங்கிருக்கிறது. அத்தகைய நிலைமைகள் காணப்படுகின்ற ஒரு மாவட்டத்திற்கு இத்தகைய ஓர் அபிவிருத்தித் திட்டத்தின் மூலம் பாரிய முதலீடுகள் வருமாக இருந்தால், அந்த முதலீடுகளை உள்வாங்கி மேற்கொள்ளப்பட இருக்கின்ற கைத்தொழிலுக்குள் 15,000 பேரைக்கொண்ட அந்த 4,000 புறமொதுக்கப்பட்ட குடும்பங்களையும் நிச்சயமாக உள்ளீர்க்க வேண்டும்; அவர்களுக்கும் வாழ்வாதார ஏற்பாடுகளைச் செய்துகொடுக்க வேண்டும்; அவர்களுக்கு கிடைக்கவேண்டிய காணி உரிமையினைப் பெற்றுக்கொடுக்க வேண்டும் என்று கேட்டுக்கொள்வதோடு, இவற்றை இந்த நல்லாட்சி உறுதி செய்ய வேண்டுமென்றும் கூறி, வாய்ப்புக்கு நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன். வணக்கம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට බොහොම ස්තූතියි.

මීළඟට, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා.

[අ.භා. 5.19]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද ජාතික මට්ටමේ ඉතා වැදගත් යෝජනාව සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් මා අදහස් දක්වන්න බලාපොරොත්තු වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර 68ක් තුළ තමුන්නාන්සේලා දෙපිරිසම මාරුවෙන් මාරුවට මේ රටේ ජනතාව විසින් බලයට පත් කළ බව ඔබතුමා දන්නවා. ජනතාව කරපු ඒ දැවැන්ත පරිත්‍යාගයට තමුන්නාන්සේලාගේ පැත්තෙන් මේ රටට කරලා තිබෙන්නේ මහා විනාශයක් කියලා අපි විශ්වාස කරනවා. එම විනාශයෙන් මිදෙන්න පුළුවන් ක්‍රමවේදයන් අපි වසර ගණනාවක් තිස්සේ අවස්ථා කිහිපයක් තුළදී, කටේ කෙල හිඳෙනකල්, කට කැඩෙනකල් අපි දිගින් දිගටම කිව්වා විතරක් නොවෙයි, මේකෙන් ගොඩ එන්න පුළුවන් ක්‍රමවේදයත් අපි අපේ පැත්තෙන් තමුන්නාන්සේලාට පැහැදිලි කර දුන්නා. නමුත්, අද වනතුරුත් ඒවා තුට්ටුවකටවත් මායිම් කරලා නැහැ. අපි ඒ ගැන ඉතාමත්ම කනගාටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම දෙයක් කියන්න ඕනෑ. පළාත් සභාවේ ඉඳලා සහ අලුතෙන්ම පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්න නවක මන්ත්‍රීවරු අතීතය පිළිබඳව බොහෝ කරුණු කාරණා දන්නේ නැහැ. ඔවුන්ට මේවා පිළිබඳ අත් දැකීමක් නැහැ. එම නිසා මම එතුමන්ලාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. විශේෂයෙන්ම තමන්ගේ අම්මලා,

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

තාත්තලා වැඩිහිටි ඥාතීන් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු අය ඉන්නවා. ඒ අය අතීතයේ කරපු කියපු දේවල් පිළිබඳ ඒ අයගෙන් වැටහීමක් ලබා ගෙන ආවොත් තමුන්නාන්සේලාට පාර්ලිමේන්තුව තුළ කථා කරන්න ඉතාමත්ම පහසු වෙයි කියලා මා විශ්වාස කරනවා.

අපේ රට කාර්මික වශයෙන් සංවර්ධනය කිරීම සඳහා පසු ගිය වකවානුව පුරාම -පසු ගිය වසර 68ක කාලය තුළ- සමාජවාදී රටවල්, මිශ්‍ර ආර්ථිකය තිබුණු රටවල්, ප්‍රගතිශීලී රටවල් ඒ වාගේම ධනවාදී රටවල් යනාදී වශයෙන් විවිධ රටවල් සද්භාවයෙන් සහ සද්භාවයෙන් නොවන මට්ටමෙන් වුණත් අපට ඉහළට යන්න අපට අත් ඔසවන්න සහයෝගය දුන්නා. ඒ අයගේ පරිත්‍යාගයන් විධියට -ප්‍රදානයන් විධියට- සුළු පොලී ණය වශයෙන් ලබා දීලා ආරම්භ කරපු අපට ගැළපෙන, අපට ආවේණික මහා පරිමාණ කර්මාන්තශාලා වන රෙදි කර්මාන්තශාලා, ටයර් කර්මාන්තශාලා, ඛනිජ වැලි කර්මාන්තශාලා, කඩදාසි කර්මාන්තශාලා, සීනි කර්මාන්තශාලා, සිමෙන්ති කර්මාන්තශාලා, ලුණු කර්මාන්තශාලා විශාල වශයෙන් මේ රටේ තිබුණා. මේ දැවැන්ත කර්මාන්තවලින් මේ රටට ලොකු සේවයක් වුණා. රටට නිෂ්පාදනයක් ලබා දුන්නා. රටේ අමුද්‍රව්‍ය උපයෝගී කරගෙන අමුද්‍රව්‍ය නැත්නම් අමුද්‍රව්‍ය පිට රටින් ගෙනැල්ලා මේ කර්මාන්තශාලා පවත්වා ගෙන ගියා. ඒ වාගේම මේ කර්මාන්තශාලාවලින් අපේ රටේ ජනතාවට විශාල සේවයක් වුණා කියන එකත් අපි පිළිගන්න ඕනෑ. මොකද, අපේ ශ්‍රමිකයෝ මෙම කර්මාන්තශාලාවල වැඩ කළා. ඒ තුළින් ඒ අයට ආදායමක් සොයා ගන්න අවස්ථාව ලැබුණා. නමුත්, පසුගිය වකවානුව පුරා තමුන්නාන්සේලා දෙගොල්ලන්ම එකතු වෙලා කරපු දේවල් පිළිබඳව අපි කල්පනා කරලා බැලුවොතින්, මේ රටට වරින් වර ලාභ ලබා දුන්, රටට මහත් දැවැන්ත සේවයක් කළ, අපේ රටේ මිනිස් ශ්‍රමයට වටිනාකමක් දුන් කර්මාන්තශාලා සියයකට වැඩි ප්‍රමාණයක් කුණු කොල්ලයට විකුණලා දැම්මා; මේවා නැති හංගස්ථාන කළා; මේවා විනාශ කළා. අද මේ නවක පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, වසර 25ක් 30ක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු හිටපු මැති ඇමතිවරු, ඉන්න මන්ත්‍රීවරු අද කථා බහ කරන්නේ ඒ සියල්ල අමතක කරලායි. ඒ අය අද කථා බහ කරන්නේ කවදාවත් බලයේ නොසිටි අය විධියටයි.

අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට පත්වෙලා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒ මතයේ ඉඳගෙන තමයි කථා බහ කරන්නේ, අතීතයේදී කිසි දෙයක් නොකරපු අය විධියට. අපේකම, අපේ දේ පිළිබඳව කිසිදු කැක්කුමක් නැතුව, ඒ සියල්ල විකුණා දමා, විනාශ කර දමා අද තමුන්නාන්සේලා අංශක 180ක් අනික් පැත්තට කැරකිලා දැන් මහ ජනතාව ඉදිරියේ බයිලා වාදනය කරනවාය කියන එකයි මගේ අදහස. ඔබතුමන්ලා කවදාවත් මේවායින් පාඩම් ඉගෙන ගන්නේ නැහැ. අපට ඉතිහාසයක් තිබෙන්නේ කොක් හඬලා සිනාසෙන්නවත්, හඬා වැලපෙන්නවත් නොවෙයි; පාඩම් ඉගෙනගෙන අත් දැකීම් ලබන්නයි.

අපි විශ්වාස කරනවා, තමුන්නාන්සේලා කවදාවත් අත් දැකීම් ලබන්නේ නැහැයි කියලා. අපේ දේ දියුණු කරගෙන යනවා වෙනුවට ඒ දේ විනාශ කරලා, තමුන්නාන්සේලා හැම කෙනෙක්ම වත්ත බද්දට දීලා ඇස්සට දත නියවන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. අපි මේ රටට ආදරෙයි; මේ රටේ ජනතාවටත් ඒ වාගේම ආදරෙයි. ඒ නිසා අපි රටේ ආර්ථික, සමාජයීය, සංස්කෘතික දියුණුවට කිසිසේත්ම විරුද්ධ වන්නේ නැහැ. රටේම ජනතාව දන්නවා, ඒ කාරණය මොකක්ද කියලා. විශේෂයෙන්ම මා කියන්න ඕනෑ, මහජන දේපොළ කොල්ල කන, රට විනාශ කරන, ඥාති සංග්‍රහය ඉහළින් පවත්වාගෙන යන, ඒ වාගේම ස්වාභාවික සම්පත්, රාජ්‍ය ආයතන විකුණාගෙන කන, විකුණාගෙන කාපු මේ රටේ දේශපාලන නායකයන් සහ එතුමන්ලාගේ අනුගාමිකයන් ගැන අපි මේ වකවානුව පුරාම හෙළදරවු කරලා තිබෙනවාය කියලා. ඒ වාගේම ඒ ගොල්ලන් හොරකම් කරපු මූල්‍ය සම්පත් මෙන්න මෙපමණයි කියා අපි ගණන් හදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. ජනාධිපතිතුමාට, කැබිනට් මණ්ඩලයට, අගමැතිතුමාට අවශ්‍ය සියලුම සාක්ෂි කරුණු කාරණා ඇතිව ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත් අපට හරිම කනගාටුදායකයි. මේ ජාති ත්‍රස්තයන් ආරක්ෂා කරමින්, අර පනින රිළවුන්ට ඉණිමං බැන්දා වාගේ ඒ අයට සහයෝගය දෙමින්, තමුන්නාන්සේලා අද මේවා වසං කරන්න උත්සාහ කරනවා. ඒ නිසා අද මුළු රටම මහා බෙදවාචකයක් බවට පත්වෙලා තිබෙනවා. එම නිසා මේ මොහොතේ අපි පැහැදිලිවම කියනවා, තමුන්නාන්සේලා දෙගොල්ලන්ම එකතුවෙලා අපට අවලාද, අපහාස, මදිපුංචිකම් සියල්ලම කළත් මොනම ආකාරයකින්වත් අපි අපේ ගමන නවත්වන්නේ නැහැ, අපි මේ රටේ ජනතාවට, රටට කරන්න පුළුවන් ඉහළම සේවය කරනවාය කියන එක.

මට මතකයි, හරින් ප්‍රනාන්දු ඇමතිතුමා කිව්වා, අනුර දිසානායක මන්ත්‍රීතුමන්ලා කුහකයි, මේ රටේ ඒ ප්‍රදේශ දියුණු වනවාට කැමැති නැහැයි කියලා. එහෙම දෙයක් නැහැ. අපි මේ රටටත්, ජනතාවටත් සැබෑ විධියටම ආදරෙයි. ඒ වාගේම ඒ අය ඉහළින් ඔසවා තබන්න අපට කරන්න පුළුවන් ඉහළම කැප කිරීම කරන මිනිස්සු, අපි. ඒ ගැන මේ මුළු රටේම ජනතාව දන්නවා; ඔබතුමන්ලාත් දන්නවා. ඒ ගොල්ලන් කථා කරන පල් හැලිවලින් අපේ මේ ගමන නවත්වන්න පුළුවන්කමක් නැහැයි කියන එක මා කියනවා. තමුන්නාන්සේලාට මොනවා කිව්වත් අහන්නේ නැහැයි කියලා අපට විශ්වාසයක් තිබෙනවා. "නැහැදෙන එකා ගුණ දහමින් වෙළුවත් - උගේ ගතිය ඌ නාරියි මැරුවත්" කියලා කියමනක් තිබෙනවා. බලු වලිගය අවුරුදු 7ක් උණ පුරුකේ දමලා තිබුණත්, වලිගය එළියට ගත්තාට පස්සේ එය නැමෙනවා. ඒ වාගේ තමුන්නන්සේලා කවදාවත් පාඩම් ඉගෙන ගන්නේත් නැහැ; අත් දැකීම් ලබන්නේත් නැහැ; අත් දැකීම් තුළින් තමන්ගේ වැරැදි හදා ගන්නේත් නැති තත්ත්වයට පත්වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැලවත්තේ සීනි සමාගම පටන් ගන්න අවස්ථාවේදී මට මොනරාගල දිස්ත්‍රික්කයට ගුරු පත්වීමක් ලැබුණු බව මට මතකයි. මා උපාධිධාරි ගුරුවරයකු වශයෙන් මොනරාගල දිස්ත්‍රික්කයේ පාසලක සේවය කළා. එහි සේවය කරන කාලයේදී තමයි පැලවත්තේ ඒ මහා දැවැන්ත වෘක්ෂලතා විනාශ කරන්න පටන් ගත්තේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා සිටියේ වැල්ලවාය - බුත්තල ප්‍රධාන මාර්ගයේ කොටමුදුන ප්‍රදේශයේ. කුකුරම්පොළ කියන හන්දියෙන් පටන්ගෙන කුකුරම්පොළ හන්දිය, හොරබොක්ක, හිඟුරුකඩුව, රනුගල්ල, කොටමුදුන, අමුණුමුල්ල, පස්සර යන ප්‍රදේශවල මහා දැවැන්ත වෘක්ෂලතා විනාශ කළා. පස්සරින් එහාට නමුණුකුල පැත්තේ විශාල තේ ෆැක්ටරි තිබෙනවා. මෙන්න මේ තේ ෆැක්ටරි හදන්න මහා විශාල වනස්පති විනාශ කළා.

විශේෂයෙන්ම අරටුව හයිය පලු, වීර, බුරුත වාගේ මහා දැවැන්ත ශාක එම වනස්පතියේ තිබුණා. මගේ ඇස් දෙකෙන්ම මම ඒවා දැක්කා. අක්කර දහස් ගණනක් වූ ඒ මහා විශාල රුස්ස කැලෑව ඩෝසර් කරලා, විනාශ කළා. විදුලි කියත් දාලා කපලා දිනකට "ටාටා" ලොරිවලින් සිය වතාවකට වඩා ඇද්දා. ඒ විධියට එම වනස්පති විනාශ කරලා තමයි ඒ මහා දැවැන්ත භූමිය තුළ 'පැල්වත්ත සීනි සමාගම' ආරම්භ කළේ. එදා එම සමාගම ආරම්භ කරනකොට මට මතකයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වන ධර්මදාස බණ්ඩා, පුංචි බණ්ඩා මහත්වරු කිව්වේ, "එම විදේශිකයන්ව ඉඹලා පිළිගන්න ඕනෑ." කියලා. මේ දේ මේ විධියටම සිද්ධ වුණේ එදත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව යටතේ තමයි.

අපි අහනවා, එදා ඒ මහා දැවැන්ත විනාශය කරලා ඔබතුමන්ලා බලාපොරොත්තු වුණ පරමාර්ථ ඉෂ්ට කර ගන්න පුළුවන් වුණාද කියා. ඒ දවස්වල කියුබාවෙන් සීනි කිලෝ එකක් ගෙනාවේ රුපියල් 4.75ට. එම මිල වැඩිය කියලා තමයි අපේ රටේ සීනි නිෂ්පාදනය කරලා, ඒ හානිය වළක්වන්න මේ කටයුත්ත ආරම්භ කළේ. නමුත්, ඒකෙන් සිද්ධ වුණේ ඒ වැඩේ නොවෙයි කියන එක අපි මේ මොහොතේ පැහැදිලි කරලා කියන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, මා මේ වෙලාවේ ඔබතුමාගේ අවධානය මේ කාරණය කෙරෙහි යොමු කරවනවා. ගරු ඇමතිතුමනි, කන්තලේ සීනි කර්මාන්තශාලාවට අයත් අක්කර 25,000ක් තිබෙනවා. හිඟුරාන සීනි කර්මාන්තශාලාවට අයත් අක්කර 12,000ක් තිබෙනවා. දැන් මේ කර්මාන්තශාලා දෙකම අක්‍රිය වෙලායි තිබෙන්නේ. පැල්වත්ත සීනි සමාගම සක්‍රියයි. සෙවනගල සීනි සමාගමත් සක්‍රියයි. එම නිසා අපි කියන්නේ, අපට අලුතින් සීනි සමාගම් අවශ්‍ය වෙන්නේ නැහැ. මෙන්න මේ සක්‍රිය සීනි සමාගම්වල නිෂ්පාදනය වැඩි කිරීමට අවශ්‍ය තාක්ෂණය, ආර්ථික මෙහෙයුම් හා අවශ්‍ය අනෙකුත් කටයුතු කරන්න. කන්තලේ සීනි කර්මාන්තශාලාවට, හිඟුරාන සීනි කර්මාන්තශාලාවට අයිති ගොවීන්ට බෙදා දීපු ඒ ඉඩම්වල නැවත වතාවක් විද්‍යාත්මක ක්‍රමයට නිෂ්පාදනය ආරම්භ කරන්න. අවශ්‍ය වතුර ටික තිබෙනවා. පොහොර ටික දෙන්න පුළුවන්කම තිබෙනවා. ගොවීන් ඉන්නවා. ඒ සියල්ලම සම්බන්ධ කරගෙන එම බිම්වල සීනි කර්මාන්තය ආරම්භ කිරීමට මැදිහත් වෙන්න. අවංක වුවමනාවක් තිබෙනවා නම්, කිසි ගැටලුවක් නැහැ.

අප විශ්වාස කරන්නේ, කන්තලේ හා හිඟුරාන කර්මාන්තශාලා තමුන්නාන්සේලා හිතා මතාම අසාර්ථක කළා කියලායි. එම ව්‍යාපෘති දෙකේ ඉඩම් ටික තිබෙනවා. ගොඩනැඟිලි තිබෙනවා. යන්ත්‍ර සූත්‍ර තිබෙනවා. වාරි ජල පහසුකම් තිබෙනවා. විශේෂයෙන්ම පුහුණු ශ්‍රමය තිබෙනවා. මේ සමස්තයම උපයෝගී කර ගත්තොත් ජාතික සීනි අවශ්‍යතාව ඉෂ්ට කරන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. එම සශ්‍රීක බිම්, නැවුම් බිම් සීනි කර්මාන්තය ආරම්භ කිරීම පිණිස නැවත ලබා ගන්න ඕනෑ. එසේ නොකර -නිසි පදනමකින් තොරව- උක් වගාව සඳහා විදේශීය සමාගම්වලට යෝජිත ඉඩම් ලබා දීමෙන් ඇතැම් ගරු මන්ත්‍රීවරු සඳහන් කළ විධියට බරපතළ ලෙස පාරිසරික සහ සමාජයීය ගැටලු රාශියක් මතු වනවා. ඒක මොනම ආකාරයකින්වත් වළක්වන්න බැහැ. එම නිසා අපි කියනවා, වහාම ක්‍රියාත්මක වන පරිදි මේ යෝජිත යෝජනාව හකුළාගත යුතුයි; මේක නැවැත්විය යුතුයි කියලා. එම නිසා බදුල්ල, අම්පාර, මොනරාගල ගොවි ජනතාව ඒක රාශි කරලා, එම ජනතාවගේ යෝජනාවලට කන් දීලා, සාකච්ඡා කරලා, කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිර්දේශ ලබා ගෙන, ඒ අනුව අවශ්‍ය ප්‍රායෝගික සහ ආවේණික කෘෂි කර්මාන්තය පටන් ගැනීම තමයි කළ යුතු වන්නේ කියන එකයි අපි විශ්වාස කරන්නේ. මෙය ගරු අනුර කුමාර දිසානායක සහෝදරයා වාගේම තවත් ගරු මන්ත්‍රීවරු හා මන්ත්‍රීවරියන් කීපදෙනෙකුත් අවධානයට යොමු කළා. ඒ අනුව කටයුතු කළොත්නේ අපි විශ්වාස කරනවා, යම් ආකාරයකින් හෝ ගොඩ යාමක් සිදු කර ගන්න පුළුවන් වෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී කිව්වා, "අනුර කුමාර මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අද මේ පාර්ලිමේන්තුවේ විවාදයට ගන්න අවකාශ සලසා දීම ගැන අගමැතිවරයාට ස්තුතිවන්ත වනවා." කියා. එතුමා මේ පාර්ලිමේන්තුවට පැමිණි නවක මන්ත්‍රීවරයෙක්.

මම පැහැදිලිවම එතුමාට කියන්නට ඕනෑ ඌව වෙල්ලස්ස වේවා, මාතර ගාල්ල වේවා, මේ රටේ සමස්ත සිංහල මුස්ලිම් දෙමළ බර්ගර් මැලේ ජනතාවට මොනවා හෝ හානියක්; ආර්ථිකයට මොනවා හෝ හානියක් , රටට මොනවා හෝ හානියක් සිදු වෙනවා නම් එවැනි අවස්ථාවලදී අපි හැමදාමත් පාර්ලිමේන්තුව තුළ, පළාත් සභාව තුළ මහ ජනතාව වෙනුවෙන් රට වෙනුවෙන් අපේ හඬ අවදි කළ බව. මෙවැනි යෝජනා කාටවත් කියලා ගෙන ආයුතු යෝජනා නොවෙයි. අනිවාර්යයෙන්ම අම්පාර, දිඟාමඩුල්ල, ඌව වෙල්ලස්ස ජනතාවත්, ඒ ජනතාවගේ දරුවනුත්, ඒ ප්‍රදේශවල අර්ථිකයත්, පරිසරයත්, ඒ ප්‍රදේශවල සාමාන්‍ය තත්ත්වයත්, සංස්කෘතියත් මේ නිසා වෙනස් වෙනවා; විනාශ වෙනවා. එසේ නම් අපි ඒවා සාකච්ඡාවට ගන්නේ නැතිව වෙනත් යෝජනා සාකච්ඡාවට ගන්නවාය කියන එක හාස්‍යයට කරුණක්. එම නිසා මම එතුමාට කියනවා, අපි කාගේවත් අවසර අරගෙන මේවා ගේන්න කාගේවත් තෝල්කයෝ නෙවෙයි කියන එක. එසේ ප්‍රශංසා ලැබිය යුතුය කියන ආකාරයේ ගොන් තර්ක ගෙන ඒම මම තරයේ හෙළා දකිනවා.

එදා මේ සීනි කර්මාන්තශාලාව වෙනුවෙන් අක්කර හැටපන්දාහක් වෙන් කර තිබුණා. ඒ සඳහා ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය අමාත්‍යතුමාත් විරුද්ධ වුණා. අද වෙන් කර තිබෙන්නේ අක්කර හතළිස්දාහයි. මා විශේෂයෙන් මේ කාරණය කියන්න ඕනෑ. එතුමා පැහැලි කර කිව්වා, මෙයින් එක ගොවියෙකුට හෙක්ටෙයාර දෙකක් ලබා දෙනවාය කියා. ඒ කියන්නේ දළ වශයෙන් ගත්තාම අක්කර පහක්. ගොවීන්ට මේවා දී අනිවාර්යයෙන්ම මේ කොම්පැනිය කියන විධියටයි වගා කරන්න ඕනෑ. මෙහි වී වගා කරන්නට බැහැ. මෙහි කෙහෙල් වගා කරන්නට බැහැ. ඒ සමාගම කියන විධියට වගා කරන්නට ඕනෑ. කොම්පැනිය කියනවා, අනිවාර්යයෙන්ම මෙහි වගා කරන්නට ඕනෑ උක්ය කියා. එසේ නම් ඒ කර්මාන්තශාලාව, ඒ ව්‍යාපාරිකයා කියන වැඩ කටයුත්ත කරන්න ගොවීන් බැඳී සිටිනවා. එසේ නම් ගොවීන්ට ස්වාධීනව කටයුතු කරන්න මොනම ආකාරයකින්වත් හැකියාවක් නැහැ. සිංගප්පූරු සමාගම කියන පදයට තමයි මේ ගොවීන්ට නටන්න වෙන්නේ. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා තම කථාව පටන් ගැනීමේදීම කිව්වා, "ගොවියා මේ සමාගමට බැඳලා තිබෙනවා. ඒ කොම්පැනියේ අවශ්‍යතාවයයි ඉෂ්ට කරන්නට ඕනෑ. බහුජාතික සමාගමවල අවශ්‍යතාවයයි ඉෂ්ට කරන්නට ඕනෑ." කියා. එම නිසා බහු ජාතික සමාගමවලින් ලැබෙන කුට්ටියෙන් සාක්කු පිරෙනකොට මේ මැති ඇමතිවරුන්ට ඉන්න තැන් පවා අමතක වෙනවා. මේ අවස්ථාවේදී එතුමන් සභාවේ නැහැ. එම නිසා ඒ ගැන කියන එකේ තේරුමක් නැහැ. එතුමා තමයි කිව්වේ එක්සත් ජාතික පක්ෂයේ ඉන්දැද්දී, "මගේ බල්ලාවත් මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට යන්නේ නැහැ." කියා. නමුත් බල්ලා ගෙදර ඉන්නවා. මේ මන්ත්‍රීතුමා ගිහින් මහින්ද රාජපක්ෂ මහත්මයාගේ සාටකයේ එල්ලිලා අන්තිමේදී එතුමාගේ දෑත් ශක්තිමත් කරන්න ඇමතිකමකුත් ගත්තා. මේ වාගේ පුද්ගලයෝ තමයි අද මෙතැන ඇවිත් රෙදි ඇඳගෙන කථා කරන්නේ. එම නිසා " ලජ්ජා නැතිකම මහ මුදලිකමටත් වඩා ලොකුයි " කියන එක අපි විශ්වාස කරනවා.

එම නිසා අපි පැහැදිලිවම කියනවා ස්වාභාවික කැළෑවල ඉඩම් මේ විධියට- අමනෝඥ විධියට ව්‍යාපෘතිවලට හිතුමතේ වෙන් කර විනාශ කළායින් පස්සේ සතා සිව්පාවාටවත් ඉන්න තැනක් නැති වෙන බව.

අද අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා පැහැදිලිව කිව්වා, "මේ විධියට ස්වාභාවික වන සම්පත් විනාශ කර කොම්පැනිවලට විවිධාකාර වගාවලට, අපට ප්‍රයෝජනයක් නැති වගාවලට ඉඩම් වෙන් කිරීම නිසා කොයිතරම් අලි ඇතුන් ප්‍රමාණයක් විනාශ වුණාද?" කියා. ඇත්තු මිනිස්සු මරනවා. මිනිස්සු ඇත්තු මරනවා. එම නිසා අද මේ අලි මිනිස් ගැටුම මහා බරපතළ විධියට සිද්ධවෙගෙන යනවා. ඒ තුළින් මහා අපරාධයක් අද සිද්ධ වෙලා තිබෙනවා. එම නිසා ඉවක් බවක් නැතිව මේ ගම් බිම විනාශ කිරීම තුළින් සිද්ධ වෙන්නේ සතා සිව්පාවා වාගේම මිනිසාගේ ජීවිතත් අහිමි වෙන එකයි. අපි මේ මැති ඇමතිතුමන්ලාට කියනවා, මේ ගැන මීට වඩා අවධානය යොමු කර, මුදල් මලු පසු පස දුවන්නේ නැතිව රටත් ජනතාවත් ගැන කල්පනා කර කටයුතු කරන්නටය කියා. ඒ වාගේම මම මේ මොහොතේ මේ කාරණයත් කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017.05.09 වැනි දින අතිගරු ජනාධිපතිතුමා වෙත යවන ලද "ඌව පළාත් සභාවේ අනුමත කළ යෝජනා" සම්බන්ධයෙන් වන ලිපිය පිළිබඳව මා මේ අවස්ථාවේදී කියවන්න කැමතියි. එම ලිපියේ මෙසේ සඳහන් වනවා.

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

"2017.05.09
අතිගරු ජනාධිපති,
මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා,
ජනාධිපති කාර්යාලය,
කොළඹ.

ඌව පළාත් සභාවේ අනුමත කළ යෝජනා

2017.04.27 වන දින පැවති ඌව පළාත් සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

ඉදිරිපත් කිරීම - ඌව පළාත් සභාවේ ගරු මන්ත්‍රී සමන්ත විද්‍යාරත්න මැතිතුමා

ස්ථිර කිරීම - ඌව පළාත් සභාවේ ගරු මන්ත්‍රී ආර්.එම්. ජයවර්ධන මැතිතුමා

රිදීමාලියද්ද, මහියංගණය, පදියතලාව, මහඔය, බිබිල, කන්දකැටිය, ලුණුගල, මීගහකිවුල, මැදගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කේන්ද්‍ර කොට ගෙන මහා පරිමාණ උක් වගා ව්‍යාපෘතියක් මේ වන විට සැලසුම් කරමින් පවතී. මෙම ව්‍යාපෘතිය 2006 වසරේදී හඳුන්වා දුන් අතර, ඊට එරෙහිව බලවත් ජනතා විරෝධයක් හා පරිසරවේදීන් ඇතුළු වියතුන්ගේ විරෝධතාවයන් හේතුවෙන් එවකට රජය විසින් එම ව්‍යාපෘතිය නවතා දමන ලදී.

ඉතා සංවේදී පාරිසරික කලාපයක් වන ඉහත කලාපයේ ජලය, පස හා සියළු පාරිසරික තත්ත්වයන්ට ගැළපෙන දොඩම්, දෙහි, රබර්, කුරුඳු, රඹුටන්, ගම්මිරිස්, පොල් වැනි ආර්ථික බෝග වගාවන්ට මෙම කලාපය ඉතා සුදුසු බව කෘෂිකර්ම අමාත්‍යාංශය පවා නිර්දේශ කර තිබිය දී පාරිසරික, සමාජයීය හානි බලවත් වන ආර්ථික වැවිලි බෝගයක් වන උක් වගාව මෙම ප්‍රදේශයට නුසුදුසු බවත්, එබැවින් එම ව්‍යාපෘතිය නවතා දමා කෘෂිකර්ම අමාත්‍යාංශය ද නිර්දේශ කර ඇති පෙර කී ආර්ථික වැවිලි බෝග සඳහා ප්‍රමුඛස්ථානය ලබා දී ප්‍රදේශවාසී ජනතාවගේ ආර්ථිකය හා සමාජ ජීවිතය නගා සිටුවීමට කටයුතු කරන ලෙස මෙම ගරු සභාව යෝජනා කර සිටින්නීය.

2. ඉහත සඳහන් යෝජනාව ඌව පළාත් සභාවේදී සභා සම්මත වූ අතර, එය ඔබතුමාගේ කාරුණික දැනගැනීම සඳහා ඉදිරිපත් කරමි.

මෙයට - විශ්වාසී,
ඒ.එම්. බුද්ධදාස
සභාපති

ඌව පළාත් සභාව"

මෙන්න මේ ලිපිය අතිගරු ජනාධිපතිතුමාට යවා තිබෙනවා. අදාළ පළාත් සභාව මේ යෝජනාව ඉදිරිපත් කළත්, මේ කටයුත්ත කරන්න එපා කියලා සම්මත වෙලා තිබෙන බව ඉතා පැහැදිලියි. ඒ යෝජනා අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කරලා තිබෙනවා. එහෙනම් මේකට කළ යුත්තේ කුමක්ද කියන එක හරි පැහැදිලියි.

"රජයේ ඉඩම් කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යාපෘති සඳහා බදු පදනම මත ලබා දීම" කියන මාතෘකාව යටතේ 2014.09.23 දිනැති ලිපිය කෙරෙහි මා ඔබතුමාගේ අවධානය යොමු කරනවා. එම ලිපියේ මෙසේ සඳහන් වනවා.

"2014.09.23

සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්,
සියලුම නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරුන් / සහකාර ඉඩම් කොමසාරිස්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්.

<u>රජයේ ඉඩම් කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යාපෘති සඳහා බදු පදනම මත ලබා දීම.</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් 2014.08.23 දිනැති, වැඩ බලන ජනාධිපති ලේකම්ගේ අංක සීඑස්ඒ/5/10/1/7 ලිපියට අනුව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2014.09.17 දිනැතිව මා වෙත ලබා දී ඇති උපදෙස් හා බැඳේ.

රජයේ ඉඩම් කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යාපෘති සඳහා දීර්ඝ කාලීන බදු පදනම මත පෞද්ගලික ආයතන හෝ පුද්ගලයින් වෙත ලබා දීමේදී පොදු ක්‍රමවේදයක් අනුගමනය කරනු වෙනුවට විවිධාකාරයෙන් කටයුතු කරනු ලබන බව අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට ලක්ව ඇති බැවින් ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රමවේදයක් සකස් කරන තෙක්, අදාළ බදුකරවල රාජ්‍ය මුද්‍රාව හා රජයේ ඉඩම් ආඥා පනතේ 23(2) වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමාගේ අත්සනේ මුද්‍රාව යොදා එය සහතික කරන තෙක් ඉඩමේ භුක්තිය අදාළ පාර්ශ්වයන්ට භාර නොදීමට කටයුතු කරන ලෙස අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි දන්වා ඇත."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ ලිපියට අනුව ව්‍යාපෘතියට අදාළ ඉඩම්, ආයෝජනයන් ලබා දීම පිණිස ජනාධිපතිතුමා මේ මොහොත වනකොට අත්සන් කරලා තිබෙනවාද කියා මා ඔබතුමාගෙන් අහනවා. මා දන්න විධියට එතුමා ඒ ලිපියට අත්සන් කරලා නැහැ. මේ ලිපියට අත්සන් කරලා නැත්නම් මේ ව්‍යාපෘතියට මුල්ගල් තියන්නත් බැහැ; මේ ව්‍යාපෘතියේ ඉඩම් ලබා දීමට හැකියාවකුත් නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් වගකිව යුත්තන් දැනුවත් කරලා, අපට උත්තරයක් ලබා දෙන්න කියන කාරුණික ඉල්ලීම මා කරනවා. විශේෂයෙන්ම ඌව - වෙල්ලස්ස වාගේම දිගාමඩුල්ල ජනතාවට ආර්ථික, සමාජයීය, සංස්කෘතික වශයෙන් බරපතළ විධියට බලපාන මේ ව්‍යාපෘතිය පිළිබඳව ඉතාම වැදගත් විධියට සාකච්ඡා - කථා බහ - කරලා, මේකෙන් වන හානිය වැළැක්වීම පිණිස මෙන්න මේ යෝජනාව ක්‍රියාත්මක නොකිරීමට වග බලා ගන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.44ට, 2016 මාර්තු 08වන දින සභා සම්මතිය අනුව, 2017 මැයි 26වන සිකුරාදා පූ.භා. 10.30 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 5.44 மணிக்கு பாராளுமன்றம், அதனது 2016 மார்ச் 08ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2017 மே 26, வெள்ளிக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament Adjourned accordingly at 5.44 p.m. until 10.30 a.m. on Friday 26th May, 2017 pursuant to the Resolution of Parliament of 08th March, 2016.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.